# හෙළ දෙරණේ

# යළි පුබුදුව

සම්පාදක

කොස්වත්තේ අරියවිමල හිමි.

ධර්මදානය පිණිසයි.

අලෙවි කිරීම පිණිස නො වේ.

# හෙළ දෙරණේ යළි පුබුදුව

ප්‍රථම මුද්‍රණය : 2020

© : කොස්වත්තේ අරියවිමල හිමි.

ISBN 978- 955- 95963-7 -0

මුද්‍රණ විමසීම්: දිමුතු ප්‍රකාශන.
අංක 103/A, නුවර පාර, යක්කල.
033 2239662
077 8829705

ප්‍රකාශනය: කර්තෘ ප්‍රකාශනය.
ආර්ය නිකේතනය,
261/1 ඩී, පරකන්දෙණිය,
ඉඹුල්ගොඩ.

# පෙරවදන

අසරුවෙක් මහමග වේගයෙන් ගමන් කරයි. අශ්වයා අසරුවාගේ අණට කීකරු නැති බව පෙනෙන්නට තිබිණ. අසරුවා කටකලියා රැහැන අල්ලාගෙන සිටිය ද තමාගේ අණට අශ්වයා කීකරු නො වන තරමට කුලප්පු වී සිටින බව ඔහුට ද වැටහේ. මහමග සිටි, අසරුවාගේ මිතුරෙක් තම සගයා දැක 'කොහෙ ද යන්නේ' යි විමසී ය. යන්නේ කොහේදැයි නො දත් අසරුවා "අශ්වයාගෙන් අහපා...න් "යි පැවසී ය.

නූතන මිනිසාගේ සංවර්ධන ක්‍රියාදාමය ද කුලප්පු වූ අශ්වයා වැනි ය. අසරුවා මෙන් කොහෙද යන්නේ, යන්න මිනිසා නො දනියි. නූතන මිනිසා ස්වභාව නියාමයේ පැවැත්මට විරුද්ධව නො ගොස් ලෝකය ප්‍රයෝජනයට ගන්නවා වෙනුවට එය කාබාසිනියා කරන බව නම් නිතර කල්පනා වේ. එය කෙළවර වනු ඇත්තේ මිනිස් ක්‍රියාදාමය තවදුරටත් කරගෙන යා නො හැකි පරිදි මහා පරිමාණ විපතකින් ඇනී නතරවීමක් හැටියට යයි සිතුනත් එවන් විපතක් වෙනුවට හදිසියේ ම ප්‍රාදූර්භූත වූයේ මිනිස් ක්‍රියා දාමය නතර කර දමන්නට පොළඹවන ගෝලීය වසංගතයකි.

මහා පරිමාණ විපතක් ඇතිවීම වෙනුවට ගෝලීය වසංගතයක් පැමිණීම මිනිස් ක්‍රියාදාමය යෝග්‍ය දිශානතියට යොමු කරගැනීම සඳහා අවස්ථාවක් සලසා දීමක් හැටියට සැලකිය හැකි ය. මහත් විනාශයක් ගෙන දීමට කලින් නිවැරදි වන්නට අවස්ථාවක් ස්වභාව නියාමය විසින් ම මිනිසා වෙත පිරිනමනු ලැබ ඇත. එය හරියට මව් කෙනෙක් දඩබ්බර දරුවකුගේ නොහොබිනා කම් ඉවසා සමාව දෙන්නා සේ ය. යමරජු ඉදිරියට යමපල්ලන් විසින් ගෙන එනු ලබන සත්වයා කෙලින් ම නිරයට නියම නො කර, සුගතිගාමී වීමට අවස්ථාවක් උදා කරදෙන්නට හැකිදැයි සලකා බැලීමක් හැටියට "නුඹ කළ කුශලයක් තියෙනවා ද"යි මතක් කරගන්නට අවස්ථාවක් පිරිනමනවා වැනි ය.

එහෙත් මිනිසා මෙය හැදෙන්නට දුන් දඬුවමක් බව දකිනවා ද යන්න සැක සහිත ය. ඒ නිසා **"හෙළ දෙරණේ යළි**

**පුබුදුව"** රචනා කරන්නට කල්පනා කළෙමි. ඒ සඳහා අවශ්‍ය හුදෙකලාව හා විවේකය කොරෝනා ඇඳිරි නීතිය නිසා සම්පූර්ණ විය. ඇඳිරි නීතිය අස්සේ වුණත් වෙලාවට දානය ද ලැබුණි. අපහසුකම් අස්සේ නමුත් ඒ අවශ්‍යතාව ඉටු වන විට අපෙනුත් සමාජයට යමක් මේ වෙලාවෙ කෙරෙන්න ඕන කියන සිතිවිල්ල ඇති වෙන එක ස්වභාවිකයි. සමහර විට ඔය දානෙ උයාගෙන එන්නේ ආණ්ඩුවෙන් ලැබුණ රුඃ 5000/- න් ටිකක් වියදම් කරල වෙන්න පුළුවනි. ඒ නිසා අවශ්‍ය පණිවිඩය ඇතුළත් පොතක් ලියල මුද්‍රණය කරල නොමිලේ ජනතාවට පිරිනමන්න ඕන කියන සිතිවිල්ල මෙය රචනා කිරීමට උත්තේජනය සැපයී ය.

මෙහි ඇතුළත් පණිවිඩය ලෝකයට අවශ්‍ය බව කල්පනා වී තිබුණත් ක්‍රියාත්මක වෙමින් තිබුණ ජගත් ක්‍රියාදාමය ඊට සූදුසු නොවන බව පැහැදිලිව ම පෙනෙන්නට තිබුණි. **'දැන් ඇති'** කියා මිනිසුන්ට සිතුනේ නැත. **'දැන් නම් හොඳට ම ඇති'** කියල හිතනවටත් වඩා **'දැන් නම් ඕනවටත් වැඩියි'** කියා හිතන්නට තිබුණේ මින් බොහෝ කලකට පෙර ය. ඒත් මිනිසාට එහෙම හිතුනේ නැත. තණ්හාව එතරම් බලගතු ය. **'දැන් ඇති'** කියා මිනිසුන්ට තව ම හිතී නැත. කොවිඩ් 19 ඉදිරියේ සිතී ඇති බව පෙනෙන්නේ "දැන් ඇති" යන්නට වඩා **'පොඩ්ඩක් හෝව්'** කියල පමණි. තව ටික දවසකින් පරණ වැඩටික හිතේ හැටියට පටන් ගනීවි. පසුගිය සියවස් දෙක තුළ නවීන සංවර්ධනයේ නාමයෙන් මිනිස් ජීවිතයට එකතු කරගත්ත අලුත් දේවලින් ටිකක් වත් අතහැරගන්න මිනිසාට හිත හදාගත හැකි ද, යන්න අඩමානයි. මේ ගැන හිතන කොට පොඩි උපමා කථාවකුත් සිහියට එයි.

එක් මිනිසෙක් යම් අවශ්‍යතාවක් සඳහා වනයකට පිවිසියේ ය. ආපසු එන්නට සූදානම් වුවත් ආ දිසාව පැහැදිලි නැත. ඔහු වනයේ අතර මං විය. කෙමෙන් අඳුර ගලා ආවේ ය. ගමේ අඳුරට වඩා වනයේ අඳුර දැඩි ය. අඳුරේ නමුත් කලඑළි තැනකටවත් යා ගනු පිණිස එහා මෙහි සැරිසරද්දී ප්‍රපාතයකට ඇද වැටුණේ ය. කෙසේ නමුත් ලොකු වැල්පටක් අතට හසු විය. වැල් පටෙහි එල්ලී සිටින ඔහුට එය අතහරින්නට නො හැකි ය. කොහේ ඇද වැටේ දැයි නො දනී. වැල අත නො හැර

එළිවෙනතුරු එල්ලී සිටීම ද අමාරු ය. පණ බය නිසා අතහරින්නට ද බැරි ය. කෙසේ හෝ එල්ලීගෙන ම සිටියේ ය. වටින් ගොඩින් එළිය වැටෙන විටයි, ඔහුට පෙණුනේ බිම පය ගහන්න තව ඇත්තේ වියතක් පමණක් බව. සොබාදහමට නො දරිය හැකි පමණ අතහරින්නට, කොරෝනාව අරුණාලෝකයක් පිරිනමා ඇත.

නූතන මිනිසා අතහරින්නට අකැමැත්තෙන් දුක් දනවන දේවල් ගොඩක් කර දරා සිටිති. අතහැරියොත් සහනය අත ළඟ ය. ඒත් තෘෂ්ණාව ඒකට ඉඩ දෙන්නේ නැත. කොවිඩ් 19 වසංගතය අහවර වීමෙන් හෝ ඒ සමඟ ජීවත්වීමට හුරු වීමෙන් හෝ මනුෂ්‍යයා යළි සුපුරුදු වැඩ පිළිවෙළ ම ගෙන යාවි. එතකොට මිහිමව යළිත් අකීකරු දරුවන්ගේ පීඩාවෙන් හඬා වැටේවි. එහෙම වුණොත් ඒ ඇයි? මිනිසුන්ගේ නුවණැස අවිද්‍යාවෙන් තණ්හාවෙන් වැහී ඇති නිසයි. ඉතින් මොකවත් පෙනෙන්නෙ නැහැ. ඇතැම් මිනිස්සු අර්බුද තියෙනවට කැමති ය. අර්බුදය ගාණෙන් නොයෙක් වාසි සලසා ගැනීම් කළහැකි බැවිනි. මිනිස් ඕනෑ එපා කම් විස්මය ජනක ය.

අවිද්‍යාවෙන් ආවරණය වුණ ලෝකයා තමන් අත්දකින්නේ විඳීම්, හැඳිනීම්, චේතනා (නාම) ඔස්සේ විඤ්ඤාණයේ මැවෙන සළායතනික රූප නිමිති බව නො දනිති. නාම රූප නැතුව විඤ්ඤාණයට සමුදය වන්නට ද බැරි ය. මම ඇත්තෙක් හැටියට හිතාගෙන අත්දකින්නේ තියන දෙයක් යයි හිතා ගෙනයි, ලෝකයා ඉන්නෙ. බුදුරජාණන් වහන්සේ මෙසේ වදාරති. අවිද්‍යාවෙන් බැඳුණු ලෝකය දිගට පවතින්නක් සේ දකියි. **(මොහසම්බන්ධනො ලොකො භබ්බරූපො'ව දිස්සති)** ස්පර්ශ කරන, විඳගන්න, හඳුනාගන්න, චේතනා මවන, දැනගන්න දේවල් වලට බැඳුණ අඥානයා මොහඳුරින් ආවරණය වූයේ වෙයි. **(උපධිසම්බන්ධනො බාලො තමසා පරිවාරිතො)** අත්දකින්නෙ ඇත්තක් කියල ම යි, හිතන්නෙ. **(සස්සති විය බායති)** නුවණින් බැලුවොත් කිසිවක් නැත. **(පස්සතො නත්ථි කිඤ්චනං)**

වෙසෙස් නුවණින් ලෝකය දකින්නේ ඒ ආකාරයෙනි. එහෙත් මූලික වශයෙන් මිනිසා සිටින්නේ වෙසෙස් නුවණින් යුතුව නොව සාමාන්‍ය සංජානන මට්ටමේ ය. සියලු අරගල,

සටන්, ගැටුම්, ඝාතන, වංචා, දූෂණ, බොරුකථා, කේලම්, අවලාද, තර්ජන, හොරකම්, මැරකම් කොටින්ම කියනවා නම් කාමලෝකයට ආවේණික හොඳ නරක ඔක්කොම සංජානන මට්ටමේ වැඩ ය. පිරිපුන් ප්‍රඥාවට එළඹ විසීමට කලින් ඒ පිළිබඳ සම්මාදිට්ඨියවත් සකසා ගත්තොත් සංජානන මට්ටමේ වැඩ ද හානිදායක විනාශකාරී නො වන තත්ත්වයකට කළමනාකරණය කරගත හැකි ය. බුදුරජාණන් වහන්සේ වදාළ සමාජ චින්තනය ඒ පිණිස ය. හෙළබිම වැසියා මුල්යුගයේ බුදුදහමේ ආභාසය ලබමින් ලෞකික කටයුතු කළමනාකරණය කරගත්තේ එසේ ය. ඔවුහු සංරක්ෂණශීලී ලෙස භූමිය පරිහරණය කළහ. තමන්ට නිපදවිය නො හැකි ස්වභාවික සම්පත් පරිස්සමින් පරිහරණය කළහ. රැල්ල ගහන මහවැව් වල හේදී යාම වැළැක්වීමට බැම්මේ ඇතුළු පැත්තෙන් රළපනාව නමින් ගල් අතුරා තිබේ. ඒ ගල් ගත් තැනක් සෙවිය හැකි නො වේ. පරිසරය පලුදු නො කර, අලංකාරය ද රැක ගනිමින් ඔවුන් කටයුතු කළේ එසේ ය. එහෙත් මෝහෙන් මුළා වෙච්ච අඥාන අය බෝර ගහල, ඩයිනමයිට් දමල කඳු බැවුම් බරුගහල තියෙන හැටි, මගතොටේ යනකොට පෙනෙන්නට තිබේ. සතුන්ටත් මිනිසුන්ටත් අනතුරු දායක ගල්වලවල් කොතෙකුත් තිබේ. ධර්මයෙන් ශික්ෂණයක් නැත්නම් කාන්තාර පළඟැටියන් වගාවක් දවසෙන් විනාශ කරනව වගේ තමයි නූතන මනුෂ්‍යයා ලෝකය කාබාසිනියා කරන්නෙ.

"පොඩ්ඩක් හෝව්" වෙච්ච මේ වෙලාවෙ, පොළොවේ, ජලමූලාශ වල හා වාතයේ නැවුම් බව රැකෙන හැටියට, ගිජුකම් අඩු, සුහද මානව සබඳතා ඇති, ආහාර නමින් වසවිස නැති, ප්‍රියංකර පතිරූපදේශයක් ගොඩනගනු පිණිස ලෝකයාට නුවණැස පිබිදේවා, යනු අපගේ ප්‍රාර්ථනාවයි.

මේ ප්‍රයත්නයට යම් යම් පොත පත සොයා දීමෙන් උපකාර කළ **ප්‍රියන්ත ඇල්ලප්පෙරුම මහතා** කෘතවේදිත්වයෙන් සිහිපත් කරමි. මුද්‍රණ කාර්යය මැනැවින් ඉටු කරදුන් **දිමුතු ප්‍රකාශන ආයතනයේ අධිපති එච්. එම්. එච්. බණ්ඩාර මහත්මා** ඇතුළු කාර්ය මණ්ඩලයට පුණ්‍යානුමෝදනා පූර්වක ස්තුතිය පිරිනමමි.

කොස්වත්තේ අරියවිමල හිමි.
ආර්ය නිකේතනය,
261/1, ඩී, පරකන්දෙණිය, ඉඹුල්ගොඩ.
2020. 06. 21

## පටුන


| | | |
|---|---|---|
| 01. | 21 වැනි සියවසේ මාරාන්තික අභියෝගය .. | 01 - 04 |
| 02. | වැරදුනේ කොතැන ද?................................ | 05 - 08 |
| 03. | සදාචාරයේ අවශ්‍යතාව ................................ | 09 - 14 |
| 04. | මේ මහා විපතින් මිදී අපි අපි ම නැගිටිමු .. | 15 - 20 |
| 05. | වැව්බැඳි රාජ්‍යය ........................................ | 21 - 30 |
| 06. | පෙර රජවරුන් රට කළ හැටි ...................... | 31 - 38 |
| 07. | පරසතුරු ආක්‍රමණ ....................................... | 39 - 52 |
| 08. | 1948 න් පසු .................................................. | 53 - 62 |
| 09. | ජීවත්වීම හා ජීවනොපාය ........................... | 63 - 78 |
| 10. | විද්‍යාව තාක්ෂණය හා දර්ශනය .................. | 79 - 94 |
| 11. | සැපවත් ජීවිතය ........................................... | 95 -108 |
| 12. | සමාප්තිය .................................................. | 109 -118 |

01

## 21 වැනි සියවසේ මාරාන්තික අභියෝගය:

ලෝකයේ වරින් වර වසංගත රෝග ව්‍යාප්ත වේ. අභිවාතක වැනි ජනපද රෝග පිළිබඳව අපේ බණ පොත් වල ද සඳහන් වී ඇත. විශාලාමහනුවර රෝගභය, දුර්භික්ෂභය, අමනුෂ්‍යභය යන තුන්බියකින් ඇළලී ගිය බව අපි දනිමු. 1918 දී පළමු ලෝකයුද්ධය අවසන් වීමෙන් පසු සන්නිපාත ලෝක වසංගතයක් ඇති වී තිබේ. ස්පාඤ්ඤ වයිරසය නම් රෝගකාරකයෙක් එයට හේතු වී ඇත. එම රෝගයෙන් මිලියන 20 ත් 50 ත් අතර සංඛ්‍යාවක් මියගිය බවත් අසන්නට ලැබේ. 1918 වසරේ දී ලංකාවේ පැතිරී ගිය දරුණු උණ රෝගයකින් බොහෝ දෙනෙක් මියගිය බව ඉතිහාස පොතපතේ සඳහන් වී තිබේ. එය සන්නිපාත ලෝක වසංගතය ම ය. ලංකාවේ 20,000 ක් පමණ මියගොස් තිබේ. ප්‍රතිශ්‍යාව සහිත උණක් වන මේ රෝගය තුන්දා උණ වශයෙන් ද හැඳින්වී තිබේ. නැව් ගමනාගමනය මේ වයිරසය ව්‍යාප්ත වීමට හේතු වී තිබේ. 1921 දී කතරගම කොලරා රෝගයෙන් ද, මහනුවර මහාමාරිය රෝගයෙන් ද තෙල්දෙණිය ප්‍රදේශයේ අතීසාර රෝගය පැතිරීම නිසා ද, ජීවිත රාශියක් මරු වැළඳගෙන ඇත. 1919, 1920 කාලයේ බුරුමයෙන් හා ඉන්දියාවෙන් ගෙන්වන සහල් ආනයනය වැළකී යාමක් නිසා ලංකාවේ ආහාර හිගයකින් ද ජනතාවට දුක් විඳින්නට සිදු වී තිබේ. මේ ආකාර වසංගත දුර්භික්ෂ වලට මිනිසාට මුහුණ දෙන්නට සිදු වන්නේ අහඹු සිදුවීම් වශයෙන් නොව මිනිස් සන්තානයෙහි දසඅකුශල චේතනා බලගතු වීමට ප්‍රතිචාර වශයෙන් බව මෙහි දී වෙසෙසින් සිහිපත් කළයුතුව තිබේ.

2020 දී ද කිසිවෙක් නො සිතූ විදිහට ගෝලීය වසංගත රෝගයක් ව්‍යාප්ත වී තිබේ. රටවල් දෙසිය ගණනක කොවිඩ් 19 හෙවත් නව කොරෝනා නමැති මේ රෝගකාරක වයිරසය ව්‍යාප්ත වී තිබේ. මේ ආගන්තුක වයිරසය කලින් නො ඇසූ විරූ නිසා ඊට ඖෂධයක් ද නැත. ඒ අතර වයිරසයෙන් ආසාදනය වීම ද වේගවත් ය. මේ වයිරසය ආසාදනය වන්නේ ද ස්වසන

පද්ධතිය ඇසුරු කරගෙන ය. මියයන්නේ දවසට සියදහස් ගණනිනි. මින් පැහැදිලිව ම පෙනෙන්නේ කොවිඩ් 19 ගෝලීයකරණය වී ඇති බවයි. සිංහලෙන් ගෝලීයකරණය යන වචනය භාවිතා කරන්නේ ‘Globalization’ යන ඉංග්‍රිසි වචනයට පාරිභාෂික වශයෙනි. ලෝකව්‍යාප්තව දියුණු වීම, ක්‍රියාත්මක වීම “develop or operate worldwide”[1] යනු Globalize යන වචනයේ අර්ථයයි. ලොව කොවිඩ් 19 වයිරසයෙන් ආසාදිතයෝ ලක්ෂ ගණනින් වෙත් නම්, සිදු වී ඇත්තේ වයිරසය ලෝකව්‍යාප්තව ක්‍රියාත්මක වීම ය. එනම්: ගෝලීයකරණය වීම ය. විශ්ව ගම්මානය පිළිබඳ සිහිනයක සිටින මනුෂ්‍යයා ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක වූ ස්වයම්පෝෂණ ආර්ථික රටාවන් සාම්ප්‍රදායික නො දියුණු කමක් හැටියට සලකා වාණිජවාදී ලෝක ආර්ථික රටාවකින් සියලු සුඛවිහරණයන් සපුරාගන්නට කටයුතු කරද්දී ඒ හැමෙකක් ම සැණෙකින් නවතා ලමින් මාරාන්තික වයිරසයක් ගෝලීයකරණය වී තිබේ.

මේ වයිරසය ව්‍යාප්තවීම හේතුවෙන් ඇති වන ජීවිත අවදානම ඉදිරියේ ලෝකයේ බලවත් රටවලට තම ධනබලයෙන් හා අවිබලයෙන් කළහැකි කිසිවක් නැත. දියුණු වෛද්‍ය පහසුකම් තිබුණ ද එය නිසි ලෙස කළමනාකරණය කරගත් බවක් ද නො පෙන්. රටවල් වසා දැමීමට සිදු විය. මඟී ගුවන් ගමන් නතර විය. කර්මාන්ත ශාලා නතර විය. පොදු ජනතාවට නිවෙස් තුළට වී සිටීමට සිදු විය. වයිරසයෙන් ආසාදිත යයි සැක සහිත අය නිරෝධායන මධ්‍යස්ථාන වල රඳවන්නට සිදු විය. ආසාදිතයයි තහවුරු වූ අය රෝහල් ගත කෙරුණි. බැහැර රටක සිට ගුවනින් එන හා ගෙන්වා ගන්නා අය නිරෝධායන මධ්‍යස්ථාන වල රඳවන්නට සිදු විය. ඒ අතරින් සමහරු රෝගග්‍රස්ථ වූහ. බොහෝ රටවලින් වාර්තා වූයේ දිනකට සිය දහස් ගණන් මියයන බව ය. වෘත්තීය ක්‍රියාදාමයන් ඇණහිටි මේ අවස්ථාවේ ජනතාවට ආහාර සපයා ගැනීම හා රෝගීනට අවශ්‍ය ඖෂධ ලබා ගැනීම පිළිබඳ විශේෂ විධික්‍රම සැලසුම් කරන්නට සිදු විය. පුද්ගල ඇසුර මීටරයකින් ඔබ්බට දුරස් කරන්නට සිදු විය. කොවිඩ් 19 ලෝකෙන් තුරන් වූ බවට සහතික විය හැකි තාක් පරෙස්සම් වියයුතු ය. මේ වසංගතය

---

[1] Compact Oxford Referance Dictionary, P: 350.

මිනිස් ලොවට ම කරන අනතුරු ඇඟවීමක් බව පොදුවේ සමස්ත මනුෂ්‍ය වර්ගයා තේරුම් ගෙන ඇත්දැයි සැකසහිත ය. අප දන්නා මෑත ඉතිහාසය තුළ මිනිසාගේ ප්‍රතිශක්තිය නැති කොට වැළඳෙන මොන ලෙඩකින් හෝ මරාදමන එච්. අයි. වී. වයිරසය පැමිණියේ ය. ඉන් මිනිසා සංයමයට පත් වූ බවක් නම් පෙනෙන්නට නැත. මීට අමතරව සූකර සන්නිපාතය (ඌරු උණ), සාස්, ජැපනීස් එන්සෙපලයිටීස්, චිකුන්ගුනියා ආදී හැඳින්වීම් සහිත වසංගත මට්ටමේ රෝග වරින් වර ලෝකයේ නොයෙක් ප්‍රදේශ වල ව්‍යාප්ත විය.

මුහුද ගොඩ ගැලුවායයි කියන පැරණි කථා නො ඇදහූ අයට ඇදහිය හැකි පරිදි 2004 වසරේ දෙසැ: 26 දින දකුණු ආසියා කලාපයට සුනාමි උදම්රළ ගලා ආවේ ය. විනාඩි කිහිපයක් ඇතුළත වෙරළාසන්න ප්‍රදේශ යකුන් කෙළපු පිටියක් වැනි විය. ජීවිත හානි වූයේ ලක්‍ෂ ගණනිනි. උන් හිටි තැන් මැකී යන පරිදි සිදු වූ නිවාස, දේපල හානිය තක්සේරු කිරීමට නො හැකි තරම් විය. මව්පියන් සොයුරු සොයුරියන් දූදරුවන් හැම විනාශ වී හුදෙකලා වූවෝ බොහෝ ය. ඒත් වැඩිකලක් නො යා දී ම මිනිසාට එය අමතක වූ ගාණ ය. මිනිසා යහපත් මාවතකට අවතීර්ණ වූ බවක් පෙනෙන්නට නැත. මිනිසා පරණ ගමනේ ම ය. ඒ මිනිසාට වෙනත් මාවතක් පෙනේනේ නැති නිසා ය. වෙනත් මාවතක අවශ්‍යතාවක් දකින්නට තරම් විවේක මනසක් නැති නිසා ය.

භෞතිකත්වය පිළිබඳව නූතන මිනිසා බෙහෙවින් හසළ ය. එහෙත් ආධ්‍යාත්මිකත්වය පිළිබඳ නුවණැසින් නූතන මිනිසා අන්ධ ය. අත්දැකීම හා අත්දකින්නා යන ද්වෛතය ම හුදු චේතනාමය තත්ත්වයන් (මඤ්ඤනා) පමණි. ඉඳුරන්ගෙන් අත්දකින්නේ සැබැවින් ම සිදුවන දෙයයයි පුද්ගලයා කල්පනා කරයි. පටු චින්තනය තුළ එය ඇත්තක් සේ ගැණුනත් පුද්ගලයා අත්දකින්නේ සිදුවන දෙය නොව, ඉඳුරන්ට හසුවන ආකාරය පමණක් බව නො දනියි. විශ්වය යනු ඇත්තා වූ සියල්ල යයි ගනියි. පටු චින්තනය තුළ එය ද ඇත්තක් සේ ගැණුනත් විශ්වය යනු ඉඳුරන්ට (මනින්ද්‍රිය ද ඇතුළුව) ගෝචර වන ආකාරය පමණක් බව නො දකියි. විඥානය විසින් පිළිබිඹු කරනු ලබන නාමරූපය (විඳීම්, හැඳිනීම්, චේතනා, ස්පර්ශ, මනසිකාර හා නිමිති රූප) ඇත්තක් සේ සිතෙන තාක් මිනිසාට

සතුටුදායක වෙනත් මාවතක් පෙනෙන්නේ නැත. ඒ තම කෙලෙස් තුළින් ලෝකය දකින නිසා ය. පුද්ගලයා බැඳෙන්නේ හෝ ගැටෙන්නේ හෝ රැවටෙන්නේ හෝ බාහිර දෙයකට යයි සිතුවත් සැබැවින් ම සිදුවන්නේ තමාගේ ම චේතනාමය සකස් වීම් වලට ඇලීම, ගැටීම, රැවටීම බව ප්‍රඥාව මෙහෙයවන්නේ නම් තේරුම් ගැනීම අපහසු නො වේ.

මේ ධර්මතාව නො දක්නා පුද්ගලයා ලෝභයෙනුත් ද්වේෂයෙනුත් මෝහයෙනුත් හැසිරෙනවා ඇත. මනුෂ්‍ය වර්ගයාගේ ඉතිහාසය ලොවට කියාපාන්නේ උත්තරීතර සාමයේ ඉතිහාසයක් නොව ගැටුම්කාරී බවෙහි ඉතිහාසයක් ව ඇත්තේ ඒ නිසා ය. මිනිසා තවමත් ලෝකය සංරක්ෂණශීලී ලෙස පරිහරණය කරන්නට ඉගෙනගෙන නැත. විද්‍යාත්මක වශයෙන් දියුණු වන්නට වන්නට සාමය හා සංරක්ෂණශීලිත්වය පලාගොස් ඇත.

එවන් පසුබිමක මිනිසාට කෙළෙස් තුළින් නොව නුවණින් යුතුව සිතන්නට අවස්ථාවක් උදාකරමින් කොවිඩ් 19 ව්‍යසනය ලෝකයට කඩා වැදුනේ ය. එම වයිරසය බලපෑවේ එක් කලාපයකට නොව මුලු ලෝකයට ම ය. මුළුමහත් මිනිස් වර්ගයාට ම ය. මිනිසාගේ සියලු ක්‍රියාකාරකම් වහා ඇණ හිටියේ ය. ගෝලීය වසංගතයත් සමග ආහාර දුර්භික්ෂයක් ද එන්නට ඉඩ අවකාශ වැඩි ය. තවදුරටත් මෙතෙක් කළ ආකාරයට කටයුතු කළහැකි යයි නො සිතිය යුතු ය. තවදුරටත් මිනිස් ක්‍රියාකාරකම් මෙ පරිදි වුවහොත් ඊ ළඟට එන්නේ කොවිඩ් 19 ට වඩා බොහෝ සෙයින් එහා ගිය කොරෝනාවක් විය හැකි ය. එහෙයින් මේ ලේඛණයෙන් මා බලාපොරොත්තු වන්නේ වෙනස් වියයුත්තේ කුමකට ද, යන්න මගේ ශක්ති පමණින් ඔබ ඉදිරියෙහි තැබීමට ය. එය **ධර්මය** හා **අර්ථය** එක්ව ගමන් කරන පිළිතුරක් වියයුතු වේ.

.

02

## වැරදුණේ කොතන ද.?

වෙනස් වියයුත්තේ කුමකට ද, යන්න තේරුම් ගන්න නම් මේ වෙමින් තියෙන්නේ මොකක් ද, යන්න හඳුනා ගතයුතු වේ. මහපොළවටත්, මහසයුරටත්, වායුගෝලයටත් දරන්නට නො හැකි ගමනක මිනිසා නියැලී සිටියි. ස්වභාව ලෝකය ඒ නො දැරිය හැකි බවට කොතෙක් ඉඟි කළත් ඒ බව සැලකිල්ලට ගන්නට තරම් ඉස්පාසුවක් තණ්හාවෙන් ගිනිකන වැටී සිටින මිනිසාට නැත. ඒ නිසා ම කෙමෙන් කෙමෙන් පෘථිවියේ වනගහණය ක්ෂය වී යයි. කාන්තාර භූමි ප්‍රමාණය වසරින් වසර පුළුල් වීම පිළිබඳව සංඛ්‍යා ලේඛණ සකසනවා හැරෙන්න විනාශය නම් නතර නො වේ. ගත වූ වසර දෙසියය තුළ ගොඩ නගාගත් විද්‍යා තාක්ෂණික ඥානය මිනිස් වර්ගයාගේ ජයග්‍රහණයක් සේ මිනිසා දකියි. ඕනෑ ම දුෂ්කරතාවකට නවීන විද්‍යා තාක්ෂණය තුළ විසඳුම් ඇතැයි මිනිසා කල්පනා කරයි. අවශ්‍යතාව හා ගිජුකම අතර වෙනස නො හඳුනාගත් මිනිසා ගිජුකම සංතෘප්ත කරන්නට නොයෙක් දේ නිපදවයි. නව නිපැයුම් පරිහරණය කරන තරමට, බහුභාණ්ඩික වූ තරමට ජීවිතයට නව ඇගයුම් ආරෝපණය කරගනියි. අහංකාරය මමංකාරය බලගතු වෙයි. කාර්මීකරණය නිසා සූර්යයාගෙන් එන පාරජාම්බූල කිරණ වලින් පෘථිවියේ ජීවීන් ආරක්ෂා කරන ඕසෝන් ස්තරය තුනී වෙයි. මිනිස් ක්‍රියාකාරකම් වල ප්‍රතිඵල වශයෙන් වායුගෝලයත් පානීය පරිභෝජනීය ජලයත් දූෂණය වෙයි. හුස්ම ගැනීමේ අපහසුතාව ඇති කරමින් වායුගෝලය තමන්ගේ අමාරුව පිළිබඳව මිනිසාට ඉඟි කරයි. ඒත් වායු දූෂණය නවතන්නට මිනිසාට කල්පනා වන්නේ නැත. ඒ වෙනුවට මුඛවාඩම් බැඳගෙන අම්ලකර විකුණන්නට කටයුතු කරයි. ගෝලීය උණුසුම ඉහළ යන විට වායුසමීකරණ නිෂ්පාදනය හා භාවිතය වැඩි කිරීම විසඳුමක් සේ සිතයි. ජල දූෂණය උග්‍ර වන විට පිරිපහදු කොට ජලය බෙදා හැරීමේ නළ පද්ධති ඇති කිරීමෙන් ප්‍රශ්නය විසඳන්නට සිතයි. පොළවේ ඇති ඛණිජ සම්පත් නිධි හඳුනාගන්නා මිනිසා ඒවා පරිභෝජනය

කරන්නේ මිනිසාට නිපදවිය නො හැකි ස්වභාවික ප්‍රාග්ධනයක් බව නො සළකා ය. වරක් පමණක් පාවිච්චි කළහැකි ඛණිජ තෙල් දහනය කරන්නේ අසීමිත සම්පතක් ලෙස සිතාගෙන ය. එමගින් වායුගෝලයට මුසු කරන්නේ ස්වභාව නියාමයට සමතුළනය කරගැනීමට හැකි සීමාවන් ඉක්මවාලමිනි. ඒවා සීමිත නම් සර්වබලධාරී විද්‍යාව ඊට යම් ආදේශකයක් සොයා ගන්නවා ඇත යන විශ්වාසයෙනි. ගෝලීය උෂ්ණත්වය ඉහළ යන විට උත්තරධ්‍රැවයේ හා දක්ෂිණධ්‍රැවයේ හිම දිය වී මහමුහුදේ ජලමට්ටම ඉහළ යයි. ගොඩ බිම් ප්‍රදේශ අඩු වෙයි. සමුද්‍රඛාදනය උග්‍ර වෙයි. දූපත් රටවල් කලින් ම මුහුදට බිලි වන බවට අනාවැකි පළවෙයි. මිනිසාගේ ම මිනිස් ක්‍රියාකාරකම් නිසා මෙසේ වන බව මිනිසා නො දන්නවා නො වේ. පරිසර විද්‍යාඥයෝ ද ඒ බව වරින් වර හෙළිදරව් කරති. එහෙත් දැනට ඇති මේ අධිපරිභෝජන ආකල්පය වෙනස් වියයුතු බව නො දකියි. දුටුවත් තෘෂ්ණාව විසින් වෙනසකට ඉඩ දෙන්නේ නැත.

කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා යනුවෙන් තණ්හාවේ ආකාර තුනක් බව බුදුරජාණන් වහන්සේ දක්වති. කාමතණ්හා යයි කීවේ වස්තුකාමය හා ක්ලේශකාමයටයි. ධනය, බලය, ඉඳුරන් පිණවීම එකම අරමුණ කරගත් මිනිස් ශිෂ්ටාචාරය පොළවටත් වායුගෝලයටත් ජලයටත් සමස්ත ජීවයටත් නො දැරිය හැකි ලෙස ගෙන යන මේ ක්‍රියාකාරකම් නවතාලීමට හෝ අව ම කිරීමට හෝ නො දනියි. සංවර්ධනයේ නාමයෙන් ලෝක බලවතුන් වීමේ මනෝරාජික අරමුණු සාක්ෂාත් කොට පවත්වාගෙන යාමේ භවතෘෂ්ණාව පෙරටුව පවතියි. ඒ උදෙසා බාධක යයි සිතෙන හැම දෙයක් ම විනාශ කරලීමේ විභවතෘෂ්ණාව විසින් මිනිසා මෙහෙයවනු ලැබ ඇත. සදාචාරය, සමාජ සංහිඳියාව හා මානසික සංහිඳියාව මග දමා මායාත්මක සංවර්ධන ක්‍රියාදාමයක අතිධාවනකාරී ලෙස දුවයයි. බලතණ්හාව, ධනතණ්හාව හා ආධිපත්‍යවාදය කොතරම් බලගතු ද යත් බලවත් යයි කියාගන්නා රටවල් නව යුදතාක්ෂණ අත්හදා බැලීම් සඳහා සිය ජාතික ධනයෙන් විශාල ප්‍රමාණයක් වෙන් කරයි. යුදඅවි වෙළඳම ඇතැම් බලවතුනට ජාතික ආදායම වෙයි. නොයෙක් උපක්‍රම වලින් ජාතීන් අතර අසමගි කම් ඇති කිරීම අවිවෙළඳාම සාර්ථක වීමට අවශ්‍ය ය. යුද සංහිඳියාව එවන් බලවතුනට හිසරුදාවකි. උපකාර කිරීමේ වේශයෙන් නොයෙක්

කොන්දේසි වලට යටත්ව රටවලට මූල්‍ය ආධාර හා ණය සහනාධාර පිරිනමන්නේ ස්වයම්පෝෂණය පිණිස නොව තම ආධිපත්‍යය ආරක්ෂා වන සැලසුම් වලට ය. බලවතුන්ගේ අරමුණ ඉටුවන බවට සෑහීමට පත්විය නො හැකි වන විට නම් කෙරෙන්නේ අසාර්ථක රාජ්‍යයක් හැටියට ය. පැණවෙන්නේ ආර්ථික සම්බාධක ය. පෙර වූ යුද්ධමය යටත් විජිත ක්‍රමය වෙනුවට ආදේශ වී ඇති නව යටත්විජිතවාදය මෙයයි.

මහපොළව, වායුගෝලය, ජලසම්පත, ශාකලෝකය මිනිසාට මෙන් ම සෙසු සියලු සතුන්ට ස්වභාවධර්මයෙන් හිමි වූ දායාදයන් ය. පොළවේ සියලු සම්පත් මිනිසා ඇතුළු සත්වයන්ට ප්‍රමාණවත් ය. එහෙත් මිනිසාගේ තෘෂ්ණාධික බව සංතෘප්ත කරන්නට මහපොළවේ සම්පත් නො සෑහෙන තත්ත්වයට පත් වී තිබේ. තමාට අවශ්‍ය කුමක් ද, අනවශ්‍ය කුමක් ද, යන්න තෝරා බේරා ගැනීමට ඇවැසි මිනිසාගේ නුවණැස අද ඊයේ නොව බොහෝ කලක සිට අන්ධ වී තිබේ. අධිපරිභෝජනයෙන් අධිපෝෂණයට පත්ව ඇති ධනකාමියා බලකාමියා කයිනුත් මනසිනුත් රෝගස්ථ වී ඇත. අද වෙන කොට කය සුවපත් වන්නේ කය ක්‍රියාත්මක වන පමණට බව අමතක ය. සිත සුවපත් වෙන්නේ සංසුන් වූ පමණට බව අමතක ය. අසංතෘප්ත සිතට අල්පේච්ඡතාව සෘණ සංකල්පයක් ය. ධනාත්මක යයි සිතන්නේ මහේච්ඡතාව යි. සිදු වී ඇත්තේ සියල්ල උඩුයටිකුරු වීමයි.

අද ලෝකයේ රැකියාව යන්න තමාගේ කායික ශක්තිය හා මානසික බුද්ධිය විකිණීමක් බවට පත් වී තිබේ. අවශ්‍යතා සම්පාදනය වෙනුවට අවශ්‍යතා මිල දී ගැනීමට ඇවැසි මුදල් උපයන කාර්යයක් වී තිබේ. මුදලට ශ්‍රමය විකිණීමත් ශ්‍රමය මුදලට ලබා ගැනීමත් අතර සමහන් වීමක් වෙනුවට ඇත්තේ ගැටුම්කාරී බවයි. වෘත්තීය ආශ්වාදය වෙනුවට විද්‍යමාන වෙන්නේ වෘත්තීය අසහනය පදනම් කරගත් සේව්‍ය සේවක ගැටුම්කාරී බවයි. මෙසේ ශ්‍රමය විකුණන්නට ක්‍රමයක් නැති වන විට බිහි වන ශ්‍රම අතිරික්තය කවර අසම්මත ක්‍රමයකින් හෝ මුදල් ඉපයීමට කටයුතු කරනවා ඇත. සියලු දුරාචාරයන්ට පදනම වන්නේ එයයි. පසෙක මත්පැන්, මත්ද්‍රව්‍ය උවදුර ය. පසෙක හොරමැරකම් මං කොල්ල කෑම් ය. මෛථුන දුරාචාර වෙළඳ පල ද ඒ අතර ම ය.

අද මනුෂ්‍යා සිතා සිටින්නේ මේ ගත වන්නේ විද්‍යා තාක්ෂණය ඔස්සේ දියුණු ම කාල පරිච්ඡේදය බවයි. මිනිසා සක්වල සැරිසරන්නට ද සමත් ය. පැය කිහිපයකින් කවර රටකට වුව ද පියඹා යාහැකි පරිදි ගුවන් යානා ඉන්ජිනේරු තාක්ෂණය දියුණුය. මුහුදින් ගොඩින් අහසින් ගමන් පහසුව වේගවත් ය. චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ සිදුවන සන්නිවේදනය සැබැවින් ම විදුලි වේගයෙනි. ගූගල් මැප් එකෙන් ලෝකයේ ඕනම තැනක් බලා ගතහැකි ය. අන්තර් ජාලය සැණෙකින් නොයෙක් ක්ෂේත්‍රයන් පිළිබඳ දැනුම මෙන් ම නූතන නො හික්මුණ මිනිස් ආධ්‍යාත්මයේ කුණු කන්දල් ද බෙදා හැරේ. ලෝක බලවතුන් එකිනෙකාට රහසිගතව න්‍යෂ්ටික යුදඅවි අත්හදා බැලීම් ද සිදු කෙරේ. ලෝකයට මුහු වන විකිරණශීලතාව ගැන සිතන්නේ නැත. සමූල ඝාතනයට සුදුසු අවි සදන අතර ම වෛද්‍ය විද්‍යාව ජීවිතාරක්ෂාව පිණිස සියුම් සැත්කම් තාක්ෂණය දියුණු කරයි. පිළිකාරෝගීන්, දියවැඩියා රෝගීන්, හෘදය රොගීන් වැනි බෝ නොවන රෝග වැළඳුනවුන් බහුල වී තිබේ. වයිරස් රෝග සංඛ්‍යාව ද වැඩි වෙමින් තිබේ. කාර්මීකරණය නිසා දිනකට ස්වභාව නියාමයට සමතුළනය කරගත නො හැකි පරිදි විෂ දුම් විශාල ප්‍රමාණයක් වායුගෝලයට එක් වෙයි. ඔය විදියට අද මිනිසා දියුණු කරගෙන ඇති දේවල් කෙළවරක් නො දැකියහැකි තරම් ය. අත්ලන්තික් සාගරය යනු ඈත යුගයක විද්‍යාඥානයෙන් දියුණුව තිබූ අත්ලන්තිසය නම් ප්‍රදේශයක් බවටත් ඒ දියුණුවේ ප්‍රතිඵලයක් වශයෙන් විනාශ වූවක් බවටත් ඇති මතය ද මෙහි දී සිහිපත් කර ගැනීම මැනැවි. මේ සැබැවින් ම දියුණුවක් ද නැත්නම් පිරිහීමක් පමණක් නොව දුක නිර්මාණය කරගැනීමක් ද වන බව ලෝකයා නො දකිති. මේ වැඩෙන්නේ අකුශලය බව නො දකිති.

# 03

## සදාචාරයේ අවශ්‍යතාව

නවීනවිද්‍යාව ලෝකයට කවර සමෘද්ධියක් ගෙන දුන්නත් එය හසුරුවා ගන්නට නම් ප්‍රඥාවත් සදාචාරයත් අවශ්‍ය ය. බුදුදහම අනුව නම් මේ සකසන්නේ බලවත් අකුශල කර්මයන් ය. දහම නොදත් අයකුට වුවත් තමාගේ ම යුක්තිසහගත චින්තනයෙන් මෙය වටහා ගතහැකි ය. දශඅකුශලය නව යුගයේ විසිතුරු වී ඇති ආකාරය මදකට සළකා බලමු. **පළමුවැන්න ප්‍රාණඝාතයයි.** ඉහළ යුදඅවි තාක්ෂණයේ අරමුණ මනුෂ්‍ය ඝාතනයයි. මිනිසාගේ රසතෘෂ්ණා සංතෘප්ත කරනු පිණිස දිනකට දිවිපුදන සත්වයින් කොතරම් දැයි සිතා බලන්න. **දෙවැන්න හොරකමයි.** ධනය පිණිස යුද්ධමය වශයෙන් හෝ ආර්ථිකමය වශයෙන් හෝ අන් රාජ්‍යයන් ආක්‍රමණය කිරීම, බලවතුන්ගේ අවශ්‍යතාව පරිදි අනෙකුත් රටවල ආර්ථික ක්‍රියා දාමය හැසිරවීම ආදිය තුළින් පෙනෙන්නේ එයයි. **තෙවැන්න කාමමිථ්‍යාචාරයයි.** මෛථුන රාගයෙහි සංයමය ගිලිහී යමින් පවතියි. එය සංචාරක ව්‍යාපාරය සමග වාණිජ්‍ය කරණය වී තිබේ.

**සිව්වැන්න මුසාවාදයයි.** කියන දෙය, සිතන දේ ම නො වන්නේ නම් බොරුව යනු එයයි. දියුණුව යයි පෙන්වමින් දරිද්‍රතාවට කරුණු කළමනාකරණය කිරීම, පෝෂණය පෙන්වමින් පාරිභෝගිකයාට පිළිකාකරක විෂ කැවීම වැනි මුසාවන් රැසක් අද ලෝකයේ පවතියි. **පස්වැන්න කේලමයි.** අනුන් බිඳුවීමට පාවිච්චි කරන වචනය කේලමයි. ජාතීන් අතර අසමගිය ඇති කිරීමට විවිධ ක්‍රමෝපාය භාවිතා කෙරේ. **සයවැන්න ඵරුෂ වචනයයි.** ප්‍රතිවාදීයා මැඩලන්නට තෙපළන්නේ කර්කශ වහසි බස් වලිනි. **සත්වැන්න හිස් වචනයයි.** වැඩකට නැති, මතක තබාගන්නට තරම් නො වටින වචන භාවිතයයි. තොරතුරු තාක්ෂණය ඔස්සේ මේ වචී දුසිරිත් සතර ම ක්‍රියාත්මක වේ. මේවාට මිනිස් සිත පහසුවෙන් ආකර්ශනය වී ඇති තරම කාටත් පැහැදිලි ය.

**අටවැන්න අභිජ්ඣාවයි.** පරසන්තකය මා සතු වේවා යන කල්පනාවයි. ජාත්‍යන්තර වශයෙන් අද එය ක්‍රියාත්මක

වන්නේ ආර්ථික ආක්‍රමණයක් හැටියටයි. තරගකාරී පරිභෝජනයක් හැටියටයි. **නව වැන්න ව්‍යාපාදයයි.** ඒ අනෙකා කෙරෙහි ද්‍රෝහී වීමයි. ආරක්‍ෂ, ප්‍රහාරක අවිතරගයෙන් ම මිනිසා අනෙකාට ද්‍රෝහී වන ප්‍රමාණය වටහා ගතහැකි ය. **දසවැන්න මිථ්‍යා දෘෂ්ටියයි.** ගෝලීයකරණය වූ තණ්හා මූලික උපාදානය දුකෙහි සමුදය බව නො දනියි. හොඳ නරක මෙලොව පරලොව සලකා කටයුතු කිරීමට තිබියයුතු නුවණැස වැසී ඇත.

මේ තත්ත්වය සැබැවින් ම දියුණුව දැයි කවුරුත් නුවණින් සිතා බැලියයුතුව තිබේ. බුදුදහම මෙය හඳුන්වන්නේ අධම්මචරියා විසමචරියා යනුවෙනි. මේ දසඅකුසලය බලගතු වීම යනු ආයුෂයෙන් හා වර්ණයෙන් මිනිසා පිරිහීමයි. එවන් පිරිහීම් සමයෙහි අධම්මරාගයත්, විසමලෝභයත්, මිථ්‍යාධර්මයත් විපුලත්‍වයට යන බව බුදුවදනයි.[1] මෙවා මොනවාද කියා හොඳින් තේරුම් ගතයුතුයි. **අධම්මරාගය** කියන්නේ මව, මවගේ සොයුරිය, පියා, පියාගේ සොයුරා වැනි නො සුදුසු තැනට රාගය උපදවීමයි. **(අධම්මරාගොති මාතා, මාතුච්ඡා, පිතා, පිතුච්ඡා, මාතුලානීති ආදිකෙ අයුත්තට්ඨානෙ රාගො)** **විසමලෝභය** කියන්නේ පරිභෝගයට සුදුසු තැනෙහි ද ඉතා බලවත් ලෝභයට, රාගයට වැටීමයි. **(විසමලොභොති පරිභොගයුත්තෙසුපි ඨානෙසු අතිබලව ලොභො)** **මිථ්‍යාධර්මය** කියන්නේ පුරුෂයන් කෙරෙහි පුරුෂයන්ගේ ද, ස්ත්‍රීන් කෙරෙහි ස්ත්‍රීන්ගේ ද ඡන්‍දරාගයයි. **(මිච්ඡාධම්මොති පුරිසානං පුරිසෙසු, ඉත්ථීනං ඉත්ථීසු ඡන්දරාගො.)**[2] ලෝක ශිෂටාචාරය දැන් මේ කියූ තත්ත්‍වයන් කරා ඇදී යමින් පවතින බව පෙනෙන්නට තිබේ. කුශලය අකුශලය නො සලකා භෞතික සමෘද්ධිය හඹා යන මිනිසා කරා ස්වභාවික විපත් හා මිනිසා විසින් ම සැලසුම් කර ඇති කර ගන්නා විපත් බහුල වේ. 2020 දී කඩා වැදුන මේ කොවිඩ් 19 විපත ස්වභාවික වූවක් වියහැකි ය. කාගේ හෝ සැලසුමක් ද විය හැකි ය. එහෙත් එහි ගැඹුරින් කියැවෙන්නේ "නවතින්න. මදක් සිහි එළවා බලන්න" යනුවෙන් මිනිසාට කරන අණ කිරීමක් යන්න ය.

---

1 දී: නි: 3, චක්කවත්තිසීහනාද සූත්‍රය, 116 පිට, බු: ජ: මු:

2 සුමඞ්ගලවිලාසිනී 2, 618 පිට, හේ: මු:

අන්තිමේ දී ආර්ථික ශක්තියත්, යුද ශක්තියත් අතේ දරා සිටින ලෝකයේ ධනවත් හා බලවත් යයි කියා ගන්නා රටවලට කරකියා ගතහැකි දෙයක් නැතිව ගියේ ය. සියලු මිනිස් ක්‍රියාදාම ඇණ හිටියේ ය. රටවල් වසා දමුනේ ය. මෙවන් මොහොතක බුදුදහමෙන් පැවසෙන පිළිවෙත කුමක් දැයි හඳුනා ගනිමු. දිනක් දහවල් කාලයේ කොසොල් රජතුමා බුදුරජාණන් වහන්සේ දකින්නට පැමිණි අවස්ථාවේ "මේ දවාලෙන් ම කොහේ සිට එන්නේ දැ"යි උන් වහන්සේ ප්‍රශ්න කළහ.

**"ස්වාමීනි, ඉසුරු මදයෙන් මත් වූ, කාමයෙහි ගිජුබවින් මැඬුණු, ජනපදයෙහි ස්ථිර බවට පත්, මුදුනින් අභිෂේක කරන ලද, මහපොළොව දිනා අධිපතිව වාසය කරන ක්ෂත්‍රීය රජවරුන්ට යම් රාජකාරියක් ඇත් ද එහි නියුක්තව සිට ආවෙමි"**යි රජතුමා පැවසී ය.

රජතුමාගේ මේ සාඩම්බර පිළිතුර අනුව මතු කළයුතු විශේෂ කරුණක් බුදුරජාණන් වහන්සේට පෙනුණි. ඒ නිසා උන් වහන්සේ මෙසේ නැවත ප්‍රශ්න කළහ.

"හොඳයි රජතුමනි, ඔබේ විශ්වාස කටයුතු වචන ඇති පුරුෂයන් හතර දෙනෙක් සිව් දිශාවෙන් පැමිණ 'අහස උසට මහා පර්වතයක් සියලු සතුන් සුණු විසුණු කරමින් එයි. රජතුමනි, මේ ව්‍යසනයට කළයුතු යමක් ඇත්නම් කරන්නැ'යි දැනුම් දෙති. මෙහි දී කළයුත්තේ කුමක් ද යන්න ගැන ඔබ කල්පනා කරන්නේ කෙසේ ද?"

"ස්වාමීනි මිනිසුන් නසන එතරම් නපුරු බියක් ඇති වුවහොත් දුර්ලභ වූ මේ මිනිස් බැව්හි ධම්මචරියාවත් සමචරියාවත් කුශල ක්‍රියාවත් පුණ්‍ය ක්‍රියාවත් හැරෙන්නට වෙන කුමක් කරන්නදැ" රජතුමා පැවසී ය.

බුදුරජාණන් වහන්සේ රජතුමාගෙන් නැවත මෙසේ ද විමසති. "ජරාවටත් මරණයටත් ඔබ යටත් ය. එහි දී මොකක් ද ඔබ කරන්නේ?"

"ජරාමරණ දෙකින් යටත් කරනු ලැබ ඇති කල්හි ධම්මචරියාවත් සමචරියාවත් කුසලක්‍රියාවත් පුණ්‍යක්‍රියාවත් හැරෙන්නට වෙන කුමක් කරන්න ද? ඇත්, අස්, රිය, පාබල යුද්ධ ශක්තියෙන් ද වැඩක් නැත. ධනයෙන් ද වැඩක් නැත.

ධම්මචරියාව සමචරියාව කුශල ක්‍රියාව පුණ්‍ය ක්‍රියාව හැර අන් කිසිවකින් වැඩක් නැත.."[1]

මෙහි දී අපි තවත් බුදු වදනක් හඳුනා ගනිමු. මවට දරුවාත් දරුවාට මවත් නැති වන මහා විපත් හැටියට සළකන භය තුනක් අමාතාපුත්තිකභය සූත්‍රයෙහි දක්වේ. නගර ගම් දනවු දවනු ලබන ගිනි භය, නගර ගම් දනවු යටකරනු ලබන ජලභය හා ආරක්‍ෂක ස්ථාන සොයා යෑමට තරම් වූ ජනපදවාසීන් කැළඹීමට පත් කරන සතුරු භය යනුයි. පුහුදුන් ලෝකයා මේ විපත් අමාතාපුත්තිකභය හැටියට සැලකුවත්, අහම්බෙන් හෝ මවට දරුවාත් දරුවාට මවත් මුණගැසෙන්නට ඉඩ තිබේ. එහෙයින් බුදුරජාණන් වහන්සේ මෙය හඳුන්වන්නේ සමාතාපුත්තිකභය හැටියට ය. නියම අමාතාපුත්තිකභය නම් ජරා, ව්‍යාධි, මරණ යන භය තුන බව ද දක්වති. මවට දරුවාත් දරුවාට මවත් අහිමි කරන භය තුන එයයි. සසර සැකැස්ම යනු මේ භය තුන දිගින් දිගට සකස් වීමයි. මේ සමාතාපුත්තිකභය තුනත්, අමාතාපුත්තිකභය තුනත් ප්‍රහාණය කිරීමට අවශ්‍ය ප්‍රතිපදාව නම් ආර්ය අෂ්ටාංගික මාර්ගයයි.[2] **මහත් වූ විපත් කෙළවර ඉතිරි පුද්ගලයෝ ඥාතිව්‍යසනය ගැන දුක් වෙමින් මේ විපත් ඇති වූයේ අකුසලධම්ම සමාදානය හේතුවෙන් බව සළකා කුසලය වඩන්නේ නම් හොඳ යැයි කල්පනා කරති.**[3] කුසලය යනුවෙන් කුමක් කළයුතුදැයි සිතන ඔවුහු ප්‍රාණඝාතයෙන් වළකිති. මේ ආකාරයෙන් දසඅකුසලයෙන් ම වළකිති. අධම්මරාගය, විසමලෝභය, මිථ්‍යාධර්මය අත්හරිත්. එපමණට ආයුෂයෙන් ද වර්ණයෙන් ද වැඩෙත්. ඒ නිසා රෝග ව්‍යසන ද අඩු වී යයි. විපතින් මිදීමට කුශලයෙහි ඇති ශක්තිය බුදුසමය අවධාරණය කරන්නේ ඒ ආකාරයෙනි. සරළව කිවහොත් මේ අවධාරණය කරන්නේ සදාචාරයේ අවශ්‍යතාවයි.

---

1 සංඃ නිඃ 1, පබ්බතූපම සූත්‍රය, 184 - 188 පිටු, බුඃ ජඃ මුඃ

2 "අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො සෙය්‍යථීදං සම්මාදිට්ඨි ..... සම්මාසමාධි,අයං ඛො භික්ඛවෙ, මග්ගො අයං පටිපදා ඉමෙසඤ්ච තිණ්ණං සමාතාපුත්තිකභයානං ඉමෙසඤ්ච තිණ්ණං අමාතාපුත්තිකභයානං පහානාය සමතික්කමාය සංවත්තතීති."
අංඃ නිඃ 1, අමාතාපුත්තික භය සූත්‍රය, 320 පිට, බුඃ ජඃ මුඃ

3 "මයං ඛො අකුසලානං ධම්මානං සමාදාන හෙතු එවරූපං ආයතං ඤාතික්ඛයං පත්තා, යන්නූන මයං කුසලං කරෙය්‍යාම."
දීඃ නිඃ 3, චක්කවත්ති සූත්‍රය, 120 පිට, බුඃ ජඃ මුඃ

මෙයින් අපට පැහැදිලි වන්නේ මහාපරිමාණ ගෝලීය ව්‍යසනයන් ඉදිරියේ මිනිසාගේ විශේෂඥ දැනුම් ප්‍රමාණවත් නො වන බවයි. කොවිඩ් 19 වසංගතය ඉදිරියේ දියුණු යයි කියන රටවල ඇති ඉහළ මට්ටමේ සෞඛ්‍ය පහසුකම් ප්‍රමාණවත් වී නැත. 2020 දී මිහිබට කොවිඩ් 19 යනු අමාතාපුත්තික භයට ඇතුළත් ව්‍යාධියකි. මරණයකි. මිනිසාට මුහුණදෙන ස්වභාවික විපත් හා වැළඳෙන ව්‍යාධි වලට මිනිසාගේ ම සදාචාර පරිහානිය හේතු වන බව බොහෝ දෙනා කල්පනා නො කරති. මේ පිළිබඳව අප සඳහන් කරන විට මෙය මොන පිස්සු කථාවක් දැයි කෙනෙකුට සිතෙන්නට පිළිවන. දිනක් බුදුරජාණන් වහන්සේ දැක්මට පැමිණි කෝසලක බ්‍රාහ්මණ පිරිස, බුදුරජාණන් වහන්සේගෙන් දැන් බමුණන් හා පෙර බමුණන් පිළිවෙතින් සමාන දැයි විමසී ය. 'නැත' යයි උන්වහන්සේ පිළිතුරු දුන් කල්හි වෙහෙසක් නැත්නම් පැරණි බමුණන්ගේ බමුණු දහම කියන්නැයි අයැදී ය. පැරණි බමුණෝ ලාභයට ගිජු වී මන්ත්‍රගොතා රජුන් ලවා ගවයන් ඇතුළු සතුන් සියදහස් ගණනින් මරවමින් යාගහෝම නො කළ ආකාරය පැහැදිලි කළහ. එහෙත් දැන් බමුණන්ගේ අනුශාසනා අනුව යාගයේ දී රජතුමා කළ පුරා කිරි දොවින අඟින් පයින් කිසිවකු නො පෙළන හීලෑ ගවදෙනුන් අඟින් ඇද සැතින් පහර දී මැරුවේ ය. එකල්හි දිව්‍ය බ්‍රහ්ම ඉන්ද්‍රාදීහු **'අධර්මය උපනැ'**යි හැඬූ බව ද වදාළහ. **"ඉස්සර ආශාව, කුසගින්න, ජරා යන රෝග තුනක් විය. සත්වඝාතනය හේතු කොට ගෙන රෝග අනූඅටට පැමිණියේ ය."**[1] යනුවෙන් සත්වඝාතනය රෝග සංඛ්‍යාව අටඅනූවක් වීමට හේතු වූ බව වදාළහ.

රාජ්‍යතාන්ත්‍රිකයින්ගේ අධාර්මිකත්වය කවර ප්‍රතිවිපාක ගෙන දෙන්නේ ද යන්න බුදුරජාණන් වහන්සේ අධම්මික සූත්‍රයෙහි දේශනා කර ඇත්තේ මෙසේ ය. "රජදරුවන් අධාර්මික නම් රාජපුරුෂයෝ අධාර්මික වෙති. රාජපුරුෂයන් අධාර්මික නම් බ්‍රාහ්මණ ගෘහපතීහු අධාර්මික වෙති. බ්‍රාහ්මණ ගෘහපතියන් අධාර්මික නම් ජනපද වාසීහු අධාර්මික වෙති. ජනපද වාසීන් අධාර්මික නම් සඳ හිරු බල පෑම විෂම වෙත්. සඳ හිරු බලපෑම

---

1 "තයො රොගා පුරෙ ආසුං ඉච්ඡා අනසනං ජරා,
පසූනඤ්ච සමාරමභා අට්ඨානවුතිමාගමුං."
සූ: නි:, බ්‍රාහ්මණධම්මික සූත්‍රය, 92 පිට, බු: ජ: මු:

විෂම වන විට නැකත්තරු විෂම වෙත්. නැකත්තරු විෂම වන විට දිවාරාත්‍රී විෂම වෙත්. දිවාරාත්‍රී විෂම වන කල්හි මාස අඩ්ඪමාස විෂම වෙයි. මාස අඩ්ඪමාස විෂම වන කල්හි ඍතු සංවත්සර විෂම වෙයි. ඍතු සංවත්සර විෂම කල්හි දැඩි හෝ මද වූ හෝ නො මග ගත් වාතය විෂම වෙයි. නොමග ගත් විෂම වාතය ඇති කල්හි දේවතාවෝ කුපිත වෙත්. දේවතාවන් කුපිත වූ කල්හි මනා දහරින් වැසි නො වසියි. මනා දහරින් වැසි නො වසින කල්හි ශස්‍ය විෂමව පැසෙයි. විෂමව පැසෙන ශස්‍ය අනුභව කරන මිනිස්සු අල්පායුෂ්ක වෙත්. දුර්වර්ණ ද වෙත්. දුර්වල ද වෙත්. බොහෝ ආබාධ ඇත්තෝ වෙත්."[1] යනුවෙනි.

අද ක්‍රියාත්මක වන අකුසල වල විචිත්‍රත්වය අනුව ලෙඩ රෝග ද අට අනුව ඉක්මවා විචිත්‍ර වී ඇත. ඒ අතර අළුත් ම රෝගය 'නව කොරෝනා හෙවත් කොවිඩ් 19 වයිරස්' රෝගයයි. සියලු වැඩ අත්හිටුවා මරණ සංඛ්‍යාව ගණන් කරමින් සිටින්නට සිදු වූ රෝගය මෙයයි. දිනපතා ලෝකයේ ඒ ඒ රටවල මරණ සංඛ්‍යාව සැණෙකින් දැනගැනීමට අවශ්‍ය විද්‍යුත් තාක්‍ෂණය මිනිසාට ඇත. ඒත් ලෙඩේට තාම බේතක් නැත. බේතක් හදන තෙක් කොරෝනාවත් සමග විසීමට සියලු දෙනා දැන් එකඟ වී සිටිති. මෙහෙම රෝගයක් පැතිරෙන්න කොහොමට නම් අකුසල් වැඩෙන්න ඕන ද? මේ උදා වී ඇත්තේ හැමෝ ම තම තමා පිළිබඳව ආත්මප්‍රත්‍යවේක්‍ෂණයෙහි නියැලීමට කාලයයි.

---

[1] අං: නි: 2, අධම්මික සූත්‍රය, 140 පිට, බු: ජ: මු:

# 04

## මේ මහා විපතින් මිදී අපි අපි ම නැඟිටිමු

කොවිඩ් 19 ගෝලීය වසංගතය මිනිසා මත පතිත වීමත් සමග නිම් වළලු නො දකින සංවර්ධන ක්‍රියාදාමය ඇණහිටියේ ය. හෙවත් ඇණි නතර විය. ආහාර අර්බුදයකට මුහුණ දීමේ බිය මිනිසුන් කා තුළත් ඇති විය. ඒ අතර වායුදූෂණය, ජලදූෂණය, ශබ්දදූෂණය මදකට සති කීපයකට නැවතුනේ ය. කලකට පසු මහත් වූ හිතුවක්කාර මිනිස් දරු බරක් දරා සිටි මිහිමවට පුංචි පහේ සහනයක් දැනෙන්නට විය. වායුගෝලයේ ගුණාත්මක බව ඉහළ ගියේ ය. ගඟදිය පැහැදිලි විය. ඕසෝන් ස්තරය ද ප්‍රකෘතිමත් වන්නට ඇරඹුණි.. මිනිස් ක්‍රියාකාරකම් නිසා අදෘෂ්‍යමාන වී තිබූ හිමගිර මිනිස් ඇසට දිස් වන්නට වූ බව වාර්තා විය. සතා සිව්පාවාටත් පක්ෂීන්ටත්, ගහකොළටත් මේ වෙනස හොඳින් දැනෙන්ට ඇත. ඒත් ඉතින් ඔය ගුණාත්මක වෙනස කී දවසකටදැයි දන්නේ කවු ද? මෙතෙක් මිනිසා ආ ගමන පිළිබඳව අනතුරු ඇඟවීමක් වූ කොවිඩ් 19 වෛරසය මිනිසාට නුවණැස දෙන්නට ආ දූතයකු බවට පත්කර ගැනීම නුවණැති මනුෂ්‍යයින්ගේ කාර්යයයි.

මිනිසා ද ස්වභාවධර්මයේ ක්‍රියාකරිත්වයකි. මිනිස් මනස ද ස්වභාවධර්මයේ නියාමයකි. මිනිසාට ඒ බව සිහිවන්නේ නැත. ඒ ආගන්තුක වශයෙන් සකස් වන අස්මිමානයේ බලගතු බව නිසා ය. සොබාදහමේ සමතුළනය බිඳින්නේ තෘෂ්ණාධික මිනිසාගේ අස්මිමානයයි. අස්මිමානය යනු හුදෙක් හිතාගත් තත්ත්වයක් පමණි. **(අස්මීති භික්ඛවෙ, මඤ්ඤිතමෙතං)**[1] මිනිසාගේ කයත් සිතත් සොබාදහමට ම අයත් ධර්මතාවන් ය. ඔහුට ද දිවිපැවැත්ම සකසා ගැනීමේ දී සොබාදහම පරිහරණය කරන්නට සිදුවෙනවා ඇත. අවශ්‍ය පරිදි සකසා ගන්නට සිදු වෙනවා ඇත. එහෙත් එය විනාශකාරී නො වන ආකාරයට වියයුතු ය, යන්න අවශ්‍යයෙන් ම සැලකිල්ලට ගතයුතුව ඇත.

---

[1] සං: නි: 4, යවකලාපී සූත්‍රය, 386 පිට, බු: ජ: මු:

පරිහරණය සිදුවිය යුත්තේ ගිජුකම සපුරාලන ආකාරයට නොව සමතුළනය කරගන්නට ස්වභාව නියාමයට ඉඩ අවකාශ ඉතුරු වන ප්‍රමාණයට ය. මිනිසා තම අවශ්‍යතා සම්පූර්ණ කරගන්නේ සොබාදහමට අයත් දෙයින් නම් ඔහු විසින් උගතයුත්තේ අස්මිමානය නිසා බලගතු වන ගිජුකම සපුරාලීම ගැන නොව අවශ්‍යතා සංතෘප්තිය පිළිබඳව ය. ලෝකයේ සම්පත් අසීමිත නො වන නමුත් මිනිසාගේ ගිජුකම සම්පත් වල සීමාව ද, මෙපමණකින් සෑහේ යන්න ද නො දනියි.[1]

මිහිමවට උහුලා ගත නො හැකි ගෝලීය වාණිජ අර්ථක්‍රමය ගැන පූර්ණ විශ්වාසය තබා සිටි මිනිසාට දැන් ඉතින් කුමක් කරමුදැයි සිතන්නට අවස්ථාවක් කොවිඩ් 19 විසින් උදා කර දී තිබේ. මේ බව බොහෝ දෙනාට වැටහෙමින් තිබෙණ බව පෙනෙන්නට තිබේ.

**"මේ මහා විපතින් මිදී අපි අපි ම නැගිටිමු.**
**උරුමයේ ලද ශක්තියෙන් අපි අපි ම නැගිටිමු**
**අලුත් යුගයක දැක්මකින් අපි අපි ම නැගිටිමු**
**එක ම දැයකට හිස නමා අපි අපි ම නැගිටිමු."** යන උද්යෝග පාඨය ජාතික ගුවන් විදුලියෙන් නිතර නිතර ඇසෙන්නට ගත්තේ ඒ නිසා වියයුතු ය. බොහෝ කලෙකින් නො ඇසුණ ස්වයම්පෝෂිත ආර්ථිකයක් ගැන බොහෝ දෙනා කථා කරනු විද්‍යුත් මාධ්‍යයන් තුළින් ද අසන්නට ලැබුණි.. කොවිඩ් 19 විපත ආශීර්වාදයක් වන්නේ එය නව මාවතකට හැරවුම් ලක්ෂ්‍යයක් කරගත්තොත් පමණි.

එහෙත් අපි හැරෙන්නේ කෙබඳු මාවතකට ද? හැරෙන්නේ කෙසේ ද? පවත්නා දුර්වලතා කවරේ ද? කවරක් අප වෙනස් කරගතයුතු ද? ඒ කොපමණකින් ද? එමගින් අපේක්ෂා කරන ප්‍රතිඵලය කෙබඳු වියයුතු ද? මේ ආදී ප්‍රශ්න රැසක් මෙහි දී ඉදිරිපත් වේ. මෙතෙක් සඳහන් කර ඇති කරුණු වලින් උද්ගතව ඇති ප්‍රශ්නයේ ස්වභාවය යම් තරමකට පැහැදිලි ය. අප බලාපොරොත්තු වියයුතු විසඳුම **"ගෝලීය මට්ටමේ**

---

[1] "Man must learn to satisfy his needs and not feed his greeds. The resources of the world are not unlimited whereas man's greed knows neither limit nor satiation."
Lily de Silva, "The Buddhist Attitude towards Nature" Weel. No. 346/348 P. 15. B. P. S.

**<u>විසඳුමක් මිස ප්‍රාදේශීය මට්ටමේ විඳුමක් නො වියයුතු ය</u>**"යි සිතුවොත් එය අන්තයකි. **<u>"ප්‍රාදේශීය මට්ටමේ විඳුමක් මිස ගෝලීය මට්ටමේ විසඳුමක් නො වියයුතුය"</u>** යි සිතුවොත් එය ද අන්තයකි. බුදුරජාණන් වහන්සේ ලෝකයාට ඉගැන්වූයේ අන්තයන් භජනය කිරීම වෙනුවට අන්තයන්ට නො පැමිණ මැද පිළිවෙතක් ඇසුරු කරන්නට ය. එසේ නම් අප තෝරා ගතයුතුව ඇත්තේ ගෝලීය වශයෙන් ද විපත් නො සලසන, ප්‍රාදේශීය වශයෙන් ද විපත් නො සලසන මැදුම් පිළිවෙතක් වියයුතු ය.

ලෝකයේ සැම භූමි ප්‍රදේශයක් ම එනම් සැම රටක් ම ඒ ඒ ප්‍රදේශ වලට ආවේණික ස්වභාවික සම්පත් හා පරිසරසාධක වලින් යුක්තය. යම් පෙදෙසක වෙසෙන මනුෂ්‍යයා ඒ ප්‍රදේශයේ සම්පත් හා පරිසර සාධක උචිත පරිදි කළමනා කර ගනිමින් සිය ජීවන රටාව සකසා ගතයුතු වේ. භූමිය හා ඊට ආවේණික වෘක්ෂලතාදිය සංරක්ෂණශීලීව පරිහරණය කළයුතු ය. නිදසුනක් වශයෙන් කියනවා නම් මෑතක් වන තුරු ම ලංකාවේ කුඹුරු ආශ්‍රිතව මී ගස් වවා තිබුණේ එහි ගෙඩි කන්නට එන වවුලන් හෙළන වසුරු කුඹුරට සාරවත් පොහොරක් වන නිසා බව දැක්විය හැකි ය. එහෙත් අද වන විට ඒ මීගස් වැඩිවශයෙන් ඉවත් කර ඇත. රසායණික පොහොර භාවිතයට වඩා එය කොතරම් වටින්නේ ද. ස්වයම්පෝෂිත කෘෂි ආර්ථිකයක් අපේක්ෂා කරන්නේ නම් මෙබඳු තවත් බොහෝ දේ සැලකිල්ලට ගතයුතු වේ. මේ පිළිබඳ දැනුමැත්තෝ අපේ ගම්දනව් වල තවමත් වෙසෙති. භූමිය මිනිසාට නිපදවිය හැකි එකක් නො වේ. මිනිසාට කළ හැක්කේ එහි සාරවත් බව ආරක්ෂා කර ගනිමින් පරිහරණය කිරීම පිළිබඳව රාජ්‍ය තන්ත්‍රයත් මහජනතාවත් ප්‍රතිපත්තිමය වශයෙන් එකඟතාවකට පැමිණීමයි. බලයට පත්වන සැම රජයක ම වගකීම වියයුත්තේ ඒ ප්‍රතිපත්තිමය එකඟතාව ආරක්ෂා කිරීමයි. මේ ආකාරයෙන් රට හා ජනතාව පිළිබඳව වැදගත් වන හැම අංශයකට ම අවශ්‍ය ජාතික ප්‍රතිපත්තියක් ප්‍රායෝගික අවශ්‍යතා අධ්‍යයනය කරමින් සකසා ගැනීම අවශ්‍ය ය. ලෝක ආර්ථික, දේශපාලන, අර්බුද ඉදිරියේ චංචල නො වන ප්‍රතිපත්තියක් වන්නේ එවැන්නකි. කවර රජයක් බලයට පත් වුවත් ආරක්ෂා කළයුත්තේ ඒ ප්‍රතිපත්තියයි. ප්‍රතිපත්ති වෙනසක් වන්නේ නම් ප්‍රායෝගික අවශ්‍යතා අධ්‍යයනයකින් අනතුරුව වියයුතු ය. එහි අර්ථය

කාගේවත් පෞද්ගලික දේශපාලන න්‍යායපත්‍රයක් නො වියයුතු ය, යන්නයි. ජනතා ප්‍රසාදය රැකෙන්නේ ඒ අනුව ය.

ඒ ඒ රටට අදාළ පරිදි ඒ ඒ අයුරින් කටයුතු කරමින් ස්වයම්පෝෂණයට අවකාශ සැලසෙන්නේ නම් මූලික ජීවන අවශ්‍යතා ආනයනය කරන තුරු බලා සිටීමක් නැත. එක් රටක ජනතාව ඒ රටේ සම්පත් හා පරිසරසාධක වලට එරෙහි නො වෙමින් සකසා ගන්නා පිළිවෙත ජාත්‍යන්තරයේ අභිමතයන්ට, බලකිරීම් වලට අනුව හැසිරවියයුතු නො වේ.

මේ ආකාරයෙන් ප්‍රාදේශීයව රජයක් හා එහි ජනතාව විසින් සකසා ගන්නා ස්වයම්පෝෂිත ආර්ථික පිළිවෙත ඒ රටේ පොළවටත්, වාතයටත්, ජලසම්පතටත්, ශාකපද්ධතියටත්, මිනිසා ඇතුළු සත්ව ප්‍රජාවටත් ආශිර්වාදයක් වෙනවා නො අනුමාන ය. හැම රටක් ම මේ පිළිවෙත අනුගමනය කරන්නේ නම් එය ගෝලීය වශයෙන් ද වැදගත් වන විසඳුමක් වෙනවා පමණක් නොව ගෝලීය හා ප්‍රාදේශීය දෙපාර්ශවයට ම ආශීර්වාදයක් වෙනවා නො අනුමාන ය. ප්‍රාදේශීය මට්ටමත් සලකා ගෝලීය මට්ටමත් සලකා ඒකාංශික නො වන විසඳුමක් කරා යා හැකි වන්නේ ඒ ආකාරයෙනි.

පරිසරය පිළිබඳ උද්ගතව ඇති අර්බුදකාරී තත්ත්වය ලක්වැසියන් හැටියට සිටින අපට පමණක් සීමා වූ තත්ත්වයක් නො වේ. ලෝකයට ම මේ තත්ත්වය බල පා තිබේ. මේ පිළිබඳව කථා කරන බටහිර ලෝකයේ වියතකුගේ විමැසුම් සලකා බැලීම ද අපට ප්‍රයෝජනවත් ය. ආචාර්ය, ඊ. එෆ්. ෂූමාකර් මහතා බෞද්ධ සම්මාආජීවයේ වැදගත් කම ද දකිමින් 1973 දී සම්පාදිත සිය Small is Beautiful නම් මාහැඟි කෘතියේ දී දක්වා ඇති බොහෝ විමසුම් අපගේ සැලකිල්ලට ලක් වියයුතු ය. ඔහු මෙසේ සඳහන් කරයි. **"පරිසරය දැනටමත් එක්තරා ආයාසකර බවක් අධික වෙමින් පවතින බව අපට කියාපාන්නට වෑයම් කරයි. එක් ප්‍රශ්නයක් විසඳනු ලබන විට පළමු විසඳුමේ ප්‍රතිඵල වශයෙන් අලුත් ගැටළු දහයක් පැනනගියි."**[1] මේ ගැටලු

---

[1] “Already, the environment is trying to tell that certain stresses are becoming excessive. As one problem is being ‘solved’, ten new problems arise as a result of the first ‘solution.”
Schumacher. E. F., Small is Beautiful, P. 23.

සැබැවින් ම අහඹු අසාර්ථක වීම් නොව තාක්ෂණික සාර්ථකත්වයෙහි ප්‍රතිවිපාක වශයෙන් උදාවන ගැටලු බව ද ඔහු අවධාරණය කරයි. මේ කරුණ තර්ක විතර්ක කරමින් ඔප්පු කරන්නට අවශ්‍ය නො වන කාටත් පැහැදිලිව පෙනෙන කරුණකි.

මෙහි දී මා සූදානම් වන්නේ විද්‍යාඥානය ප්‍රතික්ෂේප කිරීමට නො වේ. නවීන විද්‍යාවෙන් පිළිබිඹු වන්නේ භෞතික නියාමයන් පිළිබඳ මිනිසාගේ බුද්ධිමය සාඵල්‍යයකි. එහෙත් මෙහි දී ප්‍රකටව පෙනෙන්නේ විද්‍යාඥානය වැනි දෙපැත්ත කැපෙන අවියක් භාවිතා කරන්නට තරම් නූතන මිනිසා ආධ්‍යාත්මික වශයෙන් මුහුකුරා ගොස් නැති බවයි. අධිපරිභෝජනය වෙනුවට අල්පේච්ඡතාව අගය කරන්නට තරම් ආධ්‍යාත්මික මුහුකුරා ගිය බවක් මනුෂ්‍යයාට අවශ්‍ය ය. ඕසෝන් ස්තරය හානි වීම, ගෝලීය උෂ්ණත්වය අධික වීම, කාන්තාර පුළුල් වීම, වනගහණය අඩු වීම, ග්ලැසියර දියවීම, අම්ලවර්ෂා ඇති වීම, භූගත සම්පත් අධිපරිභෝජනයට ලක් වීම, න්‍යෂ්ටික විකිරණශීලීතාව වැඩිවීම, ජලදූෂණය ආදී විපත් ගෝලීය වශයෙන් උදා වී ඇති ගැටලු ය. ඒවා වැඩිවෙමින් තිබෙන්නේ මිනිසාගේ අවිචාරවත් බව හා ගිජුබව නිසා ය, යන්න ගැන විවාදයක් නැත. මෙහි දී ෂූමාකර් මෙසේ සඳහන් කරයි. **"සෑම විද්‍යාවක් ම එහි අදාළ සීමාවන් තුළ වැඩදායක වන නමුත් එහි සීමාවන් ඉක්මවූ වහාම නපුරු හා විනාශකාරී බවට පත් වෙයි."**[1] යනුවෙනි. උචිත තාක්ෂණ භාවිතය ගැනත්, ධරණීය සංවර්ධනය ගැනත් අද යුගයේ සාකච්ඡා කළ ද සැනසිලිදායක පිළිවෙතක් ක්‍රියාත්මක වනු නො පෙනෙන්නේ තෘෂ්ණාධික මිනිසාගේ ආධ්‍යාත්මික බෙලහීනත්වය නිසා ය.

කොවිඩ් 19 එනතුරු ම මිනිසා සිතා සිටියේ සෞභාග්‍යය සඳහා එක ම මග නවීන සංවර්ධනය කියා ය. ආධ්‍යාත්මික අගයන්ට වඩා වැදගත් කොට සැලකුවේ ආර්ථික සමෘද්ධියයි. නවීන සංවර්ධනයයි. එහෙත් මේ වසංගතය රෝගී තත්ත්වය නිසා කාර්මික සමාජය අස්ථායී බව පැහැදිලිව ම ඔප්පු

---

[1] "Every science is beneficial within its proper limits, but becomes evil and distructive as soon as it transgresses them." Ibid, P. 38.

විය. එහෙත් පෙරළා සාම්ප්‍රදායික ගැමි ආර්ථිකය කරා ආපසු යාමට නූතන මිනිසාගේ තෘෂ්ණාව ඉඩ සලසාවි ද යන්න ද සලකා බැලියයුතු වේ. නූතන සංවර්ධනය ඉදිරියේ ගැමි ආර්ථිකය බිඳවැටී ඇත. ගොවිතැනින් වැඩි ලාභ ගන්නේ ගොවියාට වඩා වෙළෙන්දා නම් ගොවියාගේ ජීවන තත්ත්වය සහනදායී වන්නේ නැත. ගොවියාගේ දරුවාට අභිමානවත් ගොවියකු වන්නට අවකාශයක් නැත. සිදු වන්නේ මොකක් හෝ රස්සාවක් හොයා ගන්නට නගර වලට සේන්දු වීමට ය. සමාජයට අහිතකර නොයෙක් ජාවාරම් වලට ඉඩ හසර විවෘත්ත වන්නේ ද මේ ස්වභාවය නිසා ය. ආර්ථික සමෘද්ධියේ දී ආධ්‍යාත්මික අගයයන් ද සැලකිල්ලට ගන්නේ නම් යෝග්‍ය සමබරතාව උදා තරගත හැකි ය.

මේ තත්ත්වය පිළිබඳව සාකච්ඡා කරන ෂූමාකර් මහතා සිය කෘතියේ බෞද්ධ ආර්ථිකය පිළිබඳ පරිච්ඡේදයේ දී පවසන්නේ **නවීන සංවර්ධනය** (modern growth) හා **පාරම්පරික නො දියුණුව** (traditional stagnation) යන දෙකින් කෝක තෝරාගතයුතු ද යන්න සොයා බැලීම වෙනුවට කළයුත්තේ නිවැරදි සංවර්ධන මාර්ගය සොයා ගැනීම බවයි. භෞතිකවාදී අපරීක්ෂාකාරී බව (materialist heedlessness) හා පාරම්පරික නිශ්චලත්වය (traditionalist immobility) අතර වූ මධ්‍යම මාර්ගය සොයා ගැනීම බවයි. කොටින් කිවහොත් **සම්මාආජීවය** සොයා ගැනීම බවයි.[1]

ගෝලීය වශයෙන් උදාවන ආපදා අවස්ථාවන්හි දී නො සැලෙන ආර්ථිකයක් පිණිස අප අවධානය යොමු කළයුත්තේ පුහුදුන් දැක්මේ අන්තගාමිත්වයෙන් මිදී ප්‍රඥාව හා සදාචාරය එක්තැන් කරන මධ්‍ය දර්ශනයක් සකසා ගැනීම පිළිබඳවයි. සම්පත් පරිහරණය පිළිබඳ දැක්ම යොමු වියයුත්තේ දිඹුල් කෑමක් මෙන් **(උදුම්බරඛාදිකංව)** සම්පත් පරිහරණය නො කිරීම පිණිසත් අනාථ මරණයෙන් මැරෙන්නකු මෙන් **(අජද්ධුමාරිකංව)** නො මැරෙනු පිණිසත් අවශ්‍ය **සමජීවිකතාව**[2] හඳුනා ගැනීම පිළිබඳවයි. කොවිඩ් 19 වසංගතය ආවේ මේ ගැන මිනිසාට සිතන්නට අවස්ථාවක් සලසා ලීම් වශයෙනි.

---

1 Sùchumacher E. F. , Small is Beautiful, P. 51

2 අං: නි: 5, ව්‍යග්ඝපජ්ජ සූත්‍රය, 238 පිට, බු: ජ: මු:

# 05

## වැව් බැඳි රාජ්‍යය

මෙහි දී රටක් හැටියට අප තේරුම් ගතයුත්තේ මේ රටේ ස්වභාවික පරිසර පද්ධතියත් රටවැසියාගේ මූලික අවශ්‍යතා සංතෘප්තියත් පිණිස ක්‍රියා කළයුත්තේ කෙසේ ද, යන්න පිළිබඳවයි. පැරණි යුගයක පටන් ක්‍රි: වः 1505 දක්වා සියවස් බොහෝ ගණනක් පරපුරෙන් පරපුරට දායාද කළ ජීවන රටාවක් ලක්වැසියාට තිබුණි. එසේ පරපුරෙන් පරපුරට දායාද කළහැකි වූයේ රටේ පරිසර පද්ධතියත් භූමි සම්පතත් මැනැවින් කළමණාකරණය කරගත් ජීවන රටාවක් නිසයි. පරසතුරු ආක්‍රමණ සිදු වුවත් ඇතැම් විට ඇති වන රාජ්‍යතාන්ත්‍රික දුර්වලතා ඉදිරියෙහි වුවත් රටවැසියාට ස්වයම්පෝෂිත කෘෂි ආර්ථිකය තුළ තම දිවි පැවැත්ම ගෙනයන්නට හැකි විය. ගෝලීය ආර්ථිකයට හුරු පුරුදු වූ අලුත් පරපුරේ බොහෝ දෙනකුට අතීතයේ සිට අද වන තෙක් ඓතිහාසිකව අප ආ ගමන් මග කෙසේ වී ද, කවර අභියෝගයන් එල්ල වී ද යන්න පොදුවේ පැහැදිලි කමක් නො තිබෙන්නට පිළිවන. අප ගතයුතු මග කෙසේ වියයුතු ද යන්න තේරුම් කරගැනීම සඳහා අප ආ ගමන්මග පිළිබඳ පැහැදිලි කමක් අවශ්‍ය ය.

**හෙළදිව්පුරාණයः**

පැරණි වෙළඳුන් අතර මහත් ප්‍රසිද්ධියක් ලැබ තිබුණ මේ දිවයින අරාබීන් විසින් හඳුන්වන ලද්දේ **'සෙරන්ඩිබ්'** යනුවෙනි. වෙළඳුන් මෙරටට පැමිණීමෙන් පෙනෙන්නේ මෙරට වාණිජ්‍ය කටයුතු සම්බන්ධයෙන් වැදගත් වූ බවයි. ග්‍රීකයින් මෙරට හැඳින්වූයේ **'තප්‍රොබේන්'** යනුවෙනි. **තප්‍රොබේන්** යන්නෙහි අර්ථය **'රාවනදීපය'** (දීප් + රාවන්) බව **අරිසෙන් අහුබුදු මහතා** පෙන්වා දෙයි.[1] රාවන රජු යුද්ධයෙහි දක්ෂයෙකි. දක්ෂ වෛද්‍යවරයෙකි. රාවන පිළිබඳව මහාවංසයෙහි කිසිවක් සඳහන් නො වෙතත් බුදුරජාණන් වහන්සේගේ ලංකාගමනය ගැන

---

1 අරිසෙන් අහුබුදු, පෙරවදන, හෙළඋරුමය, එම්. එච්. සිරිසෝම, මුල් පිටුව. 1986.

සඳහන් වී තිබේ. බුද්ධත්වයෙන් නවවැනි මස දුරුතු පෝදා ලක්දිවට වැඩම කර මහියංගන මහානාගවනයේ දී යක්ෂ ගෝත්‍රිකයනට දම් දෙසූහ. සමන්ගිරි වැසි සුමන දිව්‍යරාජයා සෝවන් වූයේ ඒ අවස්ථාවේ දී ය. දෙවන වර වැඩියේ බුද්ධත්වයෙන් පස්වෙනි වස බක්මස අමාවක් දා නාගදීපයයේ චූලෝදර, මහෝදර නාරජුන් සමගි කරවා දම්දෙසීම පිණිස ය. තෙවන වර වැඩියේ කැලණියේ මණිඅක්ඛික නාරජුගේ ඇරයුම පරිදි ය. මේ දිවයින විජයගේ ආගමනය සිදු වීමට පෙර සිට ම ජනාවාස වූවක් බවත් යක්, රක්, නා, දෙව් යන ගෝත්‍රික මනුෂ්‍යයින් විසූ බවත් එම සිවු හෙළයන් සීහළ යනුවෙන් ව්‍යවහාර වූ බවත් සැලකියයුතු ය. ලක්දිවට සංක්‍රමණය වූ ආර්යයන් හා මේ ස්වදේශිකයන් සම්මිශ්‍රණය වී තිබේ. ස්වදේශිකයන් ද නිෂ්පාදන පරිභෝජන රටාවක් දියුණු කරගෙන සිටි ජනකොටසකි. ක්‍රි: පූ: 543 ලක්දිවට ආ විජය කපුකටිමින් සිටි කුවේණි යක්ෂකුමරිය හා සම්බන්ධ වූ පුවත අපි දනිමු. දිනක් රාත්‍රී තූර්යනාදයක් ඇසී විජය කුමරු ඒ කුමක්දැයි ඇසීය. ලංකාපුර රජුගේ පුතකුගේ විවාහමංගල්‍ය උත්සවයෙන් එන තූර්නාදය බව පැවසුවා ය. අපට මෙහිදී වැදගත් වන්නේ සියලු ඓතිහාසික පුවත් සාකච්ඡා කිරීම නොව විජය පැමිණෙන්නට පෙර හෙළවැසියා ශිෂ්ටාචාරී ජනකොටසක් බවත් ලංකාපුර, සිරීසවත්‍ථුපුර වැනි නගර නිර්මාණය කරගෙන රාජ්‍යත්වයකින් යුතුව සිටි බවත් දැක්වීම ය. ගොවි කර්මාන්තය පෙර හෙළවැසියාගේ ජීවනෝපායය විය. ජලසම්පාදනය ගැන දැනුමක් ඇතිව සිටි ඔවුන් වැව් කර්මාන්තය ගැන දැනසිටියාට සැක නැත. ආර්යාගමනයෙන් පසු වැව් කර්මාන්තය වඩාත් දියුණු වූයේ අනාර්ය ස්වදේශකයන්ගේ ද සහායෙන් බව **බද්දේගම විමලවංස අනුනාහිමියෝ** සිය **"හෙළ හැදියාව"** කෘතියෙහි සාකච්ඡා කරති.[1]

ලක්දිව ආර්ය ජනාවාස ඇති වූයේ විජය කුමරුගේ පැමිණීමෙනි. වසර 38 ක් විජය රජු ලක්දිව පාලනය කළේ ය. ඔහුගේ මරණයෙන් පසු පඬුවස් දෙව් කුමාරයා එනතුරු පාලනය කළේ උපතිස්ස ඇමතියා ය. පඬුවස්දෙව් රජ වූයේ ක්‍රි: පූ: 504 දී ය. පඬුවස්නුවර නමින් ප්‍රකට උපතිස්සග්‍රාමය

---

1 වීමලවංස අනු නා හිමි,බද්දේගම, **හෙළහැදියාව**, 189, 190 පිටු, 1996.

**පඬුවස්දෙව් රජුගේ** රාජධානියයි. ඒ ක්‍රිඃ පූඃ 504 දී ය. **භද්දකච්චායනා ශාක්‍ය කුමරිය** රජුගේ බිසව වූවා ය. රටේ උතුරුදිග තැනිතලාවේ කෘෂිකර්මාන්තය නගා සිටුවා ලීමට පඬුවස්දෙව් රජු විසින් අනුරාධ ග්‍රාමයෙහි ඉදිකරන ලද වැව **අභයවැවයි.** අනුරාධපුරය රාජධානිය කරගත්තේ දඹදිවින් ආ දීඝායු කුමරුගේ පුත් **දීඝගාමිණී කුමරුට** දාව පඬුවස්දෙව් රජුගේ දියණිය වන **චිත්‍රා කුමරියට** උපන් **පණ්ඩුකාභය කුමරු** ය. ඒ ක්‍රිඃ පූ 437 දී ය. නගර නිර්මාණයෙහි දක්ෂයකු වූ පණ්ඩුකාභය රජු අනුරාධපුර නගරය නිර්මාණය කළේ ය. කෘෂිකර්මාන්තයට අනුග්‍රහ පිණිස **ජයවැව** ඉදි කළේ ය. මේ ජයවැව විලක් ජලධාරිතාව වැඩි කොට තනන ලද්දක් බව මහාවංසයෙහි දක්වේ.[1] ලක්දිව මුල් ජනාවාස ඇති වූයේ වයඹදිගින් මල්වතු ඔය, හා කලා ඔයත්, දකුණු දිගින් කුඹුක්කන් ඔය, මැණික් ගඟ, කිරිඳි ඔය හා වලවේ ගඟත් ඇසුරු කරගෙන ය. රටේ මධ්‍ය කඳුකරය අතහැර තැනිතලා ප්‍රදේශ ජනාවාස වූ බව මින් පෙනේ. කෘෂි කර්මාන්තය සඳහා වැදගත් වන්නේ තැනිතලා බිම් ය. යට කී ජයවැව ඉදිකිරිමේ කටයුතු කරන ලද්දේ පණ්ඩුකාභය රජතුමාගේ මාමා කෙනකු වන ගිරිඛණ්ඩශිව විසිනි.[2] ගොවිතැන් කිරීමට යෝග්‍ය වූයේ වියලි කලාපය බැවින් පැරණි රජවරුන් එහි වැව් අමුණු ඉදිකිරීමට බෙහෙවින් උනන්දුවක් දක්වා ඇත. මේ ආකාරයෙන් ආර්ය ජනාවාස ඇති වීමෙන් සියවස් තුනක් පමණ ගතවන විට ලක්දිව සිදු වූ සුවිශේෂී සිද්ධිය වූයේ මිහිඳු මා හිමියන් වහන්සේගේ ආගමනයයි. ඒ දෙවනපෑතිස් රාජ්‍යෝදයයි. ඒ වන විට මුලු රටම පාහේ ජනාවාස වී තිබුණි. ආර්ය, ස්වදේශීය සම්මිශ්‍රණයක් වූ මෙරට ජනතාව බුදුසමය තේරුම් ගන්නට තරම් බුද්ධිමත් වූ අතර කෘෂිකාර්මික සංස්කෘතියක් පවත්වාගෙන යන්න අවශ්‍ය ශිල්පීය දනුමෙනුත් විමසුම් නුවණිනුත් පොහොසත් වූවාට සැක නැත. බුදුසමයේ පැමිණීමත් සමග වැව්කර්මාන්තය හා වාරිමාර්ග බොහෝ සෙයින් දියුණු වන්නට විය. භික්ෂූන්

---

1 "සරං තඤ්ච ඛණාපෙත්වා කාරාපෙසි බහූදකං,
ඛයෙ ජලස්ස භාහෙන **ජයවාපී'**ති ආහු තං."
මහාවංස, 10 පරිඃ 83 ගාථාව, බුද්ධදත්ත සංස්කරණය, 60 පිට.

2 මහාවංස, 10 පරිඃ 82 ගාථාව, බුද්ධදත්ත සංසඃ 60 පිට.

වහන්සේගේ මාර්ගෝපදේශකත්වය රාජ්‍ය තන්ත්‍රයට පමණක් නොව ලක්වැසියාගේ ජනජීවිතයට අත්‍යවශ්‍ය වූවක් විය.

අනුරාධපුර යුගයේ පටන් ම අප රටේ ජනයා ජීවනෝපාය කරගත්තේ වී ගොවිතැන මූලික කරගත් කෘෂිකර්මයයි. ක්‍රිස්තු පූර්ව යුගයේ පටන් අද දක්වාත් රටට බත සපයන්නේ මෙසේ ආරම්භ වූ වාපි සංස්කෘතියයි. ඒ වාපි සංස්කෘතිය තුළ පැරැන්නන් ගත කළේ තමන් ජීවත් වන පොළවට ශ්‍රමය කැපකිරීම පදනම් කරගත් ස්වයම්පෝෂණ ජීවනරටාවකි. සැම ගමක් ම සකස් වූයේ ස්වයම්පෝෂිත ආර්ථික ඒකකයක් හැටියට ය. වැසියාගේ ජීවිතය සරල වූවක් විය. කෘෂිකර්මය ආහාර අවශ්‍යතාව පිණිස ය. කෘෂිකර්මයට අවශ්‍ය අවිආයුධ මෙන් ම මැටිභාණ්ඩ, රෙදිපිළි, ආභරණ යනාදී අනෙක් ජීවන අවශ්‍යතා සපුරාගත්තේ ද ගම තුළ ම ය. ඒවාට ඇවැසි ශිල්පීය ඥානය පවත්වාගෙන යන පවුල් පරම්පරා විසුවේ ගමතුළ ම ය. කුල නමින් හැඳින් වූයේ එබඳු **ශිල්ප ශ්‍රේණීන් ය.** කෘෂිකර්මය පිළිබඳ ශිල්පීය ඥානය පවත්වාගෙන එන අය ගොවිකුලයයි. කුලය යන්නෙහි මුල් අර්ථය පවුල යන්නයි. මේ ආකාරයෙන් සකස් වූ ජීවන රටාවේ දී සාමූහික සබඳතා බෙහෙවින් වැදගත් විය. කුඹුරු ගොවිතැන කළේ සාමූහිකව ශ්‍රමය බෙදා ගැනීමෙනි. එය හැඳින්වූයේ අත්තම නමිනි. නිෂ්පාදන කාර්යය සිදු වූයේ තමාගේ පරිභෝජනයත්, අවශ්‍යතා අනුව හුවමාරු කරගැනීම පිණිසත් පමණි.

**වාරිකර්මාන්තයඃ**

යට කී ආකාරයෙන් සකස් වූ වාපි සංස්කෘතිය ජල කළමනාකරණය කළේ කෙසේ ද යන්න ටිකක් පහදා ගතයුතු වේ. මුල් ජනාවාස සකස් වූයේ ගං හෝ ආශ්‍රිතව බව කලින් සඳහන් කළෙමු. මෙරටට වැසි ලැබෙන්නේ නිරිතදිග හා ඊසානදිග මෝසම් සුළං වලිනි. වියලි කලාපය සාමාන්‍යයෙන් අවුරුද්දේ වැඩි කාලයක් වර්ෂාවෙන් තොර ය. පැරණි සිංහලයා මේ වියලි කලාපය කෙත්වතු වලින් සරුසාර ප්‍රදේශයක් බවට පත්කරගත්තේ වැව් හා වාරිමාර්ග සකස් කරගැනීමෙනි. ඒවා සකස් කළේ භූමියේ පිහිටීම හා වසරේ වැසි රටාව හොඳින් තේරුම් ගනිමිනි. ලංකාවේ වැසිරටාව අනුව අස්වනු නෙලන කාලයට ලැබෙන්නේ වියලි කාලගුණයයි. එය වී ගොවිතැනට

බෙහෙවින් වැදගත් ය. කඳුකරයෙන් පටන් ගැනෙන ගංගා වැසි කාලයේ දී පහත් නිම්න හරහා ගලා බසියි. එය උපයෝගී කරගෙන වාරිමාර්ග ඔස්සේ වියලි කලාපයට ජලය හරවා ගැනීමෙන් පැරැන්නෝ ගොවිතැන් කළහ. වියලි කාලය වැඩි බැවින් ගොවිතැන සඳහා ජලය රඳවා තබාගැනීම අත්‍යවශ්‍ය ය. වැව් තැනීම වඩාත් දියුණු වූයේ එබැවිනි. හෙල් වැටි දෙකක් අතර බැම්මක් බැඳීමෙන් ජලය රඳවා ගැනීම එකකි. උස් බිම් දෙකක් අතර බැම්මක් බැඳීමෙන් ජලය රඳවා ගැනීම එක් ක්‍රමයකි. තැනිතලා හරහා ගලායන දිය පාරවල් හරස් කොට ජලය රඳවා ගැනීම තවත් ක්‍රමයකි. මේ ආකාරයෙන් පැරණි රජදරුවන්ගේ අනුග්‍රහයෙන් සකස් වූ විශාල වැව් පද්ධතියක් ලක්දිව විද්‍යමාන ය. මෙහි දී ඒ සියල්ල විස්තර කිරීමට නොව මා බලාපොරොත්තු වන්නේ සරළ හැඳින්වීමක් දීමට ය.

භූ විසමතාව සැලකිල්ලට ගනිමින් වැව් නිර්මාණය කිරීමේ දී අනුගමනය කළ තවත් ක්‍රමයක් නම් ප්‍රධාන වැවක් කේන්ද්‍ර කරගෙන මහවැවට ඉස්මත්තෙන් කුඩා වැව් හෙවත් කුලුවැව් දෙකතුනක් සකස් කිරීමයි. ඇලමාර්ග පිළිබඳව සළකා බැලීමේ දී ලංකාවේ ඇති ශ්‍රේෂ්ඨ වාරිමාර්ගයක් නම් යෝධඇල හෙවත් ජයගඟයි. පළමුවන සැතපුම් 17 දී සැ: 1ට අඟල් 6 ක බෑස්මක් ඇතිව මල්වතුඔය නිම්නය දිගේ මේ යෝධඇල විහිදී ගොස් ඇත. සැතපුම් 54 ක් වූ මෙයින් අනුරාධපුර වැව් පමණක් නොව කලාඔය ද පෝෂණය වේ.[1]

වැවේ රඳවා ගන්නා ජලය බෙදාහැරීම පිණිස භාවිතා කරන්නේ **හොරොව්වයි**. එය **බිසෝකොටුව** නමින් ද හැඳින්වේ. 1870 දී පමණ බ්‍රිතාන්‍ය ජාතික ඉංජිනේරුවකු වන හෙන්රි පාකර් මහතා රටේ ප්‍රධාන වැව් වල ඇති තාක්ෂණය වෙසෙසින් ඇගයීමට ලක් කළේ ය. බිසෝකොටුවේ ඇති වටිනාකම ඔහු අගය කළේ මෙසේ ය. **"ලෝකයේ මෙතරම් විශිෂ්ට වාරිකර්මාන්ත ක්‍රමයකට උරුමකම් කියන සිංහලයාට මේ තරම් විශාල වැව් හැදීමට ශක්තිය ලැබී තිබෙන්නේ "බිසෝකොටුව" නිර්මාණය කිරීමේ තාක්ෂණය ඔවුන් සතු වීම නිසයි"**[2] යනුවෙනි.

---

1 ආනන්ද ජයසුන්දර, **"අනුරාධපුරයේ වාරිකර්මාන්ත"**, ලිපිය, විමර්ශන ලිපි, රතනසෙල සාහිත්‍ය සංගමය, අංක 5, කලාපය 68 - 69.

2 මහින්දකුමාර දළුපොත, උරුමය 2, **වැවේ වගතුග,** 7 පිට.2001.

මේ දිය හොරොව්වට පහළින් වැවේ එකතු වන රොන්මඩ පිටතට ගන්නේ **මඩහොරොව්වයි**. වැවේ වැඩි වතුර පිටවීමට යොදන කපොල්ල **පිටවානයි**. වැවේ ඉස්මත්ත හඳුන්වන්නේ **වැව්තාවල්ල** නමිනි. විශාල වැව් වල වැකන්දේ ඇතුළ් පැත්ත රළ වේගයට හේදී යාම වැළැක්වීම සඳහා පඩි පෙළක හැඩයෙන් ගල් අතුරාලනු ලැබේ. ඒ **රළපනාවයි**. වැවේ ජලමට්ටම පෙන්වන්නේ **දියකැටපහණ** යි. වැකන්දේ හරි මැද **හුන්නාකඩ** නම් වේ. වැකන්දේ ඇතුළ් පැත්ත **දියකෝල්බඩ** නම් වේ. වී ගොවිතැනට අවශ්‍ය ජලසම්පාදනය ප්‍රධාන අවශ්‍යතාව වුවත් නෑම, බීම, රෙදි ඇපිල්ලීම වැනි අවශ්‍යතා පිණිස වැවේ වෙන වෙන ම මංකඩවල් කීපයක් තිබේ.

ලක්දිව පැරණි ශිෂ්ටාචාරයේ "වැව" කියන්නේ පුදබිමක් වැනි වැදගත් තැනකි. ඒ වටා සකස් වුන නොයෙක් පුදසිරිත් වතාවත් රැසක් දක්නට තිබුණි. ලක්වැසියාගේ සිතේ වැව පිළිබඳව තිබුණේ මහත් ගෞරවයකි. ජටා බැඳ, පච්චවඩම් ඇඳ වෑ කන්ද දිගේ යාම වැවට නිග්‍රහ කිරීමක් සේ සැළකුණි. වැකන්ද දිගේ මලමිනි ගෙනයාම ද තහංචියකි. වැවේ ආරක්ෂාව පිළිබඳ වගකීම් හැඟීමක් කාටත් තිබුණි.

පුරාණයේ සිට පැවත ආ මේ හෙළ කෘෂි තාක්ෂණය නොයෙක් සතුරු තාඩන පීඩන අස්සේ වුවත් ආරක්ෂා වී තිබීම පුදුම සහගත ය. ඉංග්‍රීසි පාලන යුගයේ හැම දේ ම උඩුයටිකුරු වී ගිය ද 1895 ප්‍රථම වරට මෙරටට පා තැබූ ජර්මන් ජාතික විල්හෙල්ම් ගයිගර් මහතා කුඹුරු ගොවිතැන හෙළයාගේ ආධ්‍යාත්මයට කා වැදී තිබූ ආකාරය දකින්නේ මෙසේ ය.

**"සිංහලයෝ යනු අවිවාදයෙන් ම කෘෂිකර්මාන්තයෙහි අති දක්ෂ ජාතියකි. <u>කුඹුරු වගාව ඔවුන් උපතින් ම අතමිට මොලවාගෙන පැමිණ ඇති සෙයකි.</u> කුමන ආකාරයක හෝ කෘෂි වගාවක් වෙනුවෙන් වෙහෙස නො වන්නෙක් මුලු සිංහලයේ ම නැති තරම් ය. ගොවිතැන හා සම්බන්ධ විවිධ අවස්ථාවන් උත්සවශ්‍රීයෙන් සිදු කිරීම ද තවත් විශේෂයකි. එම උත්සවය ඉතා ගෞරව සම්ප්‍රයුක්ත ලෙස ඉටු කිරීමට පවුලේ සියලු දෙනා ම හොඳින් වග බලා ගනිති. සිංහලයා සාමාන්‍ය යෙන් ව්‍යවහාර භාෂාවට වඩා වෙනස් වූ සුවිශේෂ වචන මාලාවක් වී ගොවිතැනේ දී භාවිතා කරයි. එය කමත් භාෂාව යනුවෙන් හඳුන්වති. මෙම කමත් භාෂාව ගැන නොදන්නා**

**අයකුට ඒවා තේරුම් ගැනීම ඉතාම දුෂ්කර වන අතර අඩුතරමින් ගොවියා කථාකරන්නේ කුමක් ගැන ද යන්න ගැනවත් අවබෝධයක් නො ලැබේ.**[1] ගයිගර් මහතා මෙසේ වර්ණනා කරන්නේ වැඩි ඈතක නොව 20 වැනි සියවසේ මුල් කාර්තුවේ යටත් විජිත සමයේ දිගින් දිගට ම ගොවියා බෙහෙවින් පීඩාවට ලක් වී සිටි යුගයක දුටු තත්ත්වයයි. (ඔහු දෙවන වර පැමිණියේ 1925 දී ය. තෙවන වර 1931 දී ය.)

මහාචාර්ය, කේ. එන්. ඕ. ධර්මදාස මහතා අපරට වැව් තාක්ෂණයේ විදේශයෙහි ව්‍යාප්ත යශෝරාවය පිළිබඳව ප්‍රකාශ කරන්නේ මෙසේ ය. "අපේ සම්පූර්ණ ජාතික ආර්ථිකය ගොඩනැගුණේ, වාපි කර්මාන්තය පදනම් කරගෙන අප ගොඩනැගූ සමෘද්ධිමත් දේශයක් බවට මේ සිංහලද්වීපය පත් වූයේ වාපි ශිෂ්ටාචාරයේ පදනම මත ය. එහෙයින් 12 වන සියවස පමණ වනවිට මේ දේශයේ යශෝරාවය භාරතය පුරා පැතිර ගොස්, අපේ විශේෂඥයන්ගේ සේවය ලැබීමට කාශ්මීරයෙන් පවා ඉල්ලුමක් ඇති වූ බව ඓතිහාසික සත්‍යයකි."[2] යනුවෙනි.

බුදුවදන් තුළ රථයට කොඩිය සලකුණ වන බවත්, ගින්නට දුම සලකුණ වන බවත්, රටට රජු සලකුණ වන බවත්, ස්ත්‍රියට සැමියා සලකුණ වන බවත් දක්වෙන දේශනාවක් තිබේ.[3] ඒ වාගේ ම සිංහල සංස්කෘතියට අන් සියලු සංස්කෘතීන්ගෙන් වෙන් කෙරෙන අපූරු සලකුණු ඇත. මේ ගැන කථාකරන **මාර්ටින් වික්‍රමසිංහ මහතා** "සිංහල භාෂාව එවැන්නකි. වැව් තවත් එවැනි සලකුණකි. සිංහල සංස්කෘතියෙහි ශ්‍රේෂ්ඨතම අංගය ලෙස සැලකිය යුත්තේ වැව් ය"[4] යනුවෙන් පවසයි.

---

1 සුදන්තක පී විජේතුංග, **ගයිගර් දුටු ලංකාව**, 78 පිට, 2003.

2 ධර්මදාස, කේ. එන්. ඕ. මහාචාර්ය, **"අපේ වැව සහ සිංහල ජාතිකාභිමානය"** ලිපිය, පුන්කලස, සිළුමිණ ශාස්ත්‍රීය ලිපි සරණිය, 36/ 37 පිටු, 2007 සැප්:

3 ධජො රථස්ස පඤ්ඤානං ධූමො පඤ්ඤාණමග්ගිනො,
රාජා රට්ඨස්ස පඤ්ඤාණං භත්තා පඤ්ඤාමිත්ථියා.
සං: නි: 1, රථ සූත්‍රය, 78 පිට, බු: ජ: මු:

4 මාර්ටින් වික්‍රමසිංහ, සිංහල ලකුණ, 36 පිට, 2015.

ඉංග්‍රීසි යටත්විජිත යුගයේ මෙරට මාර්ග පාලම් ඉදිකිරීමේ යෙදුන මේජර් ස්කිනර් ඉංග්‍රීසි රජය විසින් නුවරකලාවිය අනුරාධපුරය දක්වා මාර්ගයක් තැනීමට යොමු කරන ලදි. මේ ප්‍රදේශය පිළිබඳව සිතියම් අධ්‍යයනය කරන විට ඔහු දුටුවේ කඳුකර නො දන්නා ප්‍රදේශයක් හැටියට ලකුණු කර ඇති බවයි. ස්කිනර් අනුමාන කළේ මේ ශුද්ධ ප්‍රදේශය කරා යුරෝපීයයන්ට පැමිණීම දුෂ්කර කාර්යයක් බවට පත්කිරීම උඩරැටියන්ගේ ප්‍රතිපත්තිය වූ බවයි. කැලය පීරාගෙන මේ ප්‍රදේශයට ඔහු ගියේ දුෂ්කර ගමනකි. එහි ළඟා වීමෙන් පසු දුටු දෙය පිළිබඳව ඔහු සඳහන් කරන්නේ මෙසේ ය.

**"මා මෙහි පැමිණි විට දක්නට ලැබුණේ ඒ 'සිතියම්වල' සඳහන් 'කඳුකර' රට නො ව <u>විශාල දාගැබ්, අති ශෝභන විශාල වැව් ආදියේ නෂ්ටාවශේෂ සමූහයකින් සමලංකෘත වූ ද යම් කිසි අතීත සමයෙක රටේ ධාන්‍යාගාරය ව පැවති බවට ශාක්ෂි සහිත වූ ද, ජනගහනයෙන් ආඪ්‍ය දිස්ත්‍රික්කයකි.</u> මෙයින් මම මවිතයට පැමිණියෙමි. මා වඩාත් මවිත වූයේ මා මේ කාර්යය සඳහා අණ ලත් විට, ස්වභාව සිද්ධ ලෙස මේ පලාත පිළිබඳ තොරතුරු ලබාගැනීමට උත්සාහ දරූ නමුත් මට කිසිදු විස්තරයක් ලබාගැනීමට නො හැකි වූ නිසා ය. මට අසන්නට දකින්නට ලැබුණු කිසිවකු, රජයේ ඒජන්තවරයකු පවා, මේ පලාත මැදින් ගමන් කොට නො තිබුණි. මෙය මෙතරම් අප්‍රසිද්ධ ප්‍රදේශයක් ය යන සත්‍යය නිසා මගේ කුතුහලය ඇවිස්සුණෙන් මේ පළාත සොයා බැලීම සඳහා මම විශේෂ ඇල්මකින් ක්‍රියා කළෙමි."**[1] යනුවෙනි.

මේ දියුණු ශිෂ්ටාචාරයේ නටබුන් තව වසර කීපයකින් විනාශ වීමට ඉඩ ඇති බව ද ඔහු පවසයි. මේ පළාත පුරාවිද්‍යාත්මක කෞතුක භාණ්ඩ වලින් පිරී ඇතැයි ද ඔහු සඳහන් කරයි. වල් බිහි වී ඇති මේ ප්‍රදේශයේ මායිම් වශයෙන් ඇත්තේ සියවස් ගණනකට පෙර ගෙවල් වලට ජලය සැපයුණ ළිං පමණක් බව ද, මෙහි වාස්තුවිද්‍යා ආකෘතීන් මෙයට අවුරුදු අටසියයකට හෝ දහසකට පෙර ගොඩනගන ලද්දේ මෙකල මෙතරම් බෙල හීන තත්ත්වයක සිටින මිනිසුන් විසින් බව ද

---

[1] මේජර් තෝමස් ස්කිනර්, ලංකාවේ පනස් වසක්, 100 පිට, ඇල්ලේපොල එච්. ඇම්. සෝමරත්න පරිවර්තනය, ගුණසේන,

පවසයි. මේ ප්‍රදේශය පිළිබඳව නොක්ස්ගේ ප්‍රකාශයක් ගැන ද ස්කිනර් සඳහන් කරයි. **"මේ සියල්ලට ම වඩා මට ප්‍රහේලිකාවක්ව පවත්නේ පැරණි, නොක්ස් "ගල්කණු ලෝකය" යයි විස්තර කරන මීට අවශ්‍ය ගල් ලබාගත් ගල් වළවල් කොතැනක වත් දක්නට නො ලැබීමයි."**[1] යනුවෙනි. එවකට අප රට වැටී තිබුණ ප්‍රපාතයේ තරම පිළිබඳ සානුකම්පිත බවකින් දුටු ස්කිනර් මෙසේ ද සඳහන් කරයි.

"ජලය, ජලය, ජලය. මේ මිනිසුන්ට ජලය දෙන්න. එවිට මේ මිනිසුන් කොයි ලෙසකට හෝ හැඩ ගැසිය හැකි ය. එහෙත් නියම පිරිසිදු ජල සම්පාදනයක් නැතහොත් ඔවුන් මැරී යා යුතු ය. වැව් මුලදී තැනූවන් වර්ෂා ඍතුවේ දී වැඩිපුර ජලය පිටකර හැරීම පිණිස සුදුසු පමණ උපක්‍රම යෙදීමට තරම් උපායවත් හා විද්‍යාඥානයෙන් උසස් නො වූ හෙයින් මේ උදාර වැව් කැඩී බිඳී ගොස් තිබේ. මේ උසස් කර්මාන්තයන්ගෙන් ශේෂ ව පවත්නා කොටස ආරක්‍ෂා කිරීම පිණිස වහා ක්‍රියාරම්භ කරන ලෙස රජයෙන් ඉල්ලා සිටි මම, ජලය හිඟ නිසා වී ගොවිතැන හා ඒ නිසා ම වැසියන්ගේ සෞඛ්‍යය ද බෙහෙවින් පිරිහෙන බව පෙන්වා දුනිමි. ජලය වූ කලි ග්‍රීස්ම කලාපීය රටක වැසියන්ගේ ජීව රුධිරය හා ජාතික ධනයයි."[2]

ස්කිනර් කියන්නා සේ මේ ශිෂාටාචාරය වල්බිහි වූයේ වැසි සමයේ ජලය පිටකිරීමට ඇවැසි උපාය නො දැන සිටි නිසා නොව නොයෙක් ආක්‍රමණිකයන් නිසා අනුරපුරයෙන් රාජධානිය වෙනස් වීමත් පරසතුරු පීඩාත් නිසා බව අපි තේරුම් ගතයුතු වෙමු.

මේ පරිච්ඡේදයේ දී මෙතෙක් සඳහන් කළ කරුණු ටික ගෙනහැර දක්වීමෙන් මා බලාපොරොත්තු වන්නේ ආදී යුගයේ පටන් මෙරට වැසියා කෘෂිකර්මය මූලික ජීවනෝපාය කරගත් ආකාරය ඒ පිළිබඳව යමෙක් නො දන්නේ නම් ඒ අයට යම් හැඟීමක් හා අවබෝධයක් ඇති කිරීමයි. කොවිඩ් 19 උවදුර ඉදිරියේ සියලු රටවල් නතර වනතෙක් ම සියලුලෝ ම සිතා සිටියේ ගෝලීය ආර්ථිකය සියල්ල සපුරන කල්පවෘක්‍ෂයක් වශයෙනි. මේ වන විට හැම රටක් ම තම තමාට අනන්‍ය වූ

---

[1] ලංකංවේ පනස් වසක්, 104 පිට.

[2] - එම -

ආර්ථික පිළිවෙතක අවශ්‍යතාව තේරුම් ගෙන සිටිනවා විය හැකි ය. අප තේරුම්ගත යුතුව ඇත්තේ ශ්‍රී ලංකාවට අනන්‍ය ආර්ථික පිළිවෙත කුමක් ද යන්නයි. ආහාර අවශ්‍යතාව පමණක් නොව ආර්ථික පිළිවෙත විහිදී යා යුතු විවිධ මිනිස් අවශ්‍යතා කොතෙකුත් තිබේ. එසේ වුවත් මෙහි දී මා වැඩි වශයෙන් කථා කරන්නේ ආහාර අවශ්‍යතාව පිළිබඳවයි.

උදා වූ වයිරස් උවදුරත් සමග ම හැම දෙනාගේ ම අවධානය යොමු වූයේ ආහාර අර්බුදයකට මුහුණ දීමට සිදුවේ ද, යන ප්‍රශ්නය කෙරෙහි ය. ගෙවතු වගාවට බොහෝ දෙනා යුහුසුලු විය. තට්ටුනිවසයක සිටින අයට බැල්කනියේ හෝ ආහාරයට ඇවැසි යමක් වවාගැනීම ගැන කථා බහ ඇසෙන්නට විය. වසංගත ඇඳිරි නීතිය ගොවිපල වලට යාමට හා එහි වැඩකිරීමට බාධාවක් නො වන බවට රජය මාධ්‍යය ඔස්සේ ප්‍රකාශ කෙරිණ. පුරන් වූ කුඹුරු අස්සද්දන්නට පෙළඹුනි. මහකන්නයට පමණක් වගා කෙරුණ බොහෝ කුඹුරු යල්කන්නය සඳහා ද අස්සද්දන්නට විය. මේ කඩිමුඩිය ඇති වූයේ ගෝලීය ආර්ථිකයකින් යැපුම කෙරෙහි තවදුරටත් විශ්වාසය නො තැබිය හැකි බව පෙනෙන්නට වූ නිසා ය. රටේ වැව් පද්ධතිය නැවතත් පණ ගැන්විය යුතු බවට දෙගෙඩියාවක් නො වියහැකි ය. ඉංග්‍රීසි පාලකයින් මහාමාර්ග තැනීමේ දී වැව් මැදින් ඉදිකර ඇති පාරවල් සුදුසු පරිදි වෙනස් කර ඒ වැව් ප්‍රතිසංස්කරණය කළයුතුව තිබේ. අහස සූරන ගොඩනැගිලි වලින් දියුණුව මැණීම වෙනුවට දියුණුව යන්න පිළිබඳ අර්ථකථනය **"මූලික මිනිස් අවශ්‍යතා සන්තෘප්තිය"** යනුවෙන් වෙනස් වියයුතුව තිබේ.

# 06

## පෙර රජවරුන් රට කළ හැටි

විජය රජුගේ පටන් රාජ්‍යත්වය පිළිබඳ ලිඛිත ඉතිහාසයක් ලක්දිවට තිබේ. ක්‍රිස්තු පූර්ව යුගයට අයත් සෙල්ලිපි වල ගාමිණී, පරුමක, රජ, මහරජ යන වචන වලින් මහරජුනට යෙදුන ව්‍යවහාර සේ සැලකේ. මෙරට ආදීම ආර්ථික ඒකකයත් පාලන ඒකකයත් වූයේ ගමයි. ඒ අනුව රජුට **ගාමිණී** යන්න යෙදී ඇත. ගාමිණී තත්ත්වයෙන් රාජ්‍යත්වයට පරිණාමය වූ ආකාරය ද පෙනෙන්නට තිබේ. **රජ** යන ව්‍යවහාරය එන්නේ එසේ පරිණාමය වීමක් හැටියටයි. රුහුණ මාගම වැනි ප්‍රදේශ පාලකයන් **රජ** නමින් හැඳින් වේ. පිහිටිරට පාලකයා **මහරජ** විය. බුදුසමයේ පැමිණීමත් සමග බුදුසසුනත් රජයත් අතර සම්බන්ධය ඇති විය. බුදුදහම තේරුම් ගන්නා පුද්ගලයා පරිසරයට සංවේදී අයකු වන්නේ නිරායාසයෙනි. බෝසතකු නො වන කෙනෙක් රජ නො වියයුතු බවට පිළිගැනුණ අතර සසුන ආරක්‍ෂා කිරීම රාජ්‍යත්වයේ වගකීමක් විය. රාජ්‍ය උරුමය ගියේ රජුගේ වැඩිමල් සොයුරාට, පියාගෙන් වැඩිමල් පුතාට, සුදුස්සකු නැතිනම් බෑණා, සුහුරුබඩු ආදී කෙනකුට ය.

මුල දී රාජ්‍යත්වයේ තිබුණ සරළ බව වෙනුවට පසු කාලයේ මහත්වයක් ආරෝපණය වන අයුරු ද දක්නට ලැබේ. නුවරයුගය වන විට රජු දේවයන් වහන්සේ වන අතර වැසියා ගැත්තා, බලුගැත්තා තත්ත්වයට වැටෙන අයුරු දක්නට ලැබේ. නුවර යුගයේ නායක්කර් පාලන ක්‍රමයේ වූ කර්කශ ස්වභාවය මුලු මහත් ඉතිහාසයට ම වලංගු කළයුතු නො වේ. කෝට්ටේ යුගයේ සිට දක්නට ලැබෙන **රදළ** පැලැන්තිය රාජ්‍යත්වය හා සම්බන්ධ නිළධාරීන් වන අතර ඔවුන් වංශවතුන් හැටියට සාමාන්‍ය ජනතාවගේ මහත් ගෞරවයට පාත්‍ර විය.

මේ රදළ යන ව්‍යවහාරය **රදොලන්** යන වචනයේ පරිණාමයකි. ඉන් අදහස් කළේ 'රට' යනුවෙන් වෙන් කරගෙන තිබුණ පාලන ඒකකය සම්බන්ධ නිළධාරීන් ය. රද්කොල්, රද්කෝල් කැමියන් යනුවෙන් ද මොවුන් හඳුන්වා ඇත.[1] මෙසේ

---

1 අමරවංස හිමි, කොත්මලේ, ලක්දිව සෙල්ලිපි, 221 පිට, 1969.

සඳහන් වන්නේ රටේ පැරණි රාජකාරි ක්‍රමයට සම්බන්ධ නිළදරුවන් ය. අත්තානි පෙරහැර් නමින් හැඳින්වෙන පැරණි ටැම් ලිපිවල බොහෝ කාර්යයන් උදෙසා වූ නොයෙක් නිළයන් රැසක් දක්නට ලැබේ. රාජ්‍යත්‍වයට අදාළ මේ විස්තර ප්‍රමාණවත් යයි කල්පනා කරමි. මෙහි දී වෙසෙසින් අපගේ අවධානය යොමු වන්නේ භූමි පරිහරණය හා කෘෂිකර්මය පිළිබඳවයි.

**භූමි පරිහරණය හා කෘෂිකර්මයඃ**

බොහෝ දෙනා වැඩිවශයෙන් සිතා සිටින්නේ රටේ සියලු ඉඩම් රජු සන්තක ය යනුවෙනි. එය බැලූ බැල්මට සත්‍යයක් සේ පෙනුනත් රජතුමා යනු ඉඩම් හිමියකු නො වේ. රජු භූමියෙහි බාරකරුවා පමණි. රාජ්‍යයත් වැසියාත් ආරක්ෂා කිරීම රජුගේ වගකීමයි. වැසියා රජුගෙන් බලාපොරොත්තු වන්නේ එයයි. වැසියා රජුට බදු ගෙවන්නේ රාජ්‍යයත් වැසියාත් ආරක්ෂා කරන නිසයි. යම් සේවයක් කළ කෙනෙකුට නින්දගමක් දුන්නා කියන්නේ ඉඩම් දීමක් නො වේ. ඒ පුද්ගලයා කළ හෝ කරන සේවයට සැලකීමක් වශයෙන් යම් ගමකින් රජුට ලැබෙණ බද්ද, ඔහුට පවරා දීමයි.

රජතුමා විසින් රාජ්‍යයත් ජනතාවත් ආරක්ෂා කළා වගේ ම ගොවිතැන් කිරීමට අවශ්‍ය ජල පහසු කම් සපයා ගැනීම පිණිස වැව් අමුණු ඉදිකිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කෙරුණි. වෙහෙර විහාර ඉදිකිරීම වැසියාගේ ආධ්‍යාත්මික සංස්කෘතික අවශ්‍යතා සම්පූර්ණ කිරීමක් විය. මෙය අද කාලේ රජයකින් කෙරෙන ආණ්ඩු කිරීමකට සමාන කළ නො හැකියි. බොහෝ විට ගමක් වන්නේ වැව මූලික කරගත් ජනාවාසයකට ය. ගමේ විශාලත්වයේ හැටියට වැව් එකක් හෝ කීපයක් වියහැකි ය. ඒ කුලු වැව් හා මහ වැව වශයෙනි. වැව් තාවල්ලෙන් එහා පැත්තේ ඈතට විහිදෙන මහකැලෑවයි. ඉන් එන දොළපාරවල් සලකාගෙනයි, වැව සකස් කරනුයේ. වැකන්දෙන් පහලට විහිදී යන්නේ කුඹුරු යායයි. ගම් වැසියන් පදිංචි වී සිටින කොටසට කියන්නේ ගංගොඩ නැතහොත් ගම්මැද්දයි. ලඳුකැලෑ කොටස හේන් ගොවිතැන පිණිසයි. ගමේ උස් තැන පන්සලයි. ගොවියන් ගමේ කෘෂි නිෂ්පාදන කරන පිරිසයි. වළං තැනීම, කම්මල් වැඩ කිරීම, රෙදිවිවීම, ලී බඩු හැදීම වැනි වෙනත් ශිල්පයක් කරන අයට පොදු නිෂ්පාදනයට

දායක වෙන්නට අපහසුයි. ඔවුන්ගෙන් ලබාගන්නා සේවයට හිලව් කරන්නේ කෘෂි නිෂ්පාදනයි. මුදල් වෙනුවට භාණ්ඩ හුවමාරු ක්‍රමය භාවිතා විය. රජතුමාට භූමිය වෙනුවෙන් වැසියා බදුගෙවන්නේ රජුට ඇති ඉඩම් හිමිකමක් මත නොව රාජ්‍යයත් වැසියාත් ආරක්ෂා කරන නිසා ය. මූර්ති, කැටයම් වැනි ශිල්පයක් පවත්වාගෙන යන පුද්ගලයාට ඔහුගේ දස්කම් සළකා ගම්වර දීම යනුවෙන් අදහස් කෙරුනේ යම් ගමකින් ලැබෙණ බද්ද ඒ ශිල්පියාට ලබාගැනීමට සැලසීමයි. ශිල්පයක් පවත්වාගෙන යන අයට පොදු නිෂ්පාදනයට ශ්‍රමය කැප කරන්නට අවස්ථාවක් නැති නිසයි. විහාරස්ථාන වල නඩත්තුව පිණිස එවන් ගම්වර පිරිනැමීම් සිදු වේ. රාජ්‍යය යනු මෙවන් ස්වයම්පෝෂිත ගම් රාශියකි.

හැම ගමක ම ස්වාධීන පාලන ආයතනයක් තිබුණි. එය හැඳින්වෙන්නේ **"ගම්සභාව"** නමිනි. දැනුමෙන් හා අත්දැකීමෙන් පොහොසත් වැඩිමහල්ලන්ගෙන් සමන්විත ගම්සභාවෙන් අර්ථය සම්පූර්ණ වෙයි. පංසලේ භික්ෂූන් වහන්සේගෙන් ධර්මය සම්පූර්ණ වෙයි. එසේ ගොඩ නැගෙන සම්ප්‍රදාය තුළින් පාලන කාර්යය සම්පූර්ණ විය. යම් කෙනෙක් මේ ගම නමැති පාලන ඒකකයේ සම්ප්‍රදායයන්ට පටහැනි වුවහොත් පොදු නිෂ්පාදනයට ශ්‍රමය කැප කිරීම තහනම් කර ගැත්තරයට ඇදදමනු ලැබේ. එතැන් පටන් ඔහු ඉල්ලාගෙන ජීවත් වියයුතු වේ. නිවැරදි වන්නේ නම් නැවත ශ්‍රමසහභාගිත්වයට අවකාශ ලැබේ. අතීතයේ ශ්‍රමය යෙදීම සැළකුවේ නො වැළැක්විය හැකි අවාසනාවක් හැටියට නොව අභිමානයට කරුණක් හැටියට ය. කෙනෙකුගේ ශ්‍රමය තහනම් කරන්නේ දඬුවමක් හැටියට ය.

අගනගරයේ ගම්සභාවක් නැත. එහි සියලු විනිශ්වය කටයුතු කළේ රජතුමා ය. මධ්‍යම පාලනයත් පළාත් පාලනයත් සියල්ල ගමේ තිබුණි. මධ්‍යම පාලනය ධර්මයයි. එහි මධ්‍යස්ථානය පන්සලයි. පළාත් පාලනය ගම්සභාවයි. ඒ ගමේ වැඩිමහල්ලන්ගේ සභාවයි.[1]

---

[1] බිංගිරිය දේවගිරි රජමහාවිහාරාධිපති, පූජ්‍ය මලගනේ අත්ථදස්සි හිමියන් හා සාකච්ඡා කරමින් ඩී. ජී. සපුතන්ත්‍රී මහතා විසින් දිවයින බදාදා අතිරේකයට **"ගුරුවරයකු නො වන ගුරුවරයකුගේ කථාවක්"** යන තේමාවෙන් සැපයූ ලිපි පෙළේ 10 වැනි ලිපිය. 1986 මාර්තු 5 වැනි බදාදා, දිවයින පත්‍රය.

රජතුමා වුව ද පොදු සම්ප්‍රදාය ඉක්මවන්නේ නම් එය වැසියාගේ අප්‍රසාදයට හේතු වේ. දෙටුතිස් රජුගේ ඇවෑමෙන් ක්‍රි: ව: 236 දී රාජ්‍යත්වයට පත් ඔහුගේ මළණුවන් වන මහසෙන් රජුට මහජන විරෝධයක් ඇති වීම නිදසුන් කොට දැක්විය හැකියි. සොළී රටින් ආ සංඝමිත්‍ර භික්ෂුවගේ හා සෝණ ඇමතියාගේ බසට නැමී මහසෙන් රටටත් සසුනටත් විපත් කළේ ය. මහාවිහාරය බිඳදැමී ය. මීට රටවැසියා බෙහෙවින් කුපිත විය. මේඝවර්ණාභය ඇමති ප්‍රධාන මලයරට වාසීන්ගෙන් යුත් විශාල සේනාවක් යුද්ධයට එළඹුණි. මහසෙන් රජු ද සේනා පිරිවරා කඳවුරු බැඳගත්තේ ය. පසුදා උදේ යුද්ධය ඇරඹෙන්නට නියම ය. එහෙත් රාත්‍රියේ මේඝවර්ණාභය ඇමති තමා ගෙනා මිහිරි අහරක් ද ගෙන රජුගේ කඳවුරට ගියේ ය. රජු පුදුම විය. මෙය පෞද්ගලික කරුණක් නිසා නොව රටටත් සසුනටත් කරන හානිය නිසා කරන සටනක් බව රජතුමා වටහා ගත්තේ ය. රජු යුද නො කරන බවට පොරොන්දු විය. යුද්ධය වැළකී ගියේ ය. මහසෙන් නැවත රාජ්‍යත්වයෙහි තහවුරු විය. ඔහු විනාශ කළ මහාවිහාරය යළි ප්‍රකෘතිමත් කළා මෙන් ම මින්නේරිය ආදී වැව් 16 ක් කළේ ය. මින්නේරිය වැවෙන් අමුණු 80,000 වපසරිය ගොවිතැන් කරවී ය. රජු වුව ද පොදු සම්ප්‍රදාය ආරක්ෂා කළයුතු ය. සම්ප්‍රදාය කඩකරන්නේ නම් රජතුමා වුව ද අප්‍රසාදයට පත් වන්නේ ය.

ඇතැම් විට රජුගේ අනුග්‍රහය කෙළින් ම නැතත් ගම්දනව් වල කුඩා වැව් ඇලමාර්ග සකසා ගත්හ. දුටුගැමුණු රජතුමාගේ ප්‍රධාන සෙන්පතියකු වන ලභියවසභ තමන්ට කුඹුරක් සකසා ගනු පිණිස මිනිසුන් කීපදෙනකු රැස්කරවා වැවක් ඉදි කළ බව මහාවංසයේ සඳහන් වේ.[1]

පැරණි යුගයේ **"රාජකාරි ක්‍රමය"** හැටියට හැඳින් වූයේ වාරි කර්මාන්තයට අයත් වැව් ඇල වේලි, දාගබ්, පුදබිම්, ආදී රටවැසියාට අවශ්‍ය වන වැදගත් ඉදිකිරීම් වලට වසරකට දින කීපයක් ශ්‍රමය ලබාගත් ක්‍රමයයි. රටේ රජමාලිගාව හැදුවේ ද මේ රාජකාරි සේවා ක්‍රමයෙනි. පැරණි යුගයේ පටන් ක්‍රියාත්මක වූ මේ රාජකාරි ක්‍රමය ක්‍රියාත්මක වූයේ අද ඇතැමුන් සිතන පරිදි

---

1 ආදාය සො කතිපයෙ පුරිසෙ යෙව ආරභි,
බෙත්තත්ථිකො මහාවාපිං කරොන්තො තං මහබ්බලං.
මහාවංස, 23 පරි:, 92 ගාථාව, බුද්ධදත්ත සංස්: 126 පිට.

බලෙන් වැඩ ගැනීමක් හැටියට නො වේ. රාජකාරියට පැමිණෙන ජනයාගේ ජීවිතාරක්ෂාව සැලසීමට රජතුමා බැඳී සිටියේ ය. කුඹුරු අස්සැද්දීම්, හේන් ගොවිතැන් කරන කාලයට රාජකාරියට කැඳවීමක් නො වින. ශස්‍ය නෙළන කාලයට රාජකාරි සේවයට කැඳවීමක් ද නැත. සංස්කෘතික වශයෙන් ප්‍රවේණි උත්සව සමයෙහි රාජකාරියට කැඳවීමක් නො වින. තමන් වෙසෙන ප්‍රදේශයෙන් පිටස්තර දුර බැහැර පෙදෙස්වල කටයුතු වලට කැඳවීමක් ද නො වින. රාජකාරි ක්‍රමය තුළින් කළේ මනුෂ්‍යයාට ම අවශ්‍ය කටයුතුයි. එය වැසියා අසහනයට කරුණක් සේ දකින්නේ නැත. ඒ බව වෙසෙසින් සඳහන් කළේ මිෂනාරි අධ්‍යාපනයෙන් නුවණැස වසාගත් අය මේ රාජකාරි ක්‍රමය වැඩවසම් ක්‍රමයක් සේ දකින නිසයි.

1966. 6. 25 දින ශ්‍රී ලංකා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ ඉතිහාස සංගමය මගින් "ඉතිහාසයෙන් පෙනෙන භික්ෂුව හා සමාජය" යන මැයෙන් පවත්වන ලද සාකච්ඡා සම්මේලනයේ මුද්‍රිත වාර්තාවෙහි සඳහන් වන පරිදි එහි දී අදහස් පළකළ **ආචාර්ය පී. ඩී. කන්නන්ගර මහතා** රාජකාරික්‍රමය පිළිබඳව පවසන ලද අදහස[1] මෙහි දී ගෙනහැර දක්වමු. **"යුරෝපීය ජාතීන් පැමිණීමට කලින් මේ රටේ තිබ්බච ආර්ථික සාමාජික රටාව ගැන වචනයක් කීම අපේ මාතෘකාවට වැදගත් යයි සලකනවා. මේ ආර්ථික සාමාජික රටාව විස්තර කිරීමට** <u>වැඩවසම් ක්‍රමය</u> **යන ශාස්ත්‍රීය වචනය යොදාගන්නට පුළුවන්. මේ ක්‍රමය අනුව සමාජයේ නායකත්වය හිමි වී තිබුණේ රජ්ජුරුවන්ටයි. රට පාලනය කරන ලද්දේ රදළ අධිපති වරුන්ගේ මාර්ගයෙන්. මේ අයට සහාය වීමට නොයෙක් තරාතිරම් වල මුදලි මුහන්දිරම් වරුන් සහ වෙනත් මුලාදෑනීන් සිටියා. වැඩවසම් ක්‍රමය පිළිගත් න්‍යායය අනුව සියලු ඉඩම්වල අයිතිය තිබුණේ රජ්ජුරුවන්ටයි. රජයට කරන සේවය වෙනුවට මේ ඉඩම් කොටස් කර වෙනත් අයට පවරා දී තිබුණා. රදළ අධිපතීන්ට පවරන ලද ඉඩම් නින්දගම් හැටියට හඳුන්වන ලද අතර කෙළින්ම රජුගේ ප්‍රයෝජනයට තබාගත් ඉඩම් වලට කිව්වෙ ගබඩා ගම් කියලයි. විහාරවල හෝ දේවාලවල**

---

[1] "ඉතිහාසයෙන් පෙනෙන භික්ෂුව හා සමාජය" ඉතිහාස සංගමයේ ප්‍රකාශනය, 70 පිට,ශ්‍රී ලංකා විද්‍යාලංකාර විශවවිද්‍යාලය, 1966.

**ප්‍රයෝජනය සඳහා පවරන ලද ගම්බිම් විහාරගම් හෝ දේවාලගම් නමින් වෙන් වී තිබුණා. මෙම ගම්බිම්වල කුල අනුව බෙදී ගිය කර්මාන්තවල සහ ගොවිතැනෙහි යෙදුන ජනකොටස් වාසය කළා. සමස්තයක් වශයෙන් ගත්තාම මෙම සමාජයේ විවිධ කොටස් අන්‍යෝන්‍ය සේවා සම්බන්ධයකින් එකිනෙකාට බැඳී සිටියා. නිදසුනක් හැටියට තමන් භුක්තිවිඳින ගම්බිම් වෙනුවට රජුට යම් යම් සේවාවන් කිරීමට රදළ අධිපතීන් බැඳී සිටියා. එමෙන්ම නින්දගම්වල වාසය කළ සාමාන්‍ය අය තමන් භුක්තිවිඳ බිම්කොටස් වෙනුවට රදළ අධිපතීන්ට සේවය කිරීමට බැඳී සිටියා. විහාරගම් දේවාලගම් ද මේ සේවා ක්‍රමයට සම්බන්ධ වී තිබුණ බව පෘතුගීසි මූලාශ්‍ර පරීක්ෂා කරන විට පෙනී යනවා."**

මෙහි දී අදහස් පළකරන **මහාචාර්ය, තෙන්නකෝන් විමලානන්ද මහතා** වැඩවසම් ක්‍රමය හැටියට රාජකාරි ක්‍රමය හැඳින්වීම ගැන එකඟ නො වෙමින් පවසන කරුණ මෙහි දී සැලකිල්ලට ගතයුතු ය.. **"ආචාර්ය කන්නන්ගර මහත්මයාගේ දේශනයේ දී ප්‍රශ්න කීපයක්ම ඉදිරිපත් කළා. සමහර තැනක දී 'වැඩවසම් ක්‍රමය' කියල වචනයකුත් යෙදුව. මේ වචනය පැරණි පොත්වල යොදල තියෙන්නෙ එහෙම නොවෙයි. 'රාජකාරි ක්‍රමය' කියලයි. මම හිතන්නෙ කෝකටත් පැරණි වචනයම යොදන එක හොඳයි කියල. මේ වැඩවසම් ක්‍රමය කියන වචනය යොදන්ඩ පටන්ගත්තෙ පසුගිය මැතිවරණ කාලෙදීය කියල මම හිතනව."**[1] යනු ඒ ප්‍රකාශයයි.

වැඩවසම් ක්‍රමය කියන පාරිභාෂික වචනය යොදන්නේ Feudalism යන ඉංග්‍රීසි වචනයට අර්ථය හැටියට ය. එහි අදහස් වශයෙන් දක්වන්නේ "මධ්‍යකාලීන යුරෝපයේ හමුදා සේවයට හිලව් වශයෙන් රජුගෙන් වංශවතුන් ලබා ගන්නා ඉඩම් වංශවතුන්ගෙන් ලබා ගෙන පහළ සමාජ කණ්ඩායම් වංශවතුන්ට වැඩ කළ ප්‍රමුඛ සමාජක්‍රමය"[2] යනුවෙනි. නුවර

---

[1] එම, 79 පිට.

[2] "The dominant social system in medieval Europe, in which the nobility held lands from the Crown in exchange for military service, and lower orders of society held lands from and worked for the nobles."
C. O. Ref: Dictionary, p. 302.

යුගය වන විට මේවන් ස්වරූපයක් තිබුණා වියහැකි ය. එහෙත් හෙළදිව අනුරාධපුර සමයේ පටන් ක්‍රියාත්මක වුනේ එවන් වැඩවසම් ක්‍රමයක් නො වේ. මේ සමග සැලකියයුතු අනෙක් කරුණක් නම්, මෙරට සමාජයේ රදළ පැලැන්තියක් පිළිබඳව කථා කෙරෙන්නේ මෑත ඉතිහාසයේ ය. පැරණි ඉතිහාසයෙහි නුවර යුගයේ බඳු රදළයින් ගැන අසන්නට නැත. පැරණි යුගයේ රදොලන් යනුවෙන් රාජ්‍ය නිළධාරීන් හඳුන්වන ලද බව යට සඳහන් කළෙමු. ඒ රදොලන් යන වචනය  පසු කල රදළ යනුවෙන් පරිණාමය වී ඇති බව වියත් මතයයි.

මෙහි දී රජමාලිගය ගැනත් යමක් වටහා ගතයුතුව තිබේ. පැරණි රජදරුවන්ගේ මාලිගා ලොකු ගොඩනැගිලි නො වේ. අනුරාධපුර පොළොන්නරු නගර නටබුන් ඇසුරින් මේ කරුණු දකගත හැකියි. එහි ගල් ගඩොල් භාවිතයෙන් ස්ථිර ලෙස හදන්නේ අත්තිවාරම පමණි. බිත්ති ගොඩනගන්නේ මැටියෙනි. අන්තඃපුර ද නැත. රජතුමාට සියදහස් ගණන් වරඟනන් බිසෝවරුන් සිටියේ ද නැත. විශාල යුද හමුදා සිරගෙවල් ද නැත. රජතුමා කළේ රජකුලයට අයත් මෙහෙවරයි. අනුරාධපුර යුගය අරගත්තොත් රජතුමාගෙ මාලිගය තියෙන්නෙත් මහමෙව්නා උයනෙ ම යි. මහාවිහාරය තමයි, රජුන්ට අනුශාසනා කරන්නේ. ධර්මානුකූල සීමාවන් ඉක්මවන්න රජතුමාට බැහැ. මහසෙන් රජතුමා වගේ ඇතැම් විට සීමාව පන්නන අය ඇති වෙන්න පුළුවන. මහසෙන් රජු නම් මේඝවර්ණාභය ඇමතියාගේ ක්‍රියාමාර්ගය නිසා නිවැරදි විය.

එහෙත් ක්‍රිඃ වඃ 480 රජ වූ කාශ්‍යප රජතුමා සීගිරිය රාජධානිය කරගත්තේ අනුරාධපුරයේ සිටීමට බිය වූ නිසයි. කාශ්‍යප රජුගේ පියා ධාතුසේන රජු ය. ඔහු පරසතුරු ආක්‍රමණ මැඩ රට එක්සේසත් කළ රජකෙනෙකි. කලාවැව ආදී වැව් 18 ක් කරවා කෘෂි කර්මාන්තයට අනුග්‍රහ කළේ ය. ආරෝග්‍යශාලා පිහිටුවා වැසියාගේ සෞඛ්‍යය ආරක්ෂා කළේ ය. මහාවංසය රචනා කළ මහානාම හිමි ධාතුසේන රජුගේ මාමා කෙනෙකි. මහසෙන් රජුගේ බෑනා කෙනෙකු රජු සමග අමනාපයක් ඇති කරගත්තේ ය. මහසෙන් රජුගේ පුතකු වන කාෂ්‍යප සමග එක් වී රජු සිර කළේ ය. රජු සිර කළ නිසා මුගලන් කුමරු දඹදිවට පලාගියේ ය.  රජු මරා දැමුවේ භිත්තියක තබා මැටිගැසීමෙනි. රටට මහත් මෙහෙයක් කළ ධාතුසේන රජු මරා දැමීම ගැන

කාශ්‍යප කෙරෙහි රටවැසියා බෙහෙවින් කළකිරුණි. මුගලන් කුමරුට බිය වූ නිසාත් ජනතා අප්‍රසාදයත් නිසා අනුරාධපුරයෙහි වාසය නො කොට කාශ්‍යප රජු සීගිරිය රාජධානිය කරගත්තේ ය. මහාවිහාරයේ අනුශාසකත්වය අනුව කටයුතු කිරීමෙන් සීගිරි කාශ්‍යප දුරස් විය.

පරසතුරු ආක්‍රමණ නිසාත් අභ්‍යන්තර ගැටලු ආරවුල් නිසාත් වරින් වර ආර්ථික වශයෙන් ආගමික වශයෙන් පිරිහීම් ඇති වුණ ද, රටවැසියා කෘෂි ආර්ථිකය තුළ ආරක්ෂා වූ බව පෙනේ. මාඝගේ ආක්‍රමණය වැනි සමය වල වැව් පද්ධතිය හා වෙහෙර විහාර වල්බිහි වූ අවස්ථා ද ඇත. මූලික වශයෙන් රටේ රාජ්‍යත්වයෙහි වගකීම වූයේ රටවැසියාත්, වැව් පද්ධතියත්, බෞද්ධ සිද්ධස්ථානත් ආරක්ෂා කිරීමයි. ඒ සඳහා රාජ්‍යත්වයේ දැක්ම වූයේ **අස්ථාන ආයෝජනයෙනුත්, අයෝග්‍ය සංග්‍රහයෙනුත්, සාවද්‍ය පරිභෝජනයෙනුත්** [1] තොර වීමයි. මහාවංසය පස්වෙනි අග්බෝ රජුගේ රාජ්‍යකාලය පිළිබඳව සඳහන් කරන විට යට කී කරුණ දක්වා ඇති නමුත් සමස්තයක් වශයෙන් ලක්දිව පැරණි රජවරුන්ගේ රාජ්‍යතාන්ත්‍රික ආකල්පය ඉන් කියැවෙන බව සැලකිය හැකි ය.

[1] අට්ඨාන විනියොගොපි සඞ්ගහො වා විරූපකො,
සාවජ්ජො පරිභොගො වා තස්ස නාහොසි සබ්බසො.
මහාවංස, 46 පරිච්ඡේදය, 273 පිට, බුද්ධදත්ත සංස්:

# 07

## පරසතුරු ආක්‍රමණ.

ලක්දිව දකුණු ඉන්දීය ආක්‍රමණ වලට වරින් වර ගොදුරු වූ බව අපි දනිමු. ඒ ආක්‍රමණ සිදු වූයේ දකුණු ඉන්දීය බලවතුන්ට මෙරට ස්වාධීනත්වය තර්ජනයක් සේ පෙනුණ නිසාත් ධනසම්පත් නිසාත් පෙරපර දෙදිග වැදගත් මධ්‍යස්ථානයක පිහිටා තිබීම නිසාත් වෙළඳ මධ්‍යස්ථානයක් හැටියට වැදගත් වූ නිසාත් ය. ඔවුන් වරින් වර රාජ්‍යය පැහැර ගෙන පාලනය කළ ද, ඔවුන්ගේ බලය මලය දේශයට හෝ රෝහණයට ව්‍යාප්ත වන්නට අවකාශ නො ලැබිණ. එම ප්‍රදේශ රටේ ස්වාධීනත්වය උදෙසා සටන් මෙහෙයූ වූ දේශප්‍රේමීන්ගේ රක්ෂාස්ථාන වූ බැවිනි. 13 වැනි සියවසේ දී ලක්දිව රජපරපුරේ දුර්වල කාලසීමාවක් විය. සොළීන්ට පහසුවෙන් රාජ්‍යය අත්පත් කරගැනීමට හැකි වූ අවස්ථාවකි. පරාක්‍රම නමැති පාණ්ඩි රජු පළවා හැර ක්‍රිː වː 1213 දී කාලිංගමාඝ පොළොන්නරුවට කඩා වැදී පාණ්ඩි රජුගේ ඇස් උගුල්ලා ඔහු සතු ධනය පැහැර ගත්තේ ය. වස්තු ලෝභයෙන් මැඩුන ඔහු විහාරාරාම කොල්ල කෑවේ ය. පෙර වූ සොළී ආක්‍රමණ වලින් සිදුවූවාට වඩා හානියක් සිදු විය. ජනාකීර්ණව තිබුණ නුවරකලාවිය ජනශූන්‍ය විය. භික්ෂූන් වහන්සේලා ආරාම අතහැර රුහුණු මායා දෙරටට වැඩියහ. රාජකීයයෝ ද පලාගියහ. ගම් නගර වල්බිහි විය. මේ ව්‍යසනය කෙළවර වුණේ දෙවන පරාක්‍රමබාහු රජතුමා සතුරන් පළවා හැරීමෙනි. රජරට වාරිමාර්ග පද්ධතිය නඩත්තු නො කිරීමේ හේතුවෙන් විනාශ වී ගියේ ය. මෙබඳු ආක්‍රමණික බාධක කොතෙක් ඇති වුණත් රටේ පැවති වාරි කර්මාන්තය හා කෘෂිකර්මය පදනම් කරගත් ස්වයම්පෝෂණ ආර්ථිකය වැටෙමින් නැගිටිමින් කෙසේ හෝ ආරක්ෂා විය.

**යටත්විජිත යුගයː**

1505 සිට බටහිර ජාතීන්ගේ ආක්‍රමණ වලට මුල පිරුනේ පෘතුගීසීන්ගෙනි. 1640 සිට 1796 දක්වා ලන්දේසීන්ට රට ගොදුරුව පැවති කාලයයි. 1796 සිට 1948 ඉංග්‍රීසීන්ට රට ගොදුරුව පැවති කාලයයි. මොවුන් ලංකාවට ඇදී ආවේ මෙරට

කුළු බඩු වලට තිබූ ප්‍රසිද්ධිය නිසා ය. රටේ මුහුදුබඩ පලාත් වල පාලන බලය අල්ලාගත් පෘතුගීසීන්ගේ ප්‍රධාන අරමුණ වූයේ රටේ ආර්ථික සාරය පෘතුගාලයට යැවීමත් රෝමානු කතෝලික ආගම ප්‍රචාරය කිරීමත් ය. මුහුදුබඩ පලාත් ජනතාවගේ කෘෂිකාර්මික ජීවන වැඩපිළිවෙළට පෘතුගීසි පාලනයෙන් කිසිදු සහයෝගයක් නො දැක්වුණි. ඔවුන්ට මෙරට ස්ත්‍රීන් පුරුෂයින් ළමයින් අතිශය නිර්දය ලෙස ඝාතනය කිරීම විනෝදාංශයක් විය. දැඩි බදු අයකිරීම් ද, ගොවීන්ගේ වගාවන් අයුතු ලෙස අත්පත් කරගැනීමෙන් ජනතාව පීඩනයට පත්විය.[1]

පෘතුගීසීන්ගේ බලය පහ කරමින් ලන්දේසීන් මුහුදුබඩ බලය අල්ලාගත්තේ 1658 දී ය. ලන්දේසි ආණ්ඩුව ආදායම වැඩිකර ගැනීමේ බලාපොරොත්තුවෙන් කෘෂිකාර්මික කටයුතු කෙරෙහි උනන්දුවක් දැක්වී ය. වගා කළහැකි ඉඩම් සොයා බලා කෘෂිකර්මය උදෙසා යොදාගත් අතර ලන්දේසීන් යටතේ ඒවායෙහි වැඩ කිරීමට මෙරට ගොවීන් වැඩි කැමැත්තක් නො දැක් වූ බැවින් ඉන්දියාවෙන් වහලුන් ගෙන්වාගෙන ගොවිතැන් කටයුතු වල යොදවන ලදි. වාරිමාර්ග සකස් කිරීමට ලන්දේසීන් උනන්දු වූ අතර මීගමු ඇල ඉන් ප්‍රධාන එකක් විය. එයින් සිදු වූයේ පැරණි සිංහලයින්ගේ ධාන්‍යාගාරයක් බඳු මුතුරාජ වෙල කරදිය ගලා ඒම නිසා වී වගාවට නො සුදුසු වීමයි.

යුදගැටුම් සහිතව නමුත් පෘතුගීසි ලන්දේසි පාලන සමයයන්හි මෙරට සාම්ප්‍රදායික ආර්ථික ව්‍යුහය වෙනස් වූයේ මද වශයෙනි. ඔවුන්ගේ බලය පැතුරුනේ මුහුදුබඩ පලාත් වල පමණක් වීම එයට හේතුවයි. 1739 දී සිංහල රාජවංශයේ අන්තිම සිංහල රජු වන ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ අභාවයට පත් වූ අතර එතැන්සිට ඇරඹෙන්නේ නායක්කර් වංශිකයින්ගේ කාලපරිච්ඡේදයයි. 1796 දී ලන්දේසීන් ද පලවා හැර මුහුදුබඩ පළාත් අත්පත් කරගනු ලැබුයේ ඉංග්‍රිසි ජාතිකයින් විසිනි. අන්තිම නායක්කර් රජු වූ කෲර පාලකයකු වන ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කෲරත්වය නිසා ම රදළයින්ටත් සාමාන්‍ය ජනතාවටත් ඔහුගේ නායකත්වය එපා වී තිබුණි. ඔවුන්ගේ ද සහය ඇතිව ඉංග්‍රීසීන් විසින් පලාගිය රජු අල්ලාගන්නා ලද්දේ

---

[1] වැඩි විස්තර සඳහා කියවන්න: ගුණපාල මලලසේකර, ලංකා පාලි සාහිත්‍යය, **අන්ධකාර යුගය**, පරි: 196 පිටුවේ සිට, 1965.

1815 පෙබ: 18 වෙනි දා ය. සිරභාරයේ සිටි රජු 1816 ජන: 24 දින මදුරාසියට පිටුවහල් කෙරිණ. ඉංග්‍රීසින්ට මුලු රටේ ම ආධිපත්‍යය හිමි වූයේ උඩරට ගිවිසුම අත්සන් කළ 1815 මාර්තු දෙවන දින දී ය. විදේශකයන් පිළිබඳව විශ්වාසයක් නො තැබියහැකි බව සිංහලයින් දන සිටිය ද, ජෝන් ඩොයිලි විසින් සකසන ලද උඩරට ගිවිසුම් පත්‍රයට බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයාත් අදිකාරම් වරුන් හා නිළමේ වරුන් අත්සන් තැබීමෙන් ඉංග්‍රිසින්ට රට බාරදෙන ලදි.

ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම කෙසේ වෙතත් ඉංග්‍රීසින් කටයුතු කළේ සිංහලයින්ගේ ස්වාධීනත්‍වය අත්සන් කළ ගිවිසුමෙන් ම නිම වූවක් හැටියට සලකාගෙන ය. ඉංග්‍රීසින්ට මෙරට පැවැති ස්වයම්පෝෂිත ආර්ථික ක්‍රමයෙන් ප්‍රයෝජනයක් නැත. ඔවුන්ට අවශ්‍ය කළේ වෙළඳ ආර්ථිකයකි. ඔවුන්ට අවශ්‍ය ධනෝපායනය සඳහා වැදගත් වන්නේ එයයි. මෙරට පාලනය ගෙනයාම සඳහා යන විදමට එහා ගිය ආදායමක් ඔවුන්ට අවශ්‍ය විය. එනිසා ඔවුන්ගේ අවධානය යොමු වූනේ වතුවගා ව්‍යාපාරය වෙතට ය. සාම්ප්‍රදායික ශිල්පශ්‍රේණි හෙවත් කුල ක්‍රමය මත සැකසුන ස්වයම්පෝෂිත ආර්ථිකය ඉංග්‍රීසින්ගේ අරමුණු කරා යන්නට බාධකයක් විය. ඔවුන් මෙරට දෙස බැලුයේ එංගලන්තයේ සමාජ ආර්ථික දේශපාලන පරිසරය තුළිනි. මෙරට පැවැති රාජකාරි ක්‍රමය ඔවුන්ට පෙනුනේ මිනිසාගේ නිදහස නැතිකරන්නක් හැටියට ය. රටක දියුණුව රඳා පවතින්නේ ව්‍යාපාර හා අනෙකුත් ධනෝපායන මාර්ග සඳහා පුද්ගලයාට අවකාශ ඇති පමණට ය, යනු ඔවුන්ගේ කල්පනාව විය. යටත්විජිත පිළිබඳව ඔවුන්ගේ අදහස වූයේ බ්‍රිතාන්‍ය ව්‍යවසායිකයින්ට අඩු ආයෝජනයකින් වැඩි ප්‍රතිලාභයක් ලැබිය හැකි, නිෂ්පාදක අමුද්‍රව්‍ය පහසුවෙන් ලබාගත හැකි, ප්‍රදේශ වියයුතු බවයි. ඔවුන්ගේ නිෂ්පාදනයන්ට වෙළඳපලවල් වියයුතු බවයි. කොටින් ම කියතොත් යටත්විජිත යනු ඔවුන්ගේ මව්රට පෝෂණය කරන ප්‍රදේශයන් වියයුතු බවයි.

ඉංග්‍රීසි ආධිපත්‍යය යටතේ රටේ මහාමාර්ග, පාලම්, බෝක්කු, දුම්රිය මාර්ග දියුණු කෙරිණ. කෝපිවගාව, තේවගාව, රබර්වගාව, පොල්වගාව කෙරෙහි අවධානය යොමු කළේ ය. පාසල් ආරම්භ කිරීමෙන් අධ්‍යාපනයට අවකාශ උදා කෙරිණ.. මේවා දියුණුවේ අංගෝපංග සේ බැලූ බැල්මට ම පෙනේ. අද

වුනත් බොහෝ දෙනෙක් සිතන්නේ අපේ රටට මේ දේවල් ලැබුණේ යටත්විජිත පාලන සමයට පිං සිද්ධ වෙන්න නේද, යනුවෙනුයි. එහෙත් ඇතුළතින් සිදු වුනේ කෘෂිකර්මය, ජනසංස්කෘතිය, ආගමිකත්‍වය පිළිබඳ අපේ උරුමයන් කා වැදී තිබුණ මුල් උදුරා දැමීමයි. සියවස් ගණනක් රට බතින් පෝෂණය කිරීමට උරදුන් අභිමානවත් වැව් මැදින් මහාමාර්ග ඉදි කිරීමෙන් පෙනෙන්නේ රටවැසියාට කුමක් වුවත් ඉංග්‍රීසින්ගේ ආර්ථික පරමාර්ථ සපුරා ගැනීම එක ම අරමුණ වූ බවයි. මේ ක්‍රියාදාමය පිළිබඳව අපට පැහැදිලි වෙන්නට නම් අප තේරුම් ගතයුතු අපේ පැරණි රජදරුවන් හා මුතුන්මිත්තන් සකසා ගත් වැඩ පිළිවෙළ යම් තරමකට අපි සාකච්ඡා කළෙමු.

**කොල්බෲක් කොමිසමේ ආකල්පයः**

ඉංග්‍රීසින්ගේ මේ අපේක්ෂාවන් 1833 සිට මුදුන් පැමිණෙන්ට වුනේ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම් වශයෙනි. ඔවුන්ගේ මිෂනාරි පාසල් වල මේ ක්‍රියාවලිය ඉගැන්වූයේ ලංකාවත් එහි වැසියාත් මධ්‍යකාලීන යුගයට බැඳ දමා තිබුණ යදම් බිඳහෙලා නව යුගයකට පාතැබීමක් හැටියටයි. කෝලබෲක් කෙරෙහි බල පෑවේ ලංකාවේ තිබුණ ස්වභාවය නොව එංගලන්තයේ සමාජ ආර්ථික දේශපාලන ආකල්ප මෙන් ම 19 වැනි සියවසේ උගත් ඉංග්‍රීසීන් අතර විශාල ආන්දෝලනයක් ඇති කළ ඇඩම් ස්මිත්, ජෙරමි බෙන්තම් වැන්නවුන්ගේ අදහස් ය. රටක දියුණුව රඳා පවතින්නේ ව්‍යාපාර, වෙළඳාම හා වෙනත් ධනෝපායන මාර්ග පිණිස පුද්ගලික නිදහස පවතින්නේ නම් පමණක් බව ඔවුන්ගේ අදහසයි.

1. ඒ ආකල්ප තුළින් දකින කෝල්බෲක් රජු සතු වූ වෙළඳ ඒකාධිකාරය නිදහස් කළේ ය. එමගින් ප්‍රාග්ධනය යෙදවිය හැකි අයකුට ආර්ථික කටයුතු වල යෙදීමට අවකාශ විවෘත්ත විය.
2. **රාජකාරි ක්‍රමය හා ගම්සභාව** අහෝසි කළේ ය. එමගින් කුලය මත තිබූ මිනිස් ශ්‍රම සහභාගිත්‍වය ඉවත් කෙරුණි.
3. මුඩුබිම් පනතින් නීත්‍යානුකූල ලෙස හිමිකම් ඔප්පු කිරීමට නො හැකි උඩරට ජනතාව සතු ඉඩම් රජයට

පවරාගෙන යුරෝපීය වැවිලි කරුවන්ට අඩු මුදලට ලබා දීම තුළින් මහජනයාට සිය පාරම්පරික බිම් අහිමි විය.

බ්‍රිතාන්‍ය පාලනයේ මුල්කාලේ කුරුඳු ප්‍රධාන වැවිල්ලක් වුවත් ඊට ආදායම් අඩු නිසා කෝපි වගාව ඇරඹුණි. මුල දී එමගින් විශාල ආදායම් ලැබූ බැවින් ඒ සඳහා බෙහෙවින් උනන්දු වූහ. ඒ උනන්දුව කොතරම් ද යත් එය 'කොපි උමතුව' යනුවෙන් හඳුන්වන ලද බව අසන්නට ලැබේ. එහෙත් පසුව එය පුස් රෝගයකට ගොදුරු වීම නිසා තේ වගාව ඇරඹුනේ 1873 දී ය. ඊට යොදා ගත්තේ රටේ ජල පෝෂක ප්‍රදේශය වූ එතෙක් නො ඉඳුල්ව පැවති මධ්‍ය කඳුකරයයි. පහතරට රබර් වගාව ඇරඹුණේ 1876 දී ය. මුහුදුබඩ හා වයඹ පලාත් වල පොල් වගා කෙරුණි. බ්‍රිතාන්‍යයින් හා මේ වතුවගාවට සම්බන්ධ වුණ දේශීය ව්‍යාපාරිකයෝ ක්‍රමයෙන් ධනවත් වූහ. ඔවුන් සමාජ ප්‍රභූත්වයක් ඇති කරගත්තේ බ්‍රිතාන්‍ය පාලනය හා සම්බන්ධතා ගොඩනගා ගැනීමෙනි. මේ ආකාරයෙන් නව ධනපති පැලැන්තියක් බිහිවුණ ද ගොවි ජනතාවට යන එන මං නැති විය.

කෝල්බෲක් එන්නට කලින් ඉංග්‍රීසීන් මහාමාර්ග තැනීමට මහජනයාගේ ශ්‍රමය ලබාගත්තේ පෙර රජදරුවන් ශ්‍රමය ලබාගත් ආකාරයට නො වේ. ඊට වඩා දසගුණයකිනි. කුඹුරේ හේනේ ගොවිතැන්, ශස්‍ය නෙළීම් කාලය කියා නිදහසක් නො වී ය. ඉතා දුරබැහැර සේවයට කැඳවීම් ද විය. අවුරුදු උත්සව සමයේ ද රාජකාරියට කැඳවී ය. ඉතා දුෂ්කර කාර්යයහි ද යෙදවී ය. ඇතැම් විට මාර්ග ඉදිකිරීමේ දී රාජකාරි සේවයට කැඳවන අයට පොළඟුන් දෂ්ට කළවිට මේජර් ස්කිනර්ගේ ප්‍රතිකාරය වූයේ එතැන තුවාල කර වෙඩි බෙහෙත් දමා ගිනිකූරක් දල්වා ගිනි තැබීම බව ඔහුගේ **ලංකාවේ පනස් වසක්** කෘතියේ දක්වා ඇත.[1] කෝල්බෲක් කොමිසමට සාක්ෂි දුන් අයෙක් පැවසුවේ වර්ෂාවට නිතර සේදී යන පාරවල් අළුත් වැඩියා කිරීමට වඩා පාරවලට ඉහළින් වහලයක් ගැසීම යෝග්‍ය බවයි. මේ පාරවල් ප්‍රයෝජනවත් වූයේ රටවැසියාට නොව යුරෝපීයයන්ගේ වතු වගාව සඳහාත් හමුදා කටයුතු සඳහාත් ය. ඉංග්‍රීසීන් යටතේ නම් රජකාරි සේවය වැසියාට අසහනයක් ම විය.

---

[1] **ලංකාවේ පනස් වසක්**, මේජර් ස්කිනර්, ඇහැලේපොල එච්. ඇම්. සොමරත්න ගේ පරිවර්තනය, 55 පිට, ගුණසේන,

**සමාජ පරිවර්තනයː**

මේ කරුණුත් සලකා කෝල්බෲක් ප්‍රතිසංස්කරණ ඉදිරිපත් විය. කෙසේ නමුත් මෙහි ප්‍රතිඵල වශයෙන් යුරෝපීයයන්ට හා ස්වදේශකයන්ට වතුවගා ආරම්භකිරීමට හැකි විය. රටවැසියාගේ දියුණුව බොහෝ විට රඳාපවතින වී වගාවට ද ජලසම්පාදන පහසු කම් ඇතිකළයුතු බව කොමිසම කීවත් ඉංග්‍රීසි රජයේ මූලික අවශ්‍යතාව වූයේ ඔවුන්ගේ මුදල් අවශ්‍යතා සපුරා ගැනීමත් ආර්ථික වශයෙනුත්, සාමාජයීය වශයෙනුත්, දේශපාලන වශයෙනුත් එවකට යුරෝපීය සමාජය පිළිගත් ආකෘතියට අනුකූල ලංකාවක් බිහි කිරීමයි.

මේ ගම්සභාව අවලංගු කර දැමීම, රාජකාරි ක්‍රමය අහෝසි කිරීම, ඔප්පු පිට ඉඩම් පැවරීම යන ක්‍රියාමාර්ග නිසා භූගෝලීය පරිසරයත් රටවැසියාත් අතර සම්බන්ධය බිඳී ගියේ ය. පාරම්පරික ජීවනරටාව බිඳවැටී දුගියන් බවට පත් විය. ඉඩම් මිල නො කළ, ශ්‍රමය මිළ නො කළ පැරණි සමාජයේ අද දක්නට ලැබෙණ රැකියා විරහිත බව නො වී ය. කාටත් පදිංචිය හා වෘත්තීය ස්ථිර ය. පැරණි සමාජයේ ධනවත් හා දුප්පත් කියා භේදයක් නො වේ. යුගදිවි අරඹන නව යුවලකට වැඩිහිටි ආශීර්වාදය සහිතව ගම්මැද්දේ නව නිවසක් මැටියෙන් තනා ගැනීමට පිළිවන. අතීතයේ පටන් මේ මෑතක් වන තුරු ම ලක් වැසියා ජීවත් වූයේ මැටියෙන් තැනූ ගෙවල් වල ය. 1895 ලංකාවට පැමිණි ජර්මන් ජාතික විල්හෙල්ම් ගෛගර් පඬිතුමා මේ ගෙවල් පිළිබඳව පවසන්නේ "එය මෙරට සාමාන්‍ය වැසියන්ගේ ස්වභාවය විනා දුප්පත් කමක් හෝ කිසිදු අගහිගකමක් හෝ නො වේ."[1] යනුවෙනි. පුළුස්සන ලද ගඩොල් නැවත පසට මුසු නො වන බැවින් හෙළයා ගඩොල් භාවිතා කළේ අත්‍යවශ්‍ය ගොඩනැගිල්ලකට පමණි. කලුගල් භාවිතා කළේ ගල්වලවල් ඇති වන ආකාරයට නො වේ.

වතු ආර්ථිකය දියුණු වීමත් සමග ස්වදේශීය ධනපති පැලැන්තියක් ඇති විය. වතු ආර්ථිකය නිසා ඉඩම් වලට වෙළඳ වටිනාකමක් ලැබී ය. වැවිලි කර්මාන්තයෙහි ලිපිකරුවන් කොන්ත්‍රාත් කරුවන් වැනි අය නිසා මධ්‍යම පන්තියක් ඇති විය. සුළු වැටුපකට වතුවල වැඩ කරන අය කම්කරුවන් බවට පත්

---

[1] ගෛගර් දුටු ලංකාව, 143 පිට, සුදන්තක පී විජේතුං පරිවර්තනය.

විය. මේ වන තුරු ලංකාවේ සිටියේ කම්කරුවන් නොව ශ්‍රමය අභිමානයට කරුණක් බවට පත් කරගෙන සිටි ජනතාවකි. ශ්‍රම හුවමාරුවෙන් කටයුතු කළ සාම්ප්‍රදායික රටවැසියාට ශ්‍රමය මුදලට විකුණන ක්‍රමය හුරු නැත. වතුවගා වල කම්කරුවන් වීමට සාමාන්‍ය ජනතාව තුළ කැමැත්තක් නො වී ය. දකුණු ඉන්දියාවෙන් කම්කරුවන් ගෙනාවේ ඒ නිසා ය.

පොදු ජනතාවගේ කෘෂිකර්මයට ඉංග්‍රීසි රජයෙන් කිසිදු සහයෝගයක් නො වී ය. වතු වලින් මෙන් ලොකු ආදායම් ඉපයීමට නො හැකි බැවිනි. පොදු ජනතාව හේන් ගොවිතැන් කළ ලඳු කැලෑව ද වතු වලට ම යට විය. වාරිමාර්ග හා වැව් වල්බිහි වී ගියේ ය. විශාල වැව් අබලන් තත්තවයෙහි වූ නිසා සාමාන්‍ය ජනතාව කුඩා වැව් ඇසුරු කරගෙන ජීවනෝපාය පැවැත්වූහ. පොදුජන විරෝධතාවන් (කැරලි) ඇති වීමට ඇති ඉඩකඩ සළකා 1855 සිට වෝඩ් ආණ්ඩුකාරයා වැව් ප්‍රතිසංස්කරණයට උනන්දුවක් දක්වීය. විලියම් ග්‍රැගරි, වෙස්ට් රිජ්වේ වැනි ආණ්ඩුකාරවරුන් දේශිය කෘෂිකර්මාන්තය නගා සිටුවන්නට කටයුතු කර ඇත. පැරණි ගම්සභා ක්‍රමය නැවත ඇතිකරන්නට ද වියලි කලාපය ජනාවාස කරන්නට ද උනන්දුවක් දක්වූහ. එසේ නමුත් මුදල් භාවිතයටත් විදේශ භාණ්ඩ වෙළඳ පලටත් ඇබ්බැහි වීම නිසා ස්වයම්පෝෂිත ආර්ථික ආකල්පය බිඳවැටෙන්නට විය. ක්‍රමයෙන් මහාමාර්ග දියුණු වීම, දුම්රිය මාර්ග පද්ධතියක් ඇති වීම, වෙළඳාම කේන්ද්‍ර කරගෙන නාගරික පරිසරය සකස් වීම ආදිය නිසා ජනජීවිතය බෙහෙවින් පරිවර්තනයට ලක් විය.

**ගම්සභාව හා අධිකරණ කටයුතු:**

ගම්සභාව ගැන ස්කිනර් බොහෝ කරුණ පවසා ඇත. මෙය ආදි කාලේ සිට පැවත ආ ආයතනයකි. වැඩිහිටියන් තුන් දෙනකුගෙන් හෝ පස්දෙනකුගෙන් සැදුම් ලත් ගම්සභාව තෝරා ගන්නේ ගම්වැසියන් ය. රැස්වන්නේ ගස් සෙවනක් යට ය. අවවාදයෙන් හා සමාදානයෙන් දෙපාර්ශවයේ ම කැමැත්ත ඇතිව සුළු අඩ දබර සමථයකට පත් කිරීම සඳහාත් ගමේ කටයුතු සංවිධානය කරගැනීම සඳහාත් නැවත මේ ගම්සභා පිහිටුවීමෙන් ජනතාවට සෙතක් සැලසේ යයි ස්කිනර් කල්පනා කරයි. ආරවුල් ඒ අවස්ථාවේ ම විසඳන නිසා ගම්සභාව පිළිබඳව

මහජනයාගේ විශ්වාසය ඇති බැවින් හිතාමතා බොරු කීමක් ද සිදු නො වේ. ගම්සභාව නැවත පිහිටුවීමේ අවශ්‍යතාව ස්වදේශීන් විසින් තමා සමග පවසන ලද බව ද මේජර් ස්කිනර් පවසයි. මේ පිළිබඳව ලංකාවේ පනස්වසක් කෘතියේ ඔහු මෙසේ සඳහන් කරයි. "ගම්වාසීන්ගේ ඉල්ලීම පිට පුද්ගලිකව ගම්සභාව පවත්වන බොහෝ ගම්මුලාදෑනීන් ගැන මම දනිමි. තම උසස් අවංක භාවය හා අචපලත්වය නිසා සත්‍ය වශයෙන් රටවාසීන්ගේ ගෞරවාදරයට පාත්‍ර වී සිටින්නකුට ඔහුගේ මුලු කාලය ම වාගේ මේ කාරුණික කටයුත්ත සඳහා කැප කිරීමට සිදු වී තිබේ. ඔහුගේ වලව්ව හැම විට ම අසල් ගම්වලින් පැමිණි මිනිසුන්ගෙන් පිරී පවතියි. මේ මිනිස්සු අප විනිශ්චය ශාලාවන්ට පැමිණීමේ ආදීනව පිළිබඳ භීතියකින් යුක්ත වූවාහූ තම නඩු මේ ගුණවත් මිනිසාට ඉදිරිපත් කිරීමට එකඟ වෙති. ඔහු දෙපක්ෂයේ ම සාක්ෂි වලට කන් දී ඒ පිළිබඳ සාරාංශයක් ඉදිරිපත් කොට තම අදහස හෙවත් විනිශ්චය ප්‍රකාශ කරයි."[1]

යටත්විජිත පාලකයින් අධිකරණ කටයුතු වලින් බලාපොරොත්තු වන්නේ සාමය නොව ආදායමයි. ලක්වැසියා තුළ වූයේ නීති වලට වඩා සම්ප්‍රදාය තුළින් ආරක්ෂා වූ ශික්ෂණයකි. ගම්සභාවෙන් මෙන් ම භික්ෂූන් වහන්සේගෙන් ද ආරවුල් විසඳා ගැනීමට වැසියා කැමැත්තක් දක්වී ය. සම්ප්‍රදායකට බැඳුන ජනතාවක් නීතියේ යටතට ගැනීම යටත්විජිත පාලන ප්‍රතිපත්තිය වී තිබේ. වරක් ඇන්තනී ඔලිපන්ට් අග්‍රවිනිශ්චය කරුවා පැවසූයේ කහලෝගු කාරයන් නිසා ඉංග්‍රීසි උසාවියට නඩු නැති වන බවත්, නීතිඥයන්ගේ සේවය හරිහැටි ලබාගත නො හැකි බවත්, ඒ නිසා ආරවුල් විසඳන භික්ෂූන්ට විරුද්ධව අධිකරණය හමුවේ නඩු පැවරියයුතු බවත් ය. (පියෙවි ඇසින් නීතිය දෙස බැල්මක්, නීතිඥ උභය වීරසිංහ, 1986,ඔක්: 01 දිවයින, බදාදා අතිරේකය)

**සදාචාර පරිහානියඃ**

සාම්ප්‍රදායික කෘෂි ජීවනරටාව අවුල් වී වතු වල කම්කරුවන් බවට ජනතාව පත්වන විට අතමිට කාසිමුදල්

---

1 ලංකාවේ පනස්වසක්., 155 පිට.

ගැවසෙන්නට විය. ඒ සමග බීමත් කමත්, හැම ගණයකට ම අයත් දුසිරිත්ද බහුල විය. මේ පිළිබඳව ස්කිනර් සඳහන් කරන්නේ මෙසේ ය. **"වැසියන්ට අරක්කු බීම ඇබ්බැහි කිරීම පිණිස මුල දී නො මිළයේ බෙදා දීම අවශ්‍ය ය. තැබෑරුම් කාරයෝ මෙයින් මහජනයා අරක්කු බීමට පුරුදු වන බව හොඳින් දනිති. අවුරුදු කීපයකට ඉහත දී සියයට එකකු වත් මත්පැනට පෙළඹවිය නො හැකි ඇතැම් දිස්ත්‍රික්ක වල ගම්වාසීහු දැන් මත්පැනට කොපමණ ඇබ්බැහි වී සිටිත්දැයි යතහොත් දැන් සමහරු තම පැසීගෙන එන අස්වැන්න අරක්කු සඳහා තැබෑරුම් කාරයන්ට උකස් කරන බව මම දනිමි. අති ශිෂ්ට සමාජයන්හි වැජඹෙන්නන් කෙරෙහි බීමත්කම නිසා අනිවාර්යයෙන් පහළ වන විපත් රැස අපට ප්‍රත්‍යක්ෂ ය. එහෙත් දුගී, අශිෂ්ට, නූගත් ස්වදේශිකයාගේ ඉතා වැදගත් ආචාර ශීලය වන තැන්පත්කම (මත් නො වී සිටීම) පැහැර ගන්න ඔබ, ඔහු නො පමාව මනුෂ්‍යප්‍රජාව තුළ පවත්නා හැම දුරාචාරයක ම බිල්ලක් කොට ඉවත ලන්නෙහි ය."**[1]

ඉංග්‍රීසි රජය ගෙනයන වැඩපිළිවෙළ නිසා මෙරට සාමාන්‍ය ජනතාව වැටෙන ප්‍රපාතය ගැන යම් දොම්නසක් ඇති ස්කිනර් පවා දකින්නේ ස්වදේශිකයා දුගී, අශිෂ්ට, නූගත් අයකු හැටියටත්, යුරෝපීයයා අති ශිෂ්ටයකු හැටියටත් ය. අදෝමැයි.

මෙසේ සුරාපානයට ඇබ්බැහි වීම චරිතදූෂණයටත් නඩු කීමේ ආශාව වැඩි වීමටත් හේතු වූ බව ස්කිනර් කියයි. ඉංග්‍රීසි රජයවත් දේශීය විධායකයින්වත් මේ තත්ත්වය කෙරෙහි අවධානය යොමු කළේ ඉතා මද වශයෙනි. ඉංග්‍රීසි රජයට වැදගත් වූයේ අරක්කු රේන්ද වලින් ලැබෙණ ආදායමයි. මොල්ලිගොඩ නිළමේත්, ඔහුගේ විසිඑක් හැවිරිදි තරුණ පුත්‍රයාත් මියගියේ අධික බීමත් කම නිසා බව ස්කිනර් පවසයි. මුහුදුබඩ හා කඳුකර පලාත්වල තත්ත්වය මෙසේ වන විට වතුවගා ව්‍යාප්තිය අඩු උතුරුමැද පලාත් වැසියෝ කෘෂිආර්ථිකයෙන් ම දිවි ගෙවූහ. ඒ නිසා සමාජ දූෂණයට අවස්ථා අඩු විය.

19 වැනි සියවස අගභාගයේ දී අනුරාධපුර කච්චේරියේ මුල් ම ඒජන්තවරයා වන අයිරිෂ් ජාතික ලී ෂින් නමැත්තා

---

[1] ලංකාවේ පනස් වසක්, 142 පිට.

තමාගේ වර්ෂයක සේවා කාලයෙන් පසු ඉදිරිපත් කරන ලද පාලන වාර්තාවෙන් ඒ බව හඳුනාගතහැකි ය.

**"වෙසක් පසළොස්වක දිනයට 20,000 ක පමණ පිරිසක් අනුරාධපුර ඔවුන්ගේ පැරණි ශුද්ධ නගරයට රැස් වූනහ. මෙම කැලෑබද පෙදෙසේ මෙතරම් ජනගහනයක් ඉන්නේදැයි මම මවිත වීමි. මහමෙව්නා උයනේ ගස් යට නතර වී සිටින මොවුන්ගෙන් සමහරක් කච්චේරියේ කොරිඩෝවෙහි ද රෑට නතර වූහ. ඉවු පිහූ හෝ නතර වී සිටින ස්ථාන හොඳින් පිරිසිදු කර අතුගා උදෙන් ම ඔවුහු එතැනින් ඉවත්ව ගියහ. මෙතරම් විශාල ජනකායක් නතර වී උයාගෙන කන ප්‍රදේශය අපවිත්‍ර නො වේ. හැමදෙනා ම තමාගේ යුතුකම් දත්හ. මෙම 20,000 ක් පමණ පිරිස හැසිරවීමට එක ද පොලිස් නිළධාරියෙක් හෝ අවශ්‍ය නො වී ය. මගේ මවිතය දූන වූ කරුණ නම් මේ එකක් වත් නො වේ. ශ්‍රී මහබෝධිය අබියස වූ පිං පෙට්ටියයි. වෙසක් පෝයට ආ වන්දනා කරුවන්ගෙන් කොටසක් පොසොන් පොහොය වනතුරු ද සිටියහ. අවසානයේ දී විවෘත්ත කර බලන විටරුඃ 700/-පමණ මුදලක් එයට එකතු වී තිබිණ. හතර දෙනකුට පහසුවෙන් ම මෙය උසුලාගෙන යා හැකි ය. යාර සියයක් පමණ ගිය විට කැලෑව ආරම්භ වෙයි. නමුත් කිසිවෙක් මෙම අනාරක්ෂිත පිං පෙට්ටියට හානියක් කිරීමට සිතා නැත. යුරෝපයේ නම් කිසිම රටක දී මෙම පිං පෙට්ටිය මෙසේ ආරක්ෂා සහිත වීමට නුපුළුවන."**[1]

මේ පුවතින් පැහැදිලි වන්නේ මින් සියවසකට පෙර සම්ප්‍රදායක් වශයෙන් අප සංස්කෘතිය තුළ මුල්බැස තිබුණ සදාචාරයයි. ස්කිනර්ට වඩා ලී මින් ශිෂ්ටත්‍වය හා අශිෂ්ටත්‍වය අතර වෙනස හඳුනන බව පෙනේ.

**අධ්‍යාපනයඃ**

පැරණි යුගයේ සමාජයට අධ්‍යාපන ක්‍රියාවලියක් නො වී යයි බොහෝ අය සිතති. අප රටේ ශිල්පශ්‍රේණි ක්‍රමයෙන් කළේ යම් පරම්පරාවකට යම් ශිල්පයක් පිළිබඳව ඇති ශිල්පීය ඥානය පරපුරෙන් පරපුරට ගෙන යාමයි. නිපුන ශිල්පීන් රටට දායාද

---

1 "මෙය මා උපුටා ගත්තේ උභය වීරසිංහ නමැති නීතිඥ මහතා **පියවි ඇසින් නීතිය දෙස බැල්මක්** නමින් දිවයින බදාදා අතිරෝකයෙන් ඉදිරිපත් කර තිබූ සංවාද ලිපිපෙළිනි. 1986 ඔක්ඃ බදාදා දිවයින.

වුනේ ඒ ආකාරයෙනි. අපේ පැරණි ඉදිකිරීම්වල සිද්ධස්ථාන වල පිහිටුවා ඇති සෙල්ලිපි අද කියවන්නේ පුරාවිද්‍යාඥයින් ය. එදා එය කියෙව්වේ සාමාන්‍ය ජනතාව ය. අද සීගිරි ගී කියවන්නේ පුරාවිද්‍යාඥයන් ය. එදා සීගිරි ගී ලිවුවේත් කියෙව්වේත් සාමාන්‍ය ජනතාව ය. එදා රටේ ජනතාවට තේරුණ සිංහල ජාතක පොත අද අයට ගැටපද විවරණයක් නැතුව තේරුම් ගන්නට නො හැකි ය. එදාත් රටේ සිටියේ සාක්‍ෂරතාවක් ඇති ජනතාවකි. අපරටේ පැරණි යුගයේ අධ්‍යාපනය ආරම්භ වූයේ පස් හැවිරිදි වියේ දී ය. ඒ කරුණ සද්ධර්මාලඞ්කාරයෙහි සඳහන් වන්නේ මෙසේ ය.

**"එකලැ මේ ලඞ්කාද්වීපයෙහි මනුෂ්‍යයෝ පස්හැවිරිදි කුමාරවරුන් තම තමන් විභවානුරූපව නොයෙක් ආභරණයෙන් සරසා මහත් වූ මඟුලෙන් ශික්‍ෂාග්‍රහණය කරවති."**[1] යනුවෙනි.

මේ පිළිබඳව බොහෝ කරුණු **අතිපූජ්‍ය බද්දේගම විමලවංස අනුනාහිමිපාණන් වහන්සේ** විසින් රචනා කරන ලද **"පැරණි ලංකාවේ ගිහි අධ්‍යාපනය"** කෘතියෙන් හඳුනා ගත හැකි ය. ගුරු ගෙදර, පන්සල, පිරිවෙන එකල රටේ අවශ්‍යතාවන්ට අනුරූපව අධ්‍යාපනය ලබා දුන් ආයතනයි. එදා මව්පියන්ගෙන් දූ දරුවන්ට ඉගෙන ගන්නට බොහෝ දේ තිබුණි. වැඩිවශයෙන් වැඩිහිටියෝ බාල පරපුරට ගුරුවරු වූහ. ජනතාව අතර තිබූ අධ්‍යාපනයත්, කෘෂිකර්මයත්, සංස්කෘතියත් දෙපාර්තමේන්තු යටතට ගන්නා තාක් පැවතියේ ජනතාව අතේ ය.

එහෙත් ඉංග්‍රීසින්ගේ අධ්‍යාපනික ප්‍රතිපත්ති සකස් වූයේ යුරෝපීය පරමාර්ථයන් සපුරා ගැනීමට යෝග්‍ය ආකාරයෙනි. ස්වභාෂා අධ්‍යාපනය ඔවුහු පිළිකුල් කළහ. පෙරදිග යටත් විජිත සමයෙහි ඉන්දියාවේ සිටි මැකොලේ සාමි වරයා පෙරදිග යටත්විජිත අධ්‍යාපන ප්‍රතිපත්තිය ලෙස ප්‍රකාශ කළේ **ලෙයින් මසින් ස්වදේශික වූත් චින්තනයෙන් හා ක්‍රියාකාරීත්වයෙන් බ්‍රිතාන්‍යයට පක්‍ෂපාතී වූත් ස්වදේශකයන්** බිහි කිරීමයි.

පෘතුගීසීන් මිෂනාරි කණ්ඩායම් යොදාගෙන ආගම ප්‍රචාරයට කටයුතු කළ අතර ලන්දේසීහු ගම්වල "පැරිස් පාසල" නමින් හැඳින්වෙන පාසල් ආරම්භ කළහ. ඔවුන්ගේ උසස්

---

[1] සද්ධර්මාලඞ්කාරය, **උත්තරෝලිය වත්‍ථු,** 492 පිට, සංස්කෘතික මධ්‍යස්ථානයේ ප්‍රකාශනය, 1997.

අධ්‍යාපන ආයතනය "සෙමනේරිය" නමින් හැඳින් වේ. මේ ස්වරූපය සැලකිල්ලට ගත් ඉංග්‍රීසීන් මුල දී මුහුදුබඩ අධ්‍යාපනය ගැන අවධානයක් යොමු නො කළත් 1815 න් පසු යටත් විජිත අවශ්‍යතාවන්ට අනුව අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් කළේ ය. විශේෂයෙන් 1833 කොල්බෲක් ප්‍රතිසංස්කරණ යටතේ ස්වභාෂාව වෙනුවට ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් පාසල් ආරම්භ කෙරුණි. කතෝලික ආගමත්, බටහිර සංස්කෘතියත් ප්‍රචාරය කිරීම එහි මූලික අරමුණක් විය. තමනට පක්ෂපාත ස්වදේශිකයන් පාලන කටයුතු වලට සම්බන්ධ කරගැනීම ද අරමුණක් විය. මේ අධ්‍යාපනය ලද හැකි වූයේ මුදල් ඇති ධනවතුනට පමණි. වෛද්‍ය විද්‍යාලය, නීතිවිද්‍යාලය, කාර්මික විද්‍යාලය, යුනිවර්සිටි කොලීජිය ආරම්භ වූයේ රටේ බ්‍රිතාන්‍ය පරිපාලන ව්‍යුහයට අදාළ වියතුන් බිහි කිරීම පිණිස ය.

මේ ආකාරයෙන් සිදුවූයේ රටේ පැරණි කෘෂි ආර්ථික රටාවත් එහි කළමනාකාරිත්වයත් ඉවතට දමුණ බ්‍රිතාන්‍යයට අනුරූප සමාජ රටාවක් සකස් වීමයි. ව්‍යවස්ථාදායකයට ජාති මූලක නියෝජනය එක් කිරීමෙන් නිමක් නො දකින ප්‍රශ්න රාශියකට පටලැවීමට සිදු වී තිබේ. බෙදා පාලනය කිරීමේ යෝජනාව ගෙනාවේ කෝල්බෲක් කොමිසමයි. එවකට බොම්බායේ ඉංගිරිසි ආණ්ඩුකාරයා ව සිටි එල්ෆින්ස්ටන් සාමිවරයා ප්‍රකාශ කළේ ජාතිය බෙදා පාලනය කිරීම රෝම ජාතිකයන්ගේ ආදර්ශ පාඨය බවත් එය අපේ ද ආදර්ශ පාඨය වියයුතු බවත් ය. කෝල්බෲක් කොමිසම ලංකාවේ ව්‍යවස්ථාදායක සභාවට ජාති මූලක නියෝජන ක්‍රමය ඇතුළු කළේ ද ඒ ආකල්පයෙනි.

**1931 න් පසුඃ**

එහෙත් 1931 න් පසු උදා වූයේ ලංකාවේ වියලි කලාපයේ අභිවෘද්ධියට වැඩි අවධානයක් යොමු කළ කාලයකි. මේ වසරේ දී ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාව අවලංගු කර රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවන ලදි. එහි කෘෂිකර්ම හා ඉඩම් ඇමති වූයේ ගැමිකම හඳුනන ගැමියකු වූ ඩී. එස්, සේනානායක මැතිතුමා ය. වියලි කලාපය සංවර්ධනය කිරීමේ දී කෘෂිකර්මය මත පදනම් වූ ගොවිජනපද යෝජනා ක්‍රමය වඩාත් යෝග්‍ය ලෙස සැලකුණි. පැරණි වාසභූමි අහිමි වූවන්, ඉඩම් අහිමි අය,

කම්කරුවන් වැන්නවුන් තෝරා ගොඩ ඉඩම් අක්කර දෙකක් හා මඩඉඩම් අක්කර තුනක් බැගින් ලබා දී ගොවිජනපද ආරම්භ කෙරුණි. පැවති ජලාශ ප්‍රතිසංස්කරණය කිරීමටත් අලුතින් ජලාශ ඉදිකිරීමටත් අවධානය යොමු කෙරුණි. සේනපුර, මින්නේරිය, ගල්ඔය වැනි ජනපද ව්‍යාපාර නිසා කෘෂි කර්මාන්තයේ දියුණුවක් දක්නට ලැබුණි. සේනානායක සමුද්‍රය ඉදි වූයේ මේ කාලයෙහි ය. එහි ප්‍රමාණය වර්ග කිලෝ මීටර් 995 කි. ජලධාරිතාව අක්කර අඩි 770,000 කි. අක්කර 150,000 ක් වගාකිරීමට හැකි ය.

ඞී. එස්. සේනානායක මැතිතුමාට ගොවිජනතාවගේ අභිවෘද්ධිය සැලසීමට තිබුණේ ලොකු උනන්දුවකි. කෘෂිකර්මය පදනම් කරගෙන ගොවිජනපද ඇති කිරීම එහි ප්‍රතිඵලයකි. කුඹුරු හෑමේ දී ට්‍රැක්ටරය භාවිතාව හඳුන්වා දෙන අවස්ථාවේ එතුමා පවසා ඇත්තේ "කෝ මේකෙන් ගොම එන්නෙ නෑනෙ" යනුවෙනි. කුඹුරු ගොවිතැනේ දී කුඹුර සාරවත් වීම ගැන එතුමාගේ අවධානය යොමු වූයේ ඒ ආකාරයෙනි. හොඳින් සරුසාරව වැඩුණ ගොයමක් දකින විට එතුමා ලැබුයේ අසීමිත ප්‍රීතියකි. මහමග ගමන් කරන විට හොඳට පැහුණ කුඹුරක් දකින විට වාහනය නවතා කුඹුරට බැස ගොයම් බදාගෙන සතුටු කඳුළු හෙළන බව ද අපට අසන්නට ලැබී තිබේ. හෙළබිමේ අනාගතය සුරක්ෂිත වීම සඳහා කෘෂිකර්මාන්තයෙහි අවශ්‍යතාව එතුමා දුටුවේ ය.

ඉංග්‍රීසි යටත් විජිත සමයේ අවසාන භාගයේ දී ඞී. ඇස්. සේනානායක මැතිතුමා අධිෂ්ඨාන ශීලී ආරම්භයක් දුන්න ද ඒ තත්ත්වය වර්ධනය කරමින් ඉදිරියට ගෙන යාමට පසුකාලීන දේශපාලන ව්‍යාපාරය එතරම් උනන්දුවක් දක්වා නැත. පසුකාලීනව ගල්ඔය සංවර්ධන මණ්ඩලය වැනි මණ්ඩල යටතේ පාලනය වුව ද ඒවා ද අතිරේක වියදම් දැරිමක් පමණක් වී ඇත. ගොවි ජනපද ව්‍යාපාරයේ උපරිම ප්‍රයෝජනය ගන්නට නම් රාජ්‍ය අංශයෙන් ඒ පිළිබඳ පුහුණු නිළධාරීන් අවශ්‍ය ය. ගැමි ජනයාගේ ගැටලු පිළිබඳ සංවේදී වියහැකි, ඔවුන් සමග එක්ව කටයුතු කළහැකි නිළධාරීන් අවශ්‍ය ය. රටත් ජනතාවත් නගා සිටුවාලීමට දැක්මක් හා හැඟීමක් නැත්නම් උදාවන ප්‍රතිඵලය එයට වඩා වැඩි යමක් නො වේ.

1948 දී යටත්විජිත පාලනය නිම වුවත් අපට අහිමි වූ වටිනාකම් රැකගන්නට කල්පනා කළ බවක් පෙනෙන්නට නැත. 2020 වන විට යටත්විජිත පාලනය නිම වී වසර 72 ක් වන නමුත් මේ කාලය ඇදී ආයේ හර්තාල්, වර්ජන, කැරළි, ත්‍රස්ත ක්‍රියා ඔස්සේ ය. මේ කාලය තුළ කෘෂිකර්මාන්තය ආ ගමන කෙබඳුදැයි අපි ඊ ළඟට විමසා බලමු.

# 08.

## 1948 න් පසු

වසර 450 ක යටත් විජිත සමය අවසන් විය. එයින් අන්තිම වසර 150 බ්‍රිතාන්‍ය යටත් විජිත සමයයි. මෙරටට නිදහස හිමි වූ 1948 වසරට ආසන්න වසර වල පෙරදිග වෙනත් යටත් විජිතයන් ද නිදහස හිමිකර ගත්තේ ය. දෙවන ලෝකයුද්ධය අවසන් වූයේ 1945 වසරේ ය. ඉන් අනතුරුව හරිත විප්ලවයට පසුබිම සකස් වූ ආකාරය හා එහි ප්‍රතිඵල පිළිබඳ විග්‍රහයක් **පූජ්‍ය කීරන්තිඩියේ පඤ්ඤාසේකර හිමියන්** විසින් 2003 දී ප්‍රකාශ කරන ලද **"වී වරුණ"** නම් මාහැඟි කෘතියෙහි එන උපග්‍රන්ථ XIII **"ආනන්තර්ය පාපකර්මයක් - මිහි මව මැරීම"** යටතේ දක්වා ඇත. එය මෙහි දී උපුටා දක්වමි.

**හරිත විප්ලවයඃ**

"1945 දී දෙවන ලෝක යුද්ධය අවසන් විය. යුද්ධයට සම්බන්ධව සිටි කෙලෝග් (Kellogg) වැනි රසායනික ආයතන පොහොර නිෂ්පාදනයට පිවිසුණ හ. ඔවුන්ගේ සුවිශාල පොහොර නිෂ්පාදන සඳහා වෙළඳ පොළවල් අවශ්‍ය විය. මේ අතර ඇමෙරිකානු ෆෝර්ඩ් සහ රොකෆෙලර් ඇතුළු ආයතනත්, ලෝක බැංකුවත්, එක්සත් ජාතීන්ගේ සංවිධානය හා එක්ව ජාත්‍යන්තර කෘෂිකර්ම පර්යේෂණ සඳහා උපදේශක කණ්ඩායම (CGIAR) පිහිටුවන ලද හ. එම කණ්ඩායම සංවර්ධනය වෙමින් පැවති නව නිදහස් රටවල ආර්ථික හා සමාජ විද්‍යාඥයින් සිය කටයුතු වලට එක්කර ගත්තේ විශේෂ වරප්‍රසාද ලබා දෙමිනි. ඔවුහු 1950 - 65 වකවානුවේ දී සංවිධානාත්මක වැඩපිළිවෙළක නිරත වූහ.

**මුල පිරීමඃ**

ලෝකයේ ස්වභාවික බීජ හා ජාන විවිධත්වය බහුල වැදගත් ස්ථාන වල බෝග බීජ පර්යේෂණ ආයතන පිහිටුවීම විශේෂ පියවරකි. රෝමයේ පැළෑටි හා ජාන සම්පත් සඳහා ජාත්‍යන්තර මණ්ඩලය (IBPGR) ඇරඹුනේ එකලයි. ඒ අනුව

ජාත්‍යන්තර බෝග පර්යේෂණ මධ්‍යස්ථාන 8 ක් ද ජාතික වශයෙන් ජානබැංකු 60 ක් ද, පිහිටුවා සියල්ල ඇමෙරිකානු ජාතික බීජ ගබඩා කිරීමේ විද්‍යාගාරය (NSSL) වෙත සම්බන්ධ කරන ලදි. මෙය ඇමෙරිකානු එක්සත් ජනපදය, ජාන සම්පත් මධ්‍යස්ථාන වල ලෝක සම්බන්ධතා ජාලය සහ බීජ ද්‍රව්‍ය රැස්කර තබන මූලික ගබඩා සඳහාත් ප්‍රයෝජනවත් විය. එහි ජාන එකතුවට ප්‍රධාන ධාන්‍ය වර්ග වන ඉරිඟු සෝගම්, තිරිඟු හා වී අයත් වේ. මෙම ආයතන පද්ධතිය විසින් අළුත් බෝග, රසායනික යෙදවුම් හා උපකරණ ගොවීන් වෙත හඳුන්වා දෙන ලදි.

දීර්ඝ යටත් විජිත යුග පසුකරමින් තිබූ සංවර්ධනය වන රට වල බහුතර ජනතාව දුප්පතුන් වූහ. ඔවුන් ආහාර හිගයෙන් පෙළෙන හෙයින් එම ප්‍රශ්නය නො විසඳුවහොත් චීනය වැනි රටවල සිදු වූවාක් මෙන් දුප්පත් ජනතාව ආණ්ඩු විරෝධීව නැගී සිටිමින් විප්ලව කරනු වැළැක්විය නො හැකි බවත්, මේ තත්වයට විසඳුමක් සඳහා ආහාර නිෂ්පාදනයෙහි දැවැන්ත වර්ධනයක් සිදු කළයුතු බවත් තීන්දු කළ විශේෂඥයන් විසින් සැලසුම් කළ වැඩ පිළිවෙළ **හරිත විප්ලවය** යනුවෙන් නම් කරන ලදි. කෘෂිකර්මයෙහි සිදු කෙරෙන පෙරළියක් හෙයින් මීට "හරිත" යන්න ව්‍යවහාර විය.

**ලංකාවට බලපෑ හැටි:**

1950 දශකය මුල දී කැලිෆෝනියා විශ්වවිද්‍යාලයෙහි ශිෂ්‍යත්වයක් ලබා වසර 3 ක් ඇමරිකාවේ සිටි ලංකාවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ඒ. ජී. රිචඩ් ආපසු ලංකාවට එන විට බද්ධ කළ දොඩම් පැල කීපයක් කැලිෆෝනියාවෙන් ගෙනැවිත් රෝපණය කර තිබුණේ මොණරාගල රජයේ ගොවිපළෙහි ය. ඉන් බෝ කළ පැල පහළ ඌවේ ගම්වල පතුරුවා වැඩිකල් නො ගොසින් "ට්‍රිඑස්ට්‍රා" වෛරසය ඌවේ දොඩම් වගාවට වැළඳුනේ ය. ගැමියන්ගේ දුක් ගැනවිලි නිසා මීට විසඳුම් සොයා බිබිලේ මන්ත්‍රී ග්ලැඩ්වින් කොතලාවල, කෘෂිකර්ම ඇමති ජේ. ආර්. ජයවර්ධනගේ නියමයෙන් ඕස්ට්‍රේලියාවට ගොස් කොළඹ ක්‍රමය යටතේ ආචාර්ය ටෙම්පල් කයිලි ලංකාවට කැටුව ආවේ ය. ටෙම්පල් කයිලි මේ වසංගතයට කළ පිළියම් යෝජනා වසර 7 - 8 ක් තුළදීවත් ක්‍රියාත්මක නො විණි. 1962 දී අමාත්‍ය සී. පී. ද

සිල්වා ඊශ්‍රායලයෙන් ගෙන්වා ගත් මෙන්ඩල් විසින් තව දුරටත් දොඩම් වගා කළ නො හැකි තරමට තත්වය උග්‍ර කර ගිය බවට ඉතිහාසය ශාක්ෂි දරයි. කිසියම් රෝගයක් නො තිබූ මෙරට මුං ගසට කොළ කොඩ වීම, කහවීම සිදු වූයේත් විදේශ උපදේශකයන් මගිනි. අපේ මී ගවයන් වඳ කිරීමට මූමා නම් විශේෂඥයකු දුන් උපදෙස් ද අමතක නො කළයුතු ය.

ලංකාණ්ඩුව ද අප්‍රමාදව හරිත විප්ලවයට සම්බන්ධ වූයේ ය. එදා මෙදා තුර අපේ කුඹුරු මෙන් ම අනෙක් වගා බිම් ද හරිත විප්ලවය විසින් ලබා දුන් කෘෂි රසායන ගිල්වා මාරාන්තික ප්‍රහාරයකට ලක් කර හමාර ය. මේ වන විට හම්බන්තොට, පුත්ලම, අනුරාධපුර වගා බිම් විශාල ප්‍රමාණයක් නිසරු කාන්තාර වෙමින් තිබෙණ අතර අනෙක් ප්‍රදේශ වල ගොවිබිම් ද කෙමෙන් ඒ තත්ත්වයට පත්වෙමින් තිබේ. මෙසේ මරාදමනු ලබන්නේ පොළොවෙහි පස සතු ප්‍රතිඋත්පාදන ශක්තියයි. මේ ශක්තිය රැකගැනීම හා එය යළි ගොඩනැගීම දිගු කලක් ගොවිතැන් කෙරෙන අපගේ රටවල අද ප්‍රමුඛතම අවශ්‍යතාවයකි.

ඒ සමග ම මෙරට ජනයා සාම්ප්‍රදායික තාක්ෂණය මද වශයෙන් හෝ රකිනු ඉවසනු නො හැකි සමාගම්කරුවන් 2002 වන විට ගව සම්පත සමූලඝාතනය කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යංශය මෙහෙයවීමට තරම් දක්ෂ වී ඇත. අද ජාන තාක්ෂණයෙන් සැකසූ දොඩම්, ඇපල්, මිදි මෙරට සාමාන්‍ය ජනයාගේ ආහාර වට්ටෝරුවෙහි කොටසකි. ඒවා වෙළඳුම් කර එදා වේල සරිකර ගැනීමටත් ඒවා කෑමටත් මෙරට ජනතාව හුරුව සිටිති.

බහුජාතික සමාගම් සහ ඒවාට බැඳුණු දේශීය සමාගම් ඒකාබද්ධව ගොවිතැනට එල්ල කර තිබෙණ මැර ප්‍රහාරයේ විපාක සොබාදහමටත්, ගොවීන්ටත්, රටවැසි සැමටත් විඳින්නට සිදු වී බොහෝ කල් ය. අද රටේ ජනගහනයෙන් සෑම 10 දෙනෙකුගෙන් ම එක් අයකු දියවැඩියාවට ගොදුරු වීමත්, සෑම පස්දෙනෙකුගෙන් ම එක් අයකු මානසික ආතතියෙන් පෙළීමත්, සම මතුපිට පිළිකා, වකුගඩු හා හෘදයාබාධ රෝග බහුල වීමත් කෘෂි රසායන අඩංගු ආහාර පාන ගැනීම හේතුවෙන් සිදු වන බව පිළිගෙන කලක් ගත වී තිබේ. මෙරට පළිබෝධනාශක විෂවීම් 1991 - 2001 දශකය තුළ 184,294 ක් ද, ඉන් මරණ 16647

ක් ද වාර්තා විය. 1998 දී මියගිය ගණන 2250 කි. රෝහල් ගත වූ ගණන 21429 කි. මෙරට ලියාපදිංචි කර තිබෙණ පළිබෝධ නාශක වර්ග 397 කි.

අවුරුදු දහස් ගණනක් ගොවීන් විසින් යෝග්‍ය තාක්‍ෂණය යෙදීම නිසා ඉතා සරුසාරව පැවති ගොවිබිම් වලට කෘත්‍රිම පෝර මිශ්‍ර කිරීම හා ඒවා ඉක්මණින් අවශෝෂණය කරගත හැකි නව බීජ රෝපණය නිසා අස්වනු වැඩි වූ බව ඇත්තකි. එහෙත් තවත් දශකයක් එනම් 2010 පමණ වන විට මේ බිහිසුණු නව තාක්‍ෂණයෙන් ගොවිබිමට හා මිනිසුන්ට පමණක් නොව සමස්ත ජීවලෝකයට ම අත්වන දුක්ඛදායක කලදශාව ගැන ලොව දසතින් ම තොරතුරු අසන්නට ලැබෙනු ඇත."[1]

කවුරුත් පාහේ කිව්වේ වැඩිවෙන ජනගහනයට සරිලන පරිදි වැඩියෙන් ආහාර නිපදවන්න නම් නව කෘෂි තාක්‍ෂණය භාවිත කළයුතු බවයි. වැටුපකට ශ්‍රමය කැපකරන වහල් මනස වෙනුවට මහපොළවට ශ්‍රමය කැපකරන ස්වයම්පෝෂණ ජීවන රටාවක ඇති සතුට, සහනය, නිදහස හා සබැඳි ශ්‍රමයේ අභිමානවත් බව මිනිසාට නො පෙනී ගියේ ය. ශ්‍රමය කැප කරන්න තිබුණ මහපොළොව දූත් නිසරු ය. හියුමස් පස්තට්ටුව වෙනුවට ඇත්තේ වැල්ල ය. හෝදාපාලුව බලගතු ය. පස සාරවත් කරන්න හිටපු ගැඩවිලන් ඇතුළු කුඩා ප්‍රාණීන් කෘෂිරසායන භාවිතයෙන් වඳ වී ගොසින් ය. ඇලක දොළක වක්කඩක නලහඳයා, දණ්ඩියා වගේ කුඩමස්සන් පේන්නට නැත. කැලෑව අව ම වී ඇත. දොළපාරවල් හිඳී ගොස් ය. හෝදාපාලුව නිසා වැව් ගොඩ වෙලා ය. වැස්සොත් ගං වතුර ය. කඳුකරයේ නායයෑම් ය. පිරිනමන්නේ ගංවතුර සහනාධාර ය. පෑව්වොත් නියඟය ය. එතැනදි පිරිනමන්නේ නියං සහනාධාර ය. ලක්බිමට ආවේණික ශාක, සතුන්, පක්ෂීන් මුහුණ පා ඇත්තේ වඳ වීමේ තර්ජනයටයි.

මිනිස් පැවැත්ම සම්බන්ධයෙන් වැදගත් වන මූලික කරුණක් නම් ආහාරයයි. අප රට කෘෂිකාර්මික රටකි. අද එහි කෘෂිකර්මය ව්‍යාපාරික කෘෂිකර්මයක් වී තිබේ. කෘෂිජලය

---

1 පූජ්‍ය පඤ්ඤාසේකර හිමි, කීරන්තිඩියේ, **වී වරුණ,** 163, 164, 165 පිටු,. 2003.

සම්පාදනය කරන්නේ ගංගා හරස් කිරීමෙන් මහාපරිමාණ ජලාශ වශයෙනි. කෘෂිජලය ගොවියාට සැපයෙන්නේ කොන්ක්‍රීට් ඇල මාර්ග ඔස්සේ ය. පරිසරයට ඉන් ලැබෙණ ප්‍රයෝජනයක් නැත. එහෙත් යෙදූ දැනුම විශේෂඥ ය. ඊට අනුව සාම්ප්‍රදායික ගොවියා නූගත් ය. කුඹුරේ වල් නසන්නේ ද රසායණ ඉසීමෙනි. හාන්නට පෙරත් වී ඉසීමෙන් පසුත් වරින් වර නොයෙක් රසායන වර්ග යොදනු ලබයි. ට්‍රැක්ටර් යන්ත්‍ර වලටත් වැඩ කුලී වශයෙනුත් රසායණික පොහොර වලටත් විශාල මුදලක් ගෙවා කන්නයක වැඩ නිම කරන විට වියදම් කළ තරම්, වෙහෙසුන තරම් ගොවියාට ප්‍රයෝජනයක් නැත. අන්තිමට වැඩි වාසි සලසාගෙන ඇත්තේ අතරමැදි වෙළෙන්දා ය. ගොවියාට ඉතිරි වන්නේ කළකිරීම ය. මී උණ ය. වකුගඩු නරක් වීම ය. රෝගියෙක් වීම ය. ඇතැම් විට වස බී මියයාම ද සිදු වේ. අවසාන වශයෙන් සිදුවන්නේ ඉබේට ම ගොවියා යැපුම් මට්ටමේ වී නිෂ්පාදනයට යොමු වීම ය. හැකිකමක් තිබේනම් වෙනත් මොකක් හෝ රැකියාවට යොමු වීම ය. මේ ස්වභාවය දකින ගොවි දරුවා ගොවිතැනට යොමු වන්නේ ශ්‍රමය විකුණන වෙනත් රැකියාවක් සොයාගැනීමට නො හැකි වුණොත් පමණි.

හැම රටකින් ම ඇහෙන්නේ ගෝලීයකරණ අඬහැරය යි. කෘෂි තාක්ෂණය ද ගෝලීයකරණය වී තිබේ. වැඩිදෙනෙක් ගෝලීයකරණය ගැන කථා කරන්නේ මහත් උද්යෝගයෙනි. ශිතල දේශගුණයෙන් යුක්ත බටහිර දියුණුයයි කියාගන්නා නූතන ශිෂ්ටාචාරය ලෝකයේ ම ව්‍යාප්ත වීම සියල්ල සම්පූර්ණ වීමක් හැටියට සැලකේ. කාගේත් කැමැත්ත ආහාරපාන, ඇඳුම් පැළඳුම්, වාසස්ථාන, ජීවන පහසුකම්, බටහිර ක්‍රමයට සකසා ගන්නටය. තමන් ජීවත් වන භූමියට ශ්‍රමය කැප කිරීමේ ස්වයම්පෝෂණ ආර්ථිකයක් කෙරෙහි විශ්වාසය තැබීම වෙනුවට ජාත්‍යන්තර ආනයන අපනයන වෙළඳ ආර්ථිකය කෙරෙහි විශ්වාසය තබන්නට බොහෝ රටවල් යොමු වී තිබේ. සියවස් ගණනක් යටත්විජිත ආධිපත්‍යයට යටත්ව සිටි හැම අතින් ම උඩු යටිකුරු වූ අපරට වැනි රටවලට ජාත්‍යන්තර ආර්ථික විශේෂඥයන් විසින් සාම්ප්‍රදායික නො දියුණුවෙන් මිදෙන්නට යයි කියමින් නොයෙක් නොයෙක් උපදෙස් දෙනු ලබයි. අපරදිග ඥානය ගෝලීයකරණය වන්නේ ඒ ආකාරයට ය. ලෝකබැංකුව වැනි ආයතන විසින් වී ගොවිතැන හැටියට හඳුන්වනු ලබන්නේ

වැවිලි කර්මාන්තයට අයත් නො වන අඩු වටිනාකමකින් යුතු බෝගයක් හැටියටයි. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 60% කට වැඩි ප්‍රමාණයක් වෙසෙන්නේ ග්‍රාමීය ප්‍රදේශ වල ය. ඔවුන් ප්‍රධාන වශයෙන් වැවිලි කර්මාන්තයට අයත් නැති අඩු වටිනාකමකින් යුත්, එහෙත් ප්‍රධාන බෝගය ලෙස පවතින වී ගොවිතැනට සම්බන්ධ වී සිටීම රජය මූණ පා සිටින උග්‍ර ප්‍රශ්නයක් සේ ලෝකබැංකුව සලකයි.[1] මෑත කාලෙක අපරටේ කිසියම් දේශපාලන නායකයෙක් කුඹුරු ගොඩකර කර්මාන්ත පුර බිහිකරන්නට අදහස් කරන බව ප්‍රකාශ කළේ යට කී ආකාරයේ මත දරන නිසා බව අපට සිතේ. මෙරට රාජ්‍යතාන්ත්‍රිකයා රටේත් රටේ සංස්කෘතික උරුමයේත් මුල් නො සිඳුණකු වියයුතු ය.

**වගාසංග්‍රාමයඃ**

1970 දී සිරිමා බණ්ඩාරනායක මැතිණිය යටතේ නව රජයක් බලයට පත් විය. රජය නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකින් 1972 දී ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත් කළේ ය. ආනයන ප්‍රතිපත්තිය වෙනස් කර ස්වයම්පෝෂණ කෘෂිකර්මයට හා දේශීය කර්මාන්ත නංවා ලීමට රට යොමු විය. රජය යටතේ වගාසංග්‍රාමය ඇරඹිණ. ආර්ථික පිළිවෙත් වල නොයෙක් වෙනස් කම් ඇති කෙරුණි. ගිජුකම පිරිමැසීම වෙනුවට අවශ්‍යතා සංතෘප්තිය හඳුනාගෙන කටයුතු කළයුතු විය. ගිජු සිත් ඇති අය මෙයට අකැමති විය. මේ වැඩ පිළිවෙළ පිළිබඳව පොදු ජනතාව ප්‍රමාණවත් පරිදි දැනුවත් නො කිරීම සිදු වූ අඩුපාඩුවක් බවත් මේ වගාසංග්‍රාම වැඩ පිළිවෙළ කඩාකප්පල් නො වී නම් අද වන විට ස්වයම්පෝෂිත රටක් වීමට ඉඩ තිබුණ බවත් අද බොහෝ දෙනා කියති. මැතිවරණ සමය වල වගාසංග්‍රාම යුගය ගැන සිහිපත් කර ඡන්ද දායකයින් බියවද්දා ඡන්දය හරවා ගැනීමට පෙළඹෙනු මේ මෑත දී ද අසන්නට ලැබුණි. 70 - 77 කාලසීමව ඇතැම්හු හත් අවුරුදු සාපය ලෙස හැඳින්වූහ. සංවෘත

---

[1] පඤ්ඤාසේකර හිමි, කීරන්තිඩියේ, **වී වරුණ**, උපග්‍රන්ථය xiv, 1995 ජුලි 17, අංක 14546- CE, රොබට් හන්ට්, ඩග්ලස් ලිස්ටර්, විසින් ඉදිරිපත් කළ **ග්‍රාමීය කෘෂිකර්මය පිළිබඳ ලෝකබැංකු යෝජනා**, 166 පිට සිට, 2003.

ආර්ථිකයකට තෘෂ්ණා සහිත සිත කැමති වන්නේ නැත. 1977 මැතිවරණයෙන් සිරිමා රජය අන්ත පරාජයකට පත් විය.

**1977 න් පසු:**

1977 දී පැවති රජය පරදා ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා යටතේ නව රජයක් බලයට පත් විය. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ 1978 පෙබරවාරි 04 දින විධායක ජනාධිපති ක්‍රමය ආරම්භ විය. වෙළඳපළ ආර්ථිකය නිදහස් කළේ ය. සංවෘත ආර්ථිකයක සියලු සීමාවන් මුදා හැරියේ ය. නගර වල වෙළඳපලවල් නොයෙක් භාණ්ඩ වලින් පිරී ඉතිරී ගියේය. මිනිසාගේ ගිජුසිත මේ නව තත්ත්වය ඉක්මණින් වැළඳ ගත්තේ ය. විවිධ ආර්ථික ක්‍රියා දාමයන්ට ඉඩකඩ විවෘත්ත විය. මිනිසාට වඩා භාණ්ඩ වල වැදගත්කම ඉහළ ගියේ ය.

මේ පසුබිම තුළ ආනයන ප්‍රතිපත්තිය අනුව දේශීය නිෂ්පාදන කෙරෙහි උනන්දුව අඩු වී ගියේ ය. ගොවියා සහ ගොවිබිම කෙරෙහි සැලකිලිමත් වීම වෙනුවට අවශ්‍ය සහල් ඇතුළු තවත් බෝග ආනයනය කිරීම වාසි දායක සේ ගැණුනි. දෙවන ලෝක යුද්ධයෙන් පසු ඇරඹුණ හරිත විප්ලවයෙන් දූෂණය වූ ගොවිතැන මේ විවෘත්ත ආර්ථිකය යටතේ තවදුරටත් ලාභදායී කටයුත්තක් සේ නො සැළකුණි.

70 - 77 රජය කාලයේ යෝජිත මහවැලි යෝජනා ක්‍රමය නව රජයෙන් කඩිනම් කෙරුණි. වසර විස්සකින් ක්‍රමානුකූලව සපුරා ලියයුත්තක් පස්වසරකට කඩිනම් කිරීම ද නුසුදුස්සක් බව කියැවේ. රටේ නූතන මහාපරිමාන ජලයෝජනා ක්‍රමවල මූලික අරමුණ කෘෂිකර්මයට වඩා කර්මාන්ත වලට වැදගත් වන පරිදි ජලවිදුලිය නිපදවීමයි. එහෙත් අද වනවිටත් මෙරටට ආනයනය කරන ඛණිජ තෙල් වලින් විශාල ප්‍රමාණයක් විදුලිය ජනනය කිරීමට වැය වන බව අසන්නට ලැබේ. විදුලිය බල මණ්ඩලය නිතර ම තෙල් සංස්ථාවට ණය බව ද කියැවේ. එයින් කියැවෙන්නේ ජලයෝජනා ක්‍රම වල මූලික අරමුණ ඉටු නො වන බවයි. අනෙක් අතට එම යෝජනා ක්‍රම යටතේ කෘෂිකාර්මික ක්‍රියාදාමය ද අද වන විට අසාර්ථක වී තිබේ. අනුගමනය කළේ හරිත විප්ලවයේ ක්‍රියාදාමය ම නිසා වී ගොවිතැන රසායනික පොහොර වලින් දුරස් වුනේ නැත. කොන්ක්‍රීට් ඇලමාර්ග තනා ඒ ඔස්සේ ගොවීන්ට මහවැලි ජලයලබා දීම වැනි ක්‍රියාමාර්ග උචිත ජලකළමනාකරණයක්

නො වූ නිසා ඒ හැම අසාර්ථක වී ඇත. වාරිමාර්ග දෙපාර්තමේන්තුවත්, මහවැලි අධිකාරියත් උතුරු මැද පලාතේ කුඹුරු වලට ජලය බෙදා හැරීම පිණිස කොන්ක්‍රීට් ඇලමාර්ග තැනීමේ දී වාරිමාර්ග ඉන්ජිනේරු වරුන් අතට පත්කර තිබූ සැලැස්මට අනුව ඇතැම් වැව් බිඳදමා ඒ මතින් ඇල මාර්ග සදා ඇති බව ද අසන්නට ලැබේ. මීට සමගාමීව වන විනාශය ද සිදු වී ඇත. මෙයින් සිදු වී ඇති බව පෙනෙන්නේ ගමේ ජීවන ආකෘතියට ද මෙය බල පෑමෙන් ජනජීවිතය දුක්ඛිත වී ඇති බවයි. ගොවියා හිටපු ජීවන තත්ත්වයෙනුත් පහළට වැටීමයි. ගොවියා දුගියෙක් කරන, රෝගියෙක් කරන, දිළින්දෙක් කරන සාවද්‍ය තාක්ෂණය බැහැර ලිය යුතු ය. තවදුරටත් මෙරට පොළොවෙහි වී ගොවිතැන් නො කළයුතු තැනට ලැබෙණ ලෝකබැංකු උපදෙස් ප්‍රතික්ෂේප වියයුතුව තිබේ.

විවෘත්ත ආර්ථික ප්‍රතිපත්තිය යටතේ මෙරට රජයයන් විශ්වාසය තබා කටයුතු කළේ විදේශ රැකියා, නිදහස් වෙළඳ කලාපයය, ඇඟලුම් කර්මාන්තය වැනි ක්‍රියාදාමයන් කෙරෙහි ය. ඒවා මගින් මෙරටට ගලා එන විදේශ විනිමය රටේ ජාතික ආදායම ශක්තිමත් කරන බව පැහැදිලි ය. එසේ නමුත් කෝවිඩ් ගෝලීය වසංගතය ඉදිරියේ ඒ ආදායම අභියෝගයට ලක් විය. මේ ආදායම් මාර්ග අතරින් මැදපෙරදිග රැකියා වලට බොහෝ දෙනා ගියේ යුගයේ ඇගයීම් වලට සරිලන ජීවන තත්ත්වයක් යම් තරමකින් හෝ සකසා ගැනීමේ සිහිනය සැබෑ කරගනු පිණිස ය. ඉන් සාර්ථකත්වයට පත් වූ අයත් වෙති. පවුල් ජීවිත අවුල් කරගත් අයත් සිටිති. ගෘහ සේවිකාවන් හැටියට විදෙස් ගත වන ගැමි කාන්තාවන් අසරණ වූ අවස්ථා අසන්නට ලැබිණ. තියන එක ම දේපල උගසට තබා රැකෙම්වා මියෙම්වා කියා විදෙස් රැකියා සොයා ගිය අය ද වෙති. විදේශ රැකියා නියුක්ති කාර්යාංශය මගින් ගිය අයට විදේශ රැකියා තත්ත්වයන් ඉදිරියේ මුහුණ දෙන්නට වන යම් යම් ගැටලු වල දී සහනයක් සලසා ගත හැකි වුවත් ඇතැම් විට හිටියාටත් වඩා අසරණ වූ අවස්ථා ද ඇත. පෞද්ගලික ඒජන්සි කරුවන් අතර ඇතැම් වංචනික පුද්ගලයන් නිසා අසීරුතාවන්ට මුහුණ පෑවෝ ද වෙති.

ඇඟලුම් කර්මාන්තය හා නිදහස් වෙළඳ කලාපය මේ රටේ ම පවත්වන නිසා යට කී දුෂ්කරතා ඇති නො වේ. එහෙත් අපනයන කටයුතු වලට බාධක වන ගෝලීය තත්ත්වයන්

උදාවන විට ගැටලුවට මුහුණ දීමට සිදු වීම නො වැළැක්විය හැකි ය. යුදගිනි නිවීමට වඩා යුද්ධය ඇදගෙන යමින් තිබුණ යුගයේ දී "කොල්ලන්ට හමුදාව, කෙල්ලන්නට ඇඟලුම් කර්මාන්තෙ" යන ව්‍යවහාරයක් පොදු ජනතාව අතර තිබූ බව ද අපට මතක ය. දශක තුනක් යුදගිනි දිගින් දිගට ඇවිලුනේ හමුදා ශක්තිය නැති නිසා නොව පැහැදිලි දේශපාලන නායකත්වයක් නො වූ නිසා බව කාටත් පැහැදිලි කරුණකි. ඍජු තීරණ ගන්නා නායකත්වයක් යටතේ යුදගිනි නිවී යන විට එසේ නිවෙනවාට අකැමති අය ද සිටීම පුදුමයට කරුණකි. සමාජ ආර්ථික දේශපාලන ක්‍රියාවලීන් පිළිබඳ විමර්ශනය කරන ඒ පිළිබඳ වියතුන් පවසන්නේ දෙවන ලෝක යුද්ධයෙන් පසු සාම්ප්‍රදායික යටත්විජිත ක්‍රමයෙන් නිදහස් වූ ආසියා, අප්‍රිකා, ලතින් ඇමෙරිකා රටවල් නව යටත් විජිතවාදයකට ගොදුරු වූ බවයි. ඒ රටවල මිනිසුන්ට ඔවුන්ගේ අභ්‍යන්තර ප්‍රශ්න විසඳා ගැනීමේ කටයුතු වල දී, බටහිර බලවතුන්ගේ අවශ්‍යතා අනුව බාධා කිරීම් වලට මුහුණ පෑමට සිදු වීම තවදුරටත් ක්‍රියාත්මක වන යටත්විජිතවාදයයි. යටත් විජිත රටවලින් නවයටත්විජිතවාදයට අනුබල ලැබෙණ ආකාරයට නියෝජිතයින් පත්කර ගැනීමට ලෝක බලවත්තු ක්‍රියා කරති. මේ රටේ සිදු වන්නේ ද ඒ ක්‍රියාදාමයයි.

දැන් අපි තව පැත්තක් බලමු. යට කී හරිත විප්ලවයේ ද දිගුවක් හැටියට ජාන අභිජනනය කළ ආහාර නිෂ්පාදනය දැක්විය හැකි ය. බොහෝ දෙනා දැන් ආහාරයට ගන්නා වෙළඳ පලේ ලස්සනට පාටට තියෙන පළතුරු පෝෂණ ගුණයෙන් අනූන ස්වභාවික ආහාර විය හැකි ද? ජාන අභිජනනය කළ, රසායණික පොහොර වලින් විශාල කළ, ගුණයෙන් හා රසයෙන් අඩු, විෂෙන් වැඩි පළතුරු නො වෙයි ද? මේ පළතුරක් කුරුල්ලන්ට ලේන්නුන්ට කන්නට දම්මාට උන් එයට කට තියන්නේ නැත. ස්වභාවිකව හැදුණ අඹ කෑල්ල ගස්ලබු කෑල්ල දුන්නාම උන් ආහාරයට ගනිති. උන් මිනිසාට වඩා බුද්ධිමත් බව පෙනේ. සෝයා කිරි වලින් හදාගන්නා ආහාරයට මිනිස්සු සෝයාමීට් යයි කියති. "මීට්" යනුවෙන් හඳුන්වන්නේ කුමක් නිසාදැයි මට තේරෙන්නේ නැත. රසකාරක එක් කළ කුකුල්මස් රස, එළුමස් රස සෝයා මීට් තිබේ. එවිට කුකුළුමස් සංඥාවෙන් එළුමස් සංඥාවෙන් මිනිසාට සෝයා අනුභව කළ හැකි ය.

හැබැයි ගෙදර හැදෙන බල්ලා බළලා නම් ඊට රැවටෙන්නේ නැත. පැකට් කළ නොයෙක් ක්ෂණික ආහාර ද වෙළඳපලේ බහුලය. හෙවනැලි නො වැටෙන තරමට ආලෝකමත් කළ සුපිරි වෙළඳ සලෙන් ගෙනාපු ආහාර කෑමේ නම්බුකාර හැඟීමට බොහෝ දෙනා කැමති ය. මේවා කන මිනිසුන්ට ලෙඩරෝග වල ද ඉවරයක් නැත. හැදෙන ලෙඩේ හඳුනා ගන්න ද බොහෝ පරීක්ෂණ කළයුතුව තිබේ. කයේ ප්‍රතිශක්තිකරණය දුර්වල ය. බෝ වන රෝග වලට ඉක්මණින් ගොදුරු වේ. බෝ නොවන රෝග වලට ද ගොදුරු වේ. ඔන්න ඔය ආකාරයෙන් අපි විසිඑක් වැනි සියවසට පා තබා දශක දෙකක් නිමකරමින් සිටිමු.

ඔහොම සිටිද්දී ලෝකයට කඩා වැදුණ කෝවිඩ් වසංගතය ගෝලීය අර්ථ ක්‍රමයේ අසාර්ථක බව පෙන්නුම් කළේ ය. රටවල් වසා දැමුණි. මූලික ජීවන අවශ්‍යතා සපුරා ගන්නේ කෙසේ ද, යන අභියෝගය ඉදිරියට ආවේ ය. කෘෂිකර්මයත් කර්මාන්තත් අතර වෙනස මෙහි දී හඳුනාගත යුතු වේ. කෘෂිකර්මය නිසරු බිම මත කෙරෙන දෙයක් නො වේ. පරිසරය එයට වැදගත් ය. හියුමස් පසේ පස සරු කරන ක්ෂුද්‍ර ජීවීන් රසායනිකයෙන් විනාශ කිරීම වහාම නතර වියයුතුව තිබේ. රසායනික පොහොර වෙනුවට කාබණික පොහොර භාවිතය සඳහා උනන්දුව දැන් වැඩි වෙමින් තිබේ. රසායන නිසා භූතල උල්පත් දූෂණය වෙමින් තිබේ. ගැමියන් අතර වකුගඩු රෝගය බහුල විය. ලිං වතුර වෙනුවට බෝතල් කළ වතුර ගම් දනවු වල ද අලෙවි කෙරේ. පොළවත්, ජලයත්, වාතයත් දූෂණය වූ විට මිනිසා ඇතුළු ජීව සන්තතියට ම පැවැත්මක් නැති බව තෘෂ්ණාධික මිනිසා තේරුම් ගතයුතුව තිබේ. මිනිසාට නිපදවිය නො හැකි දේ සංරක්ෂණ ශීලීව පරිහරණය කිරීමටත් මිල නො කිරීමටත් අවශ්‍ය ආධ්‍යාත්මික ශික්ෂණය ගැඹුරින් හඳුනා ගතයුතුව තිබේ. කොවිඩ් 19, හෙවත් නව කොරෝනා වයිරස් උවදුර මුලුමහත් ලෝකයාට ම සිහිපත් කරදෙන්නේ එයයි.

*මෙතෙක් අප වෑයම් කළේ අප රටවැසියා සියවස් ගණනක් මොන සතුරු කරදර ඇතිවුණත් කෘෂි ආර්ථිකයෙන් ස්වයම්පෝෂී වූ ආකාරයත් යුරෝපීය ආක්‍රමණිකයන්ගෙන් ලත් ගැහැටත් කෝල්බෲක් ප්‍රතිසංස්කරණ වලින් ගොවියා අසරණ වූ සැටිත් 1948 න් පසු හරිත විප්ලවයේ රසායනික උගුලට හසු වූ සැටිත්, 1977 න් පසු සාවද්‍ය කෘෂි කළමනාකරණය නිසා ගොවියා අන්ත අසරණ වීමත් කෙටියෙන් පැහැදිලි කිරීමටයි.*

# ජීවත්වීම හා ජීවනෝපාය

මීට වසර 15 ට පමණ පෙර මට ඇලහැර බකමූණ ප්‍රදේශයේ දම්දෙසුමක් සඳහා ඇරයුම් ලැබුණි. දම් දෙසුම අවසානයෙහි පිරිස හා සාමීචියෙහි යෙදී සිටින මොහොතේ එම ප්‍රදේශයේ එක් රජයේ නිළධාරි මහත්මයෙක් එක්තරා පුවතක් සිහිපත් කළේ ය. "හාමුදුරුවනේ, මම කලක් රුසියාවේ ඉගෙන ගන්න ගිහිල්ල හිටිය. ඒ කාලෙ රුසියානු ජාතික මිතුරන් තුන්දෙනෙක් ඇසුරු කළා. අධ්‍යාපන කටයුතු නිම කරල මම ලංකාවට ආපහු එන දවසෙ ඒ අයට කිව්ව ඔබලා කවද හරි ලංකාවේ සංචාරයකට එනව නම් කලින් මට දන්වන්න කියල. පස්සෙ කාලෙක ඒ අය මටත් දන්වල ලංකාවට ආව. මට පුළුවන් හැටියට ඒ අයට ආගන්තුක සත්කාර කළා. දිවයිනේ බොහෝ තැනවල මාත් සමග සංචාරය කළා. ආපසු සිය රටට යන දවසේ එක මිතුරෙක් මට කියනව, ඔබේ රට දැක්කම මගේ හිතේ කතන්දරයක් ගොඩනැගුණ. යන්න ඉස්සරවෙලා ඒක ඔබට කියන්න ඕන කිව්ව. එහෙනම් ඉතින් කියන්න, කියල මම කිව්ව.

දෙවියන් වහන්සේ මේ ලෝකය මවල මිනිසුන්වත් මවල පස්සේ මේ ලෝකෙ ඒ ඒ මිනිස් කණ්ඩායම් වලට බෙදල දෙන්න අදහස් කළා. දැන් ඔය මිනිස්සු ඉන්නේ තම තමන්ට ලැබුණ බිම් වල. ඔය බෙදා දෙන දවසේ එක කට්ටියකට හොඳට ම නින්ද ගිහින් තිබුණා. පොළව එක් එක් මිනිස් කණ්ඩායම් වලට බෙදල දීම අවසන් වේගත එනකොට අර නින්ද ගිහින් හිටපු කට්ටියට ඇහැරුණා. දෙවියන් වහන්සේ ලෝකෙ බෙදනව දැකල මේ අයත් ඉක්මනට දෙවියන් හමු වුණා. ස්වාමීනි, අපටත් කොටසක් දෙන්න, කියල ඉල්ලා සිටිය. මම දැන් ඔක්කොම බිම් බෙදල දීල ඉවරයි. තමාල පරක්කු වෙලා ආවෙ, කොහෙද මෙච්චර වෙලා හිටියෙ, කියල දෙවියන් වහන්සේ ඇහුවා. ස්වාමීනි, අපිට නින්ද ගියා. දැනුයි ඇහැරුනේ. ඒ ගමන් ම යි, මේ දුවගෙන ආවෙ, ලෝකෙ බෙදනව දැකල. දැන් නම් එක කැල්ලක්වත් නෑ. හැබැයි මම විවේකෙන් ඉන්න වෙන් කරගත්ත කොටසක් තියෙනව. ඒකවත් එහෙනම් දෙන්නම් කියල දෙවියන් වහන්සෙ කිව්ව. අන්තිමේදි දෙවියන්

වෙන්කරගත්ත විවේක උයන නිදා හිටපු කට්ටියට දුන්න. ඒ දුන්න භූමිය තමයි, මේ ශ්‍රී ලංකාව. නිදාගෙන හිටපු කට්ටිය තමයි නුඹලා. මේක දෙවියන්ටත් විවේකය සඳහා වෙන්කරගන්න හිතුණ රටක්. නුඹලා මේක හරියට දියුණු කරගෙන නෑ. ඕකයි මගේ හිතේ ඇඳුණ කථාව, කියල ඒ පිරිස ගුවන්ගත වුණා."

ස්වභාව නියාමයේ සිද්ධීන් දේවමැවුම් වාදයක් තුළින් බැලීම රුසියානු ජාතිකයාගේ ලබ්ධිය අනුව කීවක් විය හැකි බැවින් එය අපට අදාළ නො වේ. ඔහුගේ සිතේ මැවුන මේ කථාව අනුව දියුණුව හා පිරිහීම ඔහු මැන්නෙ කොහොම ද, කියන එක අපි නො දනිමු. සමහරවිට භෞතික දියුණුව පිළිබඳ නූතන මිණුම්දඬු ඇසුරෙන් වෙන්න පුළුවන්. ඔහුගේ කථාවේ ඇගයීමයි, උපහාසයයි දෙකම තියෙන බව පෙනේ. මේ රට දෙවියන්ටත් විවේක සුවය විඳින්න පුළුවන් තරමේ රටක්, හැටියට දකීම ඔහුගේ අගයකිරීමයි. මේ රමණීය දිවයින බොහෝ දෙනාගේ ඔයවැනි ඇගයීම් වලට ලක් වී ඇති බව රහසක් නො වේ. එහෙම හිතෙන කොට ලක්බිමේ උපන්න එක ගැන පුංචි ආඩම්බරයක් සිතට දනේ. අද මේ රටේ සිටින අයට උත්තේජනයක් ඇති වෙන්න එවන් කරුණු දෙකතුනකුත් ගෙනහැර දක්වීම හොඳ ය.

මේ රටටත් ජනතාවටත් බෙහෙවින් ඇලුම් කළ ජර්මන් ජාතික විල්හෙල්ම් ගයිගර් පඬිතුමා සිය 'ගයිගර් දුටු ලංකාව' කෘතියේ මෙසේ සඳහන් කරයි.

**"මෙය සැබෑ ලෙස ම වාසනාවන්න පුන්‍ය භූමියකි."** (93 පිට.) එසේ කීවේ මේ රට ගැනයි.

**"කිසිම විටෙක අධික තෙහෙට්ටු ගතියක් නො පෙන්වන අතර සැමවිට ම සිනහවෙන් මුව සරසාගෙන වැඩෙහි නිරත වෙති."** (78 පිට) එසේ කීවේ මෙරට වැසියන් ගැනයි.

**"අප අවිවාදයෙන් පිළිගතයුතු එක් දෙයක් වෙයි. එනම් යුරෝපයේ අපගේ අධ්‍යාපන ක්‍රමය, සිංහලයා සතු බහුවිධ අධ්‍යාපන ක්‍රමයේ ඇති පුළුල් හා ගැඹුරු බවේ අහලකටවත් තව ම ලංවී නොමැති බවයි."** (137 පිට)

**"සිංහලය වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම කෘෂිකාර්මික රටක් වන අතර තමන්ට එදිනෙදා ජීවිතයේ දී අවශ්‍ය වන සියලුම දේ තමන් විසින් ම නිපදවා ගැනීමේ**

**දක්ෂයෝ වෙති."** (144 පිට) ගයිගර් පඬිතුමා රටේත් වැසියාගේත් මේ වටිනාකම් දුටුවේ 1895 සිට 1931 අතර කාලපරාසය තුළ දී බව ද සැලකියයුතු ය.

මෙහි වැසියා රට දියුණු කරගන්නෙ නැතිව නිදාගෙන ඉන්න පිරිසක් හැටියට හැඳින්වීම රුසියානු මිතුරාගේ උපහාසයයි. ඒ උපහාසයට නම් හිතේ මුකුලිත බවක් ඇති වේ. එහෙම කියන්න ඔහුටත් මොනව හරි සාධක පෙනෙන්නට ඇති. අනුරාපුර, පොළොන්නරු වැනි පැරණි යුගවල අපගේ ශ්‍රීවිභූතිය ගැන ආඩම්බර වන අපට අද ගැන ආඩම්බර වෙන්න තරම් දේකුත් නැති වන විට උදාසීන ගති පෙන්නුම් කරනවා විය හැකි ය. කාලයක් තිස්සේ දේශීය සංවර්ධන සැලසුම් බටහිර උපදේශනයන් ඔස්සේ හසුරුවන, පොදුජන හදගැස්ම නො හඳුනන රාජ්‍යතාන්ත්‍රිකයින් වැඩිපුර හිටිය රටකට එහෙම වෙන එක පුදුමයක් නො වේ. මේ මොහොතේ නැති මුදලකට, මේ මොහොතේ හදිසි අවශ්‍යතාවක් නො වන දේ වලට අවුරුදු ගණන් ණයෙන් බැඳෙන, උදේට තෙරපීගෙන වැඩට යන රෑ වෙනකොට තෙරපීගෙන ගෙදර එන අමාරුවෙන් මාසෙ දුවෝන මිනිසුන්ට ආඩම්බර වෙන්න තියෙන්නේ මොකක් ද? පාරිභෝගිකයාගේ අවශ්‍යතා තීරණය කළයුත්තේ පාරිභෝගිකයා ම මිසක් ව්‍යාපාරික ලෝකය නො වෙයි. පාරිභෝගිකයාගේ අතෘප්තිකර තෘෂ්ණාව ආරක්ෂා කිරීමේ කොන්තරාත්තුව මාධ්‍ය ආයතන විසින් බාරගෙන තිබේ. මිනිසුන්ගේ ඉල්ලුම උත්තේජනය දියුණුකිරීමෙන් නිෂ්පාදන වැඩිකිරීමේ අරමුණ මොකක් ද? මිනිස් අවශ්‍යතා සංතෘප්තිය ද? වාර්ෂික ලාභාංශය වැඩි කිරීම ද? ලෝකයට පෙන්නන්නේ අපි රැකියා අවස්ථා මෙච්චර බිහි කරල තියෙනව වගේ සාර්ථකත්වයන් ය. මුල දී හඳුන්වා දීමේ නිෂ්පාදනය ගුණාත්මක බවින් ඉහළ ය. මිනිසා තුළ ඒ පිළිබඳ ඉල්ලුම වැඩිවන විට නිෂ්පාදන ගුණාත්මක බවින් පහළ බසියි. කලක් පාවිච්චි කිරීමට ගන්නා භාණ්ඩයක් නම් ඉක්මණින් ඉවත දමා අලුත් එකක් ගැනීමට පාරිභෝගිකයාට සිදු වේ. ව්‍යාපාරිකයා අඛණ්ඩ අළෙවි තත්ත්වයක් පවත්වා ගන්නේ එහෙම ය. මෙය මිනිසුන්ට හම්බ කරල පිරිමහන්න බැරි තත්ත්වයකි. දැන් දැන් හැම කෙනාට ම ආතතිය ය. මෙය බුදුදහම පවසන මිථ්‍යා ආජීවය නිසා ඇති වන්නකි.

යටත් විජිත සමයේ නොමිලේ අරක්කු දීල ඊට ඇබ්බැහි කරපු මේ සමාජෙ ඇතැම් අය කොවිඩ් සමයේ රජයෙන් දුන් රුපියල් පන්දාහේ සහනාධාරය අරගෙන මත්පැන් පෝලිමේ හිටිය නම් මේ රට නගාහිටුවන එකත් ලේසි කටයුත්තක් නො විය හැකියි. එසේ නමුත් කෝවිඩ් වසංගත උවදුර ගෝලීය උවදුරක් වූ නිසා මේ මහා විපතින් මිදී අපි අපි ම නැගිටින්න ඕන කියන අදහස බොහෝ දෙනාගෙ සිත් වලට කා වැදී තිබීම අස්වැසිල්ලට කාරණයකි. එය හැඟීමකට පටු නො වී බුද්ධියෙන් පණ පෙවුණක් වියයුතු ය.

බුදුදහමේ සම්මා ආජීවයෙන් පෝෂණය ලබමින් ආර්ථික ප්‍රයත්නය ක්‍රියාත්මක වියයුතු ආකාරය පිළිබඳව අපි යමක් තේරුම් ගනිමු. සම්මා ආජීවය යනු සමාජ විරෝධී නො වන ලෙසටත්, ස්වභාව ලෝකයට විරුද්ධ නො වන ලෙසටත් දිවි පැවැත්මයි. සමාජ විරෝධී නො වීම ගැන සළකන විට දහමෙහි දූෂණ ක්‍රියාවන්ගෙන් අත්මිදීම අවධාරණය වේ. අත්ලස් ගැනීම **(උක්කොටන),** ලාභය උදෙසා අනුන් රැවටීම **(වඤ්චන)** වටිනා දේට සමාන නො වටිනා දෙයකින් රැවටීම **(නිකතිසාචියොගො)** මිත්‍යා ආජීවයයි. ශාක ලෝකය නිර්දය ලෙස විනාශ කිරීම **(බීජගාම භූතගාම පාතව්‍යතා)** මිත්‍යා ආජීවයයි. තවත් අයුරකින් කිවහොත් ගැටලු ප්‍රශ්න බිහි වන ආකාරයට පවත්වන කවර ජීවන රටාවක් වුව ද අයත් වන්නේ මිත්‍යා ආජීවයටයි.

ලෝකයේ ස්වභාව නියාමයට අනුව දිවි පැවැත්ම සම්මා ආජීවයයි. එය වියවුල් වන ආකාරයට කටයුතු කිරීමට මිනිසාට බලයක් පිරිනමා නැත. මිනිසා සකසාගන්නා ජීවනෝපායයන් ජෛවී පැවැත්ම විනාශ කරන්නක් හෝ ජීවන අතවරයක් හෝ නො වියයුතු ය. ජීවත්වීම හා ජීවනෝපාය අතර වෙනස හඳුනා ගතයුත්තේ එබැවිනි. යම් ජීවනෝපායයක් ජීවන වධයක් නිර්මාණය කරන්නේ නම් ඉන් පෙනෙන්නේ ජීවත්වීම හා ජීවනෝපාය අතර වෙනස හඳුනාගෙන නැති බවයි.

**ශ්‍රමාභිමානයඃ**

පැරණි සමාජයේ පැවති පොදු ශ්‍රම ආයෝජනය නොමැති අද පවත්නා වැනි සමාජයක ශ්‍රමය මිල කිරීම අනිවාර්ය වේ. එහි දී ශ්‍රමය ලබා ගන්නා පුද්ගලයා ශ්‍රමිකයා කෙරෙහි උපස්ථානශීලී වියයුතු ය. ශ්‍රමිකයා ශ්‍රම ග්‍රාහකයා

කෙරෙහි අවංක කමින් සානුකම්පිත වියයුතු ය. ප්‍රකට සිගාල සූත්‍රයෙහි දැක්වෙන පරිදි ශ්‍රමිකයාට කටයුතු පැවරිය යුත්තේ ඔහුගේ හැකියාවට ගැලපෙන පරිදි ය. **(යථාබලං කම්මන්තසංවිධානෙන)** වැටුප යනු කෑමවියදම හැටියට නො සලකා වැටුපට අමතරව ආහාර සම්පාදනය කිරීම ශ්‍රමිකයාට යහපත් ජීවන තත්ත්වයක් පවත්වාගෙන යාමට හේතු වේ. **(භත්තවෙතනානුප්පදානෙන)** ශ්‍රමිකයා රෝගී වන අවස්ථාවල වෛද්‍ය පහසුකම් සැලසීම තුළින් ශ්‍රමිකයා තුළ සුරක්ෂිත හැඟීමක් වර්ධනය වේ. **(ගිලානුපට්ඨානෙන)** විශේෂ අවස්ථා වල පාරිතෝෂිකයක් ලබා දීම ශ්‍රමිකයාට හොඳින් වැඩ කිරීම පිණිස හේතු වන උත්තේජනයකි. **(අච්ඡරියරසානං සංවිභාගෙන)** නිසි කලට සේවා කටයුතු වලින් නිදහස් කිරීම ශ්‍රමිකයාගේ පෞද්ගලික ජීවන කටයුතු වලට පහසුවකි. **(සමයෙ වොස්සග්ගෙන)**

ශ්‍රමග්‍රාහකයා මේ අයුරින් කටයුතු කරන කල්හි ශ්‍රමිකයා ඊට යහපත් ප්‍රතිචාරය පළකරන්නේ කලින් කටයුතු ඇරඹීමෙනි. **(පුබ්බුට්ඨායී)** කලින් සේවාස්ථානයෙන් බැහැර නො වීමෙනි. **(පච්ඡානිපාතී)** නොදුන් දෙයන් නො ගැනීමෙනි. **(දින්නාදායී)** මැනැවින් කටයුතු කිරීමෙනි. **(සුකතකම්මකරා)** සේව්‍යයාගේ ගුණ කීමෙනි. **(කිත්තිවණ්ණහරා)**[1] සේව්‍ය සේවක සම්බන්ධතාව මෙබඳු නම් හොරමැර කම් නැත. වර්ජන නැත. වෘත්තීයය තෘප්තිදායක ය. බුදුරජාණන් වහන්සේ මේ කථා කරන්නේ නිවන්මගටත් අයත් ගිහි අරියසාවකයින් ද කරන පිළිවෙළයි.

## බුද්ධිමත් ඉඩම් පරිහරණයඃ

ශ්‍රමය මෙන් ම ඉඩම් ද මිළ නො කළ බැවින් පුරාණ ලක් වැසියන්ගෙන් කිසිවෙක් කුලී ගෙවල සිටියේ නැත. ගම්මැද්දේ නිවහනක් හදාගැනීමට පිළිවන. පොදු නිෂ්පාදනයට ශ්‍රමය කැප කිරීමට ද පිළිවන. රැකියාවත් තිබේ. පදිංචියට නිවහනක් ද තිබේ. තරුණයකුට තරුණියකට යුගදිවි අරඹන්නට බාධාවක් ද නැත. බටහිර යටත් විජිත පාලකයින් ඉඩම් ඔප්පු ක්‍රමය ඇති කරන තුරු ම සියවස් ගණනක් මේ රට පැවතුනේ මේ ඉඩම් පරිහරණ ක්‍රමය උඩ ය. අද ඉන්න අය ඒ තිබුණෙ

---

[1] දීඃ නිඃ 3, සිගාල සූත්‍රය, 308 පිට, බුඃ ජඃ මුඃ

වැඩවසම් ක්‍රමයක් කියා සිතන නමුත් අද පවතින ක්‍රමය පෙරට වඩා බුද්ධිමත්ය කියන්නට කිසිදු හේතුවක් සොයා ගන්නට නො හැකි ය. පැරැන්නන් මෝඩයින් හැටියට අප හිතුවත් අද රැකියාවක් හොයා ගන්න, ඉඩමක් ගන්න, ගෙයක් හදාගන්න, යුග දිවියක් අරඹන්න මොනතරම් නම් වෑයම් කරනව ද? ඇතැම් විට මුලු ජීවිතය ම ගත කරන්නේ කුලී ගෙවල් වල ය. මොකක් හෝ රැකියාවක් සොයා නගරයට සේන්දු වන්නන් නිසා නගරාශ්‍රිතව මුඩුක්කු, අනවසර පැල්පත් මණ්ඩි ඇති වන්නේ මේ නිසා ය. එවන් පරිසර සියලු වර්ගයේ ම දූරාචාර වලට තෝතැන්නක් වීම නො වැළැක්විය හැකි ය.

අද ඉඩම් පරිහරණය බෙහෙවින් අවුල් සහගත ය. කෘෂිකාර්මික භූමි වෙනමත්, කර්මාන්ත භූමි වෙනමත්, වනරක්ෂිත භූමි වෙනමත්, පාසල් රෝහල් කායඞාල ආදීය සඳහා වෙනමත් වශයෙන් භූමි පරිහරණය කළමනාකරණය වියයුතු වේ. භූමිය කියන්නේ වැඩි කරගන්න පුළුවන් දෙයක් නො වේ. ඉඩ තියෙන තියෙන තැන් වල පර්චස් පහේ දහයෙ විස්සේ පුංචි පුංචි ඉඩම් කැබලි වල පදිංචි වීමේ ක්‍රමය පිරිමැසිය හැකි වැඩ පිළිවෙළක් නො වේ. පැරණි සමාජයේ ගංගොඩ, ගම්මැද්ද වශයෙන් පදිංචි වන ප්‍රදේශය වෙන් කරගෙන තිබුණේ ඒ නිසයි. එහෙත් අද යුගයේ ජලාශ, වැව් ආදියට වෙන් කර තිබුණ වන පෙදෙස් වලත් මිනිසුන් පදිංචි කෙරේ. වැසිසමයේ ජලයෙන් යට වන තැන්වල ද පදිංචි කෙරේ.

ඉඩම් වෙන්දේසි කරුවන් නිසා ඉඩම් මිල අධික වී තිබේ. ඇතැම්විට ඔවුන් සංවර්ධනය කළ ඉඩම් කියල නම් කරන්නේ ගහකොළ ඔක්කොම කපාපු ඩෝසර් කරපු බොරළු ඉඩම් වලට ය. ඒ ඉඩම් වල හියුමස් පස සකස් වෙන්න කොතරම් කල් ගතවේ ද? ඉඩමේ වාරික ගෙවන ගමන් නිවස, ජලපහසු කම්, විදුලිය, දුරකථන පහසුකම් සපුරාගැනීමේ ක්‍රියාදාමයේ පැහැදිලි පරතෙරක් පෙනෙන්නේ නැත. මෙවන් පසුබිමක් යටතේ වැඩි මුදලක් උපයා ගැනීම සඳහා බොහෝ දෙනෙක් විදේශ රැකියා වලට යොමු වෙති. ජීවනෝපායය ම ජීවත්වීම බවට පත් වී තිබේ.

මෙවැන්නක් කථා කරන්නේ අද උදා වී ඇති තත්ත්වය අතීතයට ගෙන යා හැකිය යන අදහසකින් නො වේ. එදත් අදත් අතර වෙනස දැකගන්නටත්, ඒ දැක්ම තුළින් මේ මොහොතේ

ජීවිතය හැකිතාක් සමබරව පවත්වා ගන්නටත් උපකාරයක් වශයෙනි. සිතින් දුක් දොම්නස් උපායාස මවා ගන්නේ නැතිව මානසික සමබරතාව රැකගැනීම යනු ආමාශ රෝග, අධිරුධිර පීඩනය, දියවැඩියාව වැනි රෝග වලින් පීඩා නො වීම පිණිස හේතු වේ.

**පරිසර භක්තියඃ**

මිනිසා ඇතුළු මිහිමත වෙසෙන සත්ව සන්තතිය ම දිවි ගෙවන්නේ පරිසරය පාවිච්චි කිරීමෙනි. එහි දී පරිසරයට යම් හානියක් වේ. එහෙත් එය පරිසරයට ප්‍රකෘතිමත් කරගැනීමට පිළිවන. එසේ ප්‍රකෘතිමත් කරගැනීමට බැරි තරමට පරිසරය නසන්නේ නම් එය සියල්ලේ විනාශය පිණිස වේ. පැරණි හෙළයා මධ්‍ය කඳුකරය හා තෙත් කලාපය වෙනුවට වියලි කලාපය කෘෂිකර්මයට තේරාගත්තේ වී හා ධාන්‍ය වර්ග පැහෙන්නට හා ශස්‍ය නෙලිමට වියලි කාලගුණය අත්‍යවශ්‍ය නිසයි. වැව් පද්ධතිය සහ කුඹුරු, මෙන් ම හේන් සකස් කිරීම යනු ද පරිසරය අවශ්‍ය පරිදි සකස් කරමින් කළයුත්තකි. එහෙත් අවසානයේ ඒ කෘෂි පද්ධතිය ම පරිසරයට වඩාත් ආශීර්වාදයක් වේ.

වැවක ඉහත්තාවට හෙවත් තාවල්ලට එපිටින් වනරොදක් තිබේ. එය හේන් ගොවිතැන සඳහා එළි කරන්නේ නැත. වැව්තාවල්ලේ වැවෙන ලඳු කැලෑව පෝටාවැටියයි. වැසිකාලෙට වැවට රොඩුකුණු ගසාගෙන ඒම පෝටාවැටියෙන් වැළකී යයි. වැහි කාලෙට වැවේ පිට වානෙන් ගලායන වැඩි වතුර වාං ඇල දිගේ ගලායයි. එයින් පරිසරයට තෙතමනය හා සාරවත් බව ගෙන දේ. කුඹුරු යායට හානියක් නො වේ. පැරණි ආර්ථික පිළිවෙත් පරිසරයට ආශීර්වාදයක් වන්නේ ඒ ආකාරයෙනි. ක්‍රිඃ පූඃ යුගයේ සිට ක්‍රිඃ වඃ 1505 අතර කාලය දකුණු ඉන්දීය ආක්‍රමණ වරින් වර සිදු වුණත් ගොඩනගාගත් ධර්ම අර්ථ රටාව තුළ මෙරට වැසියා ස්වයම්පෝෂිත කෘෂිකර්මයෙන් අවශ්‍යතා සංතෘප්ත කරගෙන පරිසර හිතකාමී දිවිපෙවෙතක් ගෙන ගිය බව පෙනේ. එයින් සම්පූර්ණ වූයේ අර්ථයයි. එනම්ඃ ආර්ථිකයයි. බුදුසමයේ ආශීර්වාදයත් සමග සම්පූර්ණ වූයේ ධර්මයයි. එනම්ඃ සදාචාරයයි. ආර්ථිකයේ භෞතික සංකේතය වූයේ වැවයි. සදාචාරයේ භෞතික සංකේතය වූයේ දාගබයි.

සියවස් දහස් ගණනක් පවත්වාගෙන ආ මේ ධර්ම අර්ථ රටාව වර්තමානයට මුහුණ දීමේ දී යොදා ගන්නා තරමට සහනය සැලසේවි. එය හුදු මනෝරාජික සංකල්පයක් ලුහුබැඳීමක් නො වේ. ඓතිහාසිකව ප්‍රායෝගික වශයෙන් අත්දුටු සත්‍යයකි. මේ විදියට පරිසරයත් සමග බද්ධ වෙන වැව් සමතලා කර කැලෑ කපා කොන්ක්‍රීට් ඇල මාර්ග දැමීමෙන් වන්නේ හානියකට වැඩි දෙයක් නොවේ. සතෙකුටවත් එහි වසන්නට නො හැකි ය. නියම පරිසර දූෂණය නම් එයයි. වැව් පද්ධතිය ප්‍රතිසංස්කරණය කරන්නත්, වැව් හරහා සුද්දන් දැමූ පාරවල් සුදුසු පරිදි වෙනස් කරන්නත් පුළුවන් නම් සැලසෙන්නේ සෙතක් ම ය. රැස්වන්නේ පිනක් ම ය.

අපි දැන් 21 වැනි සියවසේ දශක දෙකක් අවසන් වන තැන සිටිමු. එහෙත් නූතන විද්‍යා තාක්‍ෂණ ක්‍රියාදාමය නම් සකලාංගසම්පූර්ණ සමෘද්ධියක් කෙසේ වෙතත් විනාශයකින් කෙළවර වන වේගවත් ගමනක යෙදී සිටින බව පැහැදිලි ය. ගමනාන්තය සිදුවන්තේ කෙසේ දැයි කිසිවෙක් නො දනිති. නූතන ලෝකය පෙරටුවෙහි තබාගෙන සිටින්නේ විනාශයෙන් කෙළවර වන සාධක සමූහයකි. ගෝලීය කාර්මික ක්‍රියාදාමය ගෝලීය පරිසරය ගිලගනිමින් තිබේ. නැසෙන පරිසරයට අලුත්වැඩියා වෙන්නට ඉඩක් දෙන්නේ නැත. තවත් අතකින් න්‍යෂ්ටික යුද්ධයකට දනුමෙන් හා තාක්‍ෂණයෙන් සන්නද්ධ වෙමින් තිබේ. අභ්‍යවකාශ යුද්ධයක් ගැන ද ඇතැම් විට කථා කරනු ඇසේ. මේ කරුණු තුළ සකස් වන්නේ බල අසහනයයි. තවත් අතෙකින් හිස ඔසවන්නේ සාගතයකට කරුණුයි. අධිපරිභෝජනවාදී සිතට මේ වනසන්නේ අනාගත පරපුරට අයත් දේ බව නො පෙනේ. කොවිඩ් 19 නිසාවත් ලෝක බලවතුනට නුවණැස පෑදුනොත් ලෝකයට ම ශාන්තියකි.

මේ කොවිඩ් 19 වසංගතයේ ආක්‍රමණයට බලවත් රටවල් ඇතුළු හැම රටක් ම ගොදුරු වූ මේ අවස්ථාවේ ගෝලීය ආර්ථික ක්‍රියාදාමය තවදුරටත් වලංගු කළ නො හැකිය යන්න හැම රටක් ම තේරුම්ගෙන සිටිනවා වියහැකි ය. එසේ නමුත් බල අරගලයට නැමුණ සිත් ඇති අයගේ බලතෘෂ්ණාව විසින් ලෝකය කොයි අතට හරවාවිද්දැයි සැක සහිත ය. මෙතෙක් සිදු වූයේ බලකාමය ධනකාමය විසින් ලෝක ආර්ථිකයත් මිනිස් ජීවිතත් හැසිරවීමයි. කලෙක පටන් මේ දක්වා විද්‍යමාන වූයේ

අහංකාරොන්මාදයෙන් යුත් රාජ්‍යයන් හා නොයෙක් සමාගම් කරුවන් මුලු විශ්වය ම තම බූදලයක් ලෙස සිතමින් කටයුතු කරන ආකාරයයි. නුවණැසකින් තොරව අත්හදාබැලීම් මට්ටමෙන් ඔවුන් ලෝකයට ගෙන දී ඇත්තේ විනාශයයි. මේ පිළිබඳව සාකච්ඡා කරන ඊ. එෆ්. ෂූමාකර් මහතා අද ලෝකය මුහුණ පා ඇති බලවත් ම අනතුරු වන්නේ න්‍යෂ්ටික ශක්තිය යොදා ගැනීම (the application of nuclear energy), කෘෂිකර්මයේ නව රසායන විද්‍යාව (the new chemistry in agriculture), ප්‍රවාහන තාක්ෂණය (transportation technology)[1] යනාදී කරුණු බව දක්වයි. මහාපරිමාන වශයෙන් සිදුවන මෙබඳු යෙදවුම් නිසා සිදු වී ඇති හානිය යළි ප්‍රකෘතිමත් වීම කෙසේ වෙතත් තවදුරටත් සිදු වන හානිය හෝ වළක්වා ගන්නට නම් මිනිසා අල්පේච්ඡතාවට යොමු වියයුතු වේ. මහේච්ඡතාව නිසා සකසා ගන්නා අර්ථික වැඩ පිළිවෙළවල් වහා කඩාකප්පල් වන සුලු ය. ජාත්‍යන්තර ආනයන අපනයන ආර්ථිකය කොවිඩ් 19 කඩාවැදීමත් සමග ඇණහිටියේ ය. එක් පැත්තකින් වසංගතයෙන් මිදීමට කටයුතු කළයුතු විය. අනෙක් පැත්තෙන් ආහාර හිගයක් ඇති නො වීමට වග බලාගත යුතු විය. මේ තත්ත්වය හැම රටක් ම මුහුණ දුන් බරපතල ගැටලුවක් විය. අල්පේච්ඡතාවෙන් යුතුව ස්වයම්පෝෂණ ආර්ථිකයකට යොමු වීම තුළින් හදිසි කඩාවැටීම් සිදු නො වේ. ඒ සඳහා අවශ්‍ය ආකල්ප පරිවර්තනයක් සියලු දුර්වලතාවන්ගේ වාසස්ථානය වන මේ මිනිස් සමාජයෙහි නියත වශයෙන් සිදු වේ ද යන්න සැක සහිත ය.

මේ පිළිබඳව සාකච්ඡා කරන ඊ. එෆ්. ෂූමාකර් ගාන්ධි තුමාගේ කියමනක් ගෙනහැර දක්වයි. **"හැම මිනිසකුගේ ම අවශ්‍යතා සංතෘප්ත කරන්නට සෑහෙන පමණ මහපොළොව සපයන නමුත් හැම මිනිසකුගේ ම ගිජුකම සපුරාලන්නට සමත් නැත."**[2] මේ අනුව ගිජුකම සපුරා ගැනීමේ පැත්ත වෙනුවට

---

[1] Schumacher, E. F. Small is Beautiful, P. 29.

[2] "Earth Provides enough to satisfy every man's needs, but not for every man's greed'
E. F. Schumacher, Small is Beautiful., P: 26.

අවශ්‍යතා සංතෘප්තිය පිළිබඳ පැත්ත තෝරාගන්නට තරම් මිනිසා ප්‍රඥාවන්ත වියයුතු ය.

**රසතෘෂ්ණාව හා ආහාර හිගයඃ**

මනුෂ්‍යයාගේ මිථ්‍යා ආජීවය ප්‍රකට කරන තවත් ප්‍රධාන කරුණක් නම් මස් පිණිස සතුන් ඇති කිරීමයි. බුදුසමයෙහි බටහිර සමාජයේ දක්නට ලැබෙණ ආකාරයේ සත්ත්වගොවිපල යන ව්‍යවහාරයක් නැත. එහෙත් ගවරක්‍ෂණය ඇත. (ගොරක්ඛ) එය මස් පිණිස නො වේ. කෘෂිකර්මයට උපකාර පිණිසත් පස්ගෝරසය වැළඳීම පිණිසත් ය. ඒ සීමාව ඉක්මවීම යනු මිථ්‍යා ආජීවයට වැටීමකි. ඌරන්, කුකුළන්, එළුවන් ඇති කිරීම බෞද්ධ සම්මාආජීවයට අයත් නො වේ. එය කෙළින් ම මස් අනුභවය අරමුණු කරගෙන ඇති බැවිනි. මස් අනුභවය පිණිස සතුන් ඇති කිරීම මනුෂ්‍යයාගේ ආහාර හිගයට මූලික වන කරුණක් බව මිනිසාට පෙනෙන්නේ නැත. 1977 ජුලි 09 දින නිකුත් කරන ලද British Medical Journal නම් වෛද්‍ය විද්‍යාත්මක සඟරාවේ "Sensible Eating" යන මැයෙන් පළවුන ලිපියක් ආචාර්ය, ඊ. ඩබ්ඃ අදිකාරම් මහතා විසින් සිංහලට පරිවර්තනය කර සිතිවිලි පත්‍රිකාවක් (අංක 17) වශයෙන් ප්‍රසිද්ධ කර ඇත. එහි සඳහන් වන පරිදි ලෝක වාර්ෂික ආහාර නිෂ්පාදනය ලෝක ජනගහනයට වසර පහක් සඳහා ප්‍රමාණවත් වන නමුත් මස් පිණිස වූ සතුන්ගේ ආහාර නිෂ්පාදනයට ඒවා යෙදීම නිසා මනුෂ්‍යයාට ආහාර හිග වී ඇති බවත් කෝටි පණහක් ජනයා කුස ගින්නේ නිඳට යන්නේ ඒ නිසා බවත් එහි සඳහන් වේ. කොවිඩ් 19 වසංගතයත් සමඟ ස්වයම්පෝෂණ ආර්ථිකයක් පිළිබඳ අප රටේ උදා වී ඇති උනන්දුව ඵලදායී කර ගැනීම පිණිස ඒ ලිපියේ අනුවාදය සම්පූර්ණයෙන් මෙහි ඇතුළත් තරන බව සැලකුව මැනවි. <u>(මේ ලිපියේ ඇති සංඛ්‍යාත්මක කරුණු අදට නොව 1977 ට අදාළ බව සැලකුව මැනවි.)</u>

**<u>"නුවණින් යුක්තව ආහාර ගැනීම"</u>**

"බටහිර ආහාර ක්‍රමයේ මූලික වෙනසක් ඇති කිරීම සඳහා තිබෙන්නේ වෛද්‍යවිද්‍යාත්මක හේතු පමණක් නම් එම කරුණු වලට ආණ්ඩු දක්වන නොසැලකිල්ල තේරුම් ගැනීමට පුලුවන. දේශපාලනඥයින් පිළිබිඹු කරන්නේ ඡන්දදායකයන්ගේ අදහස් බැවිනුත් ඔබට හොඳ මෙය යයි කියන ලද පමණින්

ස්වකීය පුරුදු වෙනස් කිරීමට ඡන්දදායකයින් අකැමති බැවිනුත් ය. එහෙත් අප කන ආහාරයේ සහ අපේ දේශීය ගොවිතැන් ක්‍රමයේ ද වෙනසක් ඇති වියයුතු යයි ඉදිරිපත් කෙරෙන තර්කයට සම්පූර්ණයෙන් ම එකිනෙකට වෙන් වෙන් ව වෛද්‍ය විද්‍යාත්මක, ආර්ථික, සාමාජයීය, සහ කෘෂිකාර්මික සාධක වලින් අනුබලය ලැබෙන්නේ ය. ”ලෝක වෛද්‍ය විද්‍යා“ (World Medicine) සඟරා වේ විද්‍යාංශයේ කතෘවරයා වන කොලින් ටජ් විසින් කියවීමට පහසු, එහෙත් සිත අවුස්සන, කෘතියක[1] ඒ සාධක දත් එක්තැන් කර තිබේ.

වෛද්‍ය විද්‍යානුකූලව ඉදිරිපත් කෙරෙන තර්කය මෙයින් වැඩියෙන් ම දුෂ්කර එක වන්නට පුලුවන. ඊට පැති බොහොමයක් ඇති බැවිනි. ”ස්වභාවික“ මනුෂ්‍ය ආහාරයෙහි මස් වලට ලැබෙන අනුපාතය ගැන මානව විද්‍යාඥයෝ තවම විවාද කර ගනිති. එහෙත් බටහිර මිනිසා ඕනෑවට වඩා මස් කන බව, ඕනෑවට වඩා සත්ත්ව මේද සහ ගෝරස කන බව, ඕනෑවට වඩා ශෝධිත (පිරිසිදු කරන ලද) කාබෝහඩ්රේට් කන බව, ඕනෑ තරම් කෙඳි සහිත ආහාර නොකන බව, ඒත්තු නොගන්න පෝෂ්‍යගුණ විද්‍යාඥයින් ඇත්තේ ටික දෙනෙකි. වඩා නුවණට හුරු ආහාර ක්‍රමයකට බැසීමෙන්, එනම් ධාන්‍ය වර්ග සහ එළවළු වර්ග වැඩියෙන් ද, මස් සහ මේද අඩුවෙන් ද කෑමෙන් මයෝකාඩියල් ඉන්ෆාක්ෂන් (Myocardial Infarction) නම් හෘදයාබාධයෙන් මැදි වයසේ දී මරණයට පත්වන්නවුන්ගේ සංඛ්‍යාවෙන් ටිකක් හෝ අඩු කරගත හැකි වේ යයි බහුල ලෙස ව්‍යාප්ත වේගන යන රෝගයක් වශයෙන් හෘදයාබාධය ගැන කෙරී ඇති පර්යේෂණ වලින් පෙනේ. බහු අතෘප්ත (Pulyunsaturated) මේද වල වටිනාකම ගැනත්’ ආහාර වලට එකතු කරන ද්‍රව්‍ය වල ද මිහිරි බව සහ රසය ඇති කරවන කෘත්‍රිම ද්‍රව්‍ය වල ද අනතුර ගැනත් දැනුම එතරම් නිශ්චයාත්මක නැත. එහෙත් ආර්ථික හේතු අනුව සලකන විට මාංසාහාරයෙන් ධාන්‍යාහාරයට කොටසක් හෝ පරිවර්තනය කිරීමේ වැදගත්කම ඊට වඩා බොහෝ සෙයින් පැහැදිලි ය.

---

[1] Tudge, Colin, The Famine Business. London Faber and Faber 1977.

බ්‍රිතාන්‍ය දූපත් වල දැනට තදබදව සිටින මනුෂ්‍යයින් (60,000,000) හය කෝටියට අමතරව ඇති කිකිළියන් 150,000,000 ද බැටළුවන් 30,000,000 ද හරකුන් 15,000,000 ද නඩත්තු කරන්නට දරණ උත්සාහය නතර කළ හොත් ආහාර අතින් ස්වයම්පෝෂිත වීමට බ්‍රිතාන්‍යයට හැකි වෙනවා ඇතැයි අවුරුදු දෙකකට ඉහත දී කෙනත් මෙලන්බි[1] පෙන්වා දුන්නේ ය. දවසට දෙවරක් අප සියලු දෙනාට මස් කත හැකි වනු පිණිස වටිනා ධාන්‍යයෙන් කුකුළන් සහ හරකුන් තර කිරීම කාර්යක්ෂම නොවන ක්‍රියාවකි. හරක්මස් එක රාත්තලක් ලබා ගැනීමට හරක් කෑම රාත්තල් 30 ක් පමණ වැය වන්නේ යයි මෙලන්බි කියයි. ශාක ආහාරය ඉතාම හොඳින් සත්ත්ව ප්‍රෝටීන් බවට පරිවර්තනය කරන්නේ කිකිළිය විසින් ය. එසේ තිබියදීත් අවුරුද්දකට රාත්තල් 30 ක බිත්තර දමන කිකිළියට රාත්තල් 100 ක ආහාර දියයුතු වන්නේ ය. <u>අද බ්‍රිතාන්‍යයෙහි නිපදවන ධාන්‍ය ප්‍රමාණයෙන් තුනෙන් දෙකක් දෙනු ලබන්නේ සතුන්ට ය. ඇත්ත වශයෙන් බලන විට, පිටරටින් ආහාර ගෙන්වීම අනවශ්‍ය ය. නිර්මාංසාහාරයෙන් යැපෙනවා නම් මනුෂ්‍යයින් කෝටි 25 ක යැපීමට ඇති වන තරම් ආහාර අපේ ගොවි බිම් වලට නිපදවීමට පුලුවන්කම ඇත්තේ ය. එහෙත් කෘෂි කර්මය ප්‍රබල කර්මාන්තයක් වී තිබියදී පවා ගොවියෝ පිටරට සිදුවීම් වලින් අතවර ලබති.</u> යුරෝපීය ආර්ථික සමුළුව අතුළත කෘෂිකාර්මීය ප්‍රතිපත්තිවල වෙනසක් හෝ උතුරු ඇමරිකාවේ විශාල ධාන්‍ය අස්වැන්නක් හෝ රුසියාවේ නරක ශීත ඍතුවක් හෝ ඇති වුවහොත් ඒ හේතුවෙන් ආර්ථික සමතුලිතතාව වෙනස් වන්නට පුලුවන. එවිට ගොවියා බංකොලොත් නොවී සිටීමට නම් ගවපාලනයේ සිට ධාන්‍ය වගාවට හෝ ධාන්‍ය වගාවේ සිට ගවපාලනයට හෝ ඌරන් ඇති කිරීම පටන්ගැනීමට හෝ ඔහුට සිදු වන්නේ ය. තමාගේ ඉඩමට ඉතාමත් ම හොඳ යයි තමා දන්න අන්දමින් ගොවිතැන් කිරීමට නිදහසක් වත් ආර්ථික සුරක්ෂිතභාවය වත් භුක්ති විඳීමට ඔහුට නැත.

---

[1] Mellanby Kenneth, Can Baitain Feed Itself. Merlin Press 1977

මේ අතරතුර ජෝන් ලොරේන් දුන් නැවත අපට මතක් කර දී ඇති පරිදි[1] ජනගහන බෝම්බය පුපුරන්නට ළං වේගෙන එයි. හරිත විප්ලවයේ ගොවිතැන් ක්‍රම වල වෙනස් වීම් සිදු වුවත් ආහාර නිෂ්පාදනයේ වෙනත් දියුණුවීම් ඇති වුවත් පෘථිවි වාසීන්ගෙන් කෝටි 50 ක් අදත් නිඳට යන්නේ කුසගින්නේ ය. අද ලෝක ජනගහනය කෝටි 400 කි. එහෙත් ගොවිපොලවල ඇති කරන සතුන් කන ආහාර ප්‍රමාණය මනුෂ්‍ය මිම්මෙන් ප්‍රකාශ කරත හොත් එය තව මනුෂ්‍යයින් කෝටි 1500 කට සෑහෙන ආහාර ප්‍රමාණයක් වන්නේය. මෙය සරළ වශයෙන් දක්වත හොත් වර්තමාන ලෝකයේ කෘෂිකර්ම නිෂ්පාදනය අද ලෝකයේ ජනගහනය මෙන් පස් ගුණයක යැපීමට සෑහෙන්නේ ය.

ධාන්‍ය වර්ග, මෑ වර්ග සහ එලවළු වර්ග වැඩියෙන් ද සතුන් ඇති කිරීමෙන් ලැබෙන දේ අඩුවෙන් ද යුක්ත වන වඩා සරළ ආහාර ක්‍රමයකට පරිවර්තනය වීමෙන් සෞඛ්‍යයේ දියුණුවක් ද ආර්ථික කරදර වල අඩු වීමක් ද සිදු වනු ඇත. පොහොසත් සමාජ වල පවතින "මාංසාහාර බුද්ධිය" (Steak House Mentality) විවේචනයට භාජනය කරමින් ද ධාන්‍යය මාංසයට පරිවර්තනය කිරීම ආචාර ධර්ම අතින් පමණක් නොව ආර්ථික වශයෙනුත් වැරදි බැව් පෙන්වමින් ද ලියා ඇති "එක පාන් වාටියක්" (One Crust Of Bread) නම් කුඩා පොත ඔක්සිෆම් (Oxfam) ප්‍රකාශකයින් විසින් මේ සතියේ දී පළකර තිබේ. සුළු ප්‍රමාණ ගෙවතු වගාවට සහ මිශ්‍ර ගොවිතැනට ආපසු යා යුතු බවත් අලෙවිය සඳහා වවන භෝගවර්ග එක බිමේ නැවත නැවත වගා නො කළ යුතු බවත් කොලින් ටජ් විස්තර වශයෙන් තර්කානුකූලව ප්‍රකාශ කරයි.

අනික් පැත්තට දක්වත හැකි තර්ක සියල්ල ම ව්‍යාපාරික ය. වෙළඳම පිළිබඳ අර්ථයක් - කෙටි කාලීන වූ හෝ අර්ථයක් - මාංසාහාරයෙහි ඇත. සමූහ නිෂ්පාදනය, සමූහ අලෙවිය, ශීත කරණ යන්ත්‍රෝපකරණවල ආධාරයෙන් මහා වෙළඳසැල් වලට බෙදා හැරීම - මෙම වර්තමාන කාර්මික ක්‍රම වැඩුනේත් සමෘද්ධ වූයේත් අණ්ඩුවල පවත්නා මැදිහත් නො වීමේ ගතියට ප්‍රතිචාර

---

1 Loraine John. Syndromes 0f the Seventies. London. Peter Owen 1977.

වශයෙන් ය. ආණ්ඩුවල මැදිහත් වීමක් නොමැති මේ ක්‍රියාමාර්ගයන් ආපසු හැරවීමට පුලුවන්කමක් නැත. සීමාරහිත ආර්ථික වර්ධනය ගැන ආණ්ඩුවල විශ්වාසය පවතින තුරු එසේ මැදිහත් වීමක් සිදු වන්නේ ද නැත. මේ අද්භූත විශ්වාසය බිඳ වැටෙන විට ඥාණවන්න ආකාරයකට අපේ ආහාර ක්‍රමය සකස් කර ගැනීමට අවස්ථාව සැලසෙනවා ඇත. තවද එවිට වර්තමාන ප්‍රතිපත්ති ගැන සමාලෝචනය කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යවරයා[1] විසින් ගෙන ඇති තීරණය අනාගතයට සංඥා කණුවක් වීමට ඉඩ ඇත්තේ ය."

බ්‍රිතාන්‍යයට අදාළ මේ ලිපියෙන් සාකච්ඡා වූයේ කොයි රටටත් අදාළ කෘෂිකර්මය, ආහාරය පිළිබඳ කටයුතු පුද්ගලයින් විසින් සීමාරහිත ආර්ථික වර්ධනයක් කරා ගෙනයාම වෙනුවට සෞඛ්‍යය, සදාචාරය, සුරක්ෂිත වන පරිදි මෙහෙයැවීමට රජයේ මැදිහත් වීමේ අවශ්‍යතාවයි. මේ ලිපියෙහි මා විසින් රේඛිත කොටස් වලින් මාගේ අවධානයට ලක් වූ කරුණු කියැවේ.

1986 දී හර්බට් ගිරාර්ඩට් පෙන්වා දෙන්නේ ලෝකධාන්‍ය නිෂ්පාදනයෙන් සියයට 40 ක් සත්ව ආහාර සඳහා යොදනු ලබන බවත්, ධනවත් රටවල් සියයට 75 ක් සත්වාහාර සඳහා යොදනු ලබන බවත්, ඇමරිකා එක්සත් ජනපදය සියයට 90 ක් යොදනු ලබන බවත් ය.[2] මේ අනුව පෙනෙන්නේ ලෝක ජනගහනයට ප්‍රමාණවත් ධාන්‍ය තිබියදී මස් අනුභවයට ඇති රුචිය පිරිමසන්නට යාම නිසා ආහාර හිගයක් නිර්මාණය වන බව ය. මෙය ආහාර හිගයට එක් හේතුවක් පමණක් නොව ප්‍රධාන හේතුව විය හැකි යයි, ආචාර්ය, ධර්මසේන හෙට්ටි ආරච්චි ශූරීහු තර්ක කරති. දහම අනුව මෙය සත්ව ඝාතනය සාමාන්‍යකරණය කිරීමක් වන්නා සේ ම, මේ සාවද්‍ය පරිහරණ ක්‍රමය මිථ්‍යා ආජීවයට අයත් වන බව දතයුතු ය. අහිංසා දහම ආධ්‍යාත්මික සදාචාරයක් වන්නා සේ ම ප්‍රඥාසම්ප්‍රයුක්ත ආර්ථික සැලැස්මක් ද වේ.

අද යුගය වන විටත් මනුෂ්‍යයා දැනුම හා චර්යාව සකසා ගැනීමට පොදුවේ යොදා ගන්නා ප්‍රධාන මාධ්‍ය දෙකක්

---

[1] The Times. 5 July 1977.

[2] හෙට්ටිආරච්චි, ධර්මසේන, ආචාර්ය, බෞද්ධ ආර්ථික දර්ශනය, 338 පිට, 1994.

වශයෙන් "ආගම" සහ "නවීනවිද්‍යාව" හැඳින්විය හැකියි. බොහෝ විට ආගම් සදාචාරය අවධාරණය කළ ද, ආගමික ඥානය අන්ධ විශ්වාසයන් කරා ගමන් කරනු දක්නට ලැබේ. නවීනවිද්‍යාව ඥානය කෙරෙහි උනන්දු වන නමුත් සදාචාරය නො සළකා හරියි. මේ අන්ත දෙකට ම නොගොස් ඥානසම්ප්‍රයුක්ත සදාචාරයත්, සදාචාරසම්ප්‍රයුක්ත ඥානයත් අවධාරණය කෙරෙන මධ්‍ය දර්ශනයක් අවශ්‍ය වෙයි. ඒ මධ්‍ය දර්ශනය අප වෙත ප්‍රදානය කරන්නේ බෞද්ධ චින්තනයයි. බෞද්ධ චින්තනය අනුව ලෝකය පරිහරණය කරන්නේ නම් අන්ධ විශ්වාසයන්ට වැටෙන්නේ ද නැත. දුරාචාරයට වැටෙන්නේ ද නැත. සාමාන්‍ය සංජානන සීමාව ඉක්මවා නුවණැස භාවිතා කරන්නේ නම් මේ කියන කරුණ කෙනකුට පැහැදිලි වන්නට පිළිවන. අද වන විට බටහිර ලෝකයේ ඇතැම් අය පවා බුදුදහම හඳුනා ගැනීමත් සමග ඔවුනගේ කලබලකාරී ජීවනරටාවේ පීඩනය මගහරවා ගැනීම පිණිස සමාධි ප්‍රඥා වැඩීමට යොමු වනු දක්නට ලැබෙන්නේ ඒ නිසාවෙනි. පෙරදිග ඥානයේ විශේෂතාවන් හඳුනාගැනීම කෙරෙහි අද උනන්දුවක් ඇති වී තිබේ. එහෙත් බල අරගලයේ නියැලී සිටින අයට එවන් අවධානයකට අස්වැසිල්ලක් තව ම ලැබී නැත.

බටහිර සංවර්ධන පූර්වාදර්ශයන්ගෙන් ගිනිකන වැටුන මෙරට අයටත් දහමේ ප්‍රායෝගික වටිනාකම් පෙනෙන්නේ නැත. ධර්මයෙහි සඳහන් වන විපත් තුනකින් මිදුන හොත් හැම විපතකින් ම මිදීමට හැකි වනු ඇත. දැන් ඒ කෙරෙහි අවධානය යොමු කරමු.

1. **කම්මන්තවිපත්තිඃ** ප්‍රාණඝාතය, හොරකම, දුරාචාරය, බොරුව, වචනයෙන් අනුන් බිඳුවීම, වචනයෙන් රිදවීම, වචනයෙන් ප්‍රමාද කිරීම කම්මන්තවිපත්තියයි.
2. **ආජීවවිපත්තිඃ** මිනිසාගේ ජීවනෝපාය ජීවත්වීම පිණිස නොවී ජීවන අතවරයක් වන්නේ නම් බුදුසමය එය අනුමත කරන්නේ නැත. සියලු සදාචාර හරපද්ධතීන් නොසලකා ලාභය ම, ලාභයෙනුත් ලාභය ම පෙරටු කරගන්නේ නම් ඒ ආජීවවිපත්තියයි. **(ලාභෙන ලාභං නිජිගිංසනතා)**

3. **දිට්ඨිවිපත්තිඃ** දශවස්තුක මිථ්‍යා දෘෂ්ටියෙන් යුතු පුද්ගලයා ලෝකයේ කටයුතු කරන්නේ ආත්මලාභය ම පෙරටු කරගෙන බැවින්, කායික වාචසික චර්යාවන් හා ආජීවය හසුරුවන්නේ කාම, ව්‍යාපාද, විහිංසා සංකල්පනා තුළිනි. සැකසෙන්නේ විපතට කරුණු ම ය.[1]

මේ විපත් තුනෙන් මිදීම ම කම්මන්තසම්පදාවයි. ආජීවසම්පදාවයි. දිට්ඨිසම්පදාවයි. කොරෝනා විපතින් පමණක් නොව සියලු විපතින් මිදීමේ යනු මෙකී විපත් තුනෙන් මිදීම ම ය. හුදු භෞතිකත්වයේ වසඟයට ගිය බටහිර පූර්වාදර්ශයන් සෙවීම වෙනුවට මිනිස් අවශ්‍යතා සංතෘප්තිය පිණිසත්, නිරුපද්‍රැත පැවැත්ම පිණිසත්, පරිසර සුරක්ෂිතතාව පිණිසත් කම්මන්ත සම්පත්තියේත්, ආජීව සම්පත්තියේත් දිට්ඨි සම්පත්තියේත් ප්‍රායෝගික අවශ්‍යතාව දැන ක්‍රියා කරන්නට සැමට නුවණැස උදා වේවා.

---

1 අංඃ නිඃ 1, අපායික වග්ග 7 සූත්‍රය, 486 පිට, බුඃ ජඃ මුඃ

# 10

## විද්‍යාව, තාක්ෂණය හා දර්ශනය

මුළු මහත් ලෝකය ම වෙනුවෙන් ඉතිහාසය තුළ බුදුසමය ආරක්ෂා කරගත් රට ලක් බිම ය. එහි වෙසෙන්නවුන් හැටියට නූතන අභියෝගයන් ඉදිරියේ අපගේ ආකල්ප බුද්ධවචනයට අනුව සකසාගැනීම අතිශයින් වැදගත් ය. සියලු ආකාර අන්තයන්ගෙන් මිදී ලෝකය දකීමේ දර්ශන සම්පත්තිය ගැබ් වී තිබෙන්නේ බුදුසමයෙහි බැවිනි. බුදුසමය ආධ්‍යාත්මික විමුක්තිය අරමුණු කරගත් ජීවන දර්ශනයකි. එය මිනිස් ජීවිතයේ හැම ක්ෂේත්‍රයකට ම අදාළව මිනිසා සතු වියයුතු දර්ශන සම්පත්තිය ඉදිරිපත් කරයි. භික්ෂූන් වහන්සේ සමාජයට පිවිසිය යුත්තේ ඒ දර්ශන සම්පත්තියෙන් සන්නද්ධව ය.

එහෙත් නවීන විද්‍යාත්මක තාක්ෂණික ප්‍රගතිය ඉදිරියේ පැන නැගී ඇති මිනිස් ගැටලු විසඳාලීමට ආධ්‍යාත්මික යයි විශේෂ කොට දක්වෙන ඉගැන්වීම් තුළින් ප්‍රයත්නයක් දැරීම නිෂ්ප්‍රයෝජන ක්‍රියාවක් හැටියට ඇතැමෙක් සලකනවා විය හැකි ය. නිර්මාණවාදය කේන්ද්‍ර කරගත් ආගමික සංකල්ප තුළින් නම් මිනිස් ගැටලු තේරුම් නො ගතහැකි ය. එයට හේතුව නම් ආත්මසාරයකින් යුක්ත වන්නේ මිනිසා පමණක් යයි සිතන බැවින් සියලු දෙය මිනිසාගේ ප්‍රයෝජනය පිණිස ය, යන මූලික පිළිගැනීම මත මිනිසා ලෝකය කෙරෙහි අනුචිත ආධිපත්‍යයක් දැරීමට ක්‍රියා කිරීමයි. එතැන සිදුව ඇත්තේ අහංකාරයේත් (මම යන හැඟීමේත්) මමංකාරයේත් (මගේ යන හැඟීමේත්) ප්‍රකාශයයි. එසේ ක්‍රියා කරනුයේ ජීව සන්තතියේ එකිනෙකට යැපෙනසුලු බව සලකන්නට තරම් ප්‍රඥාසම්ප්‍රයුක්ත බවක් නොමැති බැවිනි.

**දර්ශන සම්පත්තියඃ**

මෙහි දී දර්ශන සම්පත්තිය වශයෙන් තේරුම් ගතයුතු සත්‍යය නම් මිනිසා ස්වභාව විද්‍යාත්මක සැකැස්මක් බවයි. ශරීරය යනු හුදෙක් මිනිස් නමැති ජීවසන්තතියේ සංස්කරණයක් පමණක් නොව චේතනාමය අභිසංස්කරණයක් ද වේ. දේව මැවිල්ලක් නො වේ. "මම " යනු තිරසර ධර්මයක් නොව නාම -

රූප සම්බන්ධතා වශයෙන් මොහොතක් පාසා ලබන අත්දැකීම් ඔස්සේ කල්පනය කරගන්නා තත්ත්වයක් පමණක් බව **(පටිච්චසමුප්පන්න බව)** සාමාන්‍ය ලෝකයා නො දනියි. මම යන සංකල්පනයෙන් ඉදිරියට පැන නාශනාත්මකව හැසිරෙන්නේ ඒ නිසයි. ඊළඟට මිනිසාට තිබියයුතු අනෙක් දර්ශන සම්පත්තිය නම් පුද්ගලයා දන්නා සියල්ල මේ මොහොතට අත්දැකීම් වශයෙන් සමුදය වන ස්වභාවයක් පමණක් බවයි. ලෝකයාට අත්දැකීම් මුණගැසෙන්නේ මෙනෙහි කිරීම නිසයි. **(මනසිකාරසම්භවා සබ්බෙධම්මා)** අතීතය පිළිබඳ යමක් වේ නම් එය ද මේ මොහොතේ සංකල්පීය වශයෙන් සමුදය වන තත්ත්වයක් පමණයි. අනාගතය පිළිබඳ යමක් වේ නම් එය ද මේ මොහොතේ සංකල්පීය වශයෙන් සමුදය වන තත්ත්වයක් පමණයි. වර්තමානය යන වචනය වෙනුවට බුදුසමය මේ මොහොත උදෙසා භාවිතා කරන්නේ පච්චුප්පන්න යන වචනයයි. එහි වචනාර්ථය 'ප්‍රත්‍යයන්ගෙන් උපන්' යන්නයි. එයින් කියැවෙන්නේ වාස්තවික දේ වල ඉපදීමක් ගැන නොව පුද්ගල සළායතනික අත්දැකීම් වශයෙන් ලෝකය සමුදය වීම ගැනයි. ඒ බව නො දන මනසිකාරයට ලක්වන ස්වභාවය ඇත්තක් සේ ගන්නේ නුනුවණින් මෙනෙහි කිරීම නිසයි. ඊට කියන්නේ **අයොනිසොමනසිකාර** ය කියා ය. සමුදය හැම විට ම නිරෝධය ස්වභාවය කොට ඇත. ඇති සැටිය දැකීම වන්නේ මේ දර්ශන සම්පත්තියයි. එනම් යම් ප්‍රත්‍ය සම්බන්ධතාවකින් සමුදය වන දේ ප්‍රත්‍ය නිරෝධයෙන් නිරුද්ධ වන බව දැකීමයි. බුදුසමයේ **යෝනිසොමනසිකාරය** හැටියට දක්වන්නේ මේ පිළිවෙතයි. ප්‍රභවයෙහි පටන් මෙනෙහි කිරීම යනු යෝනිසෝමනසිකාරය යන්නෙහි අර්ථයයි. හැම දෙයක් ම පුද්ගලයාට දෙයක් වන්නේ ස්පර්ශයෙනි. තව විදියකින් කිව හොත් හැම පුද්ගල අත්දැකීමක් ම සමුදය වන්නේ සළායතනික ස්පර්ශයෙන් ය. **(ඵස්සසමුදයා සබ්බෙධම්මා)** එනම් ඇස, කන, නැහැය, දිව, කය, මන යන ආයතන ඇසුරු කරගෙන විඤ්ඤාණ (දැනීම්) ක්‍රියාවලියක් හැටියට පිළිබිඹු කරන නිමිත්ත් ඒ නිමිති විඳීම් හැඳිනීම් චේතනා ඇසුරින් දැනගැනීමත් ස්පර්ශයයි. ස්පර්ශය වේදනාවට (වෙදනා) සම්බන්ධ ය. පුද්ගලයා තණ්හාව **(තණ්හා)** ඇති කරගන්නේ ඒ වින්දනයට ය. අල්ලාගන්නේ **(උපාදාන)** තණ්හා කරන දෙයයි. දිගින් දිගට තියා ගන්න **(භව)** සිතන්නේ අල්ලාගත් දෙයයි. දිගින්

දිගට තියාගන්න හිතෙන නිසා රූපනිමිති විඳීම් හැඳිනීම් චේතනා දැනීම් වශයෙන් නැවත නැවත අත්දැකීම **(ජාති)** ලබයි. මේ නැවත නැවත අත්දකින දේවල් තමයි, කඩාකප්පල් වෙන්නේ. **(ජරාමරණ)** සියලු සෝක, හැඬුම්, වැළපීම්, දුක් දොම්නස් උපායාස ඇති වෙන්නෙ එසේ කඩකප්පල් වෙන බැවිනි. **(සොකපරිදේවදුකඛදොමනස්සුපායාසා සම්භවන්ති)** විද්‍යා තාක්‍ෂණ උපයෝගීතාවෙන් වුව ද මිනිසා අද සකස් කරගෙන ඇත්තේ කඩාකප්පල් වන දේවල් ම ය.

මේ නියාමය දන්න කෙනා "මම" කියන්නෙ මවාගත්ත අහංකාරය බව දනියි. "මගේ" කියන්නේ මවාගත්ත අයිති වාසිකමක් බව ද දනියි. "මම වෙමි" යන්න හිතා ගැනීමක් බව දනියි. **(අස්මීති භික්ඛවෙ මඤ්ඤිතමෙතං)** මම කියන්නෙ මෙන්න මේකටයි කියල යමක් අල්ල ගත්තොත් එය ද හිතාගැනීමක් පමණක් බව නුවණින් දකියි. **(අයමහමස්මීති මඤ්ඤිතමෙතං)**[1] මේ දෙක ම මැවෙන්නේ අල්ලා ගැනීම ඇති කල්හි බව දනියි. **(උපාදාය බො ආනන්ද 'අස්මී'ති හොති)** අල්ලාගන්නේ නැත්නම් මම නො මැවේ. **(නො අනුපාදාය)**[2] අල්ලාගන්නේ මොනවා ද? රූප විඳීම්, හැඳිනීම්, චේතනා (සංස්කාර), දැනීම් (විඤ්ඤාණ) යන ස්කන්ධයි. මොහොතින් මොහොත සිදු වන දෙය මෙයයි. අතීතයේ සිදු වූයේ ද මීට වැඩි දෙයක් නො වේ. මතු සිදු වන්නේ ද මීට වැඩි දෙයක් නො වේ. මේ සිතින් නිපදවීම නිම කළොත් දුක් මැවීමේ කෙළවර එයයි. එයමයි, නිවන. එයට පිළිවෙත තමා තුළ සැකසෙන සියලු චේතනාමය අභිසංස්කරණයන් විනිවිද දැකීමයි. විදසුන් වැඩීමයි.

මෙය දස්සනසම්පත්තිය හැටියට හඳුන්වන්නේ හුදු දැනුමකට සීමා වීමක් වශයෙන් නො වේ. පුද්ගලයා සළායතනිකව ලබන අත්දැකීම් ක්‍රියාවලිය පිළිබඳ හේතු ප්‍රත්‍ය සම්බන්ධතාව දැකීමයි. ලොව වාස්තවික වශයෙන් කවරක් තිබුණත් පුද්ගලයා දන්නේ සළායතනික අත්දැකීම් පමණි. පටිච්චසමුප්පාද ධර්ම න්‍යායයෙන් පැහැදිලි කරන්නේ එයයි. තමා ඇලෙන්නේ හෝ **(රාග)** ගැටෙන්නේ හෝ **(ද්වේෂ)**

---

[1] සං: නි: 4, යවකලාපී සූත්‍රය, 386 පිට, බු: ජ: මු:

[2] සං: නි: 3, ආනන්ද සූත්‍රය, 180 පිට, බු: ජ: මු:

රැවටෙන්නේ හෝ **(මෝහ)** බාහිර වාස්තවික දේ වලට සේ පෙනුනත් තමාගේ ම සළායතනික අත්දැකීම් ලෝකය පිළිබඳ සංකල්පනාමය ස්වභාවයට බව තේරුම් ගැනීමයි. **(සඞ්කප්පරාගො පුරිසස්ස කාමො)**[1] ඇසින් ලබන්නේ වර්ණරූප සංඥාවකි. කනින් ලබන්නේ සද්දරූප සංඥාවකි. නැහැයෙන් ලබන්නේ ගන්ධරූප සංඥාවකි. දිවින් ලබන්නේ රසරූප සංඥාවකි. කයින් ලබන්නේ ඵොට්ඨබ්බරූප සංඥාවකි. මනසින් ලබන්නේ ධම්මරූප සංඥාවකි. විඳිමින් හඳුනමින් චේතනාමය වශයෙන් සකස් කරගන්නා ස්වභාවයකි. තමා දරණ කය පිළිබඳවත් අනුන් දරණ කය පිළිබඳවත් අපට ඇත්තේ ද රූප සංඥාවකට වැඩි යමක් නො වේ.

**සසරඃ**

සසර සකස් වන්නේ යට කී සම්බන්ධතාව තුළයි. පුද්ගලයා මියයන්නේ මියයන්න කැමැත්තෙන් නො වේ. කැමති වන්නේ ඉන්නයි. පුහුදුන් පුද්ගලයා සිතන්නේ නැවත අත්දැකීම් සකසන්නයි. **(අස්සුතවා පුථුජ්ජනො ආයතිං පුනබ්භවාය චෙතෙති)**[2] අත්දැකීම් සකසනවා යනු විඤ්ඤාණය පිළිබිඹු කරන නාමරූප අත්දැකීම් ඇල්ලීමයි. උපාදාන සහිත සත්වයා මියයන මොහොතේ සකස් වන විඳින හැඳිනීම් චේතනා අනුව විඤ්ඤාණය පිළිබිඹු කරන රූප නිමිත්ත අල්ලා ගැනීම ඊ ළඟ භවයයි. විඤ්ඤාණ නාමරූප සකස් වන්නේ ඊට අනුවයි. "තව ඕනෑ" කියන හිතින් මැරෙණ කෙනාට "ඕං එහෙනං" කියල චේතනාවේ හැටියට දෙන සුගතිය හරි දුගතිය හරි අල්ල ගැනීමයි, මැරිල උපදිනව කියන්නේ. මෙතන ආත්ම කථාවක් නොවෙයි, තියෙන්නේ හේතුප්‍රත්‍ය සම්බන්ධතාවයි. මේ කරුණ බුදුරජාණන් වහන්සේ වදාළ තැනකින් පැහැදිලි කර ගනිමු.

"මහණෙනි, යමක් සිතයි ද, යමක් කල්පනා කරයි ද අනුසය වශයෙන් යමක් පවත්වා ද මෙය විඤ්ඤාණයේ පැවතීමට අරමුණ වෙයි. අරමුණ ඇති කල්හි විඤ්ඤාණයේ පිහිටීම වේ. ඒ විඤ්ඤාණය පිහිටි කල්හි , වැඩුණු කල්හි මතු පුනර්භවය හට ගැනීම වේ. මතු පුනර්භවය හට ගැණීම ඇති

---

1 අංඃ නිඃ 4, නිබ්බෙධික සූත්‍රය, 202 පිට, බුඃ ජඃ මුඃ

2 සංඃ නිඃ 4, යවකලාපී සූත්‍රය, 384 පිට, බුඃ ජඃ මුඃ

කල්හි මතු ජාති ජරා මරණ සෝක පරිදේව දුක් දොම්නස් උපායාසයෝ හටගනිත්. මෙසේ මේ දුක් රැසේ හටගැණීම වේ.”[1]

සසර සැකැස්ම මෙයයි. තමා කියන්නේ ස්ථිර දෙයක් නොව හිතා ගැනීමක් පමණක් බව දන මේ ක්‍රියාකාරිත්වය පිළිබඳ අනිත්‍යතාව දුක් බව අනාත්මබව දක මේ අත්දකින ස්වභාව කිසිවක් “මගේ නො වෙයි, මම නො වෙයි, මාගේ ආත්මය නො වෙයි” යනුවෙන් නුවණ මෙහෙයවීම විදර්ශනා භාවනාවයි. ද්‍රව්‍ය ලෝකයේ අනිත්‍යතාවට වඩා අප දකියයුත්තේ චේතනාමය වශයෙන් අභිසංස්කරණය කරගන්නා ස්කන්ධ ලෝකයෙහි අනිත්‍යතාවයි. අනිත්‍ය සංඥාව වැඩිය යුත්තේ අස්මිමානය දුරු කිරීම පිණිස ය. **(අනිච්චසඤ්ඤා භාවෙතබ්බා අස්මිමාන සමුග්ඝාතාය)** අනිත්‍යසංඥාව වඩන කල්හි අනත්ත සංඥාව පිහිටයි. **(අනිච්චසඤ්ඤිනො අනත්තසඤ්ඤා සණ්ඨාති)** අනත්තසඤ්ඤා යනු සළායතනික අත්දැකීම් තම සිතැගි අනුව හැසිරවිය නො හැකි බව දැකීමයි. අනත්තසඤ්ඤාව ඇත් නම් අස්මිමානය දුරු වෙයි. **(අනත්තසඤ්ඤී අස්මිමාන සමුග්ඝාතං පාපුණාති)** එය දිට්ඨදම්යෙහි ම නිවන පිණිස වෙයි. **(දිට්ඨෙව ධම්මෙ නිබ්බානං)**[2] මේ සත්‍යය වැටහෙන්නට පටන් ගන්නා තාක් පුද්ගල හැසිරීම් පිළිබඳ සංයමයක් ස්ථිර වශයෙන් අපේක්ෂා නො කළහැකි වේ. මේ කරුණු අප මෙහි දී පැහැදිලි කර ඇත්තේ සංක්ෂිප්ත වශයෙන් බව සැලකියයුතු ය.

## දර්ශනය හා චරණයඃ

අස්මි මානය මොහොතින් මොහොත සැකසෙන හිතාගැනීමක් පමණක් බව දැකීම ජීවන දර්ශනයක් වශයෙන් පුද්ගලයා තුළ භාවිත වන්නේ කෙසේ ද? එය අපි තේරුම් ගනිමු. අස්මිමානය යනු සංකල්පීය සකස්කර ගැනීමක් බව

---

1 “යඤ්ච භික්ඛවෙ චෙතෙති, යඤ්ච පකප්පෙති යඤ්ච අනුසෙති, ආරම්මණමෙතං හොති විඤ්ඤාණස්ස ඨිතියා. ආරම්මණෙ සති පතිට්ඨා විඤ්ඤාණස්ස හොති. තස්මිං පතිට්ඨිතෙ විඤ්ඤාණෙ විරූළ්හෙ ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති හොති. ආයතිං පුනබ්භවාභිනිබ්බත්තියා සති ආයතිං ජාති ජරා මරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සමභවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.”
සංඃ නිඃ 2, චෙතනා සූත්‍රය, 102 පිට, බුඃ ජඃ මුඃ

2 අංඃ නිඃ 5, සම්බොධිපක්ඛිය සූත්‍රය, 370 පිට, බුඃ ජඃ මුඃ

නො දකින අය පහසුවෙන් ම කාම, ව්‍යාපාද, විහිංසා සංකල්ප වලින් මෙහෙයැවුණ සිතින් හැසිරීමට පෙළඹේ. එවන් පුද්ගලයා වචනයත් කයත් හසුරුවන්නේ වැරදි ආකාරයට ය. වැටෙන්නේ මිථ්‍යා ආජීවයට ය. පුද්ගලයාගේ හැසිරීමට බලපාන්නේ ඔහුගේ සංකල්පනායි. සංකල්පනාවන් සැකසෙන්නේ ජීවිතය දක්නා ආකාරය අනුවයි. ඕනෑ ම පුද්ගලයකුට තමාව ම නිරීක්ෂණය කිරීමෙන් මෙහි සත්‍යතාවය අවබෝධ කරගත හැකියි. අස්මිමානය සංකල්පීය සකස් කරගැනීමක් බව දකින පුද්ගලයාගේ කාම, ව්‍යාපාද, විහිංසා සංකල්පනා සංයමයට පත් වීම ස්වභාවයයි. ඒ වෙනුවට නෙක්ඛම්ම, අව්‍යාපාද, අවිහිංසා සංකල්පනා පිබිදෙන බැවිනි. මිනිස් චර්යාවන් සැකසෙන්නේ එවන් සංකල්පනා තුළින් නම් මිනිසාගේ සමාජ ව්‍යාපාරය ද නිරෝගී වෙයි. වාචසික කායික හැසිරීම් කිසිවෙකුටත් හානි දායක නො වේ. ආජීවය නිවැරදි වෙයි. උත්සාහය හා සිහිය යොමු වී ඇත්තේ දෘක්ම , කල්පනය හා චර්යාව නිවැරදි වීම පිණිස ය. එවන් සිත ඇසුරු කරන්නේ සමාහිතයයි. සමාහිත සිත නිවැරදි ඥානයෙහිත්, නිවැරදි විමුක්තියෙහිත් සමත් වෙයි.

මේ දෘක්මෙන් යුතුව ලෞකික කටයුතු හසුරුවන පුද්ගලයා ලෝකයට විනාශය ගෙනදෙන මිථ්‍යා ආජීවයකට වැටෙන්නේ නැත. පැරණි ලංකාවේ අප සියවස් ගණනක් තිස්සේ සක්‍රීය වුණ දැනුම හා එහි භාවිතය මිනිසාටත් සෙසු ශාක සත්ව ජීවපරිස්ථිතියටත් ආශීර්වාදයක් වුණා විනා හානිදායක වුණේ නැත. පලුදු වන ගතිය ආධ්‍යාත්මික ලෝකයේත් භෞතික ලෝකයෙත් ස්වභාවයයි. **(ලුජ්ජතීති බො භික්ඛු තස්මා ලොකොති වුච්චති)**[1] එසේ පලුදු වන ලෝකයක් බව නුවණින් දැක එය පරිහරණය කරන කොට නැසුන දේ යළි උපදවියයුතු වේ. **(නට්ඨං ගවෙසෙන්ති)** දිරූ දේ ප්‍රතිසංස්කරණය කළයුතු වේ. **(ජිණ්ණං පටිසඞ්ඛරොති)** පරිභෝජනයෙහි සීමාවන් හඳුනා ගතයුතු වේ. **(පරිමිත පානභොජනා)** ස්ත්‍රියක් වේවා පුරුෂයෙක් වේවා මේ දෘක්ම ඇති ගුණවත් සිල්වත් අයෙක්ම ආධිපත්‍යයෙහි තැබියයුතු වේ. **(සීලවන්තං ඉත්ථිං වා පුරිසං වා ආධිපච්චෙ ඨපෙති)**[2] දස්සනසම්පත්තියෙන් යුතු අය කටයුතු

---

1 සං: නි: 4, ලොක සූත්‍රය, 118 පිට, බු: ජ: මු:

2 අං: නි: 2, කුල සූත්‍රය, 478 පිට, බු: ජ: මු:

කරන්නේ මෙසේ බැවින් සමාජය විනාශය කරා ගමන් කරන්නේ නැත. පිරිහීමට ඇදෙන්නේ නැත.

මේවා තේරුම් නො ගෙන විද්‍යාත්මක ඥානයෙන් හා තාක්ෂණික උපයුක්තියෙන් පමණක් මානව අභිවෘද්ධිය සැලසීමට වෑයම් කිරීම ව්‍යසනය පිණිස හේතු වනු ඇත. ව්‍යසනය පිණිස පවතින හිතුමතේ සිදුකරන තාක්ෂණ භාවිතය වෙනුවට 'උචිත තාක්ෂණ' භාවිතයට යට කී දස්සන සම්පත්තිය අවශ්‍ය ය.

යමක් අනුචිත යයි මැනීමේ පිරිපුන් නිර්ණායකය කුමක් ද? මිනිසා ඇතුළු ජීව පරිසරයටත් මානව සමාජ රටාවේ නිරවුල් පැවැත්මටත් යමක් හානිකර වේ නම් එපමණකින් ම එය අනුචිත යයි ගතයුතු ය. මේ අනුචිත භාවය නිසා ඇතිවන දුර්විපාක විඳින මහජනතාව යමක් ගැන විරෝධතාව පළ කරන්නේ නම් එය බැහැර කිරීමට එයටත් වඩා සාධක අවශ්‍ය නො වේ. විද්‍යාඥයා ද්‍රව්‍ය සාපේක්ෂකත්වය දුටුවත් ආධ්‍යාත්මික අංශයේ සාපේක්ෂකත්වය නො දක්නා නිසා අස්මිමානයෙන් පෙළඹී ලෝකයට විනාශය ද සලසයි. විද්‍යාව යනු දැනුමකි. එය යම් යම් කටයුතු සඳහා උපයෝගී කරගැනීම තාක්ෂණයයි. නූතන යුගය විද්‍යාත්මක වශයෙන් දියුණුව සිටියත්, එහි තාක්ෂණික උපයුක්තිය දියුණු කරගෙන සිටියත් මනුෂ්‍ය ජීවිතයත් සියලු ආකාර මානව සම්බන්ධතාත් අවුල් ජාලයක් වී තිබෙන්නේ මිනිසාගේ දැක්මේ යම් වරදක් නිසා බව කිව හැකි ය. නිවැරදි දර්ශන සම්පත්තියක් තිබෙණවා නම් බල අසහනයෙන් යුද අවි තාක්ෂණය දියුණු කිරීමෙන් මිනිස් ජීවිතවලට තර්ජන හා හානි නො කරනවා ඇත. සමතුළනයට ඉඩකඩ නොමැති වන පරිදි මහාපරිමාණ පරිසර හානි සිදු නො කරනවා ඇත. ඒ වෙනුවට මනුෂ්‍යයාට අවශ්‍ය **පෝෂ්‍යදායී ආහාරත්, දේශගුණයට ගැලපෙන වස්ත්‍රත්, ආරක්ෂාව හා රැකවරණය සඳහා නිවාසත්, ලෙඩට බෙහෙතුත්** සම්පාදනය කරගැනීම පිණිස උත්සාහවත් වෙනවා ඇත.

**නුවණැසින් තොර විද්‍යාවේ අවභාවිතයඃ**

නුවණැසින් යුත් මානුෂික මුහුණුවරක් අප ජීවත් වන විද්‍යා තාක්ෂණික පරිසරයෙහි විද්‍යමාන වෙනවා නම් ඒ ඉතාමත් මද වශයෙනි. 20 වැනි සියවස ආරම්භයේ දී බහුතරයක් දෙනා ශුභවාදීව සිතුවේ විද්‍යාව ස්වර්ණමය යුගයකට නව දොරටු

විවෘත්ත කරාවි යනුවෙනි. මිහිමතට පාරාදීසය සැපත් වේවි යනුවෙනි. පසිඳුරන්ගේ අත්දැකීම් ලෝකය විද්‍යාත්මක නව නිපැයුම් වලින් පිරීගියේ ය. මිනිසා උගත්තේ තව තවත් තෘෂ්ණා කිරීමට ය. අපේ ඇස් ඉදිරිපිට ම පාරාදීසය වෙනුවට මිහිමතට සම්ප්‍රාප්ත වූයේ නිරයයි.

භෞතිකවාදය මුල දී තරයේ කියා සිටියේ ද්‍රව්‍යය ප්‍රාථමික බවයි. විඥානය භෞතිකයේ නිර්මාණයක් බවයි. 1808 දී ජෝන් ඩොල්ටන් පරමාණුක සිද්ධාන්තය ඉදිරිපත් කළේ ය. අදෘශ්‍යමාන, නො බෙදිය හැකි වෙන් වෙන් වූ පරමාණුන්ගෙන් ලෝකය නිර්මිත බව පැවසී ය. එහෙත් පරමාණු විශ්ලේෂණය කිරීමෙන් වෙන් වෙන් ව පවත්නා පදාර්ථ නැති බව හෙළිදරව් විය. එක් වස්තුවක තනි පැවැත්ම යන කල්පනාවෙහි මානසික මායාවකට වඩා වැඩි දෙයක් නැත. ද්‍රව්‍යයේ සාපේක්ෂ බව භෞතික විද්‍යාව දැන ගත්තත් ඒ වැටහීම අස්මි මානය දුරු වීමට හේතු වී නැත. පළමු වන පරමාණු බෝම්බය නිමැවූයේ රොබට් ඔපන්හයිමර් නම් භෞතික විද්‍යාඥයා යයි කියනු ලැබේ. පරමාණු බල ශක්තිය හඳුනා ගැනීමෙන් සිදු වූයේ ධනවාදී සමාජවාදී දේශපාලන කඳවුරු අතර බල අසහනය උත්සන්න වීමයි. දෙවන ලෝක යුද්ධය මිහිපිට නිරය නිර්මාණය කළේ ය.

පරමාණු බල ශක්තිය හඳුනා ගැනීම නවීන විද්‍යාවේ දස්කමක් වන නමුත් ඉන් මිනිසා ඇද වැටුනේ න්‍යෂ්ටික බල අරගලයකට ය. විනාශයේ තරම දැන ගත්තේ න්‍යෂ්ටික බෝම්බ පිපිරවීමෙන් පසු ය. ප්‍රතිවිපාක ක්ෂණිකව මෙන් ම දිගු කාලීන ද වේ. පරිසරයට මුහුවන විකිරණශීලී අයඩින් මිනිසා ඇතුළු සත්ව ලෝකයට පිළිකා ආදී රෝග ඇති කරවන දුක් දී මරණය කැඳවන මහත් ව්‍යසනයක් වී තිබේ. බැඳගත් යක්ෂයකු වැනි න්‍යෂ්ටික බලාගාරයක් ක්ෂණයකින් ජීව සන්තතිය කොතරම් අවදානමකට පත් කරන්නේ ද යන්න 80 දශකයේ දී සිදු වූ චර්නොබිල් න්‍යෂ්ටික බලාගාරයේ ඛේදවාචකයෙන් දැනගන්නට ලැබුණි. න්‍යෂ්ටික විකිරණ ඒකකයක් හඳුන්වනු ලබන්නේ roentgen යනුවෙනි. රොන්ට්ජන් 600 වඩා ඉහළ විකිරණ ප්‍රමාණයක් මාරාන්තික බව විද්‍යාඥයෝ තහවුරු කරති. චර්නොබිල් බලාගාරයේ විකිරණ කාන්දුව සිදු වූ අලුත **"පරමාණු විකිරණයන්ට ගොදුරුව මියගිය අහිංසකයෝ"** යන මැයෙන් දිවයින පත්‍රයට ලිපියක් සපයන **ඒ. සී. ජේ. වීරකොන්**

**මහාචාර්යවරයා** මේ පිළිබඳ බොහෝ තොරතුරු හෙළදරව් කර ඇත.[1]

ආචාර්ය හැරී ඩැග්නියන් නම් භෞතික විද්‍යාඥයා 1945. 08. 12 දින ලොස් අලමෝස් විද්‍යාගාරයේ දී හදිසියේ ම විශාල විකිරණයකට හසු විය. ඔහු වහාම රෝහල් ගත කරන ලදි. මුල් පැය කීපය තුළ දී අතෙහි හිරි වැටීමක් පමණක් විය. ඉන් පසු අත ඉදිමෙන්නට විය. ක්‍ෂණයකින් ඔහුගේ සාමාන්‍ය තත්ත්වය නැති වන්නට විය. ඉන්පසු දින 20 ක විඳවීමකින් හා පිස්සුවෙන් පසුව ඔහු මළේ ය. මෙවන් සිද්ධි රැසක් එම ලිපියෙහි ඇතුළත් ය. මෙබඳු න්‍යෂ්ටික අත්හදා බැලීම් මගින් මුදා හැරෙන විකිරණ නිසා සිදුවන රෝගී වීම් හා ජීවිතහානි අතිවිශාල ය. මේවායේ හානිය නිතර ම ලෝකයාට අඩු කොට පෙන්වීමට ද ඒ පිළිබඳ වගකිවයුත්තෝ උත්සාහ ගනිති. 1986 අගෝ: 13 බදාදා දිවයින අතිරේකයට **"නොදනුවත්ව අප බිලිගන්න මාරක විකිරණ"** යන මැයෙන් ලිපියක් සපයන මහාචාර්ය ඒ. සී. ජේ. වීරකෝන් මහතා ලංකාවේ තත්ත්වය ගැන මෙසේ සඳහන් කරයි.

"නමුත් අපේ ශ්‍රී ලංකා පරමාණු බලශක්ති අධිකාරිය මේවා ගණන් නො ගනී. එමෙන් ම අබල දුබල බලාගාරයකින් නිකුත් වන විකිරණයන් සුළු කොට හා අනතුරු රහිත බව පෙන්වා දෙයි. මෙය අපට පෙන්වා දී ඇත්තේ මෙවැනි අනතුරකින් ලැබෙණ විකිරණ ප්‍රමාණය කොළඹ ජීවත් වීමේ දී ස්වභාවිකව ලැබෙණ හෝ පැය 3 1/2 ක කාලය තුළ ගුවන්යානයකින් කොළඹ සිට සිංගප්පූරුවට යන විට ලැබෙණ විකිරණය තරම් සුළුයයි ද, එක්ස් කිරණ මගින් ලෙඩෙක් පරීක්‍ෂා කරන විට මීට වඩා විකිරණයක් ලැබෙණ බවත් පවසමින් ය." යනුවෙනි.

යට කී චර්නොබිල් බලාගාර සිද්ධියෙන් අනාගතයේ දී එක්ලක්‍ෂ පණස්දහසක මරණ සංඛ්‍යාවක් බලාපොරොත්තු වීමට සිදු වෙතත් රොබට් ගේල් නමැති මහාචාර්යවරයා පවසන්නේ චර්නොබිල් අනතුරේ ප්‍රතිඵල විසින් අගනා වෛද්‍ය තොරතුරු රැසක් නිර්මාණය කළහැකි බවයි. (87 පෙබ: 07, දිවයින) වෛද්‍යවිද්‍යාව අංශයෙන් සලකන විට ඒ තොරතුරු වැදගත් වුවද ඒ සඳහා කී දෙනෙක් ජීවිතයෙන් වන්දි ගෙවිය යුතුව තිබේ

---

[1] 1986 ජුලි මස 23 වැනි දින, දිවයින බදාදා අතිරේකය, 10 පිට.

ද? විද්‍යාත්මක ඥානය භාවිතයේ දී මිනිස් මුහුණුවරක තාක්ෂණයක් නො වීමේ වැරැද්ද එයයි. මනුෂ්‍යයා ලෞකික කටයුතු වල දී ධර්මයේ ආධිපත්‍යයට යටත් වියයුත්තේ එබැවිනි.

කෙටියෙන් කිවහොත් යම් තාක්ෂණ භාවිතයක් නිසා ස්වභාව නියාමයට ප්‍රකෘතිමත් කරගැනීමට විරාමයක් නො ලැබෙණ තරමට වායුගෝලය දූෂණය වෙනවා නම්, වායුගෝලයේ උණුසුම වැඩි වෙනව නම්, ඕසෝන් ස්තරයේ විනාශය සිදු වෙනව නම්, ධ්‍රැව ප්‍රදේශ වල හිම තට්ටු දිය වෙනවා නම්, දූපත් රටවල් මුහුදුබත් වීමේ තර්ජනයට මුහුණපානවා නම්, පානීය පරිභෝජනීය ජලය දූෂණය වෙනවා නම්, පොළොවේ භූගත, භූ තල ජල උල්පත් විනාශ වෙනව නම්, ශබ්ද දූෂණයට සීමා මායිම් නැත්නම්, එහෙම තාක්ෂණ භාවිතාවක් කරන මනුෂ්‍යයින්ට ඇත්තේ මොන විදියේ ජීවන දර්ශනයක් ද? ධනය හා බලය එක ම සාරධර්මය කරගත් බව නො වේ ද?

රක්ෂිත වැසි වනාන්තර විනාශ කරනව නම්, 1815 වෙනකම් රැකගත්ත මලයරටේ කඳුකර වනාන්තර විනාශය ඇරඹුවා නම්, කඳුකරයේ හෝදාපාලුව වැඩි වෙනව නම්, ජලාශ ගොඩ වෙනව නම්, හැම වැසි සමයක ම නායයාමේ තර්ජන නම්, සාරවත් පස නිසරු වෙනව නම්, වෙළඳපලට නිකුත් කරන ආහාර වර්ග විෂ සහිත වී ඇත් නම්, අවපැහැ නො වෙන්න හාපික් වලින් හෝදපු කොස් මදුලු මිනිසුන්ට කවනව නම්, එ වැනි දේ ආහාරයට ගන්නා අය වකුගඩු, අක්මා රෝග පිළිකාදියට ගොදුරු වෙනව නම්, නිට්ටාවට සුවයක් නැතිව දුක් විඳ මියයනවා නම්, අද මනුෂ්‍යාට තියන ජීවන දර්ශනය මොකක් ද?

ලෝකය ම අද මිනිසුන්ට නිපදවන්න බැරි පොසිල ඉන්ධන දහනය කරන්නේ අසීමිත සම්පතක් හැටිට හිතාගෙන නම්, එමගින් වායුගෝලය විෂ වීම ස්වභාව නියාමයට සමතුළනය කරගන්න බැරිනම්, මිනිසාට නිපදවන්න බැරි කලුගල් පර්වත විවිධ ඉදිකිරීම් පිණිස කඩාබිඳිනව නම්, ගල්කොරි අවට මිනිසුන්ට ස්වසන ආබාධ ඇතිවෙන එක සැලකිල්ලට ගන්නෙ නැත්නම්, පරිසර සංරක්ෂණය වෙනුවට එහි විනාශයට බලපත් නිකුත් වෙනවා නම්, ස්වභාවධර්මයට ප්‍රකෘතිමත් කරගන්න බැරි මෙවන් විනාශ දිගින් දිගට වෙනව

නම්, පොළොවේ තෙතමනය ආරක්ෂා වන වගුරු බිම් සංවර්ධනයේ නාමයෙන් ගොඩ කරනවා නම්, එනිසා වැසිසමයේ ගංවතුර තර්ජන ඇති වෙනවා නම්, අද මනුෂ්‍යාට තියෙන ජීවනදර්ශනය මොකක් ද? මුදල් පසුපස හඹායාම නො වේ ද?

අන්තර්ජාල තාක්ෂණය, තොරතුරු තාක්ෂණය අලුත් දැනුම බෙදාහදා ගන්න හොඳ ක්‍රමයක් බව ඇත්ත ය. කොවිඩ් වසංගත සමයේ ඔන් ලයින් ක්‍රමයට දරුවන් නිවෙස් වල සිට අධ්‍යාපනය ලැබීමට හැකි වූ බවත් ඇත්ත ය. සමාජ මාධ්‍යජාල ඔස්සේ, මුහුණු පොත ඔස්සේ හොඳ නරක දෙකම මිනිස් මනසට ගලා එයි. පරිසර දූෂණය වගේ ම මිනිස් සිත දූෂණය වීම මානව සංහතියට ම අනතුරක් නො වේ ද? නිවැරදි ජීවන දර්ශනයක් නැති නම් කාම, ව්‍යාපාද, විහිංසා සංකල්ප බහුල වීම නො වැළැක්විය හැකි ය. ඒ වැරදි සංකල්ප වලින් මැඩී මිනිසාගේ කය, වචනය, ආජීවය සැකසෙන විට උදාවන තත්ත්වය කෙබඳු විය හැකිදැයි නුවණින් සිතා බැලීම වටියි.

අප මුලුමහත් ලෝකය ම සළකා මෙසේ කථා කළාට, මුලු ලෝ වැස්සා ම එකහඬින් ධර්මයෙන් සන්නද්ධ වෙන්න සූදානම් නැත. එහෙම බලාපොරොත්තු වෙනව නම් ඒකත් වැරදියි. ඒත් මුලු ලෝකයම පහසුවෙන් විපතට ඇද දමන්නට අවශ්‍ය දැනුම මිනිසා සතු කරගෙන සිටීම ගැන අවදිමත් බවක් අපට අවශ්‍යයි. **කය සංවර කරගන්නැයි දැනුම් දෙමින් මීටරයක දුරස් බව ඇති කළ, වචනය සංවර කරගන්නැයි මුඛවාඩමක් දුන්න** කොවිඩ් 19 කඩා වැදීමත් එක්ක සියලු මිනිස් ව්‍යාපාර නතර වුණ මේ වෙලාවෙ, අලුතෙන් සිතන්න වුණ මේ වෙලාවෙ කාගෙ හරි නුවණැස ටිකක් හරි විවර වෙනව නම් මේ ලියන්නේ ඒ පිණිසයි. අනුචිත විනාශකාරී අයුරින් තාක්ෂණ භාවිතා නො කිරිමට ලෝක රාජ්‍යයන්ගේ එකඟතාවක් කොරෝනා අභියෝගය ඉදිරියේ ඇති වුණොත් එය ලෝකයට ම ශාන්තිය පිණිස වේවි.

**තෘෂ්ණාවේ ගෝලීයකරණය:**

මිනිසා පාරිභෝගික සත්වයෙක් ය, යන සංකල්පය බහුලව ව්‍යවහාර කරන බව ඇසේ. ඒක ඇත්තක් නම් ඉන් අවධාරණය වන්නේ 'මිනිසා ජීවත් වන්නේ පරිභෝජනය

කරන්නට ය' යන්න යි. එහි දී පරිභෝජනයට එහා ජීවිතය ගැන සිතිය යුත්තක් නැති වේ. එවන් සමාජයට සීමාවන් දන්න පරිභෝජනය කිරීමේ **(පරිමිත පානභෝජනා)** අවශ්‍යතාවක් දකින්නට නො හැකි ය. බුදුදහමට අනුව නම් පරිභෝජනය ජීවත් වීමේ පරමාර්ථය නො වේ. ජීවිතය පිරිසිඳ දැක දුක් කෙළවර කිරීම පිණිස ය. වස්ත්‍ර, ආහාර, වාසස්ථාන, බෙහෙත් කයක් දරණ බැවින් සකසා ගතයුතු දෙයක් පමණි. එබැවින් බුදුදහම පවසන්නේ භෝග සම්පත් සම්පාදනය කළයුත්තේ දැහැමි සීමාවන් තුළ වියයුතු බව ය. **(ධම්මෙන)** සැහැසි කමින් තොරව ය. **(අසහාසෙන)** දහමෙහි හැසිරෙන්නාට ඇත්තේ ගිජු නො වන පරිහරණයකි. **(අගථිතො)** නො මුළා වූ පරිහරණයකි. **(අමුච්ඡිතො)** පාරිභෝගික වස්තූන්ට යටත් නො වුණ පරිහරණයකි. **(අනජ්ඣාපන්නො)** ආදීනව පක්‍ෂය සලකා කරන පරිහරණයකි. **(ආදීනව දස්සාවී)** අත්මිදීම පිණිස යෙදූ නුවණින් කරන පරිහරණයකි. **(නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති)**[1]

නිවැරදි ආජීවයට ගැලපෙන පරිදි සම්පත් ඉපයීමත් පරිභෝජනයත් පිළිබඳ නුවණැස කෙබඳු ද යන්න මේ පරිච්ඡේදයේ ආරම්භයෙහි දී දැක්වීමි. එහෙත් නූතන ලෝකයා විශ්වාසය තබා ඇත්තේ ආර්ථික වර්ධනය, නිදහස් වෙළඳ ප්‍රතිපත්තිය හා මූල්‍යය මත පදනම් වූ සංවර්ධනයක් පිළිබඳවයි. අනෙක් අතට එක ම පරිභෝජන සංස්කෘතියක් ගෝලීය සංස්කෘතිය බවට පත් වීමේ ආදීනවය නම් මහත් පරිසර විනාශයන් ද ගෝලීය වශයෙන් බලාපොරොත්තු වන්නට සිදු වීමයි. කොවිඩ් 19 වසංගතය එය ඇති වූ ජනපදයට සීමා නො වී ගෝලීය වසංගතයක් වූයේ එබැවිනි. මේ විපතට මුහුණ දෙන හැම රටක් ම මේ වන විට ගෝලීය ආර්ථික ක්‍රියාදාමය වෙනුවට ස්වයම්පෝෂණ ආර්ථිකයක වැදගත් කම තේරුම්ගෙන ඇතැයි සිතිය හැකි ය.

රාජ්‍යයන් වශයෙන් මිනිස් කණ්ඩායම් වෙන වෙන ම රටවල දිවි ගෙවුව ද, ඔවුන්ගේ පරිසර ක්‍රියාකාර කම් වල බලපෑම ගෝලීය වශයෙන් ව්‍යාප්ත වීම නො වැළැක්විය හැකි ය. මිනිසාගේ තෘෂ්ණාව බලගතු වන විට සමතුලනයට අවකාශ ඇති නො වන මහාපරිමාණ පරිසර හානීන් සිදු වේ. සැබැවින්

---

[1] සං: නි: 4, රාසිය සූත්‍රය, 598 පිට, බු: ජ: මු:

ම ගෝලීයකරණය යනුවෙන් අද සිදුවෙමින් පවතින්නේ තෘෂ්ණාවේ ගෝලීය කරණයයි. බුදුසමය තණ්හාව දුකට මුල යයි **(ඡන්දොහි මූලං දුක්ඛස්ස)** උගන්වන්නේ ඒ නිසයි. 'මම', 'මගේ'යන සංඥාව උපදවන්නේ ද තණ්හාව මගිනි. **(තණ්හා ජනෙති පුරිසං)** පුද්ගලයා තණ්හා කරන්නේ විඳීනයටයි. **(වෙදනා පච්චයා තණ්හා)** විඳීනය යනු සළායතනික ඵස්සයෙන් සමුදය වන ස්වභාවයයි. **(ඵස්ස පච්චයා වෙදනා)** අපගේ සියලු අත්දැකීම් සමුදය වන්නේ සළායතනික ඵස්සය ප්‍රත්‍යය කරගෙන බව යට සඳහන් කළෙමු.

**භික්ෂූන් වහන්සේ:**

යට කී දස්සනසම්පත්තිය පදනම් කරගෙන ලෝකයාට අර්ථයෙන් හා ධර්මයෙන් අනුග්‍රහ දැක්විය යුත්තේ භික්ෂූන් වහන්සේ ය. පෙර රජදවස අර්ථය හා ධර්මය පිණිස රජුට ද අනුශාසනා කළේ මහාවිහාරීය භික්ෂූන් වහන්සේලා ය. මහමෙවුනා උයනෙහි ම රජමාලිගය ඉදි කෙරුනේ ඒ නිසා ය. එහෙත් ඓතිහාසිකව භික්ෂූන් වහන්සේ ආ මේ ගමන කොතරම් ගැහැට සහිත වූවක් විය. ක්‍රි: පූ: පළමු සියවසේ මහත් විනාශයක් සිදු කළ බැමිණිටියා සාගතය සමයේ ධර්මයේ චිරස්ථිතිය පිණිස මහත් දුෂ්කරතා මැද්දේ මාතුල ජනපදයේ අලුවිහාරේ දී මහතෙරවරු එක්රැස්ව එතෙක් වාචෝද්ගත ත්‍රිපිටකය ලියා තැබූහ. අද යුගයේ අපට දහම දැනගැනීම සඳහා අතිශයින් ම ප්‍රයෝජනවත් නමුත් ලේඛණගත කළ තැන් පටන් ධර්ම ගවේෂණය ලිහිල් වී යාම ඇරඹුණාට සැක නැත. බොහෝ සෙයින් පෙනෙන්නට තිබෙන්නේ ප්‍රතිපදාව අතහැරී ගිය සෙයකි. එසේ වන විට බුද්ධ වචනයෙහි අන්තර්ගත දස්සනසම්පත්තිය පිළිබඳ අවබෝධය ටිකෙන් ටික සැඟවී යාම ස්වභාවික ය. දෙවනපෑතිස් රජු රාජ්‍යත්වයට පත් ක්‍රි: පූ: 247 සිට වසර 40 ක කාලය ඇතුළත මිහිඳුමහරහතන් වහන්සේගේ ලංකාගමනය සිදු විය. සිවුපිරිස ම සකස් වෙමින් සසුන ප්‍රතිෂ්ඨාපිත විය. මගඵල නුවණ ලද්දෝ ඇති වූහ. රහතන් වහන්සේලා බිහි වූහ. ඒ තත්ත්වය දිගටම තිබුණා යයි කිව නො හැකි ය. අනුරපුර යුගය පුරා වත් එසේ නො වී ය. එහෙත් ආරම්භයේ දී සැකසුන බෞද්ධ සංස්කෘතික පදනම හා ධර්ම අර්ථ රටාව ජනතාව අතර සුරක්ෂිත විය. පොළොන්නරු,

දඹදෙණි, යාපහුව, කුරුණෑගල, ගම්පල, කෝට්ටේ යුගවල බෞද්ධ ශිෂ්ටාචාරයේ ආරම්භක තත්ත්වය ඒ හැටියෙන් ම ආරක්ෂා වුණා යයි කිව නොහැකි ය. ක්‍රිඃ වඃ 1505 පෘතුගීසීන්ගෙන් ඇරඹෙන යටත් විජිත සමය වන විට තිබුණේ කෝට්ටේ රාජධානි යුගයයි. මේ කාලය දක්වා ම ලංකාවේ පැරණි ධර්ම අර්ථ රටාව රැකී තිබුණත් බොහෝ අඩුපාඩු කම් සහිතව වියහැකි ය.

යටත් විජිත යුගය ආරම්භ වීමත් සමග ඇරඹෙන වසර 450 ක පමණ කාල සීමාව භික්ෂූන් වහන්සේත් බෞද්ධ ජනතාවත් මුහුණ පෑයේ අමුතු ම අභියෝග රැසකට ය. එතෙක් පැවති සම්ප්‍රදායයන් බැහැර වෙමින් රෝම ලන්දේසි නීතිය මේ රටට ආරෝපණය කෙරිණ. එතෙක් පැවති ඉඩම් පරිහරණ ක්‍රමය මුලුමණින් ම වෙනස් විය. මේ වන තෙක් විහාර වල, සෙනසුන් වල වැඩ සිටියේ විහාරවාසී, සෙනසුන් වාසී භික්ෂූන් වහන්සේලා ය. විහාරාධිපතීන් වහන්සේලා සේනාසනාධිපතීන් වහන්සේලා නො වේ. ඒ වෙනුවට සිටියේ සඟමහළු පිළිවෙළට අනුකූල සංඝස්ථවිරයන් වහන්සේලා ය. විහාරාරාම ඉදිකිරීමේ කටයුතු භික්ෂූන් වහන්සේගේ කාර්යයක් නො වී ය. එය ගිහි උදවියගේ කාර්යයකි. සංඝික පරිහරණ ක්‍රමයට තිබූ ආරාම, සෙනසුන් ගිහි සමාජයෙහි මෙන් අධිපති භික්ෂුවට කැමැත්තක් කළහැකි තත්ත්වයට පත්විය. පැරණි භූමි පරිහරණය වෙනුවට ඉංග්‍රීසි යටත් විජිත යුගයේ දී පෞද්ගලික ව්‍යවසායිකත්වය දියුණු වීමෙන් නව ස්වදේශීය ධනපති පංතියක් බිහි වූ බව අපි පෙර සාකච්ඡා කළෙමු. කෝල්බෲක් ප්‍රතිසංස්කරණ අනුව පරම්පරා ගම්බිම් අහිමි වූ ගොවි ජනතාව කෙරෙහි නොව භික්ෂූන් වහන්සේගේ වැඩි සැලකිල්ල ඇති වූයේ නව ස්වදේශීය ධනපති පංතිය කෙරෙහි ය. විහාරාරාම ඉදි කිරීම භික්ෂූන් වහන්සේගේ කාර්යයක් බවට පරිවර්තනය වූ බැවිනි. විහරාධිපතීන් වහන්සේ නමක් අපවත් වූ විට එහි ඊ ළඟ අධිපතිත්වය සඳහා අර්බුද පැනනගින්නේ විහාරාරාම භික්ෂුවගේ දේපලක් වීම නිසයි.

මෙ වැනි ඓතිහාසික සිද්ධි දාමයක් තුළ අප යට සංක්ෂිප්තව පැහැදිලි කළ දස්සනසම්පත්තිය පිළිබඳ අවධානය ක්‍රමයෙන් ක්‍රමයෙන් ගිලිහී යාම ස්වභාවික ය. අද භික්ෂු අධ්‍යාපන ක්‍රියාවලිය රටේ පොදු අධ්‍යාපන ප්‍රවාහයට අන්තර්ගත වූවක් වී තිබේ. එය බාහිර වශයෙන් සුරක්ෂිත බවක් සේ

පෙනුනත් එමගින් සසුනේ ආචාර්ය, උපාධ්‍යාය සම්බන්ධතාවේ වැදගත් කම ගිලිහී යාම සතුටුදායක තත්ත්වයක් නො වේ. ආචාර්ය, උපාධ්‍යාය සම්බන්ධතාව තුළ බුදුරජාණන් වහන්සේ බලාපොරොත්තු වූයේ සද්ධා, හිරි, ඔත්තප්ප, විරිය පඤ්ඤා යන සේඛ ධර්මයන්හි නවකයා ශික්‍ෂණයට පත් කිරීමයි. මෙහි 'පඤ්ඤා' යනුවෙන් දක්වෙන්නේ යට සඳහන් කළ දර්ශන සම්පත්තියයි. බුදුරජාණන් වහන්සේ සඳහන් කරන්නේ තමන් වහන්සේ විසින් භික්‍ෂුව ශ්‍රද්ධා, හිරි, ඔත්තප්ප, විරිය, පඤ්ඤා යන සේඛ ධර්ම ඔස්සේ කුසලධර්මයෙහි ලා කළයුත්ත නිමකරන තෙක් ආරක්‍ෂා කළයුතු බවයි.[1] මෙරට සමාජය නව යුගයක්, නව දැක්මක් කරා යොමු වන මේ අවස්ථාවේ ණයට නො ගත් දැක්මකින් ලෝකයාට අනුකම්පා කරන්නට භික්‍ෂුව සමත් වියයුතු ය. සෑම දුර්වලතාවන්ට ම වාසස්ථානයක් වන කාම ලෝකයෙහි අතරමං නො වන්නට නම් භික්‍ෂූන් වහන්සේ අව ම වශයෙන් සක්කායසමුදයෙහි ප්‍රත්‍ය සම්බන්ධතාව නුවණින් දැක ප්‍රත්‍යවේක්‍ෂණය කළ යුතු ම ය. තෘෂ්ණාව පෙරදැරි කරගත් නූතන පරිභෝජනවාදයට යට වීම වෙනුවට භික්‍ෂුව කළයුත්තේ තෘෂ්ණාව විනිවිද දැකීමයි.

ලෝකයාට ආධ්‍යාත්මික මග පෙන්වීමක් කරන්නට නම්, බුද්ධවචනය පෙළ ඇසුරින් ව්‍යාඛ්‍යාන කරන්නකු වීම පමණක් ප්‍රමාණවත් නො වේ. සීලය, සමාධිය හා ප්‍රඥාව ප්‍රායෝගිකව වඩන්නකු ද විය යුතු ය. දස්සනසම්පත්තිය ගිලිහී ගොස් සංස්කෘතික ඇගයීම් පමණක් මද වශයෙන් ශේෂ වී ඇති අද යුගයේ භික්‍ෂුත්වයේ වගකීම වියයුත්තේ දස්සනසම්පත්තිය ප්‍රායෝගිකත්වයට නැගීමයි. නැතිනම් සංස්කෘතියේ ඉතිරි වී ඇති ටික ද විනාශ වනු ඇත.

## දර්ශනයෙන් තොර සංස්කෘතිය:

අතීතයේ යම් දැක්මක් අනුව ලක්වැසියා කටයුතු කළා නම් නොයෙක් විපර්යාසයන් ඔස්සේ වර්තමානයට ඇදී ආ

---

[1] "...යාවකීවඤ්ච භික්ඛුනො සද්ධාය අකතං හොති කුසලෙසු ධම්මෙසු, හිරියා ..., විරියෙන ..., ඔත්තප්පෙන ..., පඤ්ඤාය අකතං හොති කුසලෙසු ධම්මෙසු, අනුරක්ඛිතබ්බො තාව මෙ සො භික්ඛවෙ භික්ඛු හොති."
අං: නි: 3, කාමෙසුපලාළිත සූත්‍රය, 10 පිට, බු: ජ: මු:

සමාජයට ඒ අතීත දැක්ම ක්‍රමයෙන් අපැහැදිලි වී ගිය බව පෙනෙන්නට තිබේ. මනෝවිද්‍යාඥ සිග්මන් ෆ්‍රොයිඩ් සමග කලක් කටයුතු කළ කාර්ල් ගුස්ටාව් යුං මනෝවිද්‍යාඥයා ඔහුගේ චරිතාපදානයෙහි ලංකාවේ දී ලැබූ අත්දැකීමක් (20 වැනි සියවසේ මුල් භාගයේ පමණ) සඳහන් කර තිබේ. **"ශ්‍රී ලංකාවේ දී සිදු වූ සිද්ධියක් මගේ සිහියට නැඟෙයි. අප නුවර බලා යද්දී දක්නට ලැබුණකි මෙය. පාර පටු බැවින් ගැමියන් දෙදෙනකුගේ කරත්ත දෙකක රෝද දෙකක් එකට හැප්පී අනතුරක් සිදු විය. බොහෝ විට බලාපොරොත්තු වියයුතු පරිදි කිසිදු ගහබැණ ගැනීමක් සිදු නො වී ය. රියදුරන් දෙදෙනාම හෙමින් මොන මොනවාදෝ මුමුනමින් රියෙන් බැස්සාහ. ඔවුන් දෙදෙනාගේ මුවින් පිට වූ වදන් නම් "අනිච්චං දුක්කං"** යන්නයි. එය සියල්ලෙහි ම අනිත්‍ය ස්වභාවය මෙනෙහි කිරීමකි. සැබැවින් ම මෙය 'ඉන්දියානු' ගතිය ද?"[1] ගැටුමකට තරම් වූ කරුණක් ඒ ගැමි ගැල්කරුවන් දෙදෙනා විසඳා ගත්තේ අනිත්‍යය සිහි කිරීමෙනි. ගැටුමකට නො යා ඔවුන් අනිත්‍යය සිහිපත් කළේ සක්කායදිට්ඨිය ප්‍රහාණයට තරම් ගැඹුරු දැක්මකින් යුතුව නො වන්නට පිළිවන. එහෙත් අනිත්‍යය සිහිකිරීම සංස්කෘතික වශයෙන් ඔවුන් තුළ ශේෂ වී තිබීම ගැටුමකට නො යාමට තරම් විය.

මේ පොතේ 7 පරිච්ඡේදයේ දී දක්වන ලද අනුරාධපුර කච්චේරියේ ඒජන්ත ලී ෂිං මහතාගේ වාර්ෂික වාර්තාවෙන් ගෙන හැර දැක් වූ පුවත නැවත කියවන්න. අනේක ගැහැට මැද වුව ද ගැමියන් තුළ සංස්කෘතික ඇගයුම් පණ අදිමින් හෝ ශේෂව තිබූ අයුරු ඉන් ප්‍රකටව පෙනේ. මෙකී සිදුවීම් දෙක වැනි අවස්ථා වල දී 21 වැනි සියවසේ මුල් කාර්තුව ගතකරමින් සිටින අද සමාජයත් ඒ අයුරින් ම හැසිරේවි ද? සැබැවින් ම නැත. එහි අර්ථය දර්ශනයෙන් තොරව පණ අදිමින් තිබුණ සංස්කෘතිය ද අවසන් හුස්ම හෙළීමට ආසන්නව ඇති බවයි. මේ මොහොතේ භික්ෂුවගේ භූමිකාව වියයුත්තේ නෙක්ඛම්ම, අව්‍යාපාද, අවිහිංසා සංකල්පනයන්ගේ පිබිදීමට අවැසි දස්සන සම්පත්තිය ලෝකයා වෙත ප්‍රදානය කිරීමයි.

---

[1] පඤ්ඤාවංස හිමි, මණ්ඩාවල, ප්‍රතිවීනාවලෝකන, (පැරීසියේ සිට ලියූ ලියුම්) 105 පිට, 2006.

# 11

## සැපවත් ජීවිතය

එක්දහස් අටසිය අසූගණන් වල ඉංග්‍රිසි ජාතික විද්‍යාඥයකු වන අර්නස්ට් හෙකල් නැමැත්තා ලංකාවට ආවේ ය. රටේ සංචාරය කරමින් ජීවීන් පිළිබඳ අධ්‍යයනයක යෙදුන ඔහු පසුව "ලංකාවට ගමනක්" (A VISIT TO CEYLON) යන මැයෙන් කෘතියක් සම්පාදනය කළේ ය. එහි මෙරට පිළිබඳ විවිධ තොරතුරු ඇතුළත් වී තිබේ. ඉතිහාස පොතකින් දැනගතහැකි තොරතුරු වලට වඩා ජනජීවිතය හා සම්බන්ධ තොරතුරු සංචාරකයකු අතින් ලියැවෙන වාර්තාවල දැකිය හැකි ය. මේ හෙළයා සියවස් කීපයක් යටත් විජිත තාඩන පීඩන වලින් හෙම්බත් වී සිටි යුගයේ අවසාන ඉංග්‍රිසි යටත්විජිත සමයයි. කොළඹ සිට ගාල්ල බලා අශ්ව කෝච්චියෙන් යද්දී ඔහු මෙරට හා වැසියා පිළිබඳව දකින ආකාරය මෙසේ සටහන් කරයි.

"සිංහලයෝ මුදලේ අගය නො දත්තවුන් නො වෙති. එනමුදු ලොව අන් කවර ජාතියකටත් වඩා ඔවුනට මුදල් අවශ්‍ය වනුයේ අව ම වශයෙනි. <u>ලොව සිව්දිග පීරා බැලුවත්, මෙම මාහැඟි දිවයිනෙහි තරම් සොබාදහමේ විශිෂ්ට දායාදයන් හා අගනා සම්පත් කවරදාවත් නො සංසිඳෙනා හා කිසිදු බාධාවකින් තොරව නෙලා ගතහැකි ස්ථාන ඇත්තේ අල්පයකි.</u> ඉතා දුගී සිංහලයකුට වුව ද කිසිදු අපහසුවකින් තොරව ඔහුගේ එදා වේල සරි කර ගැනීමට සෑහෙන තරම් මුදලක් උපයා ගත හැක. ශත දහයක හෝ පහළොවක වියදමින් එක් දිනක් බඩ කට පුරා කෑ හැකි බව මට ඒත්තු ගියේ ය. මෙරට සුලභව වගා කෙරෙන එළවලු හා අල්ලන මසුන් ප්‍රමාණය කෙතෙක් විශාල ද කිව හොත් බත් හා අනෙකුත් ආහාර වර්ග සමග අනුභව කරන ව්‍යංජන හා මාළුවල කිසිදු හිඟයක් නැත්තේ ය.

<u>ඉදින්, කවර කරුණක් සඳහා සිංහලයන් වෙහෙස මහන්සි වී ඔවුන්ගේ දුක් කම්කටොලු වලින් තොර දිවියට බාධා පමුණුවා ගතයුතු ද? නැත. නැත. මෙම පිළිවෙතට බාධාවන අයුරින් මෙම පාරාදීසයේ ජීවන රටාව හැඩගැසී නොමැත. ජීවිතයේ සැබෑ අරුත මේ යයි පවසන්නාක් මෙන් ඔවුහු බොහෝ දුරට සැනසිල්ලෙන් හා සැහැල්ලුවෙන් දිවි ගෙවති.</u>

මොවුන් සිය නිවෙස් තුළ දිගා වී විවේක ගන්නා ආකාරය හෝ මඟ දෙපස රංචු ගැසී තොරතෝංචියක් නොමැතිව අල්ලාප සල්ලාපයෙහි යෙදෙන අයුරු ඕනෑම අයකුට දැක ගත හැක. සිය ගෙවත්තේ හෝ එළවලු කොටුවේ කිරීමට නියමිත සුළු මෙහෙය නිම කළවිට, දවසේ ඉතිරි කොටස රිසි සේ ගත කිරීමට මොවුනට කිසිදු බාධාවක් නොමැත. මොවුන් විවේකය ගත කරනා ආකාරය ද කිසිදු උද්‍යෝගිමත් අයුරකින් හෝ කඩිසර භාවයකින් තොර වන්නේ ය. අප මවිතයට පත් කරනා ආකාරයේ සිත් වශී කරනා පුදුමාකාර නිසසල බවකින් හා අලස දැහැනකින්, මෙම දිවයිනෙහි වෙසෙනා තෘප්තිමත් ජනයාගේ වැඩ කටයුතු හා දිවි පෙවෙත බැඳී ඇති බව පැහැදිලි වේ. සිංහලයිනි! තොප මෙලෙස ගතකරනා දිවිය අපට ද ඊර්ෂ්‍යා උපදවන සුලු ය. එනමුදු තෙපි හෙට දවස ගැන හෝ ඉදිරි අනාගතය ගැන කිසිදු තැකීමක් කරනා බවක් නො පෙනේ. ඔබටත් ඔබේ දරු කැලටත් හාමත් නො වී සිටීමට අවශ්‍ය භවභෝග ඔබ නුදුරින් වැවෙනා අතර, සුළු වැඩ කොටසක් නිමකර මීටත් වඩා සැප සම්පත් බලාපොරොත්තු විය හැක්කේ කොයිබින් ද? ගෙ වතු වල සාත්තුව ලබමින් වැවෙනා මල් මෙන්, මොවුනට ද අත පය සොලවා මහන්සි වියයුතු නො වේ. මොවුනට දහඩිය මුගුරු හෙලා කර්මාන්ත වල නිරත වීම ද හෙම්බත් වීම ද නුහුරු ය. ආයාසකර ප්‍රයත්නයකින් තොරව, සොබා දහමින් ඔවුනට අවශ්‍ය සියලු සම්පත් ලබා ගත හැක. කුසුමකට මෙන් මොවුනට ද, ඉටු කර ගැනීමට අසීරු ප්‍රාර්ථනා නොමැත. ව්‍යාපාරික ලෝකයේ තරඟකාරී බව වැඩි වීම මොවුනට දැවෙන ප්‍රශ්නයක් නො වේ. කොටස් හා ව්‍යාපාර වස්තු වල අගය කෙතෙක් උච්චාවචනය වුව ද එය ඔවුනට හිරිහැරයක් නො වන්නේ ය. ශිෂ්ට සමාජයේ තවත් උදාර අභිප්‍රායක් වන නම්බුනාම හා උසස් තනතුරු පසුපස හඹා යාම මොවුන් නො දත්තා සේ ය. මොවුන් මේ කිසිත් නොමැතිව ජීවත් වුවත් ඉමහත් සතුටින් දිවි ගෙවනා බවක් පෙනෙන්නට ඇත. යුරෝපීයයන් වන අපට හිමි, අවශ්‍ය පමණට වඩා වැඩි, දහස් සංඛ්‍යාත බඩු මුට්ටු හා උපකරණ ගැන ඊර්ෂ්‍යා කිරීමට මොවුනට කිසි සේත් නො සිතෙන බව මම අනුමාන කරමි. මොවුහු පාරාදීසයක විනෝදයෙන් දිවි ගෙවමින් සරළ දිවි පෙවෙතක් ගත කරන, සොබා දහමේ නොයිඳුල් දරුවෝ වෙති.

මොවුන් සිය පැල්පත් වල දිගා වී, පොල් කරටි මතින් පහතට වැටෙනා අව් රැල්ල දෙස නෙත් යොමු කරමින් ධ්‍යානයකට සමවැද මෙන් සිටිනු මා දැක ඇත. මොවුහු නිතරම පාහේ සිත ගත ප්‍රාණවත් කරනා ප්‍රණීත බුලත් විටක රස බලනා අතර ම, සිය ළමා ළපටින් සුරතල් කිරීමට ද අමතක නො කරති. පාර අද්දර ඇති ඇළකින් හෝ ගඟකින් ස්නානය කොට නැවත හැඳ පැළඳ ගත් පසු, මොවුන් සෑහෙන වේලාවක් ගත කරනුයේ මහත් පරිශ්‍රමයෙන් ගැට ගසාගන්න කොණ්ඩයට සිත් වශී කරන අයුරින් කැස්බෑ ලෙලේලෙන් නැමි පනාවන් ගසා ගැනීමට ය. දුක් කරදර වලින් හා රාජකාරි කටයුතු වලින් හෙම්බත් වී සිටිනා කවරෙකුට වුව ද, මොවුනගේ සාමකාමී ගතිපැවතුම් හා සරල දිවි පෙවෙත ගැන ඊර්ෂ්‍යා නො සිතේ ද?

සිංහලයන් කෙසෙල් ගොමුවක් අසබඩ හෝ පොල් රුප්පාවක සෙවණේ ඔවුනට හුරු පුරුදු සරළ පිළිවෙළට නිසංසලව හා සාමකාමී අයුරින් කල් ගතකරන ආකාරය දුටු මට, මෙවැනි සිතුවිලි නිරතුරුව ම පහළ වීම නො වැළැක්විය හැකි විය."[1]

මේ 2020 සිට බලන විට වසර 140 කට පමණ පෙර අර්නස්ට් හෙකල් දුටු මෙරට සාමාන්‍ය වැසියාගේ ජීවන විලාසිතාවයි. ඔහුගේ මේ වැණුම අනාගත අරමුණක් නැති කම්මැලි පිරිසක් ගැන යයි ඇතැම් විට කෙනකුට සිතෙන තරම් ය. මෑතක් වනතුරු සාමාන්‍ය වැසියන් ජීවත් වූයේ වරිච්චි ගෙවල් වල ය. පරිසරය හා ඒකාබද්ධව ය. අවශ්‍යතා අඩු ය. නිරතුරු දැවෙන ප්‍රශ්න නැත. එක්දහස් නවසිය පණස් ගණන් හැට ගණන් වල ද අපේ ගම්දනව් වල මේ නිස්කලංක බව දක්නට ලැබුණි. එහෙත් අද වනවිට ක්‍රමයෙන් ගොඩ නැගී ඇති මිනිස් අවශ්‍යතා බැහැර කොට ඒ සරළත්වය කරා ආපසු යාමට සූදානම් වේ යයි සිතීම අපහසු ය. එසේ ආපසු යා යුතු යයි යෝජනා කිරීමට ද අපට නො හැකි ය. අර්නස්ට් හෙකල් පවසන පරිදි යුරෝපීයයෝ ඒ වන විටත් පමණට වඩා වැඩි දහස් සංඛ්‍යාත බඩුමුට්ටු හා උපකරණ සහිත ජීවන රටාවකට හුරු වී සිටියහ. ඒ යුගය වන විටත් පමණට වඩා වැඩි නම් අද

---

1 සේනානායක, චානක, "ලංකාවට ගමනක්", අර්නස්ට් හෙකල්ගේ "A VISIT TO CEYLON" කෘතියේ සිංහල පරිවර්තනය, 186, 187 පිටු. 2005.

වන විට යුරෝපීයයාගේ තත්ත්වය කොතරම් දැයි සිතා ගැනීම ද අසීරු විය හැකි ය. යුරෝපීය ආකෘතිය අනුව නව සංවර්ධනයන් කරා ගමන් කිරීම පෙරදිග සමාජවල ද අරමුණ වී ඇති බවට සැකයක් නැත. "ඕනවටත් වඩා" වූ අරමුණු කරා ශීඝ්‍රයෙන් දිවෙන ගෝලීය සංස්කෘතියක් පිළිබඳ අපේක්ෂාව කොවිඩ් 19 වෛරසය පිළිබඳ බිය ඇතිවන තෙක් ම සක්‍රීයව පැවතුන බව රහසක් නො වේ. පොදුවේ මිනිසා තෘෂ්ණාධික ය. අවශ්‍යතා අව ම කර ගැනීමක් උදෙසා හිත හදා ගන්නට මිනිසා තුළ පොදු සූදානමක් ඇත්දැයි අපි නො දනිමු. 70 වේ දශකයේ 77 දක්වා ක්‍රියාත්මක කළ වගා සංග්‍රාමය හා ආනයන සීමා කිරීම් බහුතරයක් පිරිස නො පිළිගත් බව අපි දකිමු. ඉන් අනතුරුව බලයට පත් වූ රජයේ විවෘත්ත ආර්ථික පිළිවෙත මිනිසා වහා වැළඳගත් බව ද අපි දනිමු. එහෙම වුණේ කොහොම ද? බුදුදහමේ හරය කලින් ම හිත්වලින් ගිලිහී ගොස් තිබුණ අතර යටත් විජිත යුගයේ යම්තරමකින් හෝ ශේෂ වී තිබුණ සංස්කෘතික ආකල්ප ටිකත් වියැකී ගිය ආකාරයයි ඒ.

බුදුදහමේ හරය මිනිස් සිත්සතන් වලට හඳුන්වා දීම භික්ෂූන් වහන්සේ සතු කාර්යයකි. සංස්කෘතිකත්වය හඳුන්වා දීමෙන් පමණක් ඒ කාර්යය සම්පූර්ණ වන්නේ නැත. නව දැනුමින් යුක්ත යොවුන් ජනතාවට දහම ජීවන දර්ශනයක් වන්නේ කෙසේ ද, යන්න පිළිබඳව භික්ෂූන් වහන්සේට අවදියක් තිබියුතු ය. නූතනත්වය තුළ මතුවන නව ප්‍රවණතාවන් ඉදිරියේ බෞද්ධ ස්ථාවරය කුමක් ද යන්න ගැන නො පැකිළෙන අවබෝධයක් අවශ්‍යය. ගැටලු වලට බෞද්ධ ස්ථාවරය දකින්නට පශ්චාත් කාලීන සම්ප්‍රදාය මතවාදයන්ට සීමා නො වුණ මූලික බුද්ධවචනය ඇසුරින් සසර සහ නිවන පිළිබඳ දැක්මක් භික්ෂූන් වහන්සේට අවශ්‍ය ය. මෙය සංස්කෘතිකමය වශයෙන් හැඩගැසී ඇති දායක ප්‍රතිග්‍රාහක සම්බන්ධතාව ඉක්මවා ගිය කර්තව්‍යයකි. මේ සඳහා භික්ෂුව පුහුදුන් ලෝකයාගේ ඇගයුම් ලුහුබැඳීම වෙනුවට එය ඉක්මවා යාමක් අවශ්‍ය ය.

නූතන ගෝලීයකරණ ක්‍රියාදාමයට භික්ෂූන් වහන්සේත් ගෘහස්ථ බෞද්ධයාත් හසු වී නැතැයි අපට නො කිවහැකි ය. ථායිලන්තයේ සුලක් සිවරාක්ෂා සමාජ සංශෝධන වැඩපිළිවෙළේ මෙහෙයැවීමෙන් කටයුතු කරන Pracha Hutanuwatr සහ Jane Rasbash යන ස්වාමි භාර්‍යා දෙපල ගෝලීයකරණය පිළිබඳ

බෞද්ධ දක්ම පැහැදිලි කරමින් සම්පාදිත කෘතියෙහි ගෝලීයකරණය ඉදිරියේ බෞද්ධ ජීවිතයේ සිදු වී ඇති පරිවර්තනය පිළිබඳව මෙසේ සඳහන් කර ඇත. "ඉහළ පෙළේ භික්ෂූන් වහන්සේලා උසස් ප්‍රඥාව සොයා බුදුදහමේ මූලික ඉගැන්වීම් වලට අනුව සරළ ජීවිතයක් ගෙවීම අමතක කරමින් සිටිති. මේ නූතන භික්ෂූන් වහන්සේලා බී. එම්. ඩබ්ලියු. හා මර්ස්ඩීස් අලුත් ම මොඩලය සඳහා එකිනෙකා හා තරඟ කරමින් සිටිති. සුළු පිරිසක් සැබෑ ඉගැන්වීමට අනුව ක්‍රියා කළ ද ගිහි බෞද්ධයා නිතරම බුදුසමය භාවිතා කරන්නේ ජීවිතයේ චාරිත්‍ර විධි ක්‍රියාත්මක කිරීමක් වශයෙන් පමණි. අද බොහෝ ගිහි බෞද්ධයන් සැබැවින් ම වන්දනා කරන්නේ මුදලට හා සමෘද්ධියට ය."[1] ථායිලන්ත බෞද්ධ සමාජය පිළිබඳව කරන මේ විචාරය මෙරටට ද අදාළ ද නැද්ද යන්න නුවණින් විමසා බලනු මැනැවි.

කොවිඩ් වසංගතය පැමිණීමත් සමග ගන්නට සිදු වූ ක්ෂණික පියවරක් හැටියට රටවල් වසා දැමෙන තුරු ම මිනිසා ලෝකය පරිහරණය කළේ පැය කිහිපයකින් වගාවක් විනාශ කරන කාන්තාර පළඟැටි සේනාවක් සේ ය. පළඟැටි උවදුර ව්‍යාප්ත වෙමින් මිනිසාට ඒ කරුණ ද තේරුම් කරදෙමින් තිබේ. වසංගතයෙහි මරණබිය දෙකක් විය. එකක් වයිරසයෙන් මියයාමේ බිය ය. අනෙක සා ගින්නෙන් මියයාමේ බිය ය. සා ගින්නෙන් මියයාදෝ යන බිය එන්නේ ආනයන අපනයන කටයුතු ඇරඹෙන තුරු රටේ තියෙන ආහාර ටික ඇති වේ ද, යන සැකයත් එක්කයි. ගෝලීය ආර්ථිකයක් කෙරෙහි විශ්වාසය තැබීමේ අවදානම ලෝකයාට ම එකවර තේරුම් ගියේ මේ වතාවේ ය. කෝවිඩ් නො එන්න මෙය තවමත් තේරුම් නො ගන්නවා ඇත.

---

[1] "The high – ranking Buddhist monks are forgetting the basic teachings of the Buddha to live a simple life in quest of higher wisdom – these modern monks are competing with each other for the latest model BMW and Mercedes! Lay Buddhist often use Buddhism only as a ritualistic function in life and few live according to the real teachings. Today most ley Buddhists actually worship money and 'success'."
Globalization from A Buddhist Perspective, bodhi leaves No. 146, p: 9, B.P.S., 1998.

මේ අවස්ථාවේ තේරුම් ගිය තවත් කරුණක් සිහිපත් කළයුතු ම ය. රජය යටතේ පවත්නා ජනතා සේවාවන් පෞද්ගලික කරණය කිරීමේ, පෞද්ගලික ව්‍යවසායිකත්වයට පවරා දීමේ බියකරු බවයි. සෞඛ්‍ය, ගමනාගමනය, අධ්‍යාපනය පෞද්ගලික කරණයට ලක් වී තිබුණා නම් ඇති වන තත්ත්වය කුමක් වියහැකි ද? සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා ආරක්ෂක අංශය නියැලී සිටින්නේ වයිරස් ආසාදන අභියෝගයට මුහුණ දෙමින් අඛණ්ඩ මෙහෙයුමක ය. එවැන්නක් පෞද්ගලික අංශයකින් බලාපොරොත්තු නො වියහැකි ය. පාඩුව නො බලා ගමනාගමන අවශ්‍යතා සපුරන්නට හැකි වන්නේ ද රාජ්‍ය අංශයටයි.

කෙසේ හෝ වසංගතය අභිමුඛයේ අප රටේ ක්ෂණික පියවරක් හැටියට ගෙවතුවගා ක්‍රමය ගැන උනන්දුව ඇති විය. තට්ටු නිවාස වල බැල්කනියේ හෝ යමක් වවා ගැනීමට උනන්දුව ඇති විය. යල කන්නයේ වී වගාවට ද උනන්දුව ඇති විය. එහෙත් මේ පිළිබඳව දිගුකාලීන වැඩ පිළිවෙළක් අවශ්‍ය ය. මීට වසර 140 ට පෙර අර්නස්ට් හෙකල් මහතා මෙරට වාරිශිෂ්ටාචාරයේ නටබුන් දෙස බලා පවසන කරුණ කෙරෙහි ද අපගේ අවධානය යොමු වියයුතු ය.

"මෙහි ඇති සෞම්‍ය දේශගුණයත් සරු පසත් කරන කොට ගෙන, නිරායාසයෙන් ම වත්මන් ජනගහනය මෙන් සය හෝ අට ගුණයක පිරිසකට වාසභූමිය කොට ගතහැක. පැරණි වංශකථාවලට අනුව වසර දෙදහසකට කලින් මෙහි සිටි ජනගහනය, අදට වඩා සැලකියයුතු ප්‍රමාණයකින් සමහර විට දෙගුණයකින් වුව ද වැඩි වීමට පුළුවන. දැනට බොහෝ ස්ථාන වල වල් බිහිව අතහැර දමා ඇති හා ජන ශූන්‍ය වූ උතුරු කොටස, එකල ජනී ජනයා බහුල වාසස්ථානයක් වන්නට ඇත. මෙකල වග වලසුන් රජ කරන, ලෙහෙනුන් හා ගිරවුන් එල සොයා හැසිරෙන, තෙරක් නො පෙනෙන කැලෑවන් එකල <u>මනාව සැලසුම් කළ එමෙන්ම දුටුවන් මවිත කරවන අන්දමේ වාරිමාර්ග පද්ධතීන්ගෙන් පෝෂණය වූ සරුසාර කුඹුරු යාය විය. වැව් හා බැඳී ඒ අසබඩ ගොඩනැගුනු, එහෙත් පසුව අතහැර දමූ මහා නගර වන අනුරාධපුරය, සීගිරිය, පොලොන්නරුව හා අනෙකුත් ඒවා අතීත ශ්‍රී විභූතිය මේ යයි විදහා පාන සාධකයන් වන්නෝ ය. එමෙන් ම ඉන්දියන්</u>

<u>සාගරයේ මුතු ඇටය හා රත්න දීප යන විරුදාවලියෙන් පිදුම් ලද මෙම මාහැඟි දිවයින මතුවට සංවර්ධනය කළයුතු අඳුම ගැන ද යම් ඉඟියක් මෙම නටබුන් වලින් සිතා ගත හැක්කේ ය."</u>[1]

හෙකල් මහතා මේ සඳහන් කරන්නේ මීට වසර 140 ට පමණ පෙර ස්වරූපයයි. අද වන විට ඒ නටබුන් තත්ත්වය ඉක්මවා ඇත. අදටත් අප රටේ පැරණි වාරි පද්ධතිය ජීවමාන ය. අවශ්‍ය වන්නේ යෝග්‍ය ප්‍රතිසංස්කරණයයි. අතීතයෙහි වූ පරිදි ගොවියාගේ ශ්‍රමාභිමානය ආරක්ෂා කරලීමයි. හෙකල් මහතා සඳහන් කරන "මෙහි ඇති සරුපස" හරිත විප්ලවයට පෙර වූ සරුපස බව දතයුතු වේ. අද කළ යුත්තේ කෘෂිකර්මයේ නව රසායන විද්‍යාව බැහැර කරලීමයි. උචිත තාක්ෂණය භාවිතා කිරීමයි. අවශ්‍ය වන්නේ ගෝලීය වශයෙන් විපත් නො සලසන, ප්‍රාදේශීය වශයෙන් ද විපත් නො සලසන මැදුම් පිළිවෙතකි. අතීත දැනුම වේවා, නූතන දැනුම වේවා එය සදාචාරය හා එක්ව යන්නක් නම් දුක නිර්මාණය කිරීම පිණිස වූවක් නො වනු ඇත. ආහාර අතින් මෙන් ම අනෙකුත් මූලික මිනිස් අවශ්‍යතා වලින් ද ස්වයම්පෝෂිත රටක් ගොඩනගා ගැනීම කෙරෙහි රාජ්‍ය තන්ත්‍රයටත් ජනතාවටත් ශක්තිය ධෛර්යය නුවණැස පිබිදේවා. මෙහි දී බුද්ධවචනය තුළින් සැපවත් ජීවිතය පිළිබඳ නිර්ණායකයන් මෙන් ම සුභාෂිත උපදේශයන් රැසක් ද හඳුනා ගතහැකි ය.

**සුවදායක දිවියඃ**

**"ආරොග්‍යපරමා ලාභා සන්තුට්ඨීපරමං ධනං,**
**විස්සාසපරමා ඤාති නිබ්බානපරමං සුඛං"** [2]

"'**ලාභය**' <u>නිරෝගි බව</u> පරම කොට ඇත. '**ධනය**' <u>සෑහීම</u> පරම කොට ඇත. '**ඥාතිත්වය**' <u>විශ්වාසය</u> පරම කොට ඇත. '**සැපය**' <u>නිවන</u> පරම කොට ඇත."

මේ බුදුවදනෙහි අර්ථය තව ටිකක් ලිහිල් කර මෙසේ දක්වන්නට හැකි ය. <u>"ලාභයේ උපරිමය නිරෝගි කමයි. ධනයේ</u>

---

[1] අර්නස්ට් හෙකල්, ලංකාවට ගමනක්, 102 පිට,

[2] බුඃ නිඃ 1,ධම්මපද, සුඛවග්ග, 8 ගාථාව, 76 පිට, බුඃ ජඃ මුඃ

<u>උපරිමය සැහීමයි. නෑ කමේ උපරිමය විශ්වාසවන්ත කමයි. සැපයේ උපරිමය නිවනයි.”</u>

ලෙඩදුක් අඩු කයක් ඇතිව, අවශ්‍යතාවන් පිළිබඳව සෑහීමට පත්වුණ සිතින් යුතුව, විශ්වාසවන්තයින් අතර කෙනෙකුට ජීවත් වන්නට තිබෙණවා නම් කොයි තරම් නම් සහනයක් ද? එබඳු අයට නිවන් සුවය උදා කරගන්නා එකත් බෙහෙවින් පහසු ය. මීට ම අදාළව බුදුදහම අපට තවදුරටත් හඳුන්වා දෙන කරුණක් වන්නේ සුදුසු දේශයක වාසය කිරීමයි. **(පතිරූප දෙස වාසෝ ච)** පසුගිය පරිච්ඡේදයක සඳහන් කළා වගේ දෙවිවරුනුත් විවේකය පිණිස වෙන් කරගන්න හිතපු භූමියක් අපට ලැබී තිබෙන්නෙ කියන බව තේරුම් ගන්න. බොහෝ විදේශිකයින් විසින් මේ ලක්බිම හඳුන්වා තිබෙන්නේ පාරාදීසය යනුවෙනි. ඒ ගැන අප ආඩම්බර වුණාට වැඩක් නැත. 1948 සිට 2020 දක්වා වසර 72 ඇතුළත නවීන ලෝකයේ දේවල් යම් තරමක් ලැබුණත් පාරාදීසයක් සකස් වුනේ නැත. රටේ භූගෝලීය පරිසරය, කාලගුණය හඳුනාගත් පැරැන්නෝ මේ රට පෙරදිග ධාන්‍යාගාරය බවට පත් කළහ. එහෙත් නවතාක්ෂණ භාවිතාවන් ඇති නමුත් හැමදාම මෙරටට කියන්නේ දියුණුවෙමින් පවතින රටක් කියා ය. එය හඳුන්වන්නට වෙන්නේ “නවතාක්ෂණ අවභාවිතය” කියා ය.

නිදහසෙන් පසු මෙරට බලයට පත්වන අයගෙන් වැඩිහරියක් මාතෘභූමියත් ජනතාවත් කෙරෙහි විශ්වාසය තබා පැහැදිලි සැලැස්මකට අනුව කටයුතු කිරීම වෙනුවට කළේ බටහිර බල කඳවුරු වල නියෝජිතයින් හැටියට කටයුතු කිරීමයි. යෝග්‍ය නායකත්වයන් හඳුනා ගැනීමට අවශ්‍ය විනිවිද භාවය මහජනයා තුළ නො වුනා වෙන්න ද පිළිවන. මහජනයා හිතන්නේ ඡන්දෙන් පත්වෙන අය මහජන නියෝජිතයින් කියා ය. ප්‍රජාතන්ත්‍රවාදී සම්මතය එයයි. ඒක එහෙම ම ද කියා මහජනයාටත් තේරුම් ගන්න බැරි අවස්ථා ද උදා වේ. ජනතාව විසින් ඡන්දෙන් පරද්දනු ලැබූ අයත් සමහර විට වෙන පැත්තකින් මැතිසබයට එන අවස්ථාත් තිබේ. එහෙම වෙන කොට මහජනයාට සිදුවන්නේ ප්‍රජාතන්ත්‍රවාදයේ හැටි එහෙම වෙන්නැති කියා සිතන්නට ය. දැන් ඉතින් කාලය ඇවිත් තිබෙන්නේ මේ සියලු විහිලු වැඩසටහන් වලට නැවතීමේ තිත

තියා තිරසර වැඩ පිළිවෙළක් ඇරඹීම පිණිසයි. ඒ නිසා යට කී බුද්ධවචනයට අනුව සංවර්ධනයේ උචිත බව හා උසස් බව පිළිබඳ නිර්ණායකයන් වියයුත්තේ කවරේදැයි සිතා බැලීම වඩාත් සුදුසු ය.

## 01. ආරොග්‍යපරමා ලාභාඃ

ලාභයේ උපරිමය නිරෝගි කමයි. කය ලෙඩවීම ස්වභාව කොට ඇත්තකි. **(ව්‍යධිධම්මො)** රෝගයන් අතර ඉහළ ම රෝගය කුසගින්න ය. **(ජිගච්ඡාපරමා රොගා)**[1] එහෙත් කුසගින්නට ගන්නා ආහාරය සමග විෂ රසායණ ශරීරගත වීමෙන් රෝගී වීම වෙන ම ගැටලුවකි. කලක් තිස්සේ පොළවට මුසු වන කෘෂි රසායන නිසා ජල උල්පත් දූෂණය වී ජනතාවගේ වකුගඩු නරක් වේ නම් ඒ රසායන භාවිතය වහා අත්හළ යුතු ය. මිනිස් අවශ්‍යතා වශයෙන් නිෂ්පාදනය කරන කවර දෙයක් වුව ද කයටත් පරිසරයටත් හානි දායක නම් එය නතර කළයුතු ය. අද යුගයේ රෝග වලට බටහිර ප්‍රතිකාර වශයෙන් ගන්න ඖෂධ ප්‍රතිරෝධ වලිනුත් බොහෝ සංඛ්‍යාවක් මරණයට පත් වෙති. ක්ෂුද්‍රජීවී ප්‍රතිරෝධය නිසාත් මියයති. කෘෂි රසායන භාවිතය, කාර්මීකරණයෙන් වන වායු දූෂණය ආදිය නිසා මිනිසාගේ පරිසරයට සිදු වන හානිය නිසා නොයෙක් රෝග ඇති වේ. ලෙඩගෙනදෙන සංවර්ධනය කෙසේ නම් ලාභයක් වන්නේ ද? නොවන්නේ ම ය.

ආරෝග්‍යය ගැන කියන විට මානසික ආරෝග්‍යය අවශ්‍යයෙන් ම සැලකිල්ලට ගත යුත්තකි. නූතන සමාජයෙහි මානසික ගැටලු නිසා ප්‍රතිකාර ගන්නා ළමා, තරුණ, මැදි, වියපත් පිරිස් වැඩි වෙමින් තිබේ. වේගවත් ගමනක යෙදී සිටින සමාජයේ තම මූලික ජීවන අපේක්ෂාවන් සපුරා ගැනීම සැබැවින් ම අභියෝගයකි. දුක චේතනාමය සකස් කිරීම් පරම කොට ඇත. **(සඞ්ඛාරපරමා දුඛා)**[2] දුකෙහි උපරිමය චේතනාමය අභිසංස්කරණයයි. බුදුසමය කායිකරෝග හා චෛතසිකරෝග යනුවෙන් රෝග වර්ග දෙකක් ගැන සඳහන් කරයි. සමහර විට

---

1 බුඃ නිඃ 1, ධම්මපද සුඛවග්ග, 7 ගාථාව, 76 පිට, බුඃ ජඃ මුඃ

2 - එම -

කායික රෝග නැති අවස්ථා දක්වන්නට පුළුවන් වන නමුත් රහතන් වහන්සේ නමක් හැරෙන්න අනෙක් අයට චෛතසික රෝග නැති මොහොතක් වත් පෙන්වන්නට හැකිය යන්න දුර්ලභ කරුණක් බව සඳහන් වේ.[1] තරගකාරී ජීවන රටාවත්, ඉච්ඡාභංගත්වයත්, සිත් දූෂණය කරන තොරතුරු පතුරුවා හැරීමත්, මත් උවදුරත් බොහෝ සේ චෛතසික රෝග වලට බලපාන බව සිතමි. පුද්ගලයාගේ මානසික නිරෝගීතාව නො සලකා දිනාගත යුත්තේ කුමක් ද?

**සන්තුට්ඨීපරමං ධනං**

ධනයේ උපරිමය සංතෘප්තියයි. දැන් අපි සොයා බලන්නේ සතුටින් ජීවත් වීම යනු කුමක් ද, යන්නයි. සතුටේ පූර්වාදර්ශය බටහිර ලෝකයෙන් ගන්න වුවමනා නැත. සතුට යන වචනයෙහි අර්ථය සෑහීම යන්නයි. නඩත්තුව පහසු සරළ ජීවන රටාව, මූලික ජීවන අවශ්‍යතා සංතෘප්තිය, පරිසර සුරක්ෂිතතාව, පවුලේ හා පවුලෙන් බැහැර මානව සම්බන්ධතා යහපත් වීම, ආධ්‍යාත්මික වශයෙන් අනෙකා කෙරෙහි සංවේදී මනසකින් ක්‍රියා කිරීම, මුදලට යට නොවුන ඇපකැප වීම යනුවෙන් සතුටින් ජීවත් වීමට පොදුවේ අප සියලු දෙනා අවධානය යොමු කළයුතු කරුණු ගණනාවක් පෙන්නුම් කළහැකි ය.

ධනය හැමවිට ම සෑහීම, සංතෘප්තිය පරම කොට ඇත. සෑහීමට පත් වීම ම ධනය සේ දැක්වූයේ භෞතික ධනසම්පත් පිළිබඳ ආශාව සපුරාලිය නො හැකි බැවිනි. තෘෂ්ණාවේ දාසභාවයට ගිය පුද්ගලයා හැම විට ම දනෙන්නේ අඩුපාඩු බව ම ය. **(ඌනො ලොකො අතිත්තො තණ්හාදාසො)**[2] වෙළඳ ලෝකය හඳුන්වා දෙන හැම දෙයක ම හිමිකරුවෙක් වීම ධනවත් වීම නො වේ. අද මිනිසා යාන්ත්‍රික ය. කිසිම ඉස්පාසුවක් නැත. එබඳු අය ජීවත් වෙනවාට වඩා කරන්නේ

---

[1] "තෙ භික්ඛවෙ, සත්තා දුල්ලභා ලොකස්මිං යෙ චෙතසිකෙන රොගෙන මුහුත්තම්පි ආරොග්‍යං පටිජානන්ති, අඤ්ඤත්‍ර ඛීණාසවෙහි."
අං: නි: 2, රොග සූත්‍රය, 278 පිට, බු: ජ: මු:

[2] ම: නි: 2, රට්ඨපාල සූත්‍රය, 440 පිට, බු: ජ: මු:

ජීවත් වීමට සූදානම් වීම ය. මරණාසන්න වන තුරුත් සූදානම ඉවර නැත. අඩුපාඩු කම් රැසක් හිතේ තබාගෙන මියයයි. **(ඌනාව හුත්වාන ජහන්ති දෙහං)** මේ ලෝකයෙහි වස්තුකාමය පිළිබඳව දන් ඇති යන අවස්ථාවක් නො දක්විය හැකි ය. **(කාමෙහි ලොකම්හි නහත්ථි තිත්ති)**[1] ජීවිතේ සෑහීමකට පත් වීමක් තිබියයුතු ය. **(සන්තුස්සකො)** පහසුවෙන් පෝෂණය කළහැකි වියයුතු ය. **(සුභරො)** කටයුතු බහුල කරගතයුතු නො වේ. **(අප්පකිච්චො)** දිවි පැවැත්ම සැහැල්ලු වියයුතු ය. **(සල්ලහුකවුත්ති)**[2] හැබැයි, හුඟ දෙනෙක් හිතන්න පුරුදු වී සිටින්නේ සෑහීමට පත් වීම ඍණාත්මක ස්වභාවයක් හැටියට ය. මුදල ම ජීවිතය හැටියට දකින අයට හිතෙන්නේ එහෙම ය.

**විස්සාසපරමා ඤාතිඃ**

ඥාතිත්වයේ උපරිමය විශ්වාසයයි. මානව සම්බන්ධතාව විශ්වසනීය වියයුතු වේ. ඥාතිත්වය විශ්වාසය පරම කොට ඇත. අනෙකා විශ්වාස කළහැකි නම් ඥාතිත්වය එතැන ම ය. අද මිනිස් ලොව යනු අවිශ්වාසය රජකරන තැනක් වී තිබේ. පුද්ගලයින්ගේ සිත් පිත් විවිධයි, විචිත්‍රයි, භින්නරුචිකයි. ඒ අනුව කය, වචනය, හිත හසුරුවන ලෝකයාට තවෙකකු කෙරෙහි විශ්වාසය නො තැබිය හැකි වී තිබේ. මේ හිත් පිත් වල විවිධත්වය සැකසෙන්නේ ඒ ඒ පුද්ගලයාගේ ලෝකදෘෂ්ටියට අනුව ය.

මෙහි 10 වන පරිච්ඡේදයේ දී දක්වන්නට යෙදුන දස්සන සම්පත්තියත්, දර්ශනය හා චරණයත් මිනිසාට ආත්ම ප්‍රත්‍යවේෂණයෙන් යුතුව තේරුම් ගතහැකි වෙතොත් ලෝකය එක ම නෑ පරපුරක් බව දකිනවා ඇත. සාමාන්‍ය ලෝකයේ දී ද ඉඳහිට කෙනකුට මේ දැක්මේ ආලෝකය පහළ වන අවස්ථා තිබේ. එවන් අවස්ථාවක් රුසියානු අභ්‍යාවකාශ ගාමියකු වන ව්ලැඩිමියර් ලයකොෆ් වරක් ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානයේ දී කළ ප්‍රකාශයකින් විද්‍යමාන වේ. **"අභ්‍යවකාශයේ සිට අපේ පෘථිවිය දෙස බලන විට එය ඉතා පියකරු චමත්කාර ජනක දර්ශනයක් වේ. අභ්‍යවකාශයේ අඳුරු පසුබිම මැද නිල් - කොළ**

---

1 - එම -, 446 පිට.

2 සුඃ නිඃ මෙත්ත සූත්‍රය, 44 පිට, බුඃ ජඃ මුඃ

**පාටින් බැබලෙමින් තිබෙණ අපේ ලෝකය ඒ අයුරින් දකින ඕනෑ ම අයකුට ඒ ගැන ලොකු ආදරයක් සමීප බවක් ඇති වෙනවා. මිනිස් අප මහපොළොවේ දී බොහෝ විට ආරවුල් ඇති කරගන්නා දේශ සීමා කිසිවක් පෙනෙන්නෙ නැහැ. එක ම තනි ලෝකයක් හැටියට පමණයි එය දිස් වන්නේ. ඒ තනි ලෝකයේ සිටින අප සැවොම තනි මිනිස් පවුලක් බව අභ්‍යවකාශ ගාමීන් වන අපට ඉතා හොඳින් ඒත්තු යනවා."**[1]

තෘෂ්ණා දී කෙලෙස් ගෝලීයකරණය වෙනවා වෙනුවට ලෝභයෙන් ද්වේෂයෙන් හා මෝහයෙන් මිණුම් නො වන මෙවන් අප්පමාණචේතසාවක් ගෝලීය වශයෙන් පිළිගැනෙනවා නම් එය ලෝකයට ආශීර්වාදයක් ම ය. සංවර්ධනයේ වේශයෙන් හරිතවිප්ලව උගුලෙහි පටලවන්නන් වැනි ව්‍යාජ විශ්වාසවන්ත කම් වලට හසු නො වීමට මතු පරිස්සම් වියයුතුව තිබේ.

**නිබ්බානපරමං සුඛං**

සැපයේ උපරිමය නිවනයි. මීට සියලු චේතනාමය සකස් කිරීම් වල සංසිඳීම යන අරුත ඇත. **(සබ්බසඞ්ඛාර සමථො)** රාගයෙන්, ද්වේෂයෙන් හා මෝහයෙන් බර වූ සංකල්පනා ඇති කල්හි විද්‍යමාන වන්නේ දුකයි. කෙනකුට මේ ලෝකයෙහි යම් සැපක් දැනෙනවා නම් ඒ දුක් දෙකක් අතර ඇති පුංචි නිමේෂයක දැනෙන වෙනසක් පමණයි. මිනිසා ඒ වෙනස සැපක් හැටියට හිතුවත් එය සැපක් නොව දුකෙහි පීඩනය නිමේෂයකට අඩු වීමක් පමණි. දුක කියා ගන්නේ ද චේතනාමය සකස් කිරීමකි. සැප කියා ගන්නේ ද චේතනාමය සකස් කිරීමකි. කෙනෙක් අත්දකින්නේ බාහිර දේ කියා සිතුවත් අවසාන වශයෙන් අත්දැක ඇත්තේ තමාගේ ම චේතනාමය අභිසංස්කරණයක් පමණයි. සමුදය දතයුතු වන්නේත් නිරෝධය දතයුතු වන්නේත් මේ චේතනාමය සකස් කිරීම් පිළිබඳව ය. චේතනාමය වශයෙන් සැකසෙන මනෝධර්ම නො යෙදේ නම් තවදුරටත් දුකෙහි සමුදයක් නැත. නිවීම කෙළවර කොට ඇති සැපය එයයි.

**"මේ චේතනාමය සකස් කිරීම් ඒකාන්ත වශයෙන් ම අනිත්‍ය ය. ඉපිද ව්‍යය වීම ස්වභාව කොට ඇත. ඉපිද ව්‍යය වී**

---

[1] 1987 පෙබ: 21, දිවයින.

**යන මේ චේතනාමය සකස් කිරීම් වලින් නිදහස් වීම සැපයයි."**[1] ඒ ප්‍රඥාව ඇති තැන කාම, ව්‍යාපාද, විහිංසා සිතිවිලි වලින් පෙළඹී පුද්ගලයා ක්‍රියා කරන්නේ නැත. එහි දී ආරෝග්‍යයත්, සංතෘප්තියත්, විශ්වසනීයත්වයත් ආරක්ෂා වනු ඇත. එය ආධ්‍යාත්මික සංසිඳීම පිණිස ද වනු ඇත.

**කොරෝනා ජනකවි.**

**විශ්‍රාමික බැංකු කළමනාකරු, එස්. දිසානායක මහතා විසින් රචිතයි.**

දතයුතු කොරෝනා පාඩම කුමක් වැනි

සිත කය වදන කියනා මේ තුන්දොරිනී
වන සංකාරයේ සුචරිත බව නොවුණි
අත් වුණු කොරෝනා දඬුවම කුමක් වැනි
වපුරන ලද දෙයින් අස්වනු නෙලනු වැනි

නොසරුප්, මුසා, ප්‍රලාප බස් බිනීමෙනි
වදනේ සංකාර දිව අග විස කෙරුණි
අත් වුණු කොරෝනා දඬුවම කුමක් වැනි
හැම මුව හරහටම මුබවාඩම බැඳුණි

කම්සැප සොයා නිරතුරුවම ගත ඇදුණි
කයසංකාරයේ සංවරකම බිඳුණි
අත්වුණු කොරෝනා දඬුවම කුමක් වැනි
කොටහලු වී වගේ ගෙට කොටු කර තැබුණි

සදහම් එළිය බිඳ පසෙකට විසි කෙරුණි
ලෝකය රමණයට ගොස් අඳුරට වැටුණි
අත්වුණු කොරෝනා දඬුවම කුමක් වැනි
මුලු රට ඇඳිරි නීතියකට යට කෙරුණි

---

1 "අනිච්චා වත සඞ්ඛාරා උප්පාදවයධම්මිනො,
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති තෙසං වූපසමො සුඛො.
දීඃ නිඃ 2, මහාපරිනිබ්බාණ සූත්‍රය, 246 පිට, බුඃ ජඃ මුඃ

සිත් සංකාරයේ ප්‍රතිඵල මේ ලෙසිනි
වට පරිසරයෙ ගතියෙන් දෑසට පෙනුණි
දතයුතු කොරෝනා පාඩම කුමක් වැනි
ලොසොබා දහම් රීතිය රැක්කොත් අගනි

අත අල්ලනා ගත දූවටෙන හැම තැනිනි
කැත විෂබීජයක් සම තවරා ගැනුණි
දතයුතු කොරෝනා පාඩම කුමක් වැනි
"හිත ඇල්ලුවොත්" තණ්හා බීජය ලැබුණි

විසබීජය ඇසට නො පෙනෙනු කුමක් වැනි
දුක් අරි සත්‍ය මසැසින් නො දකිනා වැනි
වයිරස ගත තුළට ගිය විට කුමක් වැනි
මරණය හෝ එ වැනි දුකකට බැඳුණු වැනි

මීටරයක් දුරින් ඉන්නේ කුමක් වැනි
සිවුපස නිසි ලෙසින් වළඳන කෙනා වැනි
බත් ටික ගෙදරට ම ලැබුණේ කුමක් වැනි
අරි උතුමන්ගෙ ගුණ දැක දුන් දන් බෙලෙනි

නිරෝධායනය වෙන්නේ කුමක් වැනි
පස්කම් ලොවින් නිස්සරණය වෙනා මෙනි
දෙහි කහ යොදා අත් සෝදනු කුමක් වැනි
සිත දම් දිය යොදා කෙලෙසින් මුදනු වැනි

# 12.

## සමාප්තිය

කොවිඩ් 19 වෛරසයේ සම්ප්‍රාප්තියත් සමඟ ගෝලීය ආර්ථිකයක් කෙරෙහි විශ්වාසය තබා සිටීමේ අවදානම කාටත් තේරුම් ගිය මේ මොහොත මෙතෙක් ලොව ආ සාවද්‍ය ගමන් මග වෙනස් කිරීමට උදා වූ අවස්ථාවකි. මේ අවස්ථාව පැහැර හැරියොත් පතිරූප දේශයක් සකස් කර ගැනීමට යළි උදා වන අවස්ථාවක් ගැන දනට අපට නො සිතියහැකි ය. එසේ වුවහොත් මෙතෙක් ආ ව්‍යසනකාරී මඟෙහි ම යන්නට සිදු වෙනවා ඇත. රාජ්‍යතන්ත්‍රයත් ජනතාවත් මේ අනතුරෙහි දී ප්‍රඥාවන්ත වියයුතු වේ. අප මෙසේ කථා කළ ද, සසරක් නිවනක් ගැන දක්මක් නැති ලෝක බලවතුන් සැපවත් වන්නට බලන්නේ දියුණු වෙමින් පවතින රටවල් තම අභිමතය පරිදි හැසිරවීමෙනි.

සංවර්ධනය වෙමින් ඇති රටවල ණය කපා හැරීම සඳහා එම රටවල වනාන්තර ඇමරිකන් සමාගම් වලට ගැනීමේ පනතක් 1998 දී ඇමරිකානු කොන්ග්‍රස් මණ්ඩලයේ සම්මත වීම එවැන්නකි. ණය කැපී යාමේ වාසිය පෙන්වා සංවර්ධනය වෙමින් පවතින රටවල ඇමරිකාවට අයත් වනාන්තර ඇති වීමේ දී ජලය හා භූමිය අහිමි වීමෙන් පහර වදින්නේ ගොවි ජනතාවටයි. වී ගොවිතැනටයි.

ස්වයම්පෝෂිත ආර්ථිකයක් ගොඩනැගීමටත් රසායන භාවිතයේ උවදුරින් නිදහස් වීමටත් අපි පෙරුම් පුරන්නේ නම් මෙවන් ජාත්‍යන්තර කුයෝපක්‍රම කෙරෙහි ප්‍රඥාසම්ප්‍රයුක්ත අවදියකින් ක්‍රියා කළයුතුව තිබේ. 1943 දී ඇමරිකානු රොක්ෆෙලර් සමාගම තිරිඟු හා ඉරිඟු වැඩි දියුණු කිරීම සඳහා “CIMMTY” ආයතනය මැක්සිකොවේ ආරම්භ කරන ලදි. හරිත විප්ලවය ක්‍රියාත්මක වූයේ මැක්සිකෝවේ සිට ය. එය අදටත් පොහොසත් රටක් නො වේ. මැක්සිකානු සංක්‍රමණිකයන් ඇමරිකාවට සංක්‍රමණය වන්නේ එබැවිනි. එය වළක්වා ලීම සඳහා මැක්සිකෝ දේශසීමාවේ තාප්පයක් බඳින බවට ඩොනල්ඩ් ට්‍රම්ප් ජනාධිපතිවරණ පොරොන්දුවක් දී ඇත්තේ ද එබැවිනි. හරිත විප්ලවයේ සාර්ථකත්වය එබඳු ය. අමරිකානු

රොක්ෆෙලර් හා ෆෝඩ් සමාගම් අන්තර්ජාතික වී පර්යේෂණායතනය (IRRI) පිහිටුවන ලද්දේ පිලිපීනයේ ය. මේ පිළිබඳ බොහෝ කරුණු ගවේෂණය කරන **කොලට් සේනානායක, නාරද කරුණාතිලක** මහතුන් දෙපල විසින් **"බත් කැවත් පාන් කැවත් වස ම තමයි"** යන මැයෙන් 2020 ජනවාරි 05 ඉරිදා **වරුණ** පත්‍රයට ලිපියක් සපයමින් මේ **'ඊරි'** ආයතනයේ ක්‍රියාකාරීත්වය ගැන මෙසේ සඳහන් කරති.

"'ඊරි' මගින් සිදු කර ඇති එක් ප්‍රධාන කාර්යයක් වන්නේ ලෝකයේ වී නිෂ්පාදනය පාලනය කිරීමේ බලය ලොකු සමාගම් කීපයකට ලබා දීමයි. ඊට මග පාදාගෙන ඇත්තේ වී නිෂ්පාදනය රසායනික විප්ලවයට බිලි කිරීමෙනි. අවුරුදු දහස් ගණනක් වී වගා කළ ලංකාව කෘෂි නිෂ්පාදන සමාගම් කිහිපයක වහලකු වී ඇත්තේ කිසියම් සංවිධානාත්මක වැඩ පිළිවෙළක් විසින් සිංහල සමාජය දේශපාලනික වශයෙන් භේද කරවීමෙනි.

ලංකාවට නැවතත් සාම්ප්‍රදායික සිංහල ගොවිතැන වෙත ගමන් කිරීමට නො හැකි වන සේ හිර කිරීමක් ද 'ඊරි' විසින් සිදු කරනු ලබයි. ඒ අධ්‍යාපනය හරහා ළමයින්ට විද්‍යාත්මක කෘෂි කර්මය ඉගැන්වීමෙනි. මෙහි ප්‍රතිඵලය රටේ ගොවිතැන ගැන දැනුමැති ප්‍රාඥයින් වෙනුවට කෘෂිකර්මය ගැන දන්නා උගතුන් බිහි වීමයි. ඔවුන් කරන්නේ රට කෘෂි නිෂ්පාදන සමාගම් වල වහලුන් වශයෙන් රඳවා තබා ගැනීමයි. පසුගිය වසරේ මෛත්‍රීපාල සිරිසේන ලංකාවේ හිටපු ජනාධිපතිවරයා පිලිපීනයේ ඊරි වෙත කැඳවාගෙන යනු ලැබීම පවා ඔවුන්ගේ සැලසුමක් වියයුතු ය."[1] යනුවෙනි.

වසවිස නැති පෝෂණ ගුණයෙන් යුක්ත ආහාර රටාවක් පිණිස, රටේ පරිසරයේ සුරක්ෂිත බව රැකගනු පිණිස, රටේ ව්‍යවසායිකත්වය හා නවෝත්පාදනය උචිත අයුරින් සංවිධානය කරගනු පිණිස කටයුතු කිරීමත් ලෙහෙසි පහසු වැඩක් නො වේ. නිවන් අරමුණ වසාලන්නට මාර බලවේග එන්නා සේ සෞභාග්‍යය පිණිස ධර්ම අර්ථ රටාවක් සකසා ගැනීමේ දී ද ඊට බාධක වන පරිද්දෙන් මාර බලවේග ඉදිරිපත් වන බව අමතක කළයුතු නො වේ. ඒවා හඳුනාගෙන සිටීම ඒවා

1 කොලට් සේනානායක, නාරද කරුණාතිලක, "බත් කැවත් පාන් කැවත් වස ම තමයි", වරුණ පුවත්පත, 2020. ජනවාරි 05 ඉරිදා.

අභිභවනයට ශක්තියක් වෙයි. නො හඳුනාගත හොත් වෙන දේ ගැන, වෙන්නේ මොකක් දැයි යන්න ගැන වටහා ගැනීමට මා කියවා ඇති පොඩි කටන්දරයක් මෙහි දී උපයෝගි කරගන්නට පිළිවන. මේ කථාව ඇත්තක් දැයි මම නො දනිමි.

දවසක් ස්ටාලින් මාඕසේතුංට කොමියුනිස්ට් වාදය හඳුන්වා දෙන්න හිතාගෙන ඇහුවලු "සහෝදරය, ඔබ කොහොම ද බළලෙකුට ගම්මිරිස් කවන්නේ ? " කියල.

ක්‍රම දෙකක් තියෙනව. මාඕසේතුං කිව්ව. එක්කෝ බලෙන් කවනව. එහෙම නැත්නම් මාළුවකුට ගම්මිරිස් දාල දෙනව.

ස්ටාලින් කියනව, "වැරදියි, ඕක අපේ දෘෂ්ටියට එකඟ නැහැ. පළමුවෙනි එක බලහත්කාර කමක්. දෙවැන්න රැවටීමක්. ඔබ දැනගන්න අපි කවදාවත් මිනිස්සුන්ට බලකරන්නෙත් නෑ. මිනිස්සුන්ව රවට්ටන්නෙත් නෑ."

එහෙනම් කොහොම ද ඔබ ඒක කරන්නෙ? මාඕසේතුං අහනව.

"ස්ටාලින් කියනව. මෙහෙමයි. මම බළලාගෙ වලිගෙ ගම්මිරිස් අතුල්ලනව. දැවිල්ල අල්ලන්න පටන් ගත්තට පස්සෙ බළලා පිටිපස්සට හැරිල වලිගෙ ලෙවකනව. මේ ආකාරයෙන් කැමැත්තෙන් ම බළලා ගම්මිරිස් කනවා." (හැබැයි, මාළුවකුට ගම්මිරිස් දාල දුන්නත් වලිගෙ ගම්මිරිස් ඇතිල්ලුවත් කරල තියෙන්නෙ රැවටීම ම යි)

හරිත විප්ලවය නිසා කාලයක් තිස්සේ බඩගින්නට ආහාර ගන්නවා ය කියා අපි වස කා ඇත්තේ ඔය ආකාරයට ය. ලෝකෙ ලොකු ලොක්කො නවරසායන කෘෂිකර්මයෙන් මිදෙන්න හදන අප වගේ පුංචි අයට බාධා කරන්න ඉඩ තිබේ. නිවන් අවබෝධ කරන්න මහන්සි වෙන කොට මාරය කැමති නෑ, වගේ ම ය. ඒ නිසා බුදුරජාණන් වහන්සේ දේශනා කරන කාරණයත් අපි තේරුම් ගතයුතු වෙමු. පාළියෙන් **'බළිස'** කියන්නේ බිලී කොක්කට ය. බිලී කොක්කේ ඇමක් අමුණපුවාම පාළියෙන් කියන්නේ **'ආමිසගතං බළිසං'** යනුවෙනි. ඇම අමුණපු කෝක්ක දියබෙට දාපුවාම ඇම දකින මාලුවා ගිලින්නේ ඇම ය. එහෙත් නොපෙනෙන කොක්කකුත් එක්ක ය. මාළුවා පත්වන්නේ මහත් විපතකට ය. දැන් බිලී බාන්නාට කැමැත්තක් කළහැකි ය. මේ උපමාව බුදුරජාණන් වහන්සේ

භික්ෂූන්ට දේශනා කරන්නේ නිවන් අවබෝධයට බාධා කරන ලාභසත්කාරය, ගුණගායනාව කියන මාරයාගේ ඇමෙන් මිදීම පිණිස කලින් ම භික්ෂූන් වහන්සේ දැනුම්වත් කරනු පිණිස ය. ලාභසත්කාරයට ගුණගායනාවට ගිජු වුනොත් මාරයා කරන දේකට යටත් වෙනවා ඇරෙන්න අන් කළයුත්තක් නැත.[1]

ආධ්‍යාත්මික ශුභසිද්ධිය පිණිසත් ලෞකික ශුභසිද්ධිය පිණිසක් බාධක වන්නේ ඇමට ගිජුවීම බව දැන් අපට පැහැදිලි ය. ඇමට සැඟවී බිළිය පවතී. ආධ්‍යාත්මික ශුභසිද්ධියට බාධක වන ලාභසත්කාරය හා ගුණගායනාව නමැති ඇමට සැඟවී ඇත්තේ තෘෂ්ණා බිළියයි. හසුවන්නේ මාරයාගේ ග්‍රහණයටයි. ඊට පසු හසුරවන්නේ මාරයා කැමති පරිදි ය. ප්‍රතිඵලය නිවීම පරම කොට ඇති සැපය අහිමි වීම ය. ලෞකික ශුභසිද්ධියට බාධක වන නවීන සංවර්ධනයේ මායාව නමැති ඇමට සැඟවී ඇත්තේ තෘෂ්ණා බිළිය ම ය. හසු වන්නේ ලෝක බලවතුන්ගේ ග්‍රහණයටයි. දියුණු වෙන්න මහන්සි ගන්න රටවල් හසුරුවන්නේ බටහිරයන් කැමති ආකාරයට ය. එවිට පරම ලාභය වන අරෝග්‍යය ද නැත. පරම ධනය වන සන්තුෂ්ටිය ද නැත. පරම ඥාතිත්වය වන විශ්වසනීයත්වය ද නැත. පොළොව ද දූෂණය වෙයි.

ආධ්‍යාත්මික හා ලෞකික අංශ දෙකේ දී ම බිලී කොක්ක වූයේ තෘෂ්ණාව ම ය. කෙසේ නමුත් බුදුදහමේ දැක්මට අනුව ගෝලීයකරණ ප්‍රවාහයේ හරය තෘෂ්ණාවේ ගෝලීයකරණය ම ය. තෘෂ්ණාව හැම දුකක ම මූල හේතුවයි.[2] පිරිපුන් දහමක් වන බෞද්ධ චින්තනයෙන් පුද්ගල පෞරුෂය පෝෂණය වන්නේ නම් සිදු වන්නේ තෘෂ්ණාවට යට වීම නොව තෘෂ්ණාව විනිවිද දැකීමයි. එහෙත් තෘෂ්ණාවෙන් මැඩුණ බලවතුන් පසුගිය සියවස් ගණනක් තිස්සේ සිදු කළේ ධනවාදී හා සමාජවාදී ආකෘති තුළ කාර්මීකරණයේ නාමයෙන්,

---

1 සං: නි: 2, බළිස සූත්‍රය, 344 පිට, බු: ජ: මු:

2 “However, from a Buddhist perspective, the very core of the globalization process is the globalization *tanha* or craving. According to Buddhist analysis craving is the root cause of all suffering.”
Globalization from A Buddhist Perspective, Bodhi Leaves, No 146, P.2, B.P.S. 1998.

සංවර්ධනයේ නාමයෙන් ලෝක ජනතාව තාඩන පීඩනයට ලක් කිරීමයි.

1854 දී ඇමරිකාවේ වොෂින්ටන් ආණ්ඩුකාරයා ආදිවාසී රතුඉන්දියානු ජාතිකයන්ගේ ඉඩම් මිල දී ගැනීමට යෝජනා කළ අවස්ථාවේ රතුඉන්දියානු නායක සියැටල් කළ ප්‍රකාශයෙන් මතු දැක්වෙන කුඩා ඡේදය ගෙන එන පණිවිඩය ගැන සිතා බලන්න.

"අපි අපේ දරුවන්ට ඉගැන්නුවා වගේ තමුන්නාන්සේලා තමුන්නාන්සේලාගේ දරුවන්ට උගන්නන්ඩ ඕනෑ පොළොව අපේ මැණියන් වහන්සේ බව. පොළොවට යමක් සිද්ධ වුණොත් පොළොවේ පුතුන්ටත් ඒක ම සිද්ධ වෙනවා. පොළොවට කෙළ ගහන මිනිස්සු තමන්ට ම යි කෙළ ගහගන්නෙ. මේ දේ අපි දන්නව. පොළොව මිනිහට අයිති නැහැ. මිනිහ පොළොවට අයිතියි. මේකත් අපි දන්නව. හැම දෙයක් ම එකිනෙකට සම්බන්ධයි. හරියට ලේ බැම්මෙන් බැඳුණු පවුලක් වගේ හැම දෙයක් ම එකිනෙකට සම්බන්ධයි. ජීවිතය කියන දැල විව්වෙ මිනිහා නො වේ. මිනිහා ඒ දැලේ එක නූල්පටක් විතරයි. මිනිහා දැලට කරන දේ තමාට ම කරගන්න දෙයක්."

ම්ලේච්ඡ රතුඉන්දියානු නායක සියැටල්ගේ පරිසර සංවේදීතාව ශිෂ්ටයන්ට නැත. තමන්ගේ ගිජුකම නිසා අනෙකාට වන තාඩන පීඩනය ගැන සංවේදීතාවක් නැත. ඒ බව හොඳින් දන අපේ උරුමය වන බුදුදහම අප වෙත ප්‍රදානය කර ඇති කිසිවෙක් විපතට නො හෙළා මෛත්‍රිය පෙරදැරි කරගෙන කටයුතු කළහැකි ජීවන දැක්මෙන් රාජ්‍යතන්ත්‍රයත් ජනතාවත් ශක්තිමත් වියයුතු ය. අප රට හා ජනතාව පිළිබඳ හැම පැතිකඩකට ම අදාළ ජාතික ප්‍රතිපත්තීන් සකස් කර ගැනීමක් අවශ්‍ය ය. කවරෙක් බලයට පත් වුව ද ක්‍රියාත්මක වියයුත්තේ ඒ ජාතික ප්‍රතිපත්තියයි. පෞද්ගලික දේශපාලන න්‍යාය පත්‍රයන් අනුව කටයුතු කිරීමකට අවකාශ නො තැබියයුතුව තිබේ. ඉහවහා ගිය කාම, ව්‍යාපාද, විහිංසා සංකල්පනා වලින් පෙළඹීම බෞද්ධ පිළිවෙතට අදාළ නැත. බෞද්ධ පිළිවෙතෙහි ක්‍රියාත්මක වන්නේ නෙක්ඛම්ම, අව්‍යාපාද, අවිහිංසා පදනමයි. පංචකාමය සංයමයෙන් පරිහරණය කිරීමත් සමාජගත ජීවිතයේ දී මෛත්‍රී චිත්තය පෙරටු වීමත් බෞද්ධ සමාජ සන්දර්භයේ දී අවධාරණය කෙරේ. මෙත් සිත පුද්ගල ඇසුර පවත්වන්නේත්, භෞතිකත්වය පරිහරණය කරන්නේ හානි දායක ලෙස නො වේ.

අපරදිග චින්තනයට අනුව දුක් අඩු කරගැනීමට යොදාගන්නට දන්නේ පස්කම් සුවයයි. එය පුහුදුන් ආකල්පයයි. බුදුරජාණන් වහන්සේ එය මෙසේ සඳහන් කරති. **"අශ්‍රැතවත් පෘථක්ජනයා කාම සුඛයෙන් අන්‍යතරව දුක් වේදනාවන්ගෙන් මිදීමක් දන්නේ නැත."** එහෙත් **"ශ්‍රැතවත් ආර්යශ්‍රාවකයා කාම සුඛයෙන් අන්‍යතරව දුක් වේදනාවන්ගෙන් මිදීමක් දනියි."**[1] දහම දකින්නා පස්කම් සුවයෙන් කැළඹෙනවා වෙනුවට ඉන් තොර වූ සමාහිත සුවය අත්දකියි. සමාහිත සුවය හඳුනන පුද්ගලයා පස්කම් සුවයට වැඩි ප්‍රණීතතර, අකුශලයක් ද නො වන සමාහිත සුවයක් අත්දකියි. සැපත හැටියට සිතා නිෂ්පාදනයත් පරිභෝජනයත් ඉහළ දමන සංස්කෘතියකට "දැන් ඇති" කියා සිතෙන අවස්ථාවක් නැත. එවන් සිත් පිත් ඇති අයට සංරක්ෂණශීලී පරිභෝජනයක් ගැන සිතා ගන්නට බැරි ය. අපරදිග ශිෂ්ටාචාරය අධිපරිභෝජනවාදී ය. ගෝලීයකරණය වන්නේ ඒ ශිෂ්ටාචාරය නම් බිහිවන්නේ ගෝලීය අධිපරිභෝජනයයි. කොවිඩ් 19 වසංගතය ගෝලීයව බලපෑම් කරනතුරු ක්‍රියාත්මක වූයේ එයයි. එකෙණෙහි ම කාටත් තේරුම් ගියේ මේ යන ගමන වැරදි බවයි. එහෙත් එය සාමාන්‍ය නුවණින් තේරුම් යාමක් විනා ප්‍රඥාවෙන් උදාවූ අවබෝධයක් නො වේ. එහෙම කියන්නේ ඇයි? මිනිසුන්ට සිහියට ආයේ ආනයන ප්‍රතිපත්තිය තවදුරටත් පවත්වාගන්නට බැරිවන විට ආහාර සාගතයකට මුහුණ දීමට සිදු වන බවයි. පාරිභෝගිකයාට හිතුනේ පුළුවන් තරම් ආහාර මිල දී ගබඩා කරගතයුතුය කියා ය. ඇතැම් මුදලාලිලාට හිතුනේ බඩු සඟවා තැබියයුතු බවයි. වැඩි මිලට විකිණියයුතු බවයි. ඕක කරන්නේ කී දවසකට ද?

මිනිසා මේ යන්නේ ස්වභාව නියාමයට දැරිය නො හැකි ගමනක් බව දකිමින්, ස්වයම්පෝෂණයේ වටිනා කම දකිමින් සිටි අයට හිතුනේ ස්වයම්පෝෂණයටත් නවෝත්පාදනයටත් යා යුතු ය, යන්නයි. ලෞකික මට්ටමෙන් ප්‍රඥාවෙන් උදාවන අවබෝධය එයයි. ආහාර නිෂ්පාදනයෙන් පළමුව පටන් ගතයුතු

---

1 "න භික්ඛවෙ පජානාති අස්සුතවා පුථුජ්ජනො අඤ්ඤත්‍ර කාමසුඛා දුකඛාය වෙදනාය නිස්සරණං."
"පජානාති හි භික්ඛවෙ සුතවා අරියසාවකො අඤ්ඤත්‍ර කාමසුඛා දුක්ඛාය වෙදනාය නිස්සරණං"
සං: නි: 4, සල්ල සූත්‍රය, 396 පිට, බු: ජ: මු:

බව පෙන්වමින් ගෙවතු වගාව ඇරඹිණ. යලකන්නයට ද කුඹුරු වගා කෙරිණ. නැගී ආ මේ උදෙයෝගය වසංගත ප්‍රශ්නය ලිහිල් වන විට ක්‍රමයෙන් අමතක වුණොත්? ඒකයි ප්‍රශ්නය. ඉදිරියට කළයුතු දේ හා තේරුම් ගතයුතු දේ බොහෝ වියහැකියි. මේ ගැන කුමරතුඟු මුනිදසුන් පවසන්නේ මෙයයි.

අලුත් අලුත් දෑ නො තනන ජාතිය ලොවැ නො නඟී
හිඟා කෑම බැරි වුණු තැන ලඟී ගයා මර ගී
ගැමි වහරින් හද පොපියන අරුත් රසය නො හැඟී
මහ දද දන ගණ උපදින කලැ පර දෑ අනැඟී

ලොවැ දියුණුවන්නට නම් නවොත්පාදනයට යා යුතු ය. මේ වසංගතයත් එක්ක හිඟාකෑම බැරිවුණ තැනකට දැන් අපි පැමිණ සිටිමු. මර ගී ගැයීමෙන් වැඩක් නැත. ගැමි හදවතෙහි මතුවන අරුත් රසය නො වැටහෙන මෝඩ අය උපදින කම් අගය කරනු ඇත්තේ පර දේ ම ය. පරගැති බවින් සිත නිදහස් කරගතහොත් රට නිදහස් කරගත හැකි ය. පළමුව සිත නිදහස් නො කරගෙන රට නිදහස් කරමුයි යමෙක් කියනවා නම් එය කට තියෙනවාට කියන මෝඩ කමට කියන කථාවත් පමණි. කුමරතුඟු මුනිදසුන් එය පවසන්නේ මෙසේ ය.

සිත නිදහස් බවට
නො පමුණුවා පළමු කොට
නිදහසට සිය රට
ලමු යි යෙති දදහු ඇතියෙන් කට[1]

සිත පරගැති බවිනුත් නිදහස් වියයුතු ය. වැරදි දැකීම් වලිනුත්, තෘෂ්ණාහරිත හැඟීම් වලිනුත් නිදහස් වියයුතු ය. නො හැකියාවෙන් නිදහස් සිත හැකියාවෙන් පිරිපුන් ය. **(සක්කො)** වංක බවින් නිදහස් සිත අවංක ය. **(උජු)** වඩ වඩාත් වංකකමින් මිදෙන සිත වඩ වඩාත් අවං ක ය. **(සූජු)** දැඩි බවින් නිදහස් වන සිත අනුන්ගේ අදහස සැලකිල්ලට ගනියි. **(සුවචො)** රළු බවින් නිදහස් සිත මෘදු ය. **(මුදු)** අහංකාරයෙන් නො මැඩුණ සිත

---

1 කුමාරතුංග මුනිදාස, විරිත් වැකිය, පිවිසුම, මුල් පිට.

අධික මානයෙන් තොර ය. **(අනතිමානී)** ගිජු බවින් නිදහස් සිත සංතෘප්ත ය. **(සන්තුස්සකො)** අධිපරිභෝජනයෙන් මිදුන සිත පහසුවෙන් පෝෂණය කළ හැකි ය. **(සුභරො)** කාර්ය බහුලත්වයෙන් නො මැඩුණ සිත අල්පකෘත්‍යතාවෙහි ඇලෙයි. **(අප්පකිච්චො)** මෙය කම්මැලි කම නො වේ. අපේක්ෂා බාහුල්‍යයෙන් නිදහස් සිත සැහැල්ලු පැවැත්මෙන් යුක්ත ය. **(සල්ලහුකවුත්ති)** අසංවර බවින් මිදුණ සිත ඇති තැන ඉඳුරන් ශාන්ත ය. **(සන්තින්ද්‍රියො)** නො මුළා සිත ප්‍රඥා සම්ප්‍රයුක්ත ය. **(නිපකො)** දඩබ්බර නැත. **(අප්පගබ්භො)** අනුචිත ඇලීම් වලින් තොර ය. **(කුලෙසු අනනුගිද්ධො)** නුවණැත්තවුන්ගේ ගැරහීමට ලක් වන සුළු වරදෙහි ද නො හැසිරේ. **(න ච ඛුද්දං සමාචරෙ කිඤ්චියෙන විඤ්ඤූ පරෙ උපවදෙය්‍යුං)** මේ දක්වන ලද්දේ ශුභසිද්ධියෙහි දක්ෂයා විසින් කළයුතු දෙයයි. **(අත්ථකුසලෙන කරණීයං)** මෙහි ශුභසිද්ධිය, අධ්‍යාත්මික ශුභසිද්ධිය ද ලෞකික ශුභසිද්ධිය ද වේ. අනෙකාට සතුරු නො වන මනසක් ඇති තැන උදාවන්නේ ශුභසිද්ධිය ම ය.

අද යුගයේ සාමය යනුවෙන් හිතන්නේ සැබෑ සාමයට නොව අනෙකාගේ බලය පිළිබඳ තක්සේරුවක් නැති තැන ඇතිවන තාවකාලික නිහඬ වීමකට ය. ඒ බලවතුන්ගේ පැත්තෙන් ය. ලෝකයේ පොදු ජනතාව ඉල්ලා සිටින්නේ සාමයයි. එහෙත් බුදුදහමට අනුව බලකාමීන් හා ඔවුන්ගේ අනුගාමිකයින් ඉන්නේ අසුර දර්ශනයෙහි ය. ඔවුන් කථා කරන්නේ දඬු සහිතව අවි සහිතව හැසිරීම පිළිබඳවයි. **(සදණ්ඩාවචරා සසත්ථාවචරා)** අරගලය ගෙන යන ආකාරය පිළිබඳවයි. **(ඉති භණ්ඩනං)** එදිරිවාදු කම් කරන ආකාරය පිළිබඳවයි. **(ඉති විග්ගහො)** කලහය ඉදිරියට ගෙන යන ආකාරය පිළිබඳවයි. **(ඉති කලහො)** මේකට දහමේ කියන්නේ අඥාන බලය කියලයි. අද ලෝකයේ තියෙන්නේ දියුණු සමාජයක් යයි කීවාට කථා කරන්නට අවශ්‍ය වී තිබෙන්නේ නිරායුධකරණය ගැනයි. සංහිඳියාව ගැනයි. ඒ බල අසහනය උත්සන්නව ඇති නිසයි. සාමයට ශක්තිය දෙන්නට නම් ධර්මයේ රැකවරණය සළසාලිය යුතු වේ. අධර්මය බලවත් ය, ශක්තිමත් ය කියා බොහෝ දෙනා සිතති. ධර්මය දුර්වල ය, ශක්ති හීන යයි ද සිතති. ඒ සිතිවිල්ල වැරදි ය. ධර්මය බලවත් ය. ශක්තිමත් ය. එයින් කිසිවකුට විපතක් නො වේ. අඥානබලය බලයක් කියා

ගන්නේ නම් එය බලයක් නො වූ බලයකි. ධර්මයෙන් සුරක්ෂිත බලයට එරෙහිව පවතින්න හැකි කෙනෙක් හැත.[1] ධර්මයේ බලය කිසිවකුට හානි කරන්නේ නැත. ඒ වෙනුවට ධර්මය උදා කරන්නේ සැපතයි. සහනයයි. සාමයයි. සංහිඳියාවයි. දහම්මග ආරක්ෂා සහිත ය. **(ඛෙමො මග්ගො)** සුවදායක ය. **(සොවත්‍ථිකො)** දහම්මගෙහි ගමන ප්‍රීතිමත් ය. **(පීති ගමනීයො)**[2]

ආධ්‍යාත්මික ගමනේ දී මෙන් ම ලෞකික අභිවෘද්ධිය කරා යන ගමන ද සුරක්ෂිත, සුවදායක, ප්‍රීතිමත් කර ගැනීමට නුවණැස භාවිතා කළයුතු වේ. ඒ ළඟ මිනිස් පරපුරටත් ශාක, සත්ව ජීව සන්තතියටත් නැවුම් පෘථුවිගෝලයක්, ජලගෝලයක්, වායුගෝලයක් ඉතිරි කර දෙන්නට වර්තමානය වග බලා ගතයුතු ය. ලෞකික අභිවෘද්ධියේ දී විද්‍යා තාක්‍ෂණය දෘඩාඞ්ගය වන විට ධර්මය (දස්සනසම්පත්තිය) මෘදුකාඞ්ගය වියයුතු වේ. ආර්ථික සංවර්ධනය ආධ්‍යාත්මික වටිනාකම් ඉක්මවා නො යන්නේ එසේ දකින විට ය. **සාම්ප්‍රදායික සංවර්ධනය හා නවීන සංවර්ධනය අතර නො ගැලපීම සමහන් වන නිවැරදි සංවර්ධන මාර්ගයක් උදෙසා අප රටේ රාජ්‍යතන්ත්‍රයටත් ජනතාවටත් නුවණැස උදා වේවා.! එපරිද්දෙන් ම ලෝක රාජ්‍යතන්ත්‍රයන්ටත්, ලොක් ජනතාවටක් නුවණැස උදා වේවා.!**

*දේවකායික සත්වයින් දෙව් බවින් චුත වෙන්න කිට්ටු වුණාම දිවමල් මැලවෙනව. දිව්‍ය වස්ත්‍ර කිළිටි වෙනව. කිහිලි වලින් දහදිය ගලනව. දිව්‍ය කය දුර්වර්ණ වෙනව. දිව්‍යාසනයේ හිත ඇලෙන්නෙ නෑ.*

*චුත වෙන්න කිට්ටු මේ දෙවියන් දකින අනෙක් දෙවිවරු ඇවිත් සැනසිලි බස් කියනව. "පින්වත, මෙයින් චුතව ඔබ සුගතියට යන්න. සුගතියට ගිහින් මැනැවින් ලැබියයුතු ලාභය ලබන්න. ඒ මනා ලාභයෙහි මැනැවින් තහවුරු වන්න." කියල.*

*මේ බව දේශනා කළ බුදුරජාණන් වහන්සේගෙන් එක් භික්‍ෂුවක් අහනව, ස්වාමීනි, දෙවියන්ගේ සුගති ගමන මොකක්*

---

[1] අබලන්තං බලං ආහු යස්ස බාලබලං බලං,
**බලස්ස ධම්මගුත්තස්ස පටිවත්තා න විජ්ජති.**
සංඃ නිඃ 1, සුභාසිතජය සූත්‍රය, 398 පිට, බුඃ ජඃ මුඃ

[2] මඃ නිඃ 1, ද්වෙධාවිතක්ක සූත්‍රය, 298 පිට, බුඃ ජඃ මුඃ

*ද? දෙවියන්ගේ මනා ලැබීම මොකක් ද? මනා ලාභයෙහි තහවුරු වීම මොකක් ද? කියල.*

*මහණ, දෙවියන්ගේ සුගතිගමන මිනිසත් බවයි. මනා ලාභය බුදුන් වදාළ ධර්මවිනයෙහි ශ්‍රද්ධාවට පැමිණීමයි. හිතට වැද ගත්, මුල් ඇද්ද, ස්ථිර වුණ, ශ්‍රද්ධාව කිසිම දෙවියකුට මරකුට බ්‍රහ්මයකුට අන් කිසි ම කෙනකුට වෙනස් නො කළහැකි ලෙස ස්ථිර කරගැනීම මනා ලාභයෙහි තහවුරු වීමයි. යනුවෙන් බුදුහු වදාළහ.*

*බු: නි: 1, ඉතිවුත්තකපාළි, පුබ්බනිමිත්ත සූත්‍රය, 420 පිට, බු: ජ: මු:*

මේ පුබ්බනිමිත්ත සූත්‍රය අනුව මිනිසත්බව දෙවියනට සුගතියක් වන්නේ බුදුන් වදාළ ධර්මවිනයෙහි ශ්‍රද්ධාවට පැමිණෙන්ට අවකාශයක් ඇත්නම් පමණි. මේ ශ්‍රද්ධාව යනු නිරය භයින් විමුක්ත නිවන් පිළිවෙතෙහි ස්ථිර වන ශ්‍රද්ධාවකි. දෙවියනට ද ශ්‍රද්ධා ප්‍රතිලාභය පිණිස බුදුන් වදාළ ධර්මවිනය ආරක්ෂා වීම පිණිස ප්‍රඥාසම්ප්‍රයුක්ත ශ්‍රද්ධාවට පැමිණීම ගිහි පැවිදි සැම අවධානය යොමු කළයුත්තක් වේ.

මනුලොව ක්‍රියාත්මක වන අකුශල ක්‍රියා දෙස බලන විට පෙනෙන්නේ දූනට වැඩි ප්‍රතිශතයක් අසුරලොවින් හා වෙනත් අඳුරු තල වලින් මිනිසත්බවට ආ අය වියහැකි බවයි. මිහි මත නිරය තනන්නේ ඔවුන් ය.

ධර්මයෙන් තොර භෞතික දියුණුව නිර්මාණය කරන්නේ නිරයයි. ධර්මයෙන් පෝෂිත භෞතික දියුණුව සුගතියයි. ච්‍යුතවන දෙව්වරුනට මනුලොව සුගතියක් වන්නේ එවිටයි. <u>මේ හෙළ දෙරණ ද, නිවන්මග වඩන්නවුන්ට විසිය හැකි පතිරූපදේසයක් කරන්නට රාජ්‍යතන්ත්‍රයේත් ජනතාවගේත් නුවණැස පිබිදේවා.!</u>

සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා.

සමාප්තයි.